
කොවිඩ් ව්‍යාප්තිය




දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බක් අව දසවක ලත් ගුරු දින | කාණ්ඩය 112 | පත්‍රය 119 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 06 බ්‍රහස්පතින්දා

ස්වර්ණභූමියේ අතීතාවලෝකනය
කතරගම
අද පත්‍රය සමඟ

# ආසාදිතයන් වැඩි වුණොත් පළාත් අතර සංචරණ සීමා පනවනවා



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස් සහ රක්ෂණ ශ්‍රියන්ත

කොරෝනා ආසාදිත රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන්නේ නම් පළාත් අතර සංචර සීමා පැනවීමට වන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා සඳහන් කරයි. මේ වන විට දිවයිනේ ප්‍රදේශ කිහිපයකින් වැඩි වශයෙන් අසාදිතයන් වාර්තා වීම හේතුවෙන් බොහෝ ග්‍රාම නිලධාරි වසම් සහ පොලිස් බල ප්‍රදේශ හුදෙකලා කර තිබේ. පිට 06

## රිෂාඩ් පාර්ලිමේන්තු කැඳවන්න එපා



පිට 06

## කැඳවා අයිතිය රකින්න



පිට 06



## නීති ගැටලුවක් නෑ

පිට 06



## අගමැති මහින්ද ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුනට

පිට 06

## කොළඹ ගුවන් පාලම්වල ඉදි කිරීම් අවුරුද්දක් ඇතුළත නිම කරන්න

ප්‍රවාහන ඇමැතිගෙන් උපදෙස්



පිට 06



## ජනපති මැතිසබයට එයි

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඊයේ (5) පෙරවරු 10. 05ට පමණ පාර්ලිමේන්තුවට පැමිණියේය. පිට 06



## මැතිවරණ ප්‍රතිසංස්කරණ විශේෂ කාරක සභා සභාපති දිනේෂ්

පිට 06

## එකම පවුලේ තිදෙනෙක් කොරෝනාවට බිලි වෙති

පිට 06

## බැඳුම්කර නඩුව ජුනි 7 දා කැඳවයි

රෝෂන් තුෂාර

යහපාලන රජය සමයේදී කළ ආන්දෝලනාත්මක ශ්‍රී ලංකා මහ බැංකු පළමු බැඳුම්කර වෙන්දේසියේදී රුපියල් මිලියන 688කට අධික පාඩුවක් කරමින් මුදල් සාවද්‍ය පරිහරණය කළේ යැයි චෝදනා යටතේ හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් ඇතුළු විත්තිකරුවන්ට එරෙහි නඩුව ජුනි 7 දින කැඳවීමට ත්‍රිපුද්ගල ස්ථිර මහාධිකරණය ඊයේ (5) නියෝග කළේය. පිට 06

## තවත් වසම් 12ක් හුදෙකලා කරයි

පිට 06

## රුධිර සංචිත පහළ ගිහින්

### වෙලාවක් වෙන් කර ගෙන ලේ පරිත්‍යාගයට අවස්ථාව

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

මේ දිනවල රට තුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය සහ එයට සමගාමීව පනවනු ලබන සංචරණ සීමා හේතුවෙන් ජාතික රුධිර පාරවිලයන සේවය සතුව පවතින රුධිර සංචිත ප්‍රමාණය පහළ ගොස් ඇති බව ජාතික රුධිර පාරවිලයන සේවයේ අධ්‍යක්ෂ වෛද්‍ය ලක්ෂ්මන් එදිරිසිංහ මහතා පවසයි. පිට 06




## උ/පෙළ නැවත සමීක්ෂණ අයදුම් ඔන්ලයින් ක්‍රමයට

රක්ෂණ ශ්‍රියන්ත සහ හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

මෙවර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට මාර්ගගත (ඔන්ලයින්) ක්‍රමය ඔස්සේ පහසුකම් සලසන බව විභාග කොමසාරිස් ජෙනරාල් සනත් පූජිත මහතා සඳහන් කරයි. පිට 06

## ලක්ෂයකට පූර්ණ සුවය


සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 ආසාදිතව රෝහල්ගතව සිට පූර්ණ සුවය ලැබූ සංඛ්‍යාව 100,075 ක් දක්වා ඉහළ ගොස් ඇති බව වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි. පිට 06

## රට නොවසා මාස දෙකක් තුළ ව්‍යාප්තිය පාලනය කළ හැකියි

සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පිට 06

ලේක් හවුස් ආයතනයේ අපි ඔබගේ ආරක්ෂාව වෙනුවෙන් පහත පූර්වෝපායන් අනුගමනය කර ඇත්තෙමු.



# නුවරඑළියෙන් තවත් කොවිඩ් ආසාදිතයෝ 30ක් හමුවෙති

**හැටන් මධ්‍යම විශේෂ**

නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ඊයේ (05) උදෑසන වන විට නව කොවිඩ් ආසාදිතයන් 30ක් වාර්තා වී ඇති බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයක නිලධාරියෙක් පැවසීය.

රාගල සෞඛ්‍ය බල ප්‍රදේශයෙන් ආසාදිතයන් 04ක්, නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශයෙන් 02ක්, අඹගමුව සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශයෙන් 02ක්, දික්ඔය දිස්ත්‍රික් රෝහලින් 01ක්, කොටගල සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශයෙන් 05ක්, නුවරඑළිය සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශයෙන් 15ක්, ලිඳුල සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශයෙන් 01ක්, වශයෙන් මේ ආසාදිතයන් වාර්තා වී ඇති බව කීය.

මෙසේ අලුතින් හමු වූ ආසාදිතයන්ගේ ළඟම ආශ්‍රිතයන් සොයා එම පිරිස් ස්වයං නිරෝධායනයට ලක් කිරීමට පියවර ගන්නා බවත් එසේ ස්වයං නිරෝධායනයට ලක් කරන පිරිස පී.සී. ආර්. පරීක්ෂාවට ලක් කිරීමට ද පියවර ගන්නා බවත් දිස්ත්‍රික්කයේ මේ වන විට වාර්තා වී ඇති සමස්ත මරණ සංඛ්‍යාව 15ක් බවද එම නිලධාරියා තවදුරටත් පැවසීය.

# වැල්ලවාය කොවිඩ් ආසාදිතයෝ 278 දක්වා ඉහළට

**වැල්ලවාය විශේෂ- ජී. අයි. ආර්. ගරුසිංහ**

වැල්ලවාය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල බල ප්‍රදේශයේ මෙතෙක් හඳුනාගත් සමස්ත ආසාදිතයන් ගණන 278 දක්වා ඉහළ ගොස් ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි.

වැල්ලවාය මූලික රෝහලින් සිදුකළ පී. සී. ආර්. පරීක්ෂණවලදී වැල්ලවාය කලාප කාර්යාලයේ නිලධාරියකුටද කොවිඩ් ආසාදනය වී ඇති බව පෙරේදා(04) තහවුරු වූ අතර ඔහුගේ ආශ්‍රිතයන් 15 දෙනෙකු ස්වයං නිරෝධායනයට යොමු වන ලෙස මහජන සෞඛ්‍ය නිලධාරින් විසින් උපදෙස් දුන්නේය.

මේ අතර ඌව මාවෙලගම පිහිටි ආයුර්වේද බෙහෙත් ශාලාවේ සේවිකාවකට කොවිඩ් ආසාදානය වී ඇති බව වැල්ලවාය රෝහලේ සිදුකළ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂාවකින් තහවුරු වී ඇති අතර ඒ හේතුව නිසා එහි වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩලයේ පිරිසක් ද ස්වයං නිරෝධානයනයට යොමු කර තිබේ .

ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් 97කට අදාළ පී. සී. ආර්. පරීක්ෂණ සඳහා සාම්පල ලබාගැනීම පෙරේදා සිදුකෙරිණි.

# තිරප්පනෙන් පළමු කොවිඩ් මරණය වාර්තා වෙයි

තිරප්පනේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ පළමු කොවිඩ් මරණය ඊයේ (05) අලුයම වාර්තා වූ බව තිරප්පනේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පැවසීය.

මෙලෙස මියගොස් ඇත්තේ තිරප්පනේ ඇතුන්ගම පාරේ පදිංචිව සිටි විශ්‍රාමික හමුදා නිලධාරියෙකි.මිය යනවිට ඔහු බිංගිරිය ඉහළ කඩිගමුව ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක ආරක්ෂක නිලධාරියකු ලෙස සේවය කර ඇත.

ඉකුත් 29දා හලාවත රෝහලෙන් පී.සී.ආර්. පරීක්ෂණයකට භාජනය වී ඇති අතර ප්‍රතිඵල ප්‍රමාද වීම හේතුවෙන් ඔහු ඉකුත් 03 වැනිදා රාත්‍රියේ සිය සොහොයුරා සමග ලොරියකින් තිරප්පනේ ප්‍රදේශයට පැමිණ ඇත.පසුව පී.සී.ආර්. පරීක්ෂණයේ ප්‍රතිඵල මගින් අනාවරණය වී ඇත්තේ ඔහුට කොවිඩ්- 19 වයිරසය ආසාදනය වී ඇති බවයි.

පසුව තිරප්පනේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් ඔහු පෙරේදා (04) රාත්‍රියේ අතරමැදි කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.පසුව ඔහු මිය ගොස් ඇත.

මිය ගිය අය රැඳී සිටි තිරප්පනේ නිවෙසේ මේ වනවිට බිරිය ,දරුවා සහ අත්උදව්කාරියක නිරෝධායනය කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම නිවෙස විෂබීජහරණය කිරීමට ද පියවර ගෙන තිබුණි.

මේ වනවිට තිරප්පනේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ කොරෝනා රෝගීන් 12ක් වාර්තා වී ඇත. ඒ අතරින් පුද්ගලයන් තිදෙනකු ප්‍රතිකාර මධ්‍යස්ථාන නැතිවීමෙන් ඔවුන්ගේ නිවාසවලම නිරෝධායනය කිරීමට පියවර ගෙන ඇත.

# ඉංගිරියේ 47කට කොරෝනා

**ඉංගිරිය මධ්‍යම සමූහ - ප්‍රියදර්ශනී කහවල**

ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඊයේ (05) උදෑසන වන විට කොරෝනා රෝගීන් 47ක් වාර්තා වී ඇති බව ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවසයි. මින් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රයිගම්වත්ත ග්‍රාම නිලධාරී වසමින් වන අතර එම සංඛ්‍යාව 10කි.

ඊට අමතරව නම්බපානින් 05ක්ද, ඉංගිරිය නැගෙනහිරින් සහ මහ ඉංගිරියෙන් 04 බැගින්ද ලෙස රෝගීන් වාර්තා වී ඇති අතර, මේ වනවිට රෝගීන් හමුවී ඇති සමස්ත ග්‍රාම නිලධාරී වසම් ගණන 18කි.

එසේම පවුල් 105කට අයත් සාමාජිකයන් නිරෝධායනයට යොමුකර ඇති බවද ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැඩිදුරටත් පවසයි.

# ස්වයං නිරෝධායනයට ලක් කර සිටි කොස්තාපල් බිඳුණුවැව කොවිඩ් ප්‍රතිකාර ඒකකයට

**සී.ගමගේ- සොරණාතොට සමූහ**

**පොලිස් සැරයන්වරයකු කොවිඩ්- 19 ආසාදිත වී මියයාමත් සමඟ ස්වයං නිරෝධායනයට ලක් කර සිටි ඇටම්පිටිය පොලිසියේ පොලිස් කොස්තාපලවරයකු කොවිඩ් ආසාදිත වී බිදුණුවැව කොවිඩ් ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කළ බව ඇටම්පිටිය පොලිසිය පවසයි.**

**මෙසේ කොවිඩ් ආසාදිත වී ඇත්තේ මඩොල්සිම ප්‍රදේශයේ පදිංචි ඇටම්පිටිය පොලිසියට අනුයුක්තව සේවය කළ 39 හැවිරිදි පොලිස් කොස්තාපලවරයකුයැයි පොලිසිය සඳහන් කරයි.**

**ඇටම්පිටිය පොලිසියට අනුයුක්තව සේවය කර රාජකාරි කටයුතු නිම කර ඉකුත් 29 වැනිදින පස්වරුවේ යතුරුපැදියෙන් නිවෙස කරා යමින් සිටියදී අතරමඟදී හදිසියේ රෝගී වී බදුල්ල මහ රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව කොවිඩ්-19 ආසාදිත වී බණ්ඩාරවෙල අමුනුදෝව ප්‍රදේශයේ පදිංචිව සිටි පොලිස් සැරයන් ගැමුණු විජේසිංහ (56 ) මහතා මියගිය බවද පොලිසිය පැවසීය.**

**පසුව සෞඛ්‍ය බලධාරීන් විසින් මියගිය පොලිස් සැරයන්වරයාගේ ප්‍රථම ආශ්‍රිතයන් ලෙස හඳුනාගත් ඇටම්පිටිය පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරීන් 10 ක් ඇටම්පිටිය වරාය ගොඩනැගිල්ලේ දින 14ක කාලයක් නිරෝධායනයට ලක් කරනු ලැබූහ.**

**එසේ නිරෝධායනයට ලක් වෙමින් සිටි ඇටම්පිටිය පොලිසියේ පොලිස් කොස්තාපලවරයකු හදිසියේ රෝගී වී බදුල්ල මහ රෝහලට ඇතුළත් කර ඇන්ටිජන් පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව මෙසේ ඔහුට කොවිඩ්-19 ආසාදිත වී ඇති බවට අනාවරණය වි ඇතැයි පොලිසිය සඳහන් කළේය.**

**දැනට සෙසු පොලිස් නිලධාරීන් නව දෙනා නිරෝධායනයේ පසුවන බවද උසස් පොලිස් නිලධාරියකු පැවසීය.**

# ලුණුවිල ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරියකට කොරොනා

**මිහිර විජේසේකර -මාරවිල සමූහ**

වෙන්නප්පුව- ලුණුවිල ප්‍රාදේශීය රෝහලේ සේවය කරන වෛද්‍යවරියකට කොරොනා රෝගය වැළඳී ඇති බවට තහවුරු වී ඇති බව පුත්තලම දිස්ත්‍රික් වෛද්‍ය සේවා අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය දිනූෂා ප්‍රනාන්දු මහත්මිය පැවසූවාය. එම වෛද්‍යවරියට රෝග ලක්ෂණ ඇතිවීමෙන් පසු සිදුකළ පීසීආර් පරීක්ෂණයෙන් ඊයේ කොරෝනා වයිරසය ආසාදනය වී ඇතිව බවට තහවුරු වී තිබේ.

වෛද්‍යවරිය රෝහලේ නිල නිවාසයක රැඳී සිටීමෙන් සේවය කර ඇති අතර ඇයගේ සමීපතම ආශ්‍රිතයන් හෙදියන් නිරෝධානයට ලක් කිරීමට සෞඛ්‍ය අංශ පියවර ගෙන තිබේ.

# කැනියොන් ජල විදුලි බලාගාරයේ සේවකයන් 04කට කොවිඩ්

**මස්කෙළිය සමූහ**
**ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක**

මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල බල ප්‍රදේශයට අයත්, කැනියොන් ජල විදුලි බලාගාරයේ සේවකයන් 04ක් කොවිඩ්-19 වයිරසය වැළඳුන ආසාදිතයන් බවට පෙරේදා (04) රාත්‍රී හඳුනාගත් ඇති බව නල්ලතන්නිය මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්. එච්. ගෝදාපතිරණ මහතා පැවසීය.

කැනියොන් ජල විදුලිබලාගාරයේ සේවයේ නියුතු සේවකයන් 76කගෙන් ඉකුත්දා (29) ලබා ගත් පී.සී.ආර්. පරීක්ෂණවල සාම්පල් වාර්තා (04) රාත්‍රී ලැබීමෙන් පසු මේ නව ආසාදිතයන් 04 දෙනා හඳුනා ගැනීමට හැකිවූ බවත්, මේ ආසාදිතයන් සිව් දෙනා මීට ප්‍රථම කැනියොන් ජලවිදුලිබලාගාරයේ සේවයේ නියුතුව සිටියදී ඉකුත්දා (24) වාර්තා වූ ආසාදිතයාගේ ආශ්‍රිතයන් වන බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක ගෝදාපතිරණ මහතා පැවසීය.

# ගලේවෙල - දිග්ගල මංගල සාදයකට ගිය 30කට කොවිඩ්

මංගල සාදයකට සහභාගි වූ පිරිසක් ඇතුළු පුද්ගලයන් තිස්දෙනෙක් සම්බන්ධයෙන් ගලේවෙල දිග්ගල ප්‍රදේශයේදී පෙරේදා (04) සිදුකළ ඇන්ටිජන් පරීක්ෂාවේදි ඔවුන් සියලුදෙනාම කොරෝනා වයිරසය ආසාදිතයන් බව තහවුරු වී ඇතැයි සෞඛ්‍ය නිලධාරීහු පවසති.

සෞඛ්‍ය නිලධාරින්ගේ අවසරයක් නැතිව මේ ප්‍රදේශයේදී මංගල උත්සවයක් පවත්වා ඇති අතර මේ කොරෝනා වයිරසය ආසාදනය වුවන්ගෙන් බහුතරය මංගල සාදයට සහභාගිවුවන් බව සඳහන් කරන මේ නිලධාරීහු නීතිවිරෝධි මත්පැන් භාවිතයද ඉතා තදින් දක්නට ඇති බැවින් වයිරසය පැතිරයාමට එම තත්ත්වයද බෙහෙවින් බලපා ඇති බවද පෙන්වා දෙති.

# රෝගීන් වාර්තාවීම 70%කින් වැඩි වෙලා: පාලනය නොකළොත් ඉදිරියේදී ඔක්සිජන් සහ දැඩි සත්කාර ඒකක හිඟ වෙන්න පුළුවන්

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති

**ප්‍රසාද් පූර්ණමාල්- පුත්තලම දිසා සමූහ**

මේ වන විට රෝගීන් වාර්තාවීම සියයට හැත්තෑවකින් වැඩි වී ඇති හෙයින් රෝගීන් සංඛ්‍යාව පාලනය නොකළහොත් ඉදිරියේදී ඔක්සිජන් මෙන්ම දැඩි සත්කාර ඒකක හා ඖෂධවල හිඟයක් ඇති වෙන්න පුළුවන් යැයි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා පවසයි.

මේ වන විට දෛනිකව වාර්තා වන රෝගීන් ප්‍රමාණය ඉහළයාම නිසා රෝගීන් ප්‍රතිකාර මධ්‍යස්ථාන කරා යොමු කිරීමේදී බරපතළ ගැටලුවලට මුහුණදීමට සිදු වන බව හලාවතදී පැවති මාධ්‍ය හමුවකදීය.

කොරෝනා පාලනය සම්බන්ධයෙන් දේශපාලකයන් ඔවුන්ට බලපෑම් නොකළ යුතු බව ද හෙතෙම කීය.

# උඩුබද්දාව හුදෙකලා වූ ග්‍රාම නිලධාරී වසම් 06කට රුපියල් 5000 බඩු මලු බෙදාදෙයි



**උඩුබද්දාව සමූහ - ආර්. ඇම්. කරුණාතිලක**

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හුදෙකලා වූ ග්‍රාම නිලධාරී වසම් 06ක් වෙත සහන සැලසීම මත පළමු අදියර යටතේ රුපියල් 5000ක් වටිනා බඩු මලු බෙදා දීම ඉකුත්දා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සුමුදු පී. විතානගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඒ ඒ ග්‍රාම නිලධාරී වසම්වලදී සිදු කෙරිණ.

මේ වැඩසටහන යටතේ කප්පන්ගමුව පරණගම ග්‍රාම නිලධාරී වසම්වල බඩු මලු බෙදා දීමද සිදු කරනු ලැබූ අතර මේ අවස්ථාවට උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සුමුදු පී. විතානගේ,උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභාපති රාජ් සිසිර කුමාර,ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. ඇම්.ගුණවර්ධන,උඩුබද්දාව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති සුමිත් දේශප්‍රිය,උඩුබද්දාව පරිපාලන ග්‍රාම නිලධාරී ජානක වික්‍රමනායක,කප්පන්ගමුව ග්‍රාම නිලධාරී රුවන් රණතුංග,පරණගම ග්‍රාම නිලධාරී නිලූකා ප්‍රතාපසිංහ මහත්ම මහත්මීහු ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# බූස්ස නාවික හමුදා කඳවුරේ ඇඳන් 162කින් සමන්විත කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක්



කොවිඩ්-19 ආසාදිත රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ රජයේ වැඩපිළිවෙළට සහාය වෙමින් ගාල්ල, බූස්ස නාවික හමුදා කඳවුරේ ඇඳන් 162කින් සමන්විත කොවිඩ්-19 අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් නාවික හමුදාව විසින් පෙරේදා (04) ස්ථාපනය කෙරිණි.

ආධුනික නාවිකයන් පුහුණු කිරීමට බූස්ස නාවික හමුදා කඳවුරේ භාවිතා කරන ලද සිවු මහල් ගොඩනැගිල්ලක් ජාතික අවශ්‍යතාව මත නාවික හමුදාව විසින් මෙලෙස කොවිඩ්-19 අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වශයෙන් පරිවර්තනය කරන ලදී.

මේ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය වාට්ටු 12කින් සමන්විත වන අතර, එහි ඇඳන් 150ක පහසුකම් ලබාදීමේ හැකියාව පවතී. එමෙන්ම මෙහි ඇඳන් 12කින් සමන්විත විශේෂ ප්‍රතිකාර ඒකකයක් ද (High Dependency Unit- HDU) ස්ථාපනය කර ඇති අතර, මේ ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත රෝගීන් ඇතුළත් කර ගැනීම 04 වැනිදා දින සිට ආරම්භ කෙරිණි. තවද නාවික හමුදාව විසින් මේ ප්‍රතිකාර ඒකකයට නාවික හමුදා වෛද්‍යවරුන් දෙදෙනෙක් ඇතුළු වෛද්‍ය කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත.

# ලංගම රුහුණු ප්‍රාදේශිකයේ දෛනික ආදායම රුපි:ලක්ෂ 40කින් අඩුවෙලා

**ගාල්ල දිස සමූහ**

කොරෝනා වසංගතයත් සමඟ මගී ජනතාව විසින් ගමන් බිමන් සීමා කොට ඇති නිසා ලංගම රුහුණු ප්‍රාදේශිකයේ දෛනික ආදායම රුපියල් ලක්ෂ 40කින් පමණ අඩු වී ඇති බැව් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ රුහුණු ප්‍රාදේශිකයේ ප්‍රධාන ප්‍රාදේශිය කළමනාකරු ආර් .වි. ප්‍රභාත් කුමාර මහතා පැවසීය.

මිට පෙර දෛනිකව රුපියල් ලක්ෂ 67ක ආදායමක් ලැබූ අතර මේ වනවිට දෛනික ආදායම රුපියල් ලක්ෂ 27 දක්වා අඩු වී ඇති බවද ඒ මහතා පවසයි. ඉන්ධන කුලිය සොයාගැනිම පවා අපහසු වී ඇති බව පවසන ප්‍රධාන ප්‍රාදේශිය කළමනාකාරවරයා ලංගම බස්රථ පමණක් ධාවනය වන අතුරු මාර්ගවල දැනට අවශ්‍ය ගමන්වාර සඳහා පමණක් බස් රථ ධාවනය කරන බවද පවසයි. එකී මාර්ගවල කාර්යාල වෙලාවන්වල බස්රථ ධාවනය කිරීමට කටයුතු කරන බවද ඒ මහතා පවසයි. දුරගමන් සේවා බස්රථ සීමා කොට ඇති බව පවසන ප්‍රධාන ප්‍රාදේශිය කළමනාකාරවරයා මගීන්ගේ අවශ්‍යතාව අනුව බස්රථ ධාවනය කිරීමට කටයුතු කරන බවද ඒ මහතා පවසයි.

පාසල් නිවාඩු ලබාදීම, උපකාරක පන්ති නොපැවැත්වීම, කාර්යාල සඳහා කැඳවිය යුතු සේවක සංඛ්‍යාව සියයට 50 දක්වා අඩුකිරීම යන හේතු නිසා පොදු ප්‍රවාහන සේවා භාවිතාකරණ මගින් සංඛ්‍යාව විශාල වශයෙන් අඩු වී ඇති බවද ප්‍රභාත් කුමාර මහතා පවසයි.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මැයි 06 බ්‍රහස්පතින්දා

# වාද විවාදවලින් පලක් නෑ

සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චිගේ කියමනකින් මේ ලියවිල්ල ආරම්භ කරන්නට කැමැත්තෙමු. ඇමැතිනිය පාර්ලිමේන්තුවේදී කියා සිටියේ ගහමරා ගැනීමෙන් හෝ වැඩකට නැති වාද පැවැත්වීමෙන් හෝ කොරෝනා අර්බුදය විසඳාගත නොහැකි බවය. පාර්ලිමේන්තුව දෙපැත්තට බෙදී ගහගැනීමෙන් කිසිදු ගැටලුවකට විසඳුමක් ලැබෙන්නේ නැත. සෞඛ්‍ය ඇමැතිනිය ඉහත අදහස පළ කළේ හැඟුම්බර ලෙස ස්වකීය අත්දැකීම් ද ඊට එකතු කරමින්ය. ඇය කොවිඩ් වැලඳී රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ද ප්‍රතිකාර ලබා සුවපත් වූ කාන්තාවකි. ඒ අතින් බලන විට කොවිඩ් පිළිබඳ ඇමැතිනියගේ අත්දැකීම පරිපූර්ණය. ඇයට සවන් දීමෙන් බොහෝ දේවල් උගත හැකිය.

ජාතික අර්බුදයකදී ඕනෑම ප්‍රගතිශීලී සංවිධානයක් රජය සමඟ ඒකාබද්ධ වී ගැටලු නිරාකරණය කිරීම සඳහා ක්‍රියා කිරීම වැදගත්ය. 1971 කැරැල්ල මැඩපැවැත්වීම සඳහා සමගි පෙරමුණ සමඟ එක්සත් ජාතික පක්ෂය සහයෝගයෙන් කටයුතු කළේය. ජේ. ආර්. ජයවර්ධන මහතා එම සහයෝගය දීමට මුල් විය. එහෙත් අද විපක්ෂ නායකයා එලෙස ක්‍රියා කරන්නේ ද යන්න ප්‍රශ්නකාරිය. අපි දේශපාලන වාසි ගැනීමෙන් තොරව සාමූහිකව ක්‍රියා කරමු යැයි යෝජනා ඉදිරිපත් කළ ද එවැන්නක් ක්‍රියාත්මක තලයේදී දකින්නට නැත. පෙරේදා පැවති පාර්ලිමේන්තු විවාදයේදී ද ඒ බව සනාථ විය. දේශපාලකයන් ලකුණු ගැනීමේ අරමුණකින් තොරව අවංක ලෙස ජාතික අර්බුදය විසඳීමට මැදිහත් වන්නේ නම් වැඩි කල් නොගෙන අර්බුදයෙන් ගොඩයෑමට හැකි වනු ඇත.

ඉන්දියාවේ මෙන් අතිශය අසීරු තත්ත්වයක් දකින්නට නැති වුව; ශ්‍රී ලංකාවේ ද රෝහල් තුළ තදබදයක් ගොඩනැගෙමින් පවතී. මෙය ඉදිරියේදී තවත් උග්‍ර වන්නට පුළුවන. ගෙවී ගිය දින කිහිපය තුළ අඛණ්ඩව නව ආසාදිතයන් දෙදහසකට ආසන්න ගණනක් දෛනිකව වාර්තා වී ඇත. සෞඛ්‍ය අංශවල මතයට අනුව මේ සංඛ්‍යාව 8000 - 10,000 අතර තත්ත්වයකට පත් වන්නට පුළුවන. එබඳු තත්ත්වයක් මතු වුව හොත් ශ්‍රී ලංකාව අසීරු තැනකට පත් වන බව රහසක් නොවේ. රජය රෝහල් පහසුකම් වැඩි කිරීමට කඩිනම් පියවර ගණනාවක් ගෙන තිබේ. මේ අතර ආරක්ෂක අංශ අලුතින් ඇඳන් හා තාවකාලික රෝහල් ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුත්තක යෙදී සිටිති. ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු ද තම පෞද්ගලික වියදමින් රෝහල් පහසුකම් වැඩි කිරීමට දායක වෙති.

ඉහත පසුබිම ආදර්ශයට ගෙන කටයුතු කරන්නට දේශපාලන පක්ෂ හා ස්වේච්ඡා සංවිධාන පියවර ගත හොත් එය කොවිඩ් මර්දනයට විශාල ශක්තියක් වනු ඇත. ශ්‍රී ලංකාව කොවිඩ් එන්නත ලබා ගැනීම අතින් සාර්ථක ස්ථානයක සිටිය ද ලෝකයේ රටවල් හැට - හැත්තෑවකට තවම කිසිදු එන්නතක් ලැබී නැත. වසංගතය මර්දනය කිරීම සඳහා ඇති එකම විද්‍යාත්මක විසඳුම එන්නත බව පිළිගනී. එහෙත් ලෝකයේ රටවල් හැටකට හෝ හැත්තෑවකට හෝ එන්නත්වලින් කිසිදු මාත්‍රාවක් ලැබී නැතැ'යි වාර්තා වීම අතිශය කනගාටුවට කාරණයකි. එම රටවල දේශපාලන නායකයන් සේම ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු ජගත් ආයතන ද ඊට වගකිව යුතුය. මානව හිමිකම් හා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ආයතන හෝ මේ සඳහා මැදිහත් විය යුතුය.

එන්නත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට යම් ගැටලුවක් ඇති බව ද එය සැඟවිය යුතු කාරණයක් නොවන බව ද රාජ්‍ය ඇමැතිනී සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ කියා ඇත. එය හොඳ තත්ත්වයකි. මෙබඳු පසුබිමක් තුළ ජනතාව ඇත්ත දැනගැනීම ඉතා වැදගත්ය. එන්නත් ලක්ෂ හයක් පිළිබඳ ගැටලුව මතුව තිබේ. ඒ ඇස්ට්‍රා සෙනිකා එන්නත් වර්ගය තුළය. ඉන්දියාවේ එන්නත් නිෂ්පාදන සමාගම අර්බුදයක පැටලී ඇති බැවින් ඇස්ට්‍රා සෙනිකා එන්නත අතිරික්ත ඇති රටවලින් මිලට ගැනීම සඳහා මේ වන විටත් සාකච්ඡා පැවැත්වෙන බව ඇමැතිනිය පැහැදිලි කර ඇත. රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නතෙන් මාත්‍රා ලක්ෂ 135ක් ගැනීමට මුදල් ගෙවා ඇති බව ද වාර්තා වෙයි.

විපක්ෂය හා තවත් දේශපාලන කණ්ඩායම් විවිධ විවේචන එල්ල කළ ද කොවිඩ් මර්දනය අතින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට ආණ්ඩුව සමත් වී ඇත. එය පිළිගත යුතු කාරණයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය මෙන්ම තවත් ජගත් ආයතන කිහිපයක් ද අපේ කොවිඩ් මර්දන වැඩපිළිවෙළ අගය කර තිබේ. රටෙන් පළමු කොවිඩ් රෝගියා හඳුනාගැනීමටත් පෙර සිට කොවිඩ් මර්දනය සඳහා කාර්ය සාධක බළකායක් හා කමිටුවක් පිහිටුවීමට ජනාධිපතිවරයා සමත් විය. කොවිඩ් මර්දනය සඳහා ආරක්ෂක අංශවල සෘජු මැදිහත්වීම ලබා ගැනීම ජනාධිපතිවරයාගේ අදහසකි. පසුව එය වෙනත් රටවල් ද අනුගමනය කරන්නට පටන් ගත්හ.

එන්නත් හිඟ වුණේ රජයේ වරදින් බව විපක්ෂ නායකවරයා පෙන්වා දී ඇත. එහෙත් එය පිළිගත හැකි කාරණයක් නොවේ. දේශපාලකයෝ කොවිඩ් වසංගතය විවිධ කරුණු සඳහා භාවිත කරති. සමහරු එය දේශපාලන වාසිය සඳහා යොදා ගනිති. තව සමහරු එය ආණ්ඩුව හා ජනාධිපතිවරයා විවේචනය කිරීම සඳහා භාවිත කරති. තවත් සමහරු කොවිඩ් සමඟ සෙල්ලම් කරති. මේ සෑම ක්‍රියාවලියකින්ම සිදු වන්නේ අර්බුදය තවත් උත්සන්න වීම මිස ඊට විසඳුමක් ලැබීම නොවේ. පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් ඇති වන විවාද හුදෙක් දේශපාලනය සඳහා යොදා ගැනෙන අතර, එහිදී වැදගත් යෝජනා ඉදිරිපත් වන බවක් ද පෙනෙන්නට නැත. මේ විවාද වනාහි කාලය නාස්ති කිරීමක් යැයි කවුදෝ කියා ඇත. එය සත්‍යයෙකි.

කොවිඩ් මර්දනයේදී සංකල්ප දෙකක් වැදගත් බව අපට සිතේ. එක සාමූහිකත්වය පිළිබඳ සංකල්පයය. අනෙක ස්වයං විනය පිළිබඳ සංකල්පයය. මේ දෙක සම්මිශ්‍රණය කර ගත හැකි නම් කොවිඩ් 19 රටෙන් අතුගා දැමීමට වැඩි කාලයක් ගත නොවනු ඇත.

**දිල්රුගෙ සීවිදි**

| | |
|---|---|
| මරණ බිය දැනෙන විට එයින් ගැලවී | ගන්න |
| ඉන්දියානුවන් පොර බදනවලු මෙහෙ | එන්න |
| අපට ඒ ටික උනොත් නැහැ තැනක් | සැඟවෙන්න |
| ඒ නිසා හැකි සෑම වෙලාවෙම ගෙයි | ඉන්න |

# ගැමි දිවිය සරු කළ ගම සමඟ පිළිසඳර

ගමට බොහෝදෙනා දක්වන්නේ අසීමිත ආදරයකි; එසේම ගෞරවයකි. උපන් දේශයට ආදරය කරන කවර හෝ පුද්ගලයෙකු සිය උපන් ගමට ආදරය දක්වන්නේ මවට, පියාට මෙනි. බුදුන් වහන්සේ පවා කිඹුල්වතින් හමන සුළඟ පවා මට සුවදායක යැයි වරෙක පැවසූ බව අසා ඇත. අපේ රටේ ද ශිෂ්ටාචාරය, සභ්‍යත්වය, සංස්කෘතිය ආදී බොහෝ ගුණාත්මක සංකල්ප ගොඩනැගී ඇත්තේ ගමෙනි. අනුරාධ ඇමතියා තැනූ අනුරාධග්‍රාම පසුව අනුරාධපුරය වශයෙන් ප්‍රකට වූ බව අපේ වංශ කතාවලින් පැහැදිලි කර දී ඇත. ඒ අනුව රටක දියුණුව සමඟ ගමත් ඒ දියුණුවේ ප්‍රතිලාභ අත්කර ගැනීම සිදු විය යුත්තකි. කෘෂිකාර්මික ජීවන රටාවකට හුරු ජනතාවක් වෙසෙන අපේ රටේ ඉලක්කගත ආර්ථික ක්‍රමයේ තෝතැන්න ගම බව අමතක නොකළ යුත්තකි. ආර්ථිකය පමණක් නොව අපේ රටේ පැවති යුද්ධවලදී සේනා සංවිධාන කටයුතු කළේ ගමෙනි. රෝහණ දේශයේ සිටි පාලකයා වූ කාවන්තිස්ස රජතුමා සමඟ විරසක වූ දුටුගැමුණු කුමාරයා සිය සේනා රැස් කිරීම, ආයුධ නිෂ්පාදනය වැනි කටයුතු සිදු කළේ කන්ද උඩරට කොත්මලේ පුසුල්පිටිය වැනි ගමක සිට බව අප ඉතිහාසයෙන් හදාරා ඇත. වළගම්බා රජතුමා යුද්ධවලින් පැරදී රහසිගත ජීවිතය ගතකළේ ගම්මානවල බව ඉතිහාසගත කතාවලින් පැහැදිලි වේ. පෘතුගීසීන්ට එරෙහිව සටන් කළ දක්ෂ රණශූරයෙකු වූ වීදිය බණ්ඩාර සැඟව සිට සේනා සංවිධානය කළේ පස්යොදුන් රට පැළෑඳ යන ගමේ සිට බව ඉතිහාසගත මූලාශ්‍රවලින් පැහැදිලි වේ.



## අභියෝග

හෙළ දුර්ග, වන දුර්ග, ගිරි දුර්ගවලින් ගහන අපේ රට විජාතික බලවේග තුනකට මුහුණ දුන්නේ සැඟව සිට පහරදීම යන ගරිල්ලා සටන් ක්‍රමයෙන් බව පැහැදිලිය. ඒ අනුව එදා ගම්මානවල ජීවත්වූ රණකාමී ජනයාගේ යුද උපක්‍රමවලින් විජාතිකයින්ට ගැලවීමක් නොවුණේ අපේ භූගෝලීය පිහිටීම ආශීර්වාදයක් වූ නිසාය. එදා ඌව වෙල්ලස්සේ සටන්වලදී මෙන්ම මාතලේ සටනින් ජීවිත පූජා කළේ ගමේ ජීවත්වූ අහිංසක ගැමියන්ය. බ්‍රිතාන්‍ය ජාතිකයින් අපේ ගම්බිම් පමණක් නොව ගොවිබිම් ද ඉතාම දරුණු ලෙස විනාශ කළේය.

1930 දශකයේ අප රටම ගිල ගත් මැලේරියා උවදුරින් පීඩා වින්දේ ගැමි ජනතාවයි. විශේෂයෙන් සතරකෝරළය, සත්කෝරළයේ ජීවත්වූ අහිංසක ගැමි ජනයාට ජීවිතයත්, මරණයත් අතර එදා සටන් කිරීමට සිදු විය. මේ පීඩාකාරී දුර්දාන්ත අවදියේ ගැමියාගේ පිහිටට පැමිණියේ එදා 'පරිප්පු මහත්තයා' නමින් හැඳින්වූ ආචාර්ය ඇන්. එම්. පෙරේරා වැනි මානවහිතවාදීන්ය. ඇන්. එම්, කොල්වින්, පිලිප්, එඩ්මන්, රොබට්, එස්. ඒ. වික්‍රමසිංහ වැනි ශ්‍රේෂ්ඨ යුගපුරුෂයන් කඳු ගිරි ශිඛර පසුකරමින් සැතපුම් ගණන් පාගමනින් ගොස් ජනතාවට පිහිට විය. ප්‍රථමාධාර පෙට්ටිය සමඟ මිනිසුන්ට අවශ්‍ය කෑම බීම වර්ග ද රැගෙන පීඩිත ගැමියන් ළඟට ගියේ දැඩි මානවදයාවෙනි.

එදා සූරියමල් ව්‍යාපාරය හරහා අපේ රටේ ගැමි ජනතාවගේ හදවත්වලට ඔවුන් කතා කළේය. ඒ මැලේරියාව නැමැති මහා ව්‍යසනයෙන් ජනතාව බේරා ගත් මානවහිතවාදීන් ලෙසය. ඔවුන් මේ රටේ ගැමි ජනතාවගේ හදවත් වැළඳ ගත්තේය. එය කෙතරම් සිදු වීමක් ද කිව හොත් රුවන්වැල්ල, කරවනැල්ල, යටියන්තොට, කෑගල්ල, අවිස්සාවේල්ල, දෙහිඕවිට, කොලොන්න වැනි මන්ත්‍රී ආසන රතු බලකොටු වශයෙන් ප්‍රසිද්ධියට පත් වූහ. ඒ ආසනවලට අනෙක් ප්‍රධාන පක්ෂවලින් ඡන්ද අපේක්ෂකයන් ඉදිරිපත් වුවද ජය ගැනීමට නොහැකි වූයේ එදා සිටම ගැමියන් තුළ තිබූ කළගුණ සැලකීම යන උතුම් ගුණාංගය ක්‍රියාවට නැංවූ හෙයිනි.

නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති වූ ඩී. ඇස්. සේනානායක මහතා ද ගැමියන් සමඟ එකතු වී ගොවි ජනපද ව්‍යාපාර ඇතිකළේය. එවකට පොළොන්නරුව සහ අනුරාධපුරයේ මහා දිසාපතිවරයා වූ පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලනය කළ සී. පී. ද සිල්වා මහතා ද රජරට ගැමි ජනයා අතරට ගියේ ඩී. එස්. සේනානායක මහතාගේ ගොවිජන ව්‍යාපාරවලට රජයේ ඉඩම් බෙදා දීමෙනි. ඔහු මින්නේරිය අසුනින් පාර්ලිමේන්තුව දක්වා පැමිණ සභානායකවරයා බවට ද පත් විය. රුහුණෙන් ඩී. එම්. රාජපක්ෂ මහතා මෙන්ම ඩී. ඒ. රාජපක්ෂ මහතා වැනි ප්‍රගතිශීලී දේශපාලනඥයන් බිහි වූයේ ද ගිරුවාපත්තුවේ ගැමි ජනයාගේ හදවත්වලට සමීප වූ ජනතා නායකයන් වූ හෙයිනි.

ගමේ නායකත්වය හිමි වූයේ ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේටය. අද මෙන් එදා රෝග බහුලව නොමැති වුවත් ගමේ ජීවකවරයා වූයේ ගමේ වෙද මහතාය. ගමේ දරුවන්ගේ නුවණැස පෑදූ ඉස්කෝලේ ලොකු මහත්තයාට නො එසේ නම් ගුරුවරයා ගමේ සුවිශේෂ ගෞරවයක් හිමි වූ තවත් චරිතයකි. ගොවිතැන්බත් කළ ගොවි මහතා ද ගමේ බොහෝ දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූයේ නිරායාසයෙනි. ගමේ කැත්තේ, උදැල්ලේ වැඩ කළ තවත් පිරිසක් කම්කරු ජනයා වශයෙන් සේවය කළේය. ගමේ පන්සල එදා සිටම ජාතික, ආගමික හා සංස්කෘතික කටයුතුවල කේන්ද්‍රස්ථානය බවට පත් විය. ගමේ අදට වඩා සාමූහික බවක් එදා ජීවන රටාව සමඟ බැඳී තිබුණි. ඒ අනුව ගොයම් කැපීම, පෑගීම, කුඹුරු අස්වැද්දීම ආදී කුඹුර සමඟ බැඳී පැවැති සබඳතාවය සමඟ එකම දම්වැලක පුරුක් මෙන් ගැමි ජනයා බැඳී සිටියහ. එදා පැවැති ගම්සභා ක්‍රමය පෙර රජ දවසේ පටන් පැවති ගමේ දියුණුව වෙනුවෙන් ක්‍රියා කළ දේශපාලන සංවිධානයකි. ගම්සභාපතිවරයා මෙන්ම ගම්සභාවේ සභිකයෝ ගමේ පොදු කටයුතුවලදී ක්‍රියා කළහ. සෑම පොදු කටයුත්තකදීම ගමේ පන්සලේ ලොකු හාමුදුරුවෝ පෙරමුණ ගත්තා සේම අවවාද අනුශාසනා කරමින් ගැමි ජනයා දිරිමත් කළහ. කෘෂිකාර්මික ජීවන රටාව වෙනුවෙන් හැඩගැසුණු ගැමි ජනයා වෙනුවෙන් වෙල්විදානේ නම් තනතුරක් ද දැරූ පුද්ගලයෙකු එකල ගමේ ජීවත් විය. මෙවැනි පරිපාලනමය ව්‍යුහයක් ස්වේච්ඡාවෙන් සෑම ගමකම එදා ගොඩනැගී තිබුණි. එය ඕනෑම ගමක ප්‍රබල සංවිධානයකි.

ආණ්ඩුව සමඟ ගනුදෙනු කිරීමට කොට්ඨාස රාලහාමි, පසුව ග්‍රාම සේවක රාලහාමි වශයෙන් ද අද ග්‍රාම නිලධාරිවරයා වශයෙන් විකාශනය වී ඇත්තේ ඒ තනතුරය. ගමේ සමුපකාරය රජයත් සමඟ ගැමි ජනයාගේ භාණ්ඩ මිල දී ගැනීමේ හා විකිණීමේ මධ්‍යස්ථානය බවට පත් වී තිබුණි. ඒ අතර ගමේ කඩයක් කරමින් වෙළෙඳාම සිදු කළ ගැමි වෙළෙඳුන් ද සිටි බව නොරහසකි. මේ වාතාවරණය හමුවේ ඉතාම සුන්දර සරල ගැමි සමාජයක් එකල පැවැති බව පැහැදිලිය. නිදහස් අධ්‍යාපනය සමඟ ගැමි දරුවන් මහා විද්‍යාල, මධ්‍ය මහා විද්‍යාල හරහා විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා උසස් අධ්‍යාපනය ලැබීය. ගමෙන් උගතුන්, බුද්ධිමතුන් වූ වෛද්‍යවරු, නීතිඥවරු, දිසාපති, උප දිසාපති, විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු පමණක් නොව ඉංජිනේරුවන් ද බිහි වූහ.

## ගැමි අසිරිය

ගමක අසිරිය කියා පෑ කවීන් අතර, සාගර පලන්සූරිය (කේයස්), 'සුදෝ සුදු' තුළින් ඒ බව කදිම වාග් චිත්‍රයකට නැඟූ අයුරු සිහිපත් වේ. ගොඩ මඩ දෙකම සරුසාරය පලබරය යන කවියෙන් ඒ බව මැනවින් පසක් වේ. තවද මහගමසේකර සූරීන් 'ගම අමතකයි' යන පද්‍ය පංතියෙන් බුද්ධිය විසින් සිදාදියට යන්න පාර කියූ බවත් පසුව ගමට එන්න පාර අමතක වූ බවත් ඉතාම සියුම් ලෙස තමන් ජාත භූමියත්, සිය මවත් එක සමාන බව පසක් කළේ මෙසේය. 'ඇත ඉඳන් අත වනලා අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ' යනුවෙනි.

සාහිත්‍ය ලෝකයෙන් තමන් උපන් ගමත්, තමන් වැදූ මවත් අමතක නොකළ යුතු බව මහගම සේකරයන් 'ගම අමතකයි' යන පද්‍ය පංතියෙන් ඉතාම සියුම්ව අවධාරණය කොට ඇත.

ජනහිතකාමී ජනතාවාදී නායකයන් කිසිදිනෙක ගම අමතක නොකරන්නේ ගමේ මිනිසුන්ට ඇති මානව දයාව නිසාය. ජනමූලනායකයන් බිහි වන්නේ ජනමූල සමාජයකයි. ඒ ජනමූල සමාජයේ පදනම සකස් වී ඇත්තේ ගමෙනි. මුලින්ම මහින්ද රාජපක්ෂ නම් දේශපාලන පෞරුෂය ගොඩනැගුණේ ද ඒ ජනමූල සමාජය වූ ගමෙනි.

ගෝඨාභය රාජපක්ෂ නම් දේශපාලන පෞරුෂය ද ශක්තිමත් කළේ ගම නැමැති ජනමූල සමාජයෙනි. ඒ ජනමූල සමාජයේ නිමැවුම්කරුවා ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා බව ද අවිවාදිතය.

## සෞභාග්‍යය

සෞභාග්‍යයේ දැක්ම පෙරටු කරගත් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගම අමතක නොකළේය. ඒ අනුව 'ගම සමඟ පිළිසඳරක්' වැඩසටහන 2020 සැප්තැම්බර් මස 25 වැනිදා සිට ආරම්භ කළේ ගැමි ජනයාගේ පොදු ගැටලුවලට විසඳුම් දීමටය. සතියක් පාසා ඉතා සාර්ථක අන්දමින් ගැමි ජනතාව මුහුණ දුන් අනේකවිධ දුක් පීඩාවලට ප්‍රායෝගික පිළිතුරු ලබා දුන්නේ රටට, ජනතාවට ආදරය කරන ජනතාවාදී නායකයෙකු වශයෙනි. මීමුරේ වැනි අති දුෂ්කර ගමකට කාපට් කළ පාරක් ලැබීම පාසල් දරුවන්ට පමණක් නොව කිතුල් කර්මාන්තය මෙන්ම විවිධ භෝග වගාවන්වලින් සිය ජීවිතය සරිකර ගන්නා ගැමියන්ට විශාල ශක්තියකි; දිරියකි. ලංකාගම වැල්පාලමේ එල්ලී ගිං ගඟ තරණය කළ පාසල් දරුවන් අද ශක්තිමත් අලුත් පාලමක් මතින් සුදු ඇඳුමින් සැරසී පාසල් යන අයුරු දකින විට ඇතිවනුයේ නිරාමිස සතුටකි. ජල පිපාසයෙන් පීඩිතව සිටි මැදිරිගිරියේ ගැමි ජනතාවට කවුඩුල්ල වැවෙන් ජලය සපයාගෙන පවිත්‍රකොට ජල පිපාසය සංසිඳුවීම කෙතරම් මානුෂික ක්‍රියාදාමයක් ද යන වග රටට ආදරය කරන බොහෝදෙනා දනිති.

ගම සමඟ පිළිසඳර ප්‍රගතිය සොයා බැලීමට නො එසේ නම් පසුවිපරමක් කිරීමට ජනාධිපතිතුමා අමතක නොකළේය. ඒ අනුව මුලින්ම ගම සමඟ පිළිසඳර පැවැත්වූ බදුල්ල හල්දුම්මුල්ල වෙලංවිට ග්‍රාමයේ චාරිකාවක නිරත වූහ. ජනතාවගේ ඉල්ලීම පරිදි යුද හමුදාව ඉදිකළ කොටබෝගස්තැන්න ක්‍රීඩාංගණයෙන් ජනාධිපතිතුමා නිරීක්ෂණ චාරිකාව ආරම්භකොට ඇත. ගම්මාන 8ක් ඔස්සේ බස් රථ දෙකක් හපුතලේ සිට වෙලංවිට දක්වා ධාවනය කිරීමෙන් ප්‍රවාහන දුෂ්කරතාවයට විසඳුම් හිමි විය. අලි වැටක් ඉදිකොට අලිවැට ආරක්ෂා කිරීමට ගම්වැසියන් කිලෝමීටරයකට එක් අයෙකු බැගින් පුද්ගලයන් 6 දෙනකු පත් කොට ඇති අතර ඔවුන් සඳහා මාසිකව රුපියල් 7500ක දීමනාවක් දීමට ද පියවර ගෙන ඇත.

වන අලි ප්‍රහාරයෙන් කැඩී ගිය නිවස වෙනුවට යුද හමුදාව ඉදිකළ නව නිවස මෙන්ම ගම සමඟ පිළිසඳරින් ප්‍රතිලාභ අත්කර ගත් ඉඩම් ඔප්පුලාභීන්ට ජනාධිපතිතුමා අඛණ්ඩව වගා කටයුතුවල නිරතවන ලෙස උපදෙස් දීමට ද අමතක නොකළේය. ගම සමඟ පිළිසඳරක් වැඩසටහන අති දුෂ්කර ගම්මානවල ජීවත් වෙන ජනතාවට ප්‍රතිලාභ රැසක් අත්පත් කර දුන් ජන දුක නිවන සාර්ථක වැඩපිළිවෙළකි. ඇතමුන් කතා නොකළත් අද ගමේ ආර්ථිකය ශක්තිමත් වී ඇති බව පැහැදිලිය. අද වී කිලෝ එකක මිල රුපියල් 55 හෝ 60 කි. අමු තේ දලු කිලෝවක මිල රුපියල් 110කි. කුරුඳු මිල රුපියල් 2500කි. ගම්මිරිස් කිලෝවක මිල රුපියල් 650කි.

රබර් මිල රුපියල් 400කි. කරුන්කා කිලෝවක මිල රුපියල් 600කි. වී වගාව සිය ජීවනෝපාය කරගෙන ජීවත් වෙන ජනතාවක් වෙසෙන මැදවච්චිය ප්‍රදේශයේ අවුරුදු ගනුදෙනුවලින් කෝටි 27ක තැන්පතු මුදලක් ග්‍රාමීය බැංකුවලට ලැබී ඇත. අද ගැමි ජනයා අතේ මේ අයුරින් මුදල් සැරිසරන්නේ වගා කටයුතුවලින් අතමිට සරු වී ඇති නිසාය. ගම සමඟ පිළිසඳරක් තුළින් ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව වන්නේ ද ගැමි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමටය. හෙට දිනයේ සරු බිමක අස්වැන්නෙන් ගැමි ආර්ථිකය ශක්තිමත් වනවා යනු මුළු රටේම සමස්ත ආර්ථිකයම ශක්තිමත් වීමකි.




**මහින්ද ආරියවංශ**

දේශීය ආර්ථිකයේ ජීවනාලිය කෘෂිකර්මාන්තය බව පැවසුවත් වී ගොවිතැනින් වී ගොවියාට සිය ආර්ථික බර සැහැල්ලු කර ගැනිමටත් රටේ සහල් වෙළෙඳ පොළ ජය ගැනීමටත් නොහැකි බවටත් වී ගොවිතැන පාඩු කර්මාන්තයක් බවට පත්ව ඇති බවටත් චෝදනා නැගෙයි. මේ කතාවේ ඇත්ත නැත්ත සහ වී ගොවිතැනේ නැඟිටීමට බාධා පමුණුවන පසු අස්වනු තාක්ෂණයේ ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය ඒ.එම්.ජේ.බී අධිකාරි මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.



# අස්වැන්න නාස්තිය වැළැක්වීමෙන් ගොවියා ශක්තිමත් කරමු

රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය **ඒ.එම්.ජේ.බී අධිකාරි**

**● ශ්‍රී ලාංකේය ජනතාවගේ ප්‍රධානතම ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි. ඒ වගේම වගා බිම්වලින් වැඩි ප්‍රමාණයක් යොදාගෙන තිබෙන්නේ වී වගාවටයි. වී වගාවෙන් අපි අද ඉන්නේ කොතැන ද?**

පෙරදිග ධාන්‍යාගාරය කියන නාමය ශ්‍රී ලංකාවට ආරෝපණය වුණේ අපේ ඉතිහාසයේ ස්වර්ණමය යුගයක් පැවති ඉතිහාසයට එක්වන කාල පරිච්ඡේදයක. නමුත් මේ හැඳින්වීම අදටත් අපිට නොගැළපෙනවා නොවෙයි.අපි අදත් සහලින් ස්වයංපෝෂිතයි. දේශීය පරිභෝජනය සඳහා අපි දැන් පිටරටින් සහල් ආනයනය කරන්නේ නෑ. අද ඇත්තේ පෙර මෙන් වූ යැපුම් කෘෂි කර්මාන්තයක් නොවෙයි. මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ වූ වාණිජ කෘෂි කර්මාන්තයක්. ඒ හරහා ඇත්තේ බොහෝ යෙදවුම් භාවිතා කර වැඩි වියදමක් දරා කරනු ලබන වගාවන්. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම අඩු වැඩි වශයෙන් වී වගා කරනවා. අපගේ දේශගුණය, වාරි පද්ධතිය, පාංශු වයනය ආදී සියලු සාධක වී ගොවිතැනට සුදුසුයි. මේ නිසා සෑම වසරකම දේශීයව වී මෙට්‍රික් ටොන් මිලියන 4.5ක් පමණ ප්‍රමාණයක් අස්වනු නෙළා ගන්නවා. මේ සියල්ල අපගේ දේශීය පරිභෝජනයට තමයි ගන්නේ. නමුත් අපිට අතීතයේ තිබුණ පෙරදිග ධාන්‍යාගාරය කියන නාමය යළි ලබා ගන්න නම් අපි සහල් අපනයනය ටත් අපි සමත් විය යුතුයි. ඒක අද කරන්න බැරි කමක් නෑ. නමුත් අපි ඒ තැනට ළඟා වෙන්න අසමත් වී තිබීම ගැනයි කතිකාවක් ගොඩනැඟිය යුත්තේ.

**● යල මහ දෙකන්නයම වී වගා කරන අපි ඇතැම් කාලවල වාර්තාගත අස්වැන්නක් ගත්තත් සහල් මිල ඉහළ යාම , සහල් හිඟය වැනි ප්‍රශ්නවලට මුහුණ දෙනවා.?**

මේ සඳහා එක් හේතුවක් නෙමෙයි. හේතු ගණනාවක් තිබෙනවා. නමුත් ඉන් තවමත් අවධානයට ලක් නොවුණු කාරණයක් මෙහිදි මතු කරන්න කැමැතියි. ඒ තමයි නෙළාගත්ත අස්වැන්න අපි නිසි ලෙස මතුවට ආරක්ෂා කර ගන්නවා ද යන්න. මේ සා විශාල වූ අස්වනු ප්‍රමාණයක් අපි නෙළාගත්තත් මේ සියල්ල අප පරිභෝජනයට ගන්නවා ද නැත්තම් නෙළාගන්නා අස්වැන්නෙන් කොටසක් අප විසි කරනවා නම් මේ කාරණය තමයි පසු අස්වනු හානිය ලෙස හඳුන්වන්නේ.

ගොවිබිමෙන් ගෙට ගත් අස්වැන්න පැරැණි ගොවියා ගබඩා කළේ අටුවක. අද අටුවක් දැක ගැනීමත් දුර්ලභයි.

**● මේ ගොවි සංස්කෘතිය බිඳ වැටීම පසු අස්වනු හානියේ ආරම්භය කියන එක ද ඔබ කියන්නේ?**

ඇත්තෙන්ම ඔව්. අපේ පැරැණි ගොවියා රට සහලින් ස්වයංපෝෂිත කරන ගමන ඉදිරියට අරගෙන ගියේ ඊටම ආවේණික වූ තාක්ෂණික ශිල්ප ක්‍රමත් සමඟ. වී ගොවියා සතුව වෙනම භාවිතයක් වගේම සංස්කෘතියක් තිබුණා. වෙහෙස මහන්සි වී උපයා ගත් ධන ධාන්‍ය තවත් කන්නයක් එනතුරු ආරක්ෂා කර තැබුයේ අටුවක. පසු අස්වනු තාක්ෂණය ආරම්භ වෙන්නේ ගබඩාකරණයෙන්. මතුවට ගබඩා කර තැබීම කියන ශිල්ප ක්‍රමයෙන් අපි අද ඉන්නේ ඍණාත්මක තැනක.

**● එදා වගේ අද ගොවීන් වී ගබඩා කරන්නේ නෑ. අස්වනු නෙළාගත් විට කුඹුරෙන්ම පටවන්නේ වෙළෙන්දාගේ ලොරියට. මේ සංස්කෘතිය හැදුණේ කොහොමද?**

මේ සඳහා ඇතැම් අය විවිධ තර්ක හේතු මතු කරනවා. වැඩි දෙනෙක් කියන්නේ ණය ටික ගෙවා ගන්න කුඹුරෙන් ම අස්වනු ටික කඬේට දෙන බවයි. නමුත් මේ හුරුව බොහොම වැරැදි තැනකටයි ගොවියා රැගෙන ගොස් තිබෙන්නේ. මෙන්න මේ කියන සරල ක්‍රමයෙන් ණය බර හෝ පවුලේ ආර්ථික බර නිදහස් කර ගැනීමට උත්සාහ දැරීම නිසාම අද වී ගොවියා ආර්ථික වශයෙන් කඩා වැටීමකට ලක්ව තිබෙන බවයි අපි කියන්නේ. ඉන් ගොවියා අපේක්ෂා කරන ලාභයක් ලැබෙන්නේ නෑ. වියදම පමණයි පියවාගන්නේ.

**● ඔබ කොහොමද එහෙම කියන්නේ.?**

අස්වනුත් වැඩි නම් මිලත් හොඳයි නම් වී ගොවිතැනෙන් ගොවියාට ගොඩ එන්න බැරි කමක් නැනේ. නමුත් අස්වනු ටික නෙළා කුඹුරෙන් ගොඩට එන ගොවියාගේ අතේ සතේ නැත්නම් මොකක් හරි වැරැද්දක් සිදු වෙමින් තිබෙනවා. අද මොකක්ද වෙන්නේ? යන්ත්‍ර සූත්‍රවලින් ප්‍රමිතිය සම්පූර්ණ වෙන්න පෙර අස්වනු ටික කපාගන්නවා. තෙත වී ටික අතට ගත්තම වෙළෙන්දා අඩු මිලට ඉල්ලනවා. වැඩි මිලක් එනතුරු ගෙදර තියාගන්න අටුවක්, ගබඩාවක් අද ගොවියා සතුව නෑ. ඒ නිසා වී ටික වෙළෙඳුන්ගේ මල්ලට දාලා හිස් අතින් ගෙදර එනවා. බාල බඩුවට අඩු මිලක් ලැබෙන න්‍යාය අපි කට වචනයට හුරු වුණාට දෛනික ජීවිතයේත් අපි කරන්නේ ඒ ටිකම බව අපි දන්නේ නෑ. අස්වනු ටික නිවෙසට ගෙනැවිත් තෙතමනය හිඳෙන තුරු වියළා මාස දෙක තුනක් ගබඩා කර තබනවා නම් වෙළෙඳපොළේ වී මිල ඉහළ යන විට අස්වැන්න විකුණා වැඩි මිලක් ගන්න පුළුවන්.

නමුත් අද අස්වනු ගබඩා කිරීමේදී ගොවීන්ට නැති ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙනවා.

ඔව්, එහි ඇත්තක් නැතුවා නෙවෙයි. නමුත් එහෙම වෙන්නේ ගබඩාකරණයේ දුර්වලතා නිසයි.ගබඩාකරණය කියන්නේ තනිකරම තාක්ෂණයක්. ඒක අපේ පැරැණි ගොවීන් හොඳට දන්නවා. ගබඩාකරණය හරියට කළේ නැත්නම් කාලයක් ගත වන විට වී බොල් වෙනවා. වි මලුවල බර අඩු වෙනවා. මීයන් වී කා දමනවා. ගුල්ලන් සහ ඉපියන් බෝ වෙනවා. වී කෙටීමේදී සහල් කැඩී යාම නිසා සහල් අස්වැන්න අඩු වෙනවා. කොටන ලද සහල්වල පණු කැදලි මතු වෙනවා. මේ ආදී සියලු හේතූන් නිසා නෙළාගත් අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක් නොදැනුවත්වම අඩු වෙලා. නැතිනම් හානි වෙලා. මේ පසු අස්වනු හානියයි. එනම් අස්වැන්න නෙළාගත් පසු සිදුවන හානියයි.

**අස්වැන්න නිසි ලෙස ආරක්ෂා කළ යුතුයි.**

**පැරැණි ගොවි ක්‍රම නැවත ගොඩනගමු.**

**● ලංකාවේ පසු අස්වනු හානිය ගණනය කළහොත් කොපමණ ප්‍රමාණයක් ද?**

සෑම වසරකම අප ගන්නා ධාන්‍ය අස්වැන්නෙන් 12-13% ප්‍රමාණයක් පසු අස්වනු හානිය ලෙස විනාශ වෙනවා. වෙනත් ආකාරයකින් කිවහොත් මේ අගය මේ අස්වැන්න නෙළාගත් පසු භාවිතයට නොගෙන විසි කර දමන ප්‍රමාණයයි. මෙම හානිය ප්‍රමාණාත්මකව ගත් කල එය දළ වශයෙන් මෙට්‍රික් ටොන් ලක්ෂ 5-6ක් අතර ප්‍රමාණයක් . මෙම හානිය සියයට 1කින් අඩු කර ගත හැකි නම්, එම ඉතිරියෙන් අමතර සහල් මෙට්‍රික් ටොන් තුන්දහස් පන්සියයක් පමණ ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකියි. මෙම සහල් ඉතිරිය සාමාන්‍ය පවුල් අටදහසක් පමණ ප්‍රමාණයකට වසරක් සඳහා ප්‍රමාණවත් වෙන බවයි ගණනය කර තිබෙන්නේ

**ගබඩා පහසුකම් වැඩි කිරීම කාලෝචිතයි.**

**නිසි කලට අස්වැන්න කැපීම කරමු.**

**● පසු අස්වනු හානිය කියන්නේ රටේ ආර්ථිකය උඩු යටිකුරු කළ හැකි ව්‍යසනයක්. මේ ගැන තවත් මොනවද කියන්න තියෙන්නේ?**

ඉවත දමන විනාශ වන භාවිතයට ගත නොහැකි වී අස්වැන්නට සරිලන ප්‍රමාණයක් අප අමතරව වගා කළ යුතුයි. ඉවත දමන්නට වගා කරනවාට වඩා අවශ්‍ය ප්‍රමාණය වගා කර ලබා ගන්නා අස්වැන්න ආරක්ෂා කර ගැනීම වඩාත් වාසිදායකයි. එවිට වගා ඉඩම් වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා භාවිතා කළ හැකියි. එමෙන්ම භූමිය සැකසීමේ සිට බීජ, පොහොර, කෘමිනාශක, වල් නාශක, කොළ මැඬීමේ යන්ත්‍ර කුලී, ඇසුරුම් ආදී සියලු යෙදවුම් සඳහා යන වියදම් සියල්ල ද ඉතිරි වෙනවා.

**● පසු අස්වනු හානිය වළක්වා ගන්නේ කොහොමද?**

බිම් සකසා, වී වපුරා, කිරිවැදී බණ්ඩි කරල් පැසී රන්වන් ගොයම් නැමී යන තෙක්ම අපි එය රැක බලා ගන්නවා. අස්වනු හානිය ආරම්භ වන්නේ ඉන් පසුවයි. එනම් අස්වනු නෙළීමේ අවස්ථාවේ සිටයි. අස්වනු නෙළිය යුත්තේ වී කරල් පැසුණු අවස්ථාවේදීයි. නමුත් වී කරලේ සියලු වී ඇට එකවර පැසෙන්නේ නෑ. වී වගාව සඳහා අස්වනු නෙළීම සුදුසු වන්නේ කරලින් 80-85% අතර ප්‍රමාණයක් හොඳින් පැසුණු පසුවයි. මෙයට වැඩියෙන් පැසීම වාසිදායක ලෙස සිතුනත් එවිට මුලින් පැසුණු වී ඇට හැලීම සිදු වෙනවා.

නොපැසුණු බීජ බොහෝ ගැටලු ඇති කරනවා. අප බොල් ලෙස හඳුන්වන්නේ මේවා. බොල් වැඩි වීම නිසා සහල් අස්වැන්න අඩු වෙනවා. කළු හෝ දුර්වර්ණ ඇට වැඩි වෙනකවා. කෘමි හානි වැඩියි. ගබඩා කාලය අඩුයි. සැකසීම අපහසුයි. ඒ නිසා නිසි අවස්ථාවේදී අස්වනු නෙළීම ඉතාම වැදගත්.

අස්වනු නෙලාගත් පසු සිදු වන්නේ කොළ මැඬීමයි. එනම් කරලින් ධාන්‍ය ඇට වෙන් කර ගැනීමයි. අද වන විට කොළ මැඬීමේ යන්ත්‍ර භාවිතය ඉතා සුලභයි. සුනාමි යන්ත්‍රය සඳහා කපාගත් ගොයම් කරල් ඇතුල් කිරීමේදී අස්වනු නෙළන අවස්ථාවට වඩා යම් තරමක් වේළී තිබීම ධාන්‍ය ඇට වෙන් කිරීම පහසු කරයි. මේ නිසා ගොයම් නෙළීමෙන් පසුව ඇතැම් විට දිනක් පමණ කුඹුරේම වී කරල් වියළීම සිදු කරනවා. නමුත් මෙහිදී වියළීම නිසා ධාන්‍ය ඇට හැලෙනවා. මෙය අවාසිදායකයි. අස්වැන්න අඩු වෙනවා.

දැන් බහුලව සිදුවන්නේ ගොයම් කැපීම සහ කොළ පෑගීම එකම අවස්ථාවේ සිදු කරන සංයුක්ත කොළ මැඬීමේ යන්ත්‍ර භාවිතයයි. භූතයා ගොයම් කපා ධාන්‍ය ඇට වෙන්කර එකතු කරන කුටීරයකට හෝ මලුවලට පුරවනවා. ක්‍රියාවන් දෙකක් එකම අවස්ථාවේදී සිදු කිරීම, ගොයම් කපා කොළ මැඬ ගැනීමට ගත වන කාලය බොහෝ අඩු වීම, කැපූ ගොයම් වෙනත් ස්ථානවලට රැගෙන යාම අවශ්‍ය නොවීම, කම්කරුවන්ගේ අවශ්‍යතාවය අඩු වීම, වියදම අඩු වීම, පිදුරු ක්‍රමානුකූලව කුඹුර මත ඇතිරෙන සේ යන්ත්‍රයෙන් ඉවතට වැටීම, හානිය අඩු වීම වැනි වාසි මෙහි තිබෙනවා. යාන්ත්‍රීකරණය මෙම සියලු කටයුතු පහසු මෙන්ම කාර්යක්ෂම ද කරනවා. නමුත් හානිය අති විශාලයි.

**● කොහොමද එහෙම වෙන්නේ?**

ඒ කියන්නේ මෙම වෙන් කර ගන්නා ධාන්‍යවල තෙතමන ප්‍රමාණය ගබඩා කිරීමට සුදුසු නෑ. අස්වනු නෙළන අවස්ථාවේ වීවල තෙතමනය 19-23% අතර අගයක් වෙනවා. නමුත් ගබඩා කිරීම සඳහා සුදුසුම තෙතමනය 14%කි. එනම් මෙම වැඩි තෙතමන ප්‍රමාණය හැකි ඉක්මනින් ඉවත් කළ යුතුයි. තෙතමනය වැඩි සෑම අවස්ථාවකදීම ධාන්‍ය ඇටයේ ශ්වසන වේගය වැඩිවෙනවා. අනෙකුත් ජීවී බීජයක සිදුවන පරිවෘත්තීය ක්‍රියා ද සීඝ්‍ර වෙනවා. මේ නිසා පෝෂණ හානියක් මෙන්ම ධාන්‍ය රත්වීම සහ අවපැහැ ගන්නවා. ධාන්‍ය තොගයේ බර අඩු වෙනවා. තෙතමනය වැඩි වන විට දිලීර හානිය මෙන්ම කෘමි සහ අනෙකුත් පළිබෝධ හානිද වැඩියි. මේ සියල්ල පසු අස්වනු හානිය වැඩි කරනවා.

**● නිවැරැදිව ගබඩා කරන්නේ කොහොමද?**

ගබඩා කිරීමේදී වී අසුරණ , ගබඩාව යන ත්‍රිත්වයම මනා පිරිසිදුතාවයෙන් වියළි තත්ත්වයෙන් තිබිය යුතුය. එවිට දිලීර, කෘමි හානි, වෙනත් පළිබෝධ හානි, ධාන්‍ය අවපැහැ ගැන්වීම්, ධාන්‍ය කෙටීමේදී වැඩියෙන් කැඩී යාම ආදී නොවිය යුතු දෑ බොහොමයක් වළක්වා ගත හැකියි. ධාන්‍යවලට අමතරව බොහෝ අනවශ්‍ය ද්‍රව්‍ය මේ සමඟ ගබඩාවී ඇති නම් ඒ මීයන්, කෘමීන් වැනි සතුන් හට ඉතා හිතකර තත්ත්වයක් වන බවත් අමතක නොකළ යුතුයි.

ගබඩාවට මීයන් ඇතුල් වන ස්ථාන වසා දැමිය යුතුයි. සියලු වා කවුලු, ජනේල සහ වහලයේ ඇති සිදුරු දැල්වලින් වසා හොඳින් වියළුණු වී, පිරිසිදු මළුවල දමා බිත්තියෙන් ඈත් කර, පොළවේ නොගෑවෙන ලෙස ලී රාමු මත ගබඩා කිරීම නිවැරැදි ක්‍රමයයි. එවිට කෘමි හානි, දිලීර හානි අවම වෙනවා. ධාන්‍ය අතරට පවනේ වියළා ගත් කොහොඹ කොළ, දෙහි කොල ආදිය මිශ්‍ර කර ගැනීමෙන් කෘමීන් ධාන්‍යවලින් ඈත් කර තැබිය හැකියි. නිරතුරුව ධාන්‍ය තොගය පරීක්ෂා කළ යුතුයි. මේ සියල්ලෙන් ධාන්‍යවල ආහාරයට ගැනීමට ඇති සුරක්ෂිතතාවය තහවුරු වනවා පමණක් නොව පසු අස්වනු හානිය ද ඉතා අවම වෙනවා. ධාන්‍යවල පසු අස්වනු හානියෙන් අඩක්ම සිදු වන්නේ ගබඩාව තුළදී බව වැඩි දෙනෙක් දන්නේ නෑ.

**● ගොවියා අතින් පමණක් නෙමෙයි රජයේ ගබඩාවලත් මිනිස් පරිභෝජනයට නුසුදුසු සහල් තොග පිටින් විනාශ කරන අවස්ථා තිබෙනවා නේද?**

ඔව්.ගොවියා අතින් වුණත් මහා පරිමාණ ගබඩාවක වුණත් සිද්ධ වෙන්නේ එකම ක්‍රියාවලියක්. ගබඩා කිරීම සහ ගබඩා කරන අස්වැන්නේ ප්‍රමිතිය නැත්නම් ඒ අස්වැන්න කාලයක් තබාගන්න බෑ. නමුත් නිවැරැදිව මේ කාර්ය කරනවා නම් වී අවුරුද්දක් පමණ කිසිදු ගැටලුවක් නැතිව සුරක්ෂිතව ගබඩා කර තැබිය හැකියි. මේ නිසා අපි අවධාරණය කරන්නේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන කෘෂිකර්මාන්තය ඉහළ තැනකට ඔසවා තැබීමට නම් අනිවාර්යයෙන්ම පසු අස්වනු තාක්ෂණය නිවැරැදිව භාවිතා කළ යුතුමයි.

අඹන්පොල විශේෂ
**සකුන්තලා ජයසිංහ**



# අලුතින් බිහි වන කොවිඩ් එන්නත් ලෝක ආර්ථිකය

ශ්‍රී ලංකාවේ දැන් මුළු ජන සංඛ්‍යාව එක් කෝටි දාහතර ලක්ෂයකි. ඊයේ (මැයි 5 දා) වන විට ඉන්දියාවේ කොරෝනා ආසාදිතයන්ගේ සංඛ්‍යාව දෙකෝටි තුන් ලක්ෂයක් විය. ශ්‍රී ලංකාවේ මුළු ජන සංඛ්‍යාවට ආසන්න පිරිසක් ඉන්දියාවේ කොරෝනා රෝගීන් බවට පත්ව තිබේ.

ඉන්දියාව කොරෝනා රෝගය සඳහා එන්නත් නිෂ්පාදනය කරන රටකි. ශ්‍රී ලංකාව මුලින් සැලසුම් කර තිබුණේ රටට අවශ්‍ය එන්නත් වලින් වැඩි ප්‍රමාණයක් ඉන්දියාවෙන් මිල දී ගැනීමටය. එන්නත් මිලියන 12ක් මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් මුදල් ද ගෙවා තිබුණි. එහෙත් මුදල් ගෙවා ඇණවුම් කිරීමෙන් ද පසුව එන්නත් නිෂ්පාදනය කරන සේරම් සමාගමට එන්නත් අපනයනය කිරීම නවතා දමන ලෙස ඉන්දීය රජය නියම කළේය. ශ්‍රී ලංකාවට අනපේක්ෂිත ලෙස එන්නත් පිළිබඳ සියලු සැලසුම් වෙනස් කිරීමට සිදු විය.

ඉන්දියාව විසින් එන්නත් දෙකක් නිෂ්පාදනය කරනු ලබයි. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් නිෂ්පාදනය කරන ලද ඇස්ට්‍රා සෙනිකා එන්නත ඉන්දියාවේදී සේරම් සමාගම විසින් කොවිෂීල්ඩ් නමින් නිපදවනු ලබයි. ඉන්දියාවේ තවත් සමාගමක් වන භාරත් බයෝටෙක් සමාගම විසින් ඉන්දියාවේම නිෂ්පාදනයක් වන කොවැක්සීන් නමැති එන්නත නිපදවනු ලබයි. සේරම් සමාගම මසකට එන්නත් මිලියන 100ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වූ අතර, බයෝටෙක් සමාගම ද එන්නත් මිලියන 700ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තුව විය.

ඉන්දියාව කොවිඩ් එන්නත් නිෂ්පාදනය කරන රටක් වුව ද ඒවා මහජනතාවට අලෙවි කිරීම සඳහා එම සමාගම්වලට අවසර දී ඇත. කෙසේ වුව ද ඉන්දියාවේ ප්‍රාන්ත රාජ්‍යයන් විසින් එන්නත් මිල දී ගෙන එම ප්‍රදේශවල ජනතාවට විදීමට කටයුතු සලසා ඇති බැවින් සාමාන්‍ය මහජනතාවට එන්නත විද ගැනීම සඳහා මුදල් ගෙවීමට සිදු නොවේ. එසේ වුවත් මෙම එන්නත විදීම සඳහා පෞද්ගලික අංශයේ රෝහල්වලට ද අවසර ලබාදුන් අතර, පුද්ගලික අංශයේ රෝහල් විසින් මුදල් අයකර එන්නත විදිනු ලබයි. ඉන්දීය පුවත්පත් ප්‍රකාශ කරන ආකාරයට මුදල් ගෙවීමට නොහැකි විශාල පිරිසක් නොමිලේ එන්නත් ලබා ගැනීම සඳහා රජය විසින් පවත්වාගෙන මධ්‍යස්ථානවලට පෝලිම්වල පසුවේ. රජය විසින් විවෘත කර ඇති මධ්‍යස්ථානවල සමාන මධ්‍යස්ථාන ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ ආයතන විසින් මුදල් අය කර විදීම සඳහා ද විවෘත කර තිබේ.

සේරම් ආයතනය එක් එන්නත් මාත්‍රාවක් රජයට ඉන්දියානු රුපියල් 400කට ද රෝහල්වලට ඉන්දියානු රුපියල් 600කට ද අලෙවි කරනු ලබයි. සේරම් ආයතනය එම මිලට එන්නත් අලවි කිරීම මගින් තමන්ගේ පිරිවැය පියවා ගැනීමටත් ලාභයක් ලබා ගැනීමටත් හැකි බව ප්‍රකාශ කර ඇත.

කොවිඩ් ව්‍යාප්තිය වේගවත් වූ 2020 වසරේ මුලදී එන්නතක් නිපදවීමට හැකි කාලය පිළිබඳ අදහසක්වත් තිබුණේ නැත. එන්නතක් කවදා හෝ නිපදවන තුරු කොවිඩ් පැතිරීම මැඩපැවැත්වීමට නොහැකි බව බොහෝදෙනෙකුගේ මතය විය. එහෙත් මේ වන විට ලොව රටවල් කිහිපයක් විසින්ම එන්නත් නිපදවා ඇත. ඉතා කෙටි කලක් තුළදී මුළු ලෝකය විසින්ම ඉල්ලා සිටිනු ලබන එන්නතක් සැපයීම සඳහා නිෂ්පාදන ආයතන කිහිපයක් ඉදිරිපත්ව සිටියි. ලොව නවතම නිෂ්පාදන සහ සැපයුම් අංශය බවට එය පත්ව ඇති අතර, නිෂ්පාදනයට එළඹ ඇති බොහෝ ආයතන ඒවායින් තම ලාභ ප්‍රමාණය ඉහළ නංවා ගැනීමට බලාපොරොත්තු වේ.

කොවිඩ්වලින් ලාභ ලැබීමට ශ්‍රී ලංකාවේ සමාගම්වලට ද ඉඩ ලැබී ඇත. අත්වැසුම්, සනීපාරක්ෂක ඇඳුම් සහ ආවරණ, මුඛ ආවරණ ආදිය නිෂ්පාදනය කර අපනයනය කරන සමාගම් රැසක් ශ්‍රී ලංකාවේ ඇත. ඒ අයුරින්ම ලෝකය තුළ ද දැන් කෝවිඩ් එන්නත් ආර්ථිකයක් ගොඩනැඟී ඇති අතර, ලොව ප්‍රධාන පෙළේ ඖෂධ නිෂ්පාදන සමාගම්වලට විශාල ලාභයක් අත්කර ගැනීමට ද අවස්ථාව සැලසී තිබේ.

ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත්පත ප්‍රකාශ කරන ආකාරයට එන්නත් අලෙවිය මඟින් ඉන්දියාවේ සේරම් ආයතනයට අති විශාල ලාභයක් හිමිකර ගැනීමට හැකි වී තිබේ. ඇමරිකාවේ පයිසර් එන්නත නිපදවන පයිසර් සහ බයෝටෙක් නැමැති සමාගම් දෙකට 2021 වසරේ දී ඩොලර් මිලියන 7000 බැගින් ඩොලර් මිලියන 14000ක ලාභයක් ලැබෙන බව සී.එන්.එන් ආයතනය ප්‍රකාශ කරයි. මොඩර්නා සමාගම කොවිඩ් එන්නත් නිෂ්පාදනය කරන තවත් සමාගමකි. 2019 දී එම සමාගම ඖෂධ අලවියෙන් ලැබූ ආදායම ඩොලර් මිලියන 60ක් පමණක් විය.එහෙත් 2021 වසරේදී කොවිඩ් එන්නත් අලෙවිය හේතුවෙන් එහි ආදායම ඩොලර් මිලියන 16,000ක් දක්වා වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ජොන්සන් සහ ජොන්සන් සමාගම කෝවිඩ් එන්නත් නිෂ්පාදනය කරන තවත් සමාගමකි. එහෙත් එම සමාගම ප්‍රකාශ කරන්නේ කෝවිඩ් එන්නත ලාභ ලැබීමේ පරමාර්ථයෙන් නිෂ්පාදනය නොකරන බවයි. ඇස්ට්‍රා සෙනිකා සමාගම ද ප්‍රකාශ කළේ තමන් එන්නත් නිෂ්පාදනය තුළින් ලාභයක් ලැබීමට බලාපොරොත්තු නොවන බවයි. එසේ වුව ද මෑතකදී ප්‍රකාශ කළේ එකී නිෂ්පාදනය තුළින් තමන් පාඩු ලබන තත්ත්වයටකට පත්ව ඇති බවත් එම ප්‍රතිපත්තිය පිළිබඳ යළි සලකා බැලීමට සිදුව ඇති බවත්ය.

රුසියාව සහ චීනය එන්නත් නිෂ්පාදනයේ දැවැන්තයන් බවට පත්ව ඇත. රුසියාවේ ස්පුට්නික් සහ චීනයේ සිනොවැක්ස් එන්නත ද රටවල් විශාල ප්‍රමාණයක් විසින් දැනටමත් භාවිත කරන අතර, ඉදිරියේ දී මිල දී ගැනීම සඳහා විශාල ලෙස ඇණවුම් කර තිබේ. එන්නත නිෂ්පාදනය කිරීම තුළින් ගොඩනැඟී ඇති ආර්ථිකයකට අමතරව ඒ හා සම්බන්ධ සැපයුම් ආශ්‍රයෙන් ද තවත් ආර්ථිකයක් ගොඩ නැඟී තිබේ. එම එන්නත් නිපදවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වැඩි වශයෙන් ම මිල දී ගනු ලබන්නේ ඇමරිකා එක්සත් ජනපදයෙන් සහ යුරෝපා රටවලිනි. ඒ වෙනුවෙන් ද අති විශාල මුදල් ප්‍රමාණයක් නිෂ්පාදකයන් විසින් වැය කරනු ලබයි. එන්නත් සඳහා අමුද්‍රව්‍ය සැපයීම මඟින් ද සමාගම් රැසක් අති විශාල ලාභයක් අත්කර ගනිමින් සිටියි.

කොවිඩ් හමුවේ ලොව සියලුම රටවල් මෙම සියවසේ දරුණුම ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නේය. එම රටවලට එම ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා තවත් විශාල කාලයක් ගතවනු ඇත. ඒ අතර, ම කෝවිඩ් ව්‍යසනය වෙනුවෙන් සෞඛ්‍යය පහසුකම් සැපයීම සඳහා ද එන්නත් මිල දී ගැනීම සඳහා ද පීඩාවට පත් පිරිස්වලට සහන සැලසීම සඳහා ද විශාල මුදලක් වැය කිරීමට සිදුව තිබේ.

ලොව සියලුදෙනාටම එන්නත් ලබාදීමෙන් පසු කොවිඩ් වසංගතය ලොවින් තුරන් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. එසේ වුව ද දැන් ප්‍රකාශ වන්නේ එය එසේ නොවන බවයි. රෝගයේ නව ප්‍රභේදයන් ඇති වීම වැනි හේතූන් නිසා එය සම්පූර්ණයෙන්ම නිම වීමට තවත් කාලයක් ගත වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම තත්ත්වය තුළ නව තත්ත්වයන්ට අනුකූලව මහජනතාවගේ ප්‍රතිශක්තිකරණය ඉහළ නැංවීම සඳහා වැඩි දියුණු කරන ලද එන්නත් නිෂ්පාදනය කිරීමට සිදු වන බවටත් අනාවැකි පළ වී ඇත.

කෝවිඩ් ව්‍යසනයෙන් දැනටමත් සංවර්ධනය වෙමින් පවත්නා රටවලට බරපතළ ආර්ථික තර්ජනයක් එල්ල වී තිබේ.එය තවත් දිගු කලක් ඇදීයාමේ ප්‍රතිඵලය වන්නේ සංවර්ධන වෙමින් පවත්නා රටවලින් සංවර්ධනය වූ රටවලට ධනය ගලා යාමේ තවත් මාර්ගයක් වර්ධනය වීමය.

ඉන්දියාවේ සේරම් සමාගම මුලින් ප්‍රකාශ කළ ආකාරයට නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් දැන් ඇතිව තිබේ. එහි නිෂ්පාදන ප්‍රමාණය පහළ වැටී ඇත. ඇස්ට්‍රා සෙනිකා සමාගමට යුරෝපා රටවලට පොරොන්දු වූ පරිදි එන්නත් සැපයීමට නොහැකි වීම නිසා එයට විරුද්ධව නඩු පැවරීමට යුරෝපා සංගමය කටයුතු කරමින් සිටී. සමහර රටවලට මේ වනතුරු එකඳු එන්නත් මාත්‍රාවක් හෝ ලැබී නැති බව වාර්තා වේ. ලෝක සෞඛ්‍ය සංවිධානය දිළිඳු රටවලට ද එන්නත් ලබාදීම සඳහා විශාල උත්සාහයක් දරමින් සිටිය ද තවමත් සාර්ථකත්වයක් ලබාගෙන නැත. එවැනි තත්ත්වයක් පැවැතිය ද ලොව නවතම ආර්ථික අංශය වන කොවිඩ් එන්නත් ආර්ථිකය ඉතා සීඝ්‍රයෙන් දියුණු වන ඉතා ලාභදායී ව්‍යවසායක් බවට වර්ධනය වෙමින් පවතී.



මහාචාර්ය
**සුනන්ද මද්දුමබණ්ඩාර**



# රට නොවසා මාස දෙකක් තුළ ව්‍යාප්තිය පාලනය කළ හැකියි

## සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

**ශිරාන් රණසිංහ**

රට සම්පූර්ණයෙන්ම ලොක්ඩවුන් නොකර මාසයක් දෙකක් තුළ කොරෝනා ව්‍යාප්තිය සම්පූර්ණයෙන්ම පාලනය කළ හැකි බව සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර මහතා 'දිනමිණ' ට පැවසීය.

රට සම්පූර්ණයෙන්ම වසා දමා රටකට කටයුතු කළ නොහැකි බවත් රට වසා දැමූ පලියට කොරෝනා වයිරසය රටින් තුරන් කර දැමිය නොහැකි බවත් ඒ මහතා කීය.

'කොවිඩ් සමග ජීවත්වීම යන සංකල්පය පසෙකට විසි කර දමා කොවිඩ් තුරන් කරමු' යන තේමාවෙන් සියලු දෙනා අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ අකුරටම පිළිපැදීම මඟින් මෙය කළ හැකි බවද ඒ මහතා පැවසීය. එහිදී කොරෝනා වයිරසය පැතිර යෑමට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග සියල්ල එකවර ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බවද ඒ මහතා කීය. චීනය, තායිලන්තය, කාම්බෝජය, වියට්නාමය ආදිය රටවල් මේ වයිරසය පාලනය කරමින් ඒ ඒ බැව් ලෝකයටම තහවුරු කර ඇතැයි ද ඒ මහතා පෙන්වා දුන්නේය.

මාර්තු මාසය දක්වා ශ්‍රී ලංකාව ඉතා අපූරුවට කොරෝනා වයිරසය පාලනය කරමින් මධ්‍යස්ථ තැනක සිටි බවද ඒ මහතා සිහි කළේය.

නමුත් මාර්තු මාසයේ සිට වයිරසය පාලනය කිරීම අතහැර දැමීමත් පොදු මහජනතාව වයිරස බිය තඹ දොයිතුවකට මායිම් නොකරමින් කටයුතු කිරීම නිසා අපේ රට අමෙරිකාව, බ්‍රසීලය, ඉන්දියාව වැනි රටවල් මුහුණ දී තිබෙන ඛේදනීය තැනකට තල්ලු වී යමින් තිබෙන බවද ඒ මහතා කීය.

ඒ අනුව නිසි සැලැස්මකට යටත්ව උපාය මාර්ගික ක්‍රම හරහා රට නොවසා වයිරසය පැතිර යෑම පාලනය කළ යුතු බවද ඒ මහතා පැවසීය. ඒ සඳහා අප රට සතුව මානව හා භෞතික සම්පත් ඕනෑ තරම් ඇතැයි ද ඒ මහතා කීය.

මේ කටයුත්ත සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නායකත්වය ගෙන උපාය මාර්ගික සැලැස්මක් යටතේ සියලු ක්‍රමවේද එකට ක්‍රියාත්මක කරමින් කොරෝනා වයිරසය තුරන් කරන ජාතික සංග්‍රාමයක් ක්‍රියාත්මක කළ යුතු බවද වෛද්‍ය ජයන්ත බණ්ඩාර මහතා අවධාරණය කර සිටියේය.

# හොර පාරෙන් ගෙනා ලක්ෂ 20ක දුම්වැටි අත්අඩංගුවට



සුරාබදු දෙපාර්තමේන්තුවේ ජාඇළ සුරාබදු ස්ථානයේ නිලධාරීහු පසුගියදා කැලණිය ප්‍රදේශයේ කළ වැටලීමකින් බදු නොගෙවූ සිගරට් 30,040ක තොගයක් සමග සැකකරුවන් සිව් දෙනකු අත්අඩංගුවට ගැනීමට සමත් වූහ.

මේ වැටලීමේදී බදු නොගෙවූ සිගරට් තොගයේ වටිනාකම ලක්ෂ 20කට අධික බව සුරාබදු නිලධාරීහු පවසති. අත්අඩංගුවට ගත් සැකකරුවන් කැලණිය, වත්තල හා ජාඇළ ප්‍රදේශවල පදිංචි අවුරුදු 22, 30, 42, 50, යන වයස්වල පසුවන්නන්ය.

විදෙස් රටක නිෂ්පාදිත මේ මුද්‍රා නොකැඩූ බදු නොගෙවූ සිගරට් තොගය 50 හා 100 කාටුන් වශයෙන් තිබූ අතර, මේ පිළිබඳ වැඩි දුර පරීක්ෂණ ජාඇළ සුරාබදු ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන සුරාබදු පරීක්ෂක වජිර විජේසිංහ මහතා විසින් කරනු ලබයි.

බස්නාහිර පළාත් (III) සහකාර සුරාබදු කොමසාරිස් උපල් කුමාර මහතාගේ උපදෙස් මත ජාඇළ වැඩ බලන සුරාබදු අධිකාරි ඉන්ද්‍රනාත් මහතාගේ අධීක්ෂණය යටතේ ජාඇළ සුරාබදු ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන සුරාබදු පරීක්ෂක වජිර විජේසිංහ මහතාගේ මෙහෙයවීමෙන් සුරාබදු පරීක්ෂක කැකුලන්දර, සුරාබදු සැරයන් 938 ශ්‍රියන්ත හේරත්, සුරාබදු නියාමකවරුන් වන 1062 බුද්ධික, 1122 ධනුක, 1206 සමීර හා සුරාබදු රියැදුරු රවීන්ද්‍ර යන නිලධාරීහු මේ වැටලීමට එක් වූහ.

# තවත් වසම් 12ක් හුදෙකලා කරයි

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

දිස්ත්‍රික්ක 4ක ග්‍රාම නිලධාරි වසම් 12ක් ඊයේ (5) සිට හුදෙකලා කරන බව කොවිඩ් 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානි යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා දිනමිණට පැවසීය. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ පමුනුව ග්‍රාම නිලධාරි වසම, හොන්නන්තර ග්‍රාම නිලධාරි වසම, දැල්තර ග්‍රාම නිලධාරි වසම හුදෙකලා කෙරේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ කුට්ටිවිල ග්‍රාම නිලධාරි වසමද හුදෙකලා කර ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලේගම ග්‍රාම නිලධාරි වසම, උඩගම ග්‍රාම නිලධාරි වසම, නව නගරය ග්‍රාම නිලධාරි වසම, වලල්ගොඩ ග්‍රාම නිලධාරි වසම, සුදුගල ග්‍රාම නිලධාරි වසම, පනාමුර ග්‍රාම නිලධාරි වසම, රත්ගම ග්‍රාම නිලධාරි වසම හුදෙකලා කර ඇත. වව්නියාව දිස්ත්‍රික්කයේ කුරුක්කල්පුතුකුලම් ග්‍රාම නිලධාරි වසම හුදෙකලා කර තිබේ. කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් මේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 12 නැවත දැනුම් දෙන තුරු හුදෙකලා කර ඇත.

# කොළඹ ගුවන් පාලම්වල ඉදි කිරීම් අවුරුද්දක් ඇතුළත නිම කරන්න

## ප්‍රවාහන ඇමැතිගෙන් උපදෙස්

**ක්‍රිසන්ති විතාරණ**

කොළඹ නගරය ආශ්‍රිතව පවතින දැඩි රථ වාහන තදබදයට පිළියමක් ලෙස ඉදි කරන ගුවන් පාලම් මාස 12ක් ඇතුළත නිම කරන ලෙස ගුවන් පාලම් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අවස්ථාවේදී මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා කොන්ත්‍රාත් සමාගම්වලට උපදෙස් දුන්නේය.

කොළඹ හා ඒ ආශ්‍රිත නගරවලත් දිවයිනේ අනෙකුත් ප්‍රධාන නගරවලත් පවතින අධික රථ වාහන තදබදය ඉවත් කිරීම සඳහා මෙවර අයවැයෙන් විශේෂ අවධානය යොමු කරන ලද අතර, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි කොළඹ නගරය ආශ්‍රිතව පවතින දැඩි වාහන තදබදයට පිළියමක් ලෙස වාහන තදබදය අධික ලෙස පවතින හඳුනා ගත් ප්‍රදේශවල දේශීය අරමුදල් යටතේ ගුවන් පාලම් ඉදි කිරීමට මහා මාර්ග අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය මේ වන විට සැලසුම් සකස් කොට ඇත.

ඒ අනුව කොම්පඤ්ඤවීදිය දුම්රිය මාර්ගය හරහා විනිසුරු අක්බාර් මාවතේ ගුවන් පාලමක් ද, උත්තරානන්ද මාවතේ ගුවන් පාලමක් ද, එම ගුවන් පාලම් දෙක සම්බන්ධ කිරීම සඳහා තවත් ගුවන් පාලමක් ද ඉදි කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. එමෙන්ම බේරේ වැව සහ කොම්පඤ්ඤවීදිය හරහා බාලදක්ෂ මාවත සහ චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත සම්බන්ධ කරමින් ගුවන් පාලමක් ද ඉදි කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත.

විනිසුරු අක්බාර් මාවතේ ඉදි කරන ගුවන් පාලම දිගින් මීටර 207ක් සහ පළලින් මීටර 8.4කින් යුක්තය. උත්තරානන්ද මාවතේ ඉදි කරන ගුවන් පාලම දිගින් මීටර 396කි. එහි පළල මීටර 10.4කි. මේ ගුවන් පාලම් දෙක එකිනෙක සම්බන්ධ කිරීම සඳහා ඉදි කරන ගුවන් පාලමේ දිග මීටර 310කි. එහි පළල මීටර 6.9කි. මේ සඳහා රුපියල් මිලියන 5,270ක් වැය වේ. මාස 12ක කාලයක් ඇතුළත මේ ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතය.

බේරේ වැව සහ කොම්පඤ්ඤවීදිය හරහා බාලදක්ෂ මාවත සහ චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත සම්බන්ධ කරමින් ඉදි කරන ගුවන් පාලම මාස 12ක කාලයක් ඇතුළත රුපියල් මිලියන 2,730ක වියදමින් දිගින් මීටර 360ක් සහ පළල මීටර් 11කින් යුක්තව ඉදි කෙරේ.

විෂය භාර ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ උපදෙස් පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති චමින්ද අතලුවගේ මහතා විසින් මේ ගුවන් පාලම් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලැබීය.

# එකම පවුලේ තිදෙනෙක් කොරෝනාවට බිලි වෙති

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

කොරෝනා වයිරසය ආසාදනයවී අයි.ඩී.එච්. රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි මාලඹේ ගෝනවත්ත ප්‍රදේශයේ එකම නිවෙසක පදිංචිව සිටි අඹු සැමි යුවළක් ඇතුළු තිදෙනකු පෙරේදා (4) මියගොස් තිබේ. මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 86 ,94 අඹුසැමි යුවළ සහ වයස අවුරුදු 82ක කාන්තාවක්ය.

මියගිය පිරිමි පුද්ගලයා කඩුවෙල හිටපු නාගරික මන්ත්‍රීවරයකු වන අතර, ඔහුගේ බිරිය විශ්‍රාමික ගුරුවරියකි. අනෙක් කාන්තාව ඔවුන්ගේ ඥාතිවරියකි. මියගිය යුවළගේ පුත්‍රයා සහ ඔහුගේ බිරියද මේ වන විට කොරෝනා වයිරසය ආසාදනයවී අයි. ඩී. එච්. රෝහලේ ප්‍රතිකාර ලබන අතර, ඥාති කාන්තාවගේ දියණියටද මේ වන විට කොරෝනා වයිරසය ආසාදනය වී ඇත.

# බදියුදීන් පාර්ලිමේන්තු කැඳවීමට නීති ගැටලුවක් නෑ

## නීතිපති

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා පාර්ලිමේන්තු සැසියට ඉදිරිපත් කිරීමට නීතිමය ගැටලුවක් නැතැයි නීතිපති රහස් පොලිසියට දැනුම් දී ඇත.

රහස් පොලිස් අධ්‍යක්ෂවරයා නීතිපතිගෙන් කළ විමසීමකට අනුව නීතිපතිවරයා මේ බව දැනුම් දුන් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිණී රජයේ අධිනීතිඥ ඉෂාරා ජයරත්න මෙණෙවිය 'දිනමිණ' ට ඊයේ (05) පැවසුවාය.

පාස්කු ප්‍රහාරයට අදාළව කළ විමර්ශනවලදී හෙළි වූ කරුණු පදනම් කර ගනිමින් සිද්ධියෙන් වසර දෙකකට පසු රහස් පොලිස් නිලධාරීන් විසින් රිෂාඩ් බදියුදීන් මහතා මෙන්ම ඔහුගේ සහෝදරයා අත්අඩංගුවට ගනු ලැබිණි.

ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව හෙළි වූ තොරතුරු මත ආරක්ෂක ලේකම්ගෙන් ගත් රැඳවා තැබීමේ නියෝග යටතේ බදියුදීන් සහ ඔහුගේ සහෝදරයා මාස තුනකට රහස් පොලිසියේ රැඳවා ගෙන ප්‍රශ්න කිරීම් කරනු ලබයි.

# මැතිවරණ ප්‍රතිසංස්කරණ විශේෂ කාරක සභා සභාපති දිනේෂ්

**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සභාපතිවරයා ලෙස දිනේෂ් ගුණවර්ධන මහතා පත් කළ බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඊයේ (5) පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය.

එම පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සෙසු සාමාජිකයන්ගේ නාම ලේඛනයද කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය.

එම විශේෂ කාරක සභාවේ සෙසු සාමාජිකයන් ලෙස ඇමැතිවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, (මහාචාර්ය) ජී. එල්. පීරිස්, පවිත්‍රා වන්නිආරච්චි, ඩග්ලස් දේවානන්දා, විමල් වීරවංශ, එම්. යූ. එම්. අලි සබ්රි, රාජ්‍ය ඇමැති ජීවන් තොන්ඩමන්, පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක, කබීර් හෂීම්, ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර, මනෝ ගනේෂන්, එම්. ඒ. සුමන්තිරන්, මධුර විතානගේ සහ සාගර කාරියවසම් යන මහත්ම මහත්මීහු පත් කර ඇත.

# බදියුදීන් පාර්ලිමේන්තු කැඳවා අයිතිය රකින්න

## විපක්ෂ නායක

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන ප්‍රශ්න කරන පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා පාර්ලිමේන්තුවට කැඳවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිය ආරක්ෂා කළ යුතු බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (5) ප්‍රකාශ කළේය.

රිෂාඩ් බදියුදීන් මහතා පාර්ලිමේන්තුවට කැඳවීම සඳහා පාර්ලිමේන්තු කටයුතු කාරක සභාවේදී කථානායකවරයාද එකඟ වූ බවත් ඒ මොහොතේදී ජාතික ආරක්ෂාව යන කරුණ සම්බන්ධයෙන් ආණ්ඩු පාර්ශ්වයේ කිසිවකු මතු නොකළ බවත් විපක්ෂ නායකවරයා සඳහන් කළේය.

එබැවින් රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට කැඳවීම සම්බන්ධයෙන් කථානායකවරයාගේ මතය පැහැදිලි කරන ලෙස තමන් ඉල්ලා සිටින බවද විපක්ෂ නායකවරයා සඳහන් කළේය.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස'මහතා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා පාර්ලිමේන්තුවට කැඳවීමට පියවර නොගන්නේ මන්දැයි විමසීමක් කරමිනි.

# රිෂාඩ් පාර්ලිමේන්තු කැඳවන්න එපා - මහජන ආරක්ෂක ඇමැති

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් නියෝග මත සිටින හෙයින් එම පරීක්ෂණ අවසන් වන තෙක් මැතිසබයට නොකැඳවන්නැයි මහජන ආරක්ෂක ඇමැති විශ්‍රාමික රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මහතා කථානායකවරයාගෙන් පාර්ලිමේන්තුවේදී ඊයේ (5) ඉල්ලීමක් කළේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් නියෝග මත සිටින කිසිදු මන්ත්‍රීවරයකු අදාළ විමර්ශන අවසන් වන තෙක් පාර්ලිමේන්තුවට කැඳවීම නොකළ යුතු බවද ඇමැතිවරයා පැවසීය.

ඇමැති සරත් වීරසේකර මහතා මේ බව සඳහන් කළේ රැඳවුම් නියෝග යටතේ සිටින රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා මැතිසබයට කැඳවන්නැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඉල්ලීමක් කළ අවස්ථාවේදීය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන ප්‍රශ්න කරන ඇතැම් කරුණු ජාතික ආරක්ෂාවටද අදාළ වන බැවින් එවැනි කරුණු හෙළිදරව් වුවහොත් ගැටලු නිර්මාණය විය හැකි බවද ඇමැතිවරයා සඳහන් කළේය. එබැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන ප්‍රශ්න කරන කිසිදු මන්ත්‍රීවරයකු විමර්ශන අවසන් වනතෙක් සභාවට කැඳවීම නොකළ යුතු බවද ඇමැතිවරයා වැඩි දුරටත් පැවසීය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ ඇමැති සරත් වීරසේකර මහතා මෙසේද පැවසීය.

## 01 වැනි පිටුවෙන්...

### බැඳුම්කර නඩුව ...

මේ නඩුව චම්පා ජානකී රාජරත්න, දමිත් තොටවත්ත සහ නාමල් බලල්ලේ යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල ඉදිරියේ විභාග කෙරේ.

මේ නඩුවේ විත්තිකරුවන් ලෙස හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයකු වන පත්තිනිගේ සමරසිරි, පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම, එම සමාගමේ හිමිකරුවන් වන ජෙෆ්රි ඇලෝසියස් සහ අර්ජුන් ඇලෝසියස්, එම සමාගමේ ප්‍රධාන විධායක කසුන් පලිසේන සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ මිත්‍ර ගුණවර්ධන, රන්ජන් හුළුගල්ල, මුතුරාජා සුරේන්ද්‍රන් සහ අජහාන් ගාර්දිය පුංචිහේවා යන අය නම් කර ඇත. 2015 වසරේ පෙබරවාරි මස 27 වැනිදා කළ බැඳුම්කර වෙන්දේසියට අදාළව රුපියල් මිලියන 688කට ආසන්න භාණ්ඩාගාර බැඳුම්කර වංක සාවද්‍ය පරිහරණය කිරීමත්, පොදු දේපළ පනතේ 5 (1) වගන්තිය යටතේ වරදක් කළේ යැයි චෝදනා කරමින් නීතිපතිවරයා විසින් විත්තිකරුවන්ට එරෙහිව මේ නඩුව ගොනු කර තිබේ. පවතින කොවිඩ් වයිරස් ව්‍යාප්තිය හේතුවෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛය ප්‍රකාරව මේ නඩුව ජූනි මස 7 වැනිදා දක්වා කල් තැබීමට විනිසුරු මඬුල්ල නියම කළ බව එම අධිකරණයේ ලේඛකාධිකාරි විසින් නිකුත් කර ඇති නිවේදනයේ සඳහන් වේ.

### උ/පෙළ ප්‍රතිඵල ...

ඒ පිළිබඳ අපේක්ෂකයන් දැනුවත් කිරීම ඉදිරියේදී ජාතික පුවත්පත්වල පළ කරන බවද සනත් පූජිත මහතා පැවසීය.

ප්‍රතිඵල සම්බන්ධයෙන් කිසියම් විමසීමක් කිරීමට අවශ්‍ය නම් 1911 ක්ෂණික ඇමතුම් අංකය ඔස්සේ හෝ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාවේ 011 2784208, 011 3784537, 011 3188350 හෝ 011 3140314 යන දුරකතන අංක ඔස්සේ ගත හැකි බවද විභාග දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

### ජනපති මැතිසබයට ...

පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසලදී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා සහ රාජ්‍ය ඇමැතිවරුන් වන කනක හේරත් මහතා සහ ඩී. වී. චානක මහතා ඇතුළු මැති ඇමැතිවරුන් විසින් ජනාධිපතිවරයාව ගෞරවයෙන් පිළිගැනීම සිදු විය.

ඉන් පසු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා සහ මැති ඇමැතිවරුන් පෙරටු කර ගෙන පාර්ලිමේන්තුවේ සභා ගර්භය වෙත පිවිසි ජනාධිපතිවරයා අගමැති මහින්ද රාජපක්ෂ මහතා, සභා නායක ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා සහ ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා සමග සභා ගර්භයෙහි අසුන් ගත්තේය.

ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවෙහි අසුන් ගන්නා අවස්ථාවේදී පාර්ලිමේන්තුව අමතමින් සිටියේ වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාය. සභා ගර්භයෙන් පිටව යෑමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සිය කාර්යාලය වෙත ගිය ජනාධිපතිවරයා එහි මද වේලාවක් රැඳී සිටියේය.

පසුගිය අප්‍රේල් 8 වැනිදා ද ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පැමිණි අතර, එහිදී ඔහු ආරක්ෂක ඇමැතිවරයා ලෙස ප්‍රථමවරට ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සභාපතිත්වය ඉසිලුවේය.

ඊට පෙර අවස්ථාවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගිය පෙබරවාරි 11 වැනිදා ද පාර්ලිමේන්තුවට පැමිණි අතර, එදිනද ඔහු සභා ගර්භයට පිවිස පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි විය.

### රුධිර සංචිත ...

අධ්‍යක්ෂවරයා පැවසුවේ දිනකට සාමාන්‍ය තත්ත්වය යටතේ රුධිර ඒකක 1,200ක් පමණ අවශ්‍ය වන බවය.

එමෙන්ම අවම වශයෙන් දිනකට රුධිර ඒකක 800ක ප්‍රමාණයක් වත් ලැබිය යුතු බවත් සම්පූර්ණයෙන්ම සංචරණ සීමා දැමුවහොත් එම ප්‍රමාණය නොලැබීමට ඉඩ ඇති බව ඒ මහතා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

එහෙයින් හැකි සෑම පුද්ගලයකුම කොළඹ නාරාහේන්පිට ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයට හෝ ප්‍රාදේශීය මට්ටමෙන් ඇති රුධිර පරිත්‍යාග මධ්‍යස්ථානයකට පැමිණ රුධිරය දෙන ලෙසට වෛද්‍යවරයා ඉල්ලීමක් කළේය.

එමෙන්ම ක්ෂණික ඇමතුම් මගින් ඒ සඳහා වෙලාවක් වෙන් කර ගන්නා ලෙසත් වෛද්‍යවරයා වැඩි දුරටත් ඉල්ලීය.

### ආසාදිතයන් වැඩි වුණොත් ...

එසේම සෞඛ්‍ය බලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, පොලිස් නිලධාරීන් ඇතුළු ආරක්ෂක අංශ සාමාජිකයන්, ග්‍රාම නිලධාරීන් ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක පුද්ගලයන් කොරෝනා වැළඳීම නිසා ජනතාවට සේවා සැපයීමේ ගැටලු මතුව ඇත.

මහජනතාව වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් ඉදිරියේදී රටේ සෞඛ්‍ය පාලනය සෞඛ්‍ය අංශ වෙතින් ගිලිහී යෑමේ තත්ත්වයක් උද්ගත වී ඇති බව ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා පවසයි.

නිසි පරිදි සෞඛ්‍ය උපදෙස් අනුගමනය නොකරමින් ජනතාව තව දුරටත් කටයුතු කිරීම හේතුවෙන් දෛනිකව ආසාදිතයන් වාර්තාවීම ඉහළ යමින් පවතින බවද හෙතෙම පෙන්වා දෙයි. මේ තත්ත්වය තව දුරටත් පැවතියහොත් මෙරට රෝහල් පද්ධතිය තුළ පවතින ධාරිතාව ඉක්මවා යෑම සහ සම්පත් සීමා සහිත වීම හේතුවෙන් සෞඛ්‍ය පාලනය සෞඛ්‍ය අංශ වෙතින් ගිලිහී යනු ඇති බව ඔහු සඳහන් කළේය. පසුගිය 27 වැනිදා සිට මෙරට දෛනිකව ආසාදිතයන් වාර්තාවීම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, එය සියයට 70ක පමණ වර්ධනයක් බව උපුල් රෝහණ මහතා පෙන්වා දෙයි.

# අගමැති මහින්ද ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුනට

**රක්ෂණ ශ්‍රියන්ත**

ආසියානු සංවර්ධන බැංකුවේ 2021/2022 වර්ෂය සඳහා 'ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ' මුලසුනට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (5) පැවති එම බැංකුවේ 54 වැනි වාර්ෂික සමුළුවේදී තේරී පත් විය.

මුදල් ඇමැතිවරයා වශයෙන් අග්‍රාමාත්‍ය රාජපක්ෂ මහතා මේ තනතුරට පත් වන විට ශ්‍රී ලංකාවේ ආසියානු සංවර්ධන බැංකු අධිපති ධුරය හොබවමින් සිටියේය.

ජෝර්ජියාවේ ටිබිලිසිහි පැවැත්වීමට නියමිතව තිබූ මේ වාර්ෂික මහා සභා රැස්වීම පවතින වසංගත තත්ත්වය හේතුවෙන් වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. ඔස්ට්‍රියාවේ සහ මොංගෝලියාවේ ඒ.ඩී.බී. අධිපතිවරු මේ රැස්වීමේදී ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරුන් ලෙස තේරී පත් වූහ.

ආසියානු සංවර්ධන බැංකුවේ 55 වැනි වාර්ෂික මහා සභා රැස්වීම ලබන වසරේ කොළඹදී පැවැත්වීමට නියමිතය.

## 01 වැනි පිටුවෙන්...

### ලක්ෂයකට පූර්ණ ...

පසුගිය පැය 24 තුළදී ආසාදිතයන් 922ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පිටව ගොස් ඇත.

කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර සඳහා මධ්‍යස්ථාන 82ක් පවතින අතර, ආසාදිතයන් 14,795ක් මේ වන විට ප්‍රතිකාර ලබමින් සිටියි. පසුගිය පැය 24 තුළදී තවත් කොරෝනා මරණ 11ක් වාර්තා වීමත් සමග කොවිඩ් මරණ සංඛ්‍යාව 720ක් දක්වා ඉහළ ගොස් ඇති බවද වසංගත රෝග විද්‍යා අංශය දැනුම් දෙයි. කොරෝනා සමස්ත ආසාදිතයන්ගේ සංඛ්‍යාව 115,590කි.

කොවිඩ් මර්දනය සඳහා වන එන්නතේ පළමු මාත්‍රාව 928,107කට දී ඇති අතර, දෙවැනි මාත්‍රාව මේ වන විට පුද්ගලයන් 140,721කට දී ඇති බවද එම අංශය සඳහන් කරයි.

**සිරිල් ජයතුංග මහතා**

මහරගම, අංක 14, රෝහල් පාර, පදිංචිව සිටි හයිලෙවල් මෝටර්ස් අධිපති, (මහරගම එක්සත් වෙළඳ සංගමයේ හිටපු සභාපති) සිරිල් ජයතුංග මහතා අභාවප්‍රාප්ත විය.

අවසන් කටයුතු මැයි 6 වන බ්‍රහස්පතින්දා පස්වරුවේ මහරගම ගොඩිගමුව පොදු සුසාන භූමියේදී සිදු කෙරේ.

**මෙයට, ශෝකයට පත්,**

**ලලිත් පුතා, චන්ද්‍රිකා දුව, ශ්‍රිනි දුව - මහරගම. 077-7181302**

# සාර්ථක වෘත්තිකයන් බිහි කර ආර්ථිකය සවිබල ගන්වමු

රටක ශ්‍රම බළකාය වූ කලී රටේ ආර්ථික වර්ධනය පිළිබිඹු කරන ප්‍රධාන සාධකයක් වන අතර, අවම ශ්‍රම බළකා සහභාගිත්වයක් තුළ රටකට තම මානව ප්‍රාග්ධනයේ උපරිම ශක්‍යතාව නොමැති වීමෙන්, එම රටෙහි සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීමට ඇති හැකියාව අහිමි වෙයි. වර්තමාන ශ්‍රී ලාංකික ශ්‍රම වෙළෙඳපොළෙහි ඇති ගැටලු පිළිබඳ සලකා බැලීමේදී ශ්‍රම බළකායට අයත් පුද්ගලයන් අතුරින් සියයට පහකට වැඩි ප්‍රමාණයක් විරැකියාවෙන් පෙළෙන අතර, මේ හේතුවෙන් ශ්‍රම බළකායට උපරිම වශයෙන් ආයෝජනය කළ හැකි පිරිස අඩු වීම සැලකිය යුතු තත්ත්වයකි. එබැවින් රටේ සංවර්ධනයේ ප්‍රධාන පුරුක වන මානව සම්පත් සංවර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවක් වී ඇත.

රටේ සංවර්ධනය අරමුණු කරගත් වර්තමාන රජයේ අතිගරු ජනාධිපතිතුමාගේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය වන 'සෞභාග්‍යයේ ඉදිරි දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ශ්‍රම බළකාය කුසලතා, නිපුණතා හා තාක්ෂණික ඥානයෙන් පිරිපුන් මිනිස් බලයක් ලෙස සවිබලගැන්වීම මූලික අපේක්ෂාව වී ඇති අතර, මානව සම්පත සංවර්ධනය කිරීමේ මෙකී ඉලක්කය රටේ සංවර්ධනයට බෙහෙවින් පිටිවහල් වන ඉතා වැදගත් අනභිභවනීය ප්‍රවේශයකි. මෙම සන්දර්භය තුළ ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බළකායක් යන දැක්ම පෙරටු කොටගෙන ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියක් තුළ අන්තර්ගත මිනිස් බල හා රැකීරක්ෂා පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ කාර්යය සඳහා අංක 1640/31 දරන 2010-02-12 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත, මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වර්තමාන රජයේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ මානව සම්පත සංවර්ධනය සඳහා ශ්‍රම බළකාය සවිබල ගන්වමින් විරැකියාව අවම කර රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් සක්‍රීය ප්‍රයත්නයක නිරත වෙමින් සිටියි.

ජාතික මිනිස් බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමත්, රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු සහ වෘත්තීය මාර්ගෝපදේශනය සැලසීමත් මෙහි ප්‍රමුඛ කාර්යයන් වෙයි. එමෙන්ම ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය, බෙදාහැරීම සහ මානව සම්පතෙහි ක්‍රියාකාරකම් ආශ්‍රිත සිද්ධි අධ්‍යයන, පර්යේෂණ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හරහා ශ්‍රම වෙළෙඳපොළෙහි කාලීන අවශ්‍යතාවයන් පුරෝකථනය කිරීමත්, අදාළ අංශ වෙත නිර්දේශ ලබාදීම මගින් සාධනීය නව ප්‍රවේශයන් කෙරෙහි අදාළ පාර්ශ්වයන් යොමු කිරීමත් මෙමගින් සිදු කරයි. එපමණක් නොව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක මහජන රැකියා සේවා මධ්‍යස්ථාන (Public Employment Service Centers PES) මගින් මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව සුවිශේෂී කාර්යභාරය රාශියක් මේ යටතේ සිදු කරනු ලබයි.

ගෝලීය වශයෙන් තරගකාරී, නිපුණතාවෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකීක ශ්‍රම බළකායක් ගොඩනැංවීම සඳහාත්, විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමත්, සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීමත්, රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් රැකියාගත කිරීම සඳහා මගපෙන්වීම ලබාදීමත් මෙහි විෂය පථයට අයත් වෙයි. එමෙන්ම මහජන රැකියා සේවා මධ්‍යස්ථාන සහ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය, ෆේස්බුක් පිටුව සහ යූ ටියුබ් චැනලය හරහා ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම මෙමගින් සිදු කරයි. එපමණක් නොව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන් මගින් රැකියා අපේක්ෂිතයන් (Job Seekers) සහ රැකියා සපයන ආයතන සඳහා (Job Providers) තම රැකියා අවශ්‍යතාවය සපුරාගනුවස් එම දෙපාර්ශ්වය අතර සහ සම්බන්ධීකරණය ගොඩනැංවීම සිදු කරනු ලබයි.

මෙකී දීර්ඝ කාලීන ඉලක්ක සපුරාලනු සඳහා පුළුල් ननිපුණතාවෙන් යුත් ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරගකාරී ශ්‍රම බළකායක් ගොඩනැංවීම සහ මානව සම්පත්වල මුළු ක්‍රයශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.

සති අන්ත පුවත්පතක් නිරීක්ෂණය කළ විට බොහෝ රැකියා අවස්ථා හඳුනාගත හැකිව තිබියදීත්, ශ්‍රම වෙළෙඳපොළ තුළ විරැකියා ප්‍රතිශතය ඉහළ අගයක් ගැනීමට හේතුව කුමක් ද යන්න සොයා බැලීමේදී පැහැදිලි වනුයේ මෙම රැකියා අවශ්‍යතාව සහ ඉල්ලුම අතර යම් පරතරයක් පවතින බවයි. එනම් මේ අතර රැකියා සපයන්නන් අපේක්ෂිත කුසලතා නොගැළපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටලුවක් පවතී. මෙම ගැටලුව විසඳීම සඳහා වර්තමාන ශ්‍රම බළකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළෙඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කර ගැනීම සඳහා පහසුකම් සලසා දීම, මිනිස් බලය සැලසුම් කිරීම, සංවර්ධනය හා පුරෝකථනය, අවිධිමත් අංශය සංවර්ධනය, පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂිතයන් පෙලඹවීම, වැඩි සේවා ඉල්ලුමක් සහිත සේවාවන් හා රැකියා ලෝකයට අවශ්‍ය කුසලතා හා නිපුණතා පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම, නිදහස් මහජන රැකියා සේවය ලබාදීම, අවදානමට ලක් වී ඇති කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් සඳහා මිනිස් බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම, ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම සහ දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳපොළ නම්‍යතා පුරෝකථනය කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙමගින් සිදු කරනු ලබයි.

එතුළින් උක්ත ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් සවිබල ගැන්වීම සඳහා මානව සම්පත සංවර්ධනය හරහා දැනුම මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැංවීමට අපේක්ෂිත අතර, දැනුමෙන් පිරිපුන් සමාජයක් සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපනය මෙන්ම උසස් වෘත්තීය අධ්‍යාපනය ලබාදීමට අවශ්‍ය මාවත විවර කර දෙමින් මෙම දෙපාර්තමේන්තුව දීපව්‍යාප්තව විශාල කාර්යභාරයක් ඉටු කරමින් සිටියි.

තව ද දසවිධ ප්‍රතිපදාවන්ගෙන් යුක්ත වත්මන් රජයේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන 'රට හදන සෞභාග්‍යයේ ඉදිරි දැක්ම' ජාතික ප්‍රතිපත්තියට මුල්තැන දෙමින් ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත් වන පවුලක්, ගුණගරුක විනය ගරුක සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යවත් දේශයක් යන චතුර්විධ අරමුණු ළඟා කර ගැනීම අපේක්ෂා කෙරෙමින් දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් ක්‍රියාත්මක අතර, එම ප්‍රතිපත්ති ප්‍රකාශයේ 4 වන පරිච්ඡේදයේ සඳහන් ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත් වන පවුලක්, සශ්‍රීක මානව සම්පතක්, ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් යන තේමා යටතේ කටයුතු කරමින් නිපුණතාවෙන් සපිරි සමාජයක් ගොඩනැංවීමට උරදෙමින් ක්‍රියා කරයි.

ඒ සඳහා වෘත්තීය පුහුණුව හා නිපුණතා අධ්‍යාපනයට මුල්තැන දෙමින් අධ්‍යාපන සුදුසුකම් නොසලකමින් අවශ්‍ය සිසුන්ට වෘත්තීය හා තාක්ෂණ පුහුණු අවස්ථා සඳහා මගපෙන්වීම ලබාදීම මගින් ශ්‍රම බළකායේ නිපුණතා සංවර්ධනයට පුළුල් අවස්ථා ලබාදීම හරහා නුපුහුණු ශ්‍රමිකයන් අඩු කර කඩිනම් සංවර්ධනයක් අත්කර ගැනීමට පුහුණු ක්‍රියාශීලී ශ්‍රම බළකායක් බිහිකිරීමට අවශ්‍ය දායකත්වය ලබාදීම මෙම දෙපාර්තමේන්තුව මගින් මේ වන විටත් සිදු කරනු ලබයි.

එපමණක් ද නොව, මෙකී ප්‍රවේශයේදී සතුටින් ජීවත් වන පවුලක් බිහිකිරීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී සාර්ථක ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීමේත්, ස්වයං රැකියා කරනු ලබන්නන් සහ කුඩා ව්‍යවසායකයන් දිරිගන්වා නව රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේත් අභිමතාර්ථය පෙරදැරිව, රජයේ නිලධාරීන්ගේ මාර්ගෝපදේශනය ලැබීමෙන් මෙන්ම ස්වකීය උත්සාහයෙන්ම සාර්ථක වූ දිවයින පුරා විසිරී සිටින ව්‍යවසායකයන්ගේ වෘත්තීය මාවත පිළිබඳ දිසිරූපණය කෙරෙන විනාඩි 3ක පමණ කෙටි වීඩියෝ පට සකස් කර මෙම වසරේ ආරම්භයේ සිට දෙපාර්තමේන්තුවේ You tube නාලිකාව (Yes we can) සහ වෙබ් අඩවිය (www.dome.lk) මගින් ජනගත කරමින් පවතී.

විරැකියාව ඉහළ යාමට හේතු වී ඇති,

1. ශ්‍රම වෙළෙඳපොළට ප්‍රවේශ වන පුද්ගලයන් සඳහා ප්‍රමාණවත් වන පරිදි ජාතික ආර්ථිකය තුළ සේවා වියුක්ති අවස්ථා පුළුල් නොවීම.
2. නව රැකියා අවස්ථා නිර්මාණය වුව ද එම ක්ෂේත්‍රවල පුහුණු ශ්‍රමිකයන් නොවීම සහ
3. හැකියා හා ළැදියා අතර නොගැළපීමේ ගැටලුවට විසඳුම් පෙන්වා නොදීම
4. තරගකාරී ආර්ථික රටාව තුළ බුද්ධිගලනය මෙන්ම රැකියා ස්ථාවරත්වය සලකා රාජ්‍ය අංශයේ රැකියා ක්ෂේත්‍රවලට ප්‍රවිෂ්ට වීමට වැඩි ළැදියාවක් දැක්වීම
5. මේ හේතුවෙන් පෞද්ගලික අංශයේ බොහෝ රැකියා අවස්ථා පැවතිය ද බොහෝදෙනා එම රැකියා නොසලකා හැරීම නිසා එම අවස්ථා ගිලිහීම
6. ස්වයං රැකියා ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීමට ඇති උකටලී මානසිකත්වය

යන සාධකයන් මඟහරවා එම තත්ත්වයන්ගෙන් මුදාගෙන රැකියා අපේක්ෂිතයන්ට තම ජීවනෝපාය මාර්ගය නිර්මාණශීලී චින්තනයෙන් ජනනය කැර ගැනීමට අවස්ථාව සලසා දීම මෙහිදී අපේක්ෂිතය.

මෙවන් සන්දර්භයක් තුළ සාමාන්‍යයෙන් මහා පරිමාණ ආයෝජකයන් සැලකූ විට ඊට සමානව කුඩා හා මධ්‍ය පරිමාණ ආයෝජකයන්ට උත්පාදනය කළ හැකි රැකියා ප්‍රමාණය වැඩි අගයක් ගනී. එබැවින් සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන්, සංවර්ධන උපාය මාර්ගයන්හිදී විරැකියා ගැටලුවට විසඳුමක් ලෙස පෞද්ගලික අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා ව්‍යාපාරිකයන් දිරිගැන්වීම කාලෝචිත වෙයි. එබැවින් ඊට සරිලන ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමේ කාලීන අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව අභිනව අධ්‍යක්ෂ, ජෙනරාල් අනූෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මියගේ සංකල්පයකට අනුව පෞද්ගලික ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා ස්වයංරැකියා කරන අය දිරිගැන්වීම උදෙසා මෙන්ම ව්‍යාපාර ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීමට අපේක්ෂාවෙන් සිටින අයට එකී ප්‍රවේශයට පූර්වාදර්ශයක් කැර ගැනීමට අවකාශය උදාකර දීමේ අරමුණින් සාර්ථක ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර ගමන් වෘත්තාන්තය ඇතුළත් මෙම කෙටි වීඩියෝපට සමාජගත කෙරේ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ධෛර්යයවත් කිරීම උදෙසා සිදු කරනු ලබන මෙම සුවිශේෂී ප්‍රචාරණය වර්තමාන රජයේ ප්‍රතිපත්තිය යථාර්ථයක් බවට පත් කිරීමට ගත් එක් ප්‍රායෝගික ප්‍රයත්නයක් ලෙස පෙන්වා දිය හැකිය.

මේ අයුරින් විරැකියාව අවම කිරීම හා සුදුසු රැකියා අවස්ථා බිහි කිරීම යන කාර්යයන් ඉටු කර ගැනීම උදෙසා විවිධ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම දෙපාර්තමේන්තුවේ කාලීන අවශ්‍යතාව හඳුනා ගනිමින් මෙම කාර්යයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගැසට් පත්‍රයක් මගින් පමණක් ස්ථාපිතව ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුවේ නෛතිකභාවය පනතක් මගින් සම්මත කරගැනීමෙන් වඩාත් පුළුල් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

ඒ සඳහා තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජේකෝන් මහතාගේ මඟපෙන්වීම යටතේ මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් අනූෂා ගෝකුල ප්‍රනානාන්දු මහත්මියගේ අප්‍රතිහත ධෛර්යය, කැපවීම හා උත්සාහය තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට පනතක් මගින් නෛතිකභාවය ගෙන දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුමැතිය දීමට පසුගිය අප්‍රේල් මස 19 වැනි දින ඇමැති මණ්ඩලය තීරණය කැර ඇති බව සඳහන් කිරීම වැදගත්ය.



**නීතිඥ එච්. ජී. ක්‍රිශාන්ති දීපශිකා**
**සහකාර අධ්‍යක්ෂ**
**(වෘත්තීය මාර්ගෝපදේශන හා පාලන)**
**මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව,**
**තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# සෞඛ්‍ය අමාත්‍යාංශය
# ලංසු සඳහා ආරාධනයයි

| දිනය | 2021-05-05 |
|---|---|
| ණය/ ප්‍රදාන අංකය සහ ශීර්ෂය | ණය 3727/G0618-SRI : සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය | HSEP/PIU/SP/W17/01/2021<br>වැඩ ප්‍රසම්පාදනය - 2 වන වටය - අදියර 1<br>(MO නිල නිවාස/ (DHC/2 PMCU)<br>කෑගල්ල දිස්ත්‍රික්කය |
| ලොට් | (W 17) ලොට් 'ඒ' බස්නාගල MO නිල නිවාස<br>(W 17) ලොට් 'බී' හිඟුරලකන්ද DHC<br>(W 17) ලොට් 'සී' කරඬුපන PMCU 1<br>(W 17) ලොට් 'ඩී' පොද්දෙනිකන්ද PMCU 2 |
| ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය | 2021-06-04 |

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආසියානු සංවර්ධන බැංකුව වෙතින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අරභයා ණය මුදලක් ලැබී ඇත. මෙම මුදලින් කොටසක් ඉහත දැක්වෙන කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රභවයන් සහිත රටවල ලංසුකරුවන්ට ලංසුකරණය විවෘතය.

02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කාර්යාලය යටතේ කොළඹ - 08, කිංසි පාරේ, නො.3/19, සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ ("සේව්‍යයා") විසින් පහත විස්තර කොට ඇති පරිදි පවත්නා ඕපීඩී (OPD) ගොඩනැගිල්ල හා පහසුකම් නවීකරණය කිරීම සහ වෛද්‍ය නිලධාරී (MO) නිලනිවාස, ප්‍රාදේශීය රෝ. (DHC) ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන දෙක නව ඉදිකිරීම ඇතුළු කාර්යයන් ඉදිකොට සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | අලුත්වැඩියාව/ OPD - ප්‍රදේශය (වර්ග අඩි) | නව ඉදිකිරීම්/ OPD ප්‍රදේශය වර්ග අඩි | සම්පූර්ණ ප්‍රදේශය වර්ග අඩි |
|---|---|---|---|
| ලොට් 'A' බස්නාගල MO නිල නිවාස | 1,883 | 1,722 | 3,605 |
| ලොට් 'B' හිඟුරලකන්ද DHC | | 4,347 | 4,347 |
| ලොට් 'C' කරඬුපන PMCU 1 | | 3,540 | 3,540 |
| ලොට් 'D' පොද්දෙනිකන්ද PMCU 2 | | 1,614 | 1,614 |

03. ආ.සං.බැංකුවේ තනි පියවර : තනි කවරය ක්‍රියාපටිපාටියට අනුකූලව විවෘත තරගකාරී ලංසුකරණය මෙහෙයවනු ලබන අතර, ලංසුකරණ ලිපිලේඛනවල විස්තර කර ඇති පරිදි යෝග්‍යතාපූර්ණ රටවල ලංසුකරුවන්ට විවෘතය.

04. පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් සහිත යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් පමණක් මෙම ලංසුකරණයට සහභාගි විය යුතුය.

**අ. මූල්‍ය**

(i) **ඓතිහාසික මූල්‍යමය කාර්ය සාධනය :**

ලංසුකරුගේ වර්තමාන මූල්‍යමය තත්ත්වයේ ස්ථාවරත්වය ඔප්පු කර දැක්වීම පිණිස පසුගිය වසර තුන සඳහා (2017/2018, 2018/2019 සහ 2019/2020) විගණිත මූල්‍ය නිවේදන ඉදිරිපත් කිරීම.

(ii) **වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යය :**

ලංසුකරුට (හවුල් ව්‍යාපාර හා හවුල්කාරිත්ව ඇතුළුව) පසුගිය වසර 3 තුළ ක්‍රියාත්මක වන හෝ සම්පූර්ණ කළ කොන්ත්‍රාත් සඳහා ලැබූ සහතික කළ ගෙවීම් එකතුව ලෙස ගණනය කළ (පහත වගුව බලන්න) වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් අවම සාමාන්‍යයක් සතුවිය යුතුය. (පහත දක්වා ඇති අවශ්‍යතාවයන් එක් එක් සමූහය (ලොට්) සඳහා වෙන් වෙන්ව අදාළ වේ.)

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | ශ්‍රී ලං. රු. මිලියන |
|---|---|
| ලොට් 'A' බස්නාගල MO නිල නිවාස | 33.61 |
| ලොට් 'B' හිඟුරලකන්ද DHC | 56.91 |
| ලොට් 'C' කරඬුපන PMCU 1 | 55.93 |
| ලොට් 'D' පොද්දෙනිකන්ද PMCU 2 | 33.01 |

(iii) **මූල්‍ය සම්පත් :**

ලංසුකරු (හවුල් ව්‍යාපාර හා හවුල්කාරිත්ව ඇතුළුව - අදාළ වේ නම්) තමන්ගේ වර්තමාන කොන්ත්‍රාත් බැඳීම් සඳහා වන අවශ්‍යයෙන් කළ යුතු මුදල් ගෙවීම් අඩු කොට, තම මූල්‍ය සම්පත් පහත දැක්වෙන කොන්ත්‍රාත් විෂයයන් සඳහා වන සම්පූර්ණ අවශ්‍යතාවයන් සපුරාලන බව හෝ ඉක්මවා යන බව හෝ පැහැදිලි කර පෙන්වා දිය යුතුය. (පහත දක්වා ඇති අවශ්‍යතාවයන් එක් එක් සමූහය (ලොට්) සඳහා වෙන් වෙන්ව අදාළ වේ)

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | (ලොට් අංක) | ශ්‍රීලං.රු. මිලියන |
|---|---|---|
| ලොට් 'A' බස්නාගල | MO නිල නිවාස | 7.26 |
| ලොට් 'B' හිඟුරලකන්ද | DHC | 9.22 |
| ලොට් 'C' කරඬුපන | PMCU 1 | 9.06 |
| ලොට් 'D' පොද්දෙනිකන්ද | PMCU 2 | 7.13 |

**ආ. පළපුරුද්ද :**

(i) **සමාන ස්වභාවයේ හා ප්‍රමාණයේ කොන්ත්‍රාත් :**

ලංසුකරු (හවුල් ව්‍යාපාර සහ හවුල්කාරිත්ව ඇතුළුව - අදාළ වේ නම්) යෝජිත කාර්යයන්ට සමාන වන, එක් එක් කොන්ත්‍රාත්තුවෙහි තම සහභාගිත්වයේ අගය පහත දැක්වෙන අගයන් ඉක්මවා යන, පසුගිය වසර පහ තුළ සාර්ථකව හෝ විද්‍යමානව කොන්ත්‍රාත්කරුවකු, හවුල් ව්‍යාපාර සහකරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු ලෙස අඩුතරමින් එක් කොන්ත්‍රාත්තුවකට හෝ සහභාගී වී තිබිය යුතුය.

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | (ලොට් අංක) | ශ්‍රීලං.රු. මිලියන |
|---|---|---|
| ලොට් 'A' බස්නාගල | MO නිල නිවාස | 13.44 |
| ලොට් 'B' හිඟුරලකන්ද | DHC | 22.76 |
| ලොට් 'C' කරඬුපන | PMCU 1 | 22.37 |
| ලොට් 'D' පොද්දෙනිකන්ද | PMCU 2 | 13.21 |

(ii) එක් ලංසුකරුවකු සාර්ථක ලංසු (අඩුම මිල නියම කළ ප්‍රතිචාරාත්මක) කීපයක් ඉදිරිපත් කරයි නම් ලංසු ඇගයීමේදී පහත දැක්වෙන, ලංසුවෙහි ඉදිරිපත් කර ඇති පරිදි, එකතු කළ අවශ්‍යතාවයන් සපුරාලීමට ඔහු සතු ධාරිතාවයද වත්කමක් ලෙස ඇතුළත් කෙරෙනු ඇත.

- වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යය
- මූල්‍ය සම්පත්
- වෙන්කළ හැකි උපකරණ සහ
- ක්ෂේත්‍රගතකරණ පිරිස්

**සුදුසුකම් නිර්ණායකයන් ලංසුකරණ ලියැවිල්ලේ වඩාත් මැනවින් විස්තර කොට ඇත.**

05. වැඩිමනත් විස්තර ලබා ගැනීමටත්, ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් වැඩකරන දිනයන්හි කාර්යාල වේලාවන් තුළ (08.30 පැය සිට 16.15 පැය දක්වා) පහත සඳහන් අය අමතන්න.

**ව්‍යාපෘති ඉංජිනේරු,**
**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**නො.75, ධර්මපාල මාවත, රත්නපුර.**
**විද්‍යුත් තැපෑල** : eng.hsep.piusab@gmail.com
**දුරකථන : 045-2221554**
**ෆැක්ස් : 045-2221554**

06. ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන ලබාගැනීමට යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්;

* රත්නපුර දිස්ත්‍රික්කය (MO නිල නිවාස,/DHC/2/PMCU) - අදියර 1 වටය 2 වැඩ ප්‍රසම්පාදනය W17 සඳහා ලංසුකරණ ලිපිලේඛන ඉල්ලා ඉහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.
* වගුවේ අයිතම අංක 08 යටතේ සඳහන් කර ඇති පරිදි ආපසු නොගෙවන (ශ්‍රී ලංකා රුපියල්) ගාස්තුවක් 2021-06-03 දින 15.00 පැයට හෝ ඊට පෙර ගෙවීම.
* ගෙවීම් කළ යුත්තේ "**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ගිණුම් අංක 84171161**" නමින් බැංකු අණකරයක් මගින් හෝ කාර්යාල දිනයන්හි 09.00 පැය සිට 15.00 පැය දක්වා මුදලින් හෝ ලංකා බැංකුවේ ගිණුම් අංක 84171161 වෙත සෘජුව තැන්පත් කිරීම මගිනි.

07. සේව්‍යයා විසින්, **5 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී 2021 මැයි 19 දින 1030 පැයට පූර්ව - ලංසු රැස්වීමක්** මෙහෙයවනු ඇත.

08. **නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**නො.78, ධර්මපාල මාවත, රත්නපුර.**
**ශ්‍රී ලංකාව.**

යන ලිපිනයට ඔබේ ලංසු ලංසුකරණ ලියැවිල්ලේ විස්තර කොට ඇති පරිදි ලංසු සුරක්ෂණය සමග **2021-06-04 දින 1030 පැයට** හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු සුරක්ෂණය බැංකු ඇපකරයක ආකෘතියෙන් ඉදිරිපත් කරන්නේ නම්, එය ලංසු ලිපිලේඛනවල 4 වන කොටසේ සඳහන් ආකෘතිය යොදගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් "**සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ**" නමට නිකුත් කළ බැංකු ඇපකරයක් විය යුතුය.

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම (ලොට්) | ලංසු සුරක්ෂණ (ශ්‍රී ලං. රු.) | ආපසු නොගෙවන ගාස්තුව/ ශ්‍රී ලං. රු. |
|---|---|---|
| ලොට් 'A' බස්නාගල MO නිල නිවාස | 336,000.00 | 5,000.00 |
| ලොට් 'B' හිඟුරලකන්ද DHC | 569,000.00 | 8,000.00 |
| ලොට් 'C' කරඬුපන PMCU 1 | 559,000.00 | 8,000.00 |
| ලොට් 'D' පොද්දෙනිකන්ද PMCU 2 | 330,000.00 | 5,000.00 |

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කොට විවෘත නොකරම ආපසු එවනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම, එම අවස්ථාවට සහභාගිවීමට කැමති ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී සිදු කෙරේ.

10. ලංසු, විවෘත කිරීමේ දින සිට දින 90 ක් සඳහා වලංගු විය යුතුය. ලංසු සුරක්ෂණය ලංසු විවෘත කිරීමේ දින සිට දින 118 ක් සඳහා වලංගු විය යුතුය.

11. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හෝ සබරගමුව පළාත් සභාවේ පළාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ කාර්යාලය හෝ ලංසුකරු විසින් ලංසු පිළියෙළ කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී දරනු ලබන කිසිදු පිරිවැයක් සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.

**සභාපති/ ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**නො.3/19, කිංසි පාර, කොළඹ - 09,**
**ශ්‍රී ලංකාව.**
**දිනය : 2021-05-04**

# සියයට 63කට මේ වසර අවසන් වීමට පෙර එන්නත්කරණය සිදු කරනවා

## සෞඛ්‍ය ඇමැතිනි **පවිත්‍රා වන්නිආරච්චි**



## පාර්ලිමේන්තුව

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

මෙම වසර අවසන් වීමට ප්‍රථම මෙරට ජනගහනයෙන් සියයට 63කට වැඩි පිරිසකට පූර්ණ එන්නත්කරණ කටයුතු සිදු කරන බව සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පාර්ලිමේන්තුවේදී පෙරේදා (04) ප්‍රකාශ කළාය.

කොවිඩ් -19 වයිරස ව්‍යාප්තිය පිළිබඳ විශේෂ කල්තැබීමේ විවාදයට එක්වෙමින් පෙරේදා (04) පාර්ලිමේන්තුවේදී ඇමැතිවරිය මේ බව සඳහන් කළාය.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව පෙරේදා (04) රැස්විය.

සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය තවදුරටත් මෙසේ ද පැවසීය.

කොරෝනා වසංගත තත්ත්වයට මුහුණ දීම සඳහා ශක්තිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

වසර එකහමාරක කාලයක් තිස්සේ කොවිඩ් 19 වසංගතය ලෝ වැසියන්ගේ සෞඛ්‍යයට පමණක් නෙවෙයි ආර්ථිකයට, රැකියාවට ආදී සියලු අංශවලට දැඩිව බලපා තිබෙනවා. කොවිඩ් වසංගතය මැඩලීම වෙනුවෙන් ආණ්ඩුව ගෙනයන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවක් මේ පාර්ලිමේන්තුවේදී මම අනාවරණය කර තිබෙනවා. මෙම වසංගතය පාලනය කිරීම වෙනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය කරුණු 10කින් සමන්විත දස වැදෑරුම් වැඩපිළිවෙළක් එළිදක්වා තිබෙනවා. කොවිඩ් පාලනයට ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව අපි කටයුතු කරනවා. ඒ වගේම කොවිඩ් පාලනය වගේම රටේ ආර්ථිකය කෙරෙහි ද අපි අවධානය යොමු කළ යුතුයි. කොවිඩ්වලට අවශ්‍ය සියලු දේ මිලදී ගැනීමට නම් අපගේ ආර්ථිකය ද ශක්තිමත් විය යුතුයි. වගකිවයුතු රජයක් ලෙස අපි කොවිඩ් පාලනයට යොමු වී තිබෙන්නේ දුගී දුප්පත් ජනතාවගේ ආර්ථිකය ද ආරක්ෂා වන පරිදියි. කොවිඩ් පාලනය වෙනුවෙන් අපි ගන්නා සෑම තීරණයකදීම රටේ ආර්ථිකය පවත්වාගෙන යාම මෙන්ම අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මාර්ග පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ද දැඩිව අවධානය යොමු කරනවා. ඒ වගේම මෙම වසංගතයෙන් බේරීම සඳහා එකම විකල්පය ලෙස එන්නත්කරණය අපි හඳුනාගෙන තිබෙනවා. කොවිඩ් රෝගීන්ට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ඒ වගේම මෙය වසංගතයක්. එය පාලනය කිරීම සඳහා සිදු කළ යුත්තේ එන්නත්කරණය බව හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව මෙම වසර අවසාන වීමට පෙර මෙරට ජනතාවගෙන් සියයට හැටතුනකට එන්නත්කරණය සිදු කර අවසන් කිරීම අපගේ ඉලක්කයයි.

දැනට ඇස්ට්‍රා සෙනෙකා එන්නත නවලක්ෂ විසිපන්දහස් දෙසිය හතළිහකට දී තිබෙනවා. රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නතට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය නැහැ කියා විපක්ෂනායකවරයා සඳහන් කළා. ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගත් ආයතන දෙකකින් අදාළ එන්නත් සඳහා අනුමැතිය දී තිබේ නම් එම රටේ ජනතාවට අදාළ එන්නත් ලබා දෙන්න පුළුවන්. රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නත් මාත්‍රා මිලියන දහතුනක් මෙරටට ගෙන්වා ගන්නවා. එයින් පළමු එන්නත් මාත්‍රා පහළොස්දහස අද ගෙන්වා ගත්තා. එම එන්නත් මිලියන දහතුනම මෙම වසර තුළදීම ගෙන්වා ගන්නවා. ෆයිසර් එන්නත් මාත්‍රා මිලියන පහක් මෙරටට ඇණවුම් කර තිබෙනවා. මෙම වසර අවසන් වීමට මත්තෙන් එන්නත්කරණය සිදු කරනවා.

අපේ රටේ ජනගහනයෙන් සියයට හැටතුනකට වඩා මෙම වසර අවසන් වීමට පෙර පූර්ණ වශයෙන් එන්නත්කරණය සිදු කර අවසන් කිරීමට අපට හැකි වෙනවා. අපි සැලසුම් කර තිබුණේ ජනගහනයෙන් සියයට හැටකට එන්නත් ලබා දීමටයි. නමුත් එම ප්‍රමාණය සියයට හැටතුන දක්වා වැඩි කිරීමටත් අපි තීරණය කර තිබෙනවා. ඉන්දියාව නිපදවන තවත් එන්නත් මාත්‍රා ගණනාවක් අපි ලබාගන්නට සැලසුම් කර තිබෙනවා.

අද දිනයේ සිට අපි පටන් ගන්නා ස්පුට්නික් එන්නත මඟින්, මෙම සතිය තුළ ආරම්භ කරන එන්නත් ක්‍රියාවලිය බාධාවකින් තොරව සිදු කරගෙන යෑමට අපට හැකියාව ලැබෙනවා. දැනට කොවිඩ් රෝගීන් සඳහා දළ වශයෙන් ඇඳන් 13,800ක් රෝහල් තුළ අපි වෙන්කර තිබෙනවා. ඉදිරි සති 2 තුළ තවත් ඇඳන් 10,000ක් අපි වෙන් කරනවා. දැනට අපේ රටේ රෝහල්වලට අවශ්‍ය ඔක්සිජන් ධාරිතාව ටොන් 25යි. එහෙත් ඔක්සිජන් ටොන් 80කට ධාරිතාව වැඩි කිරීමේ හැකියාව අප සතුයි.

අපගේ එන්නත්කරණ ක්‍රියාවලිය ලෝකයේ දියුණු රටවල් හා සමානව අපි සිදු කරනවා. ස්පුට්නික් එන්නත ලබාදීමේ ක්‍රියාවලියත් බණ්ඩනයකින් තොරව සිදු කරනවා. ඉදිරි සති දෙක තුළ තවත් ඇඳන් 10,000ක් වෙන්කරනවා. ඔක්සිජන් තිබුණට මදියි. ඒවා භාවිතා කිරීමට සිලින්ඩර් තිබිය යුතුයි. ඔක්සිජන් සිලින්ඩර් හා ජම්බෝ සිලින්ඩර් අප සතුයි. ඒ වගේම තවත් සිලින්ඩර් හත්දහසක් අපි ඇණවුම් කර තිබෙනවා. කොවිඩ් රෝගීන් වෙනුවෙන් අයි. සී. යූ. ඇඳන් 104ක් අපි වෙන් කළා. කොවිඩ් රෝගීන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් වෙන්ටිලේටර් මැෂින් තිබෙනවා. ඒ වගේම තවත් අවශ්‍ය පහසුකම් විශාල ප්‍රමාණයක් ඇණවුම් කර තිබෙනවා. ඒ වගේම සීමාවාසික පුහුණුව ලබන පිරිස් ද කොවිඩ් ප්‍රතිකාර වෙනුවෙන් පුහුණු කර තිබෙනවා.

**කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා (ස.ජ.බ.)** - කොවිඩ් 19 වයිරසයේ භයානකකම ජනතාවට නිසි ලෙස කියා නොදීම නිසා කොවිඩ් පැතිරීම සිදු වුණා. දැන් ජනතාවට චෝදනා කරලා වැඩක් නැහැ. මේ වන විට රෝගීන් වැඩිපුර වාර්තා වීම නිසා රෝහල් ධාරිතාව ඉක්මවා ගොස් තිබෙනවා. වසංගත රෝග විද්‍යා අංශයේ අධීක්ෂණයට යටත්ව ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාවට නැංවිය හැකි රෝග ප්‍රතිකාර ක්‍රමයක් ආරම්භ කළ යුතුයි. ජනගහනයෙන් සියයට 75ක්වත් එන්නත්කරණයට ලක් කිරීමෙන් මේ වසංගතය මර්දනය කළ හැකියි.

**(නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතා මුලසුනට පැමිණියේය.)**

**රාජිත සේනාරත්න මහතා** - ඊයේ වන විට ඉතිහාසයේ වැඩිම කොවිඩ් මරණ සංඛ්‍යාව වාර්තා වුණා. ඉන්දියාවටත් වඩා ඉහළ මට්ටමකින් ලංකාවේ කොවිඩ් පැතිර යනවා. තුන්වැනි රැල්ලට අපි මේ වන විට මුහුණ දෙමින් සිටිනවා. මීට පෙර තිබූ රැල්ලේදී වැඩිපුර වැළඳුණේ වැඩිහිටි ජනගහනයට. නමුත් තුන්වැනි රැල්ලේදී තරුණ සහ ළමා ජනගහනයටත් වැඩි වශයෙන් මේ වයිරසය ව්‍යාප්ත වෙනවා. කිසිදු රෝග ලක්ෂණයක් නොමැතිව මේ වයිරසය පැතිරෙනවා. ජීවිත ආරක්ෂක ඖෂධ 40 ක පමණ හිඟයකුත් තිබෙනවා. තවත් ඖෂධ 22ක් ඉදිරියේදී හිඟවීමට තිබෙනවා.

**පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා (ස.ජ.බ.)** - රාජිත සේනාරත්න මහතාගේ යෝජනාව මම ස්ථිර කරනවා. නිරෝධායන මධ්‍යස්ථාන වැඩි කර රට සුරක්ෂිත කරන්න කියලා අපි කිව්වා. නමුත් ආණ්ඩුවට ඒ කාලය වන විට අවශ්‍ය වුණේ මැතිවරණය තියලා තුනෙන් දෙකක බහුතරය ගැනීමට. ග්‍රාම නිලධාරී, සමෘද්ධි, ආර්ථික සංවර්ධන නිලධාරීන් 60000ක් පමණ රට පුරා සිටිනවා. මේ අය රුපියල් 5000 බෙදන්න රට පුරා යනවා. ඉතිං ඒ අයට එන්නත්කරණය අවශ්‍යයයි. මේ රටට සංචිත හිඟවීම නිසා ඩොලරයේ මිල ඉහළ ගිහින් තිබෙනවා. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ඇමැතිවරිය මේ වසංගතය පාලනය කරන්න සුදුසු යෝජනා ඉදිරිපත් කළත් කිසියම් නිලධාරීන් පිරිසක් ඊට එකඟ නොවීම නිසා වසංගතය තව තවත් ව්‍යාප්ත වීමේ අවදානමක් තිබෙනවා.

**වරාය හා නාවික ඇමැති රෝහිත අබේගුණවර්ධන මහතා** - කොවිඩ් රෝගය අපටත් ලෝකයටත් අලුත් අත්දැකීමක්. කොවිඩ් රෝගයට එන්නත් හොයාගන්න පුළුවන්. ඕනෑම බරපතළ රෝගයකට බෙහෙතක් හොයාගන්න පුළුවන්. නමුත් අපේ රටේ විපක්ෂයට හැදිලා තිබෙන රෝගයට නම් කිසි දවසක බෙහෙතක් හොයාගන්න බැහැ. කෝටි 15කට අධික සංඛ්‍යාවක් ලෝකයේම කොවිඩ් ආසාදිතයන් සිටිනවා. ඉන් ලක්ෂ 31කට වැඩි සංඛ්‍යාවක් මරණයට පත්ව තිබෙනවා. ලංකාවේ රෝගීන් 113676ක් වාර්තා වී තිබෙනවා. ඉන් මරණ 709ක් සිදුව තිබෙනවා. ලෝකයට සාපේක්ෂව අපේ රටේ ආසාදිතයන් සහ මරණ ගැන සොයා බලන විට ලෝක තත්ත්වය සහ අපේ රටේ තත්ත්වය ගැන ජනතාවට තේරුම් ගන්න පුළුවන්. ඉන්දියාවේ කොවිඩ් තත්ත්වය සමග සසඳා බලන විට අපේ රට තිබෙන තත්ත්වය හොඳයි. විපක්ෂය අද ඔක්සිජන් ගැන කතා කරනවා. පී.සී.ආර්, ඇඳන් ගැන කතා කරනවා. යහපාලන ආණ්ඩුව තිබුණා නම් අද මේවා ගැන නොවේ කතා කරන්න වෙන්නේ ආදාහනාගාර ගැන. යහපාලනය සිටියා නම් අද මේ රට විශාලා මහනුවරක් බවට පත් වෙනවා. හේතුව තමයි ජනාධිපති එක දෙයක් කියන විට අගමැති තව දෙයක් කියනවා. දෙන්නා දෙපැත්තකට යනවා. එවැනි තත්ත්වයක් යටතේ කොවිඩ් පාලනයක් කරන්නේ කෙසේද? මේ වන විට එන්නත් 900000කට වඩා ලබා දී තිබෙනවා. ඉදිරි මාස හතර තුළදී ජනගහනයෙන් මිලියන 13ක් එන්නත්කරණයට ලක් කිරීමට ආණ්ඩුව තීරණය කර තිබෙනවා. දිනකට ලක්ෂ 4 ක් රෝගීන් හමුවන විට ඉන්දියාවේ මැතිවරණ අද පවත්වනවා. නමුත් අපේ රටේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තු මැතිවරණය දින නියමයක් නොමැතිව කල් දැම්මා. අපේ ජනාධිපතිවරයා එහෙමයි මේ රෝගය කළමනාකරණය කරන්න කටයුතු කළේ. රෝගීන් 14000ක් රෝහල්වල සිටිනවා. ඇඳන්වල හිඟයක් පවතිනවා. අපි ඇත්ත කතා කළ යුතුයි. හමුදාවෙන් ඇඳන් 3500ක් ලබා දී තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයට අපි ඇඳන් 1000ක් හදාගත්තා.

**බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහතා** - වසංගත තත්ත්වය වැඩි වීමත් සමග ආණ්ඩුවක් විදියට විශාල වැඩ කොටසක් අපි ඉටු කර තිබෙනවා. යම් යම් අඩුපාඩු තිබුණත් අපි විශාල වැඩක් කර තිබෙනවා. ලෝකයේ රටවල් 50කට එක එන්නතක්වත් මේ වන විට ලබාගත නොහැකිව තිබෙනවා. නමුත් අපි ජනගහනයෙන් 925,000ක් එන්නත්කරණයට ලක් කර තිබෙනවා. චීනයේ සයිනොෆාම් එන්නත ද අපට ඉදිරියේදී භාවිතා කළ හැකි වෙනවා.

ස්පුට්නික් එන්නත 185,000ක් ඉදිරි සති දෙක තුන ඇතුළත ලැබෙනවා. මැයි මස අග වන විට තවත් එන්නත් ලක්ෂ 2 ක් ගෙන්වනවා. ජූනි වන විට ලක්ෂ 4ක් ගෙන්වනවා. මේ වසර අවසන් වන විට එන්නත් මිලියන 13ක් ගෙන්වීමට ගිවිසුම්ගතව සිටිනවා. මිලියන හතහමාරකට පමණ මේ එන්නත් ලබා දීමට අපි පියවර ගන්නවා. කොවැක්ස් හරහා ලක්ෂ 20ක් එන්නත් ලබා ගැනීමටත් අපේක්ෂා කරනවා.

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා** - කොරෝනා අරමුදලෙන් ආණ්ඩුව සිදු කළේ කොරෝනා දේශපාලනය. පව උල්පත් ආණ්ඩුව නිර්මාණය කළා. එන්නත වෙනුවට මුට්ටි ටිකක් ගඟට දැම්මා. මුට්ටි ගඟට දැම්මම පොකුරු ව්‍යාප්තියයි, සමාජ ව්‍යාප්තියයි නතර වුණා ද? මුට්ටිය ෆේල් වන විට කොරෝනා පැණිය ගෙනාවා. කැනඩාවෙන් යම් එන්නත් ප්‍රමාණයක් ඉල්ලා ගන්න පුළුවන්. නමුත් එවැනි සම්බන්ධතාවක් අපේ ආණ්ඩුවට නැහැ. ලෝකයේ මේ වන විට එන්නත් හිඟයක් තිබෙනවා. මෙරට ජනගහනය ලක්ෂ 220යි. එන්නත් දිය යුතු වන්නේ ලක්ෂ 154කට විතර. සීනි හොරකම නොකර එන්නත ගෙන්නුවා නම් ජාතික ආරක්ෂාවට මේ තරම් මරු පහරක් එල්ල වන්නේ නැහැ. කොවැක්ස් සහ ගැවි ක්‍රමය හරහා එන්නත් මෙරටට ලැබෙන බවට ආණ්ඩුව පවසනවා. ස්පුට්නික්, සයිනොෆාම් යන ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමත නොකළ එන්නත් මෙරටට ගෙන්වීමට සූදානම් වෙනවා. එවැනි දෙයක් නොකරන ලෙස මම සෞඛ්‍ය ඇමැතිවරියගෙන් ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තු මන්ත්‍රී අරමුදලක් ආරම්භ කර එන්නත් ගෙන්වමු. සත්‍ය තොරතුරු ජනතාවට ඉදිරිපත් කළ යුතුයි.

**හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උපුල් ගලප්පත්ති මහතා (පො.ජ.පෙ.)** - විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා දිගින් දිගටම විවිධ මාතෘකා අරගෙන සභාව නොමඟ යවන්නට උත්සාහ කරමින් සිටිනවා. මේ රටේ ජාතික සම්පත් ටික විකුණන්නට, ආගම්වාදය, ජාතිවාදය වපුරන්නට උදව් කරපු පිරිස පමණයි විපක්ෂනායකවරයා පිටුපස සිටින්නේ. ඒ සත්‍යය තේරුම් ගත්ත මේ රටේ ජනතාව හැටනව ලක්ෂයක ඡන්ද ලබාදෙමින් ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට ගෙනාවා. ගෝඨාභය රාජපක්ෂ මහතා කියන්නේ දෙබිඩි චරිතයක් නොවෙයි. සජිත් ප්‍රේමදාස මහතා පසුගිය කාලේ කිව්වේ එන්නත් ගේන්න කියලා. එන්නත් ගෙනල්ලා මේ කොරෝනා වසංගතය මැඩලන්නට උත්සාහ කරනකොට රට වහන්න කියනවා. කොරෝනා වසංගතයෙන් රට බේරා ගැනීම සඳහා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේ සිට සියලුම දෙනා මේ වෙනුවෙන් සහයෝගය දෙනවා.

**ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා (ජා.ජ.බ.)** - කොරෝනා වසංගතයේ පාලනය සම්බන්ධයෙන් ඇතිකර ගත් අධි තක්සේරුව නිසා කොරෝනා දෙවන රැල්ල ඇති වුණා. තුන්වැනි රැල්ලත් ඒ වගේමයි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බලධාරීන්ගේ පෙර දැනුම් දීම් අනුව ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැ. ඒ නිසයි මේ සියල්ල සිදු වී තිබෙන්නේ. අද වන විට ඉන්දියාවෙන් විශාල පිරිසක් මෙරටට එනවා. ආණ්ඩුව කල්පනා කරන්නේ ලැබෙන මුදල් ගැන විතරයි.

**රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා** - මොන බෙදීම් තිබුණත් අපි සියලු දෙනාම මැරෙන්න අකමැතියි. දවසක් හරි වැඩිපුර ජීවත් වෙන්න කැමතියි. ඒ නිසා අපි හැමෝම කොරෝනා වසංගත තත්ත්වය ගැන අවධානය යොමු කළ යුතුයි. මොනවා හරි ව්‍යසනයක් ඇති වන හැම වෙලාවකම අපි දෙපැත්ත බෙදිලා පාර්ලිමේන්තුවේදී වාද විවාද කරනවා. එය සුබවාදී ද අසුභවාදී ද කියලා අපි සියලු දෙනාම කල්පනා කළ යුතුයි. යුද්ධය වේලාවෙත් එහෙමයි. මේ තත්ත්වය දැන්වත් වෙනස් විය යුතුයි. ජනතාව පීඩාවට පත් වෙලා. අපි දෙපැත්ත බෙදිලා විවාද කරනවා. කොවිඩ් රැල්ල ආවා. ආණ්ඩුවක් විදිහට අපි සියලු දෙනාම එකතු වෙලා එය කළමනාකරණය කළා. ආරක්ෂක අංශ, සෞඛ්‍ය කාර්ය මණ්ඩල ආදී සියලු දෙනාගේම සහයෝගය ලැබුණා.

**ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා (ස.ජ.බ.)** - වසර එකහමාරකට ආසන්න කාලයක් කොවිඩ් වසංගතය මර්දනය කිරීම වෙනුවෙන් අසහාය සේවයක් ඉටු කරන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, ආරක්ෂක අංශ ආදී සියලු දෙනාට අපගේ විශේෂ ගෞරවය, ස්තූතිය පිරිනැමිය යුතුයි. කොවිඩ් පළමු රැල්ලට ශක්තිමත්ව මුහුණ දුන්නත් දෙවැනි තෙවැනි රැල්ල ආණ්ඩුව විසින් නොසලකා හැරියා. පී. සී. ආර්. පරීක්ෂණ සිදු කරන ප්‍රමාණය පවා අඩු කරලා තිබෙන්නෙ. ආසාදිතයින් අඩු වී නැහැ.

**කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. සී. අලවතුවල මහතා (ස.ජ.බ.)** - කොවිඩ් පාලනය සම්බන්ධයෙන් රජය ගෙන යන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් පැහැදීමක් නැහැ. කොවිඩ් පාලනය වෙනුවෙන් සිටින ඇමැතිවරියත් දැනුම් දී තිබෙනවා රට ලොක්ඩවුන් කිරීමක් සිදු විය යුතු බවට. නමුත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නේ නැහැ. අපේ පළාත්වල රෝගීන් විශාල පිරිසක් ඉන්නවා රෝහල්ගත කර නොමැතිව නිවෙස්වල. ඒ නිසා මේ රෝගීන් අසරණ වෙලා.

**රාජ්‍ය ඇමැතිනි සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය** - කොරෝනා වසංගතය කියන්නේ ගෝලීය වසංගතයක්. මෙම වයිරස් ප්‍රභේදය විටින් විට වෙනස් වෙන්නට පුළුවන්. මාරාන්තික බව වැඩි වන්නට පුළුවන් ආදී වශයෙන් විශේෂඥයන් වරින් වර ප්‍රකාශ කළා. නමුත් මේක ආණ්ඩුව විසින් ඇති කළ තත්ත්වයක් නොවෙයි. මේක ලෝක මට්ටමින් ඇති වී තිබෙන තත්ත්වයක්. විපක්ෂය නිකරුණේ චෝදනා කරන්නේ මෙම තත්ත්වය අපි ඇති කළ දෙයක් පරිද්දෙන්. පසුගිය දින කිහිපය තුළ මෙම වසංගතය ලෝක මට්ටමින්ම වැඩි වී තිබෙනවා. මේ වැඩි වීම පසුගිය සති දෙක තුළ ගෝලීයව වැඩි වී තිබෙනවා. අප්‍රේල් විසිතුන තමයි ලෝකය පුරාම ආසාදිතයින් වැඩි වුණේ. ඒ වගේම පසුගිය සති කිහිපය තුළම අග්නිදිග ආසියානු රටවල මේ වසංගතය ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත වෙලා තිබෙනවා.

**කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා (පො.ජ.පෙ.)** - කොවිඩ් රෝගය විධිමත් ලෙස වත්මන් ආණ්ඩුව කළමනාකරණය තිබෙනවා. ලෝකයේ සෑම රටක්ම සැඟවුණු සතුරෙක් සමඟ සටන් කරමින් සිටිනවා. බෙදීමකින් තොරව මේ ගෝලීය ගැටලුවට ඇතැම් රටවල් විසඳුම් සොයමින් සිටිනවා. අපේ විපක්ෂය දේශපාලනය සඳහා මේ කොවිඩ් යොදාගෙන තිබෙනවා. මේ ව්‍යසනය කළමනාකරණය වෙනුවෙන් සුවිශේෂ පහසුකම් ලබාදිය හැකි ලෙස මෙරට සෞඛ්‍ය පද්ධතිය ප්‍රතිව්‍යුහගත කළා. පහසුකම් සහිත නිරෝධායන මධ්‍යස්ථාන අපි ස්ථාපිත කළා. කොවිඩ් මර්දනය සඳහා එන්නත්කරණ වැඩපිළිවෙළ ආරම්භ කළා.

**පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මහතා (ස.ජ.බ.)** - සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, වෛද්‍යවරුන්ටත් තීරණ ගැනීමට නොදී කොවිඩ් සම්බන්ධයෙන් වෙනත් අය තීරණ ගැනීම නිවැරදි නැහැ. කොවිඩ් ප්‍රශ්නය විසඳීමට විපක්ෂය විදියට සහාය ලබා දීමට අපි සූදානම්. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කියන දේ ගණන් නොගන්නා නිසා ඒ අය අද රැකියාව අතහැරලා තිබෙනවා.

**පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස විතාරණ මහතා (පො.ජ.පෙ.)** - මහජන සෞඛ්‍ය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා ලෝකයේ දියුණු රටවල ජනතාව කොවිඩ් නිසා මරණයට පත්ව තිබෙනවා. ලෝකයේ සෙසු රටවල් සමඟ සංසන්දනය කර බලන විට ලංකාවේ රෝගී මට්ටම ගැන අපට සතුටු විය හැකියි. මේ රෝගය පාලනය කිරීම ගැන එන්නත් සම්බන්ධයෙන් ඕනෑවට වඩා විශ්වාසය තබන්න හොඳ නැහැ. රටේ ජනගහනයෙන් සියයට 80 ක්වත් එන්නත් කළොත් මේ වයිරසය වළක්වා ගන්නට හැකි වෙයි. එන්නත්වලට වඩා අපි පියවර ගත යුත්තේ සෞඛ්‍ය උපදෙස් නිසි ලෙස පිළිපැදීමටයි.

**මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා** - අපිට අභියෝගයක් තිබෙනවා. අපේ ආර්ථික වර්ධනය සියයට 3.6 කින් අඩු වුණා. තමාගේ ගෙදර සින්නක්කර වෙන විට තමයි ඒ අයට මේ බව තේරෙන්නේ. රටේ ව්‍යාපාරික කටයුතු මේ කොවිඩ් උවදුරත් සමඟ කරගෙන යාමට අපි පියවර ගත යුතු බව සිතුවා. රටේ ආර්ථික කටයුතු නොනවත්වා කරගෙන යා යුතු බවට අපි තීරණය කළා. ඒකට අභියෝග අපිට එනවා. ඒ අභියෝගය අපි තුලනය කර ගත යුතුයි. රුපියල් බිලියන 422ක් 2020දී 2019 වෙනුවෙන් ආණ්ඩුව වැය කර තිබෙනවා. නීතිමය රාමුව භාවිතා කර අපිට විරුද්ධව ඇතැම් අය නඩු පවා දමා තිබෙනවා. අපේ නම කැත කරන්න තමයි එහෙම කර තිබෙන්නේ. ඒ අය එහෙම කිරීමෙන් අපි තවත් ධෛර්යමත් වෙනවා. මේ රටේ ආර්ථිකය නැවත වරක් යහමඟට පැමිණෙනවා. රුපියල මේ වන විට ස්ථාවර වෙමින් පවතිනවා.

**පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී නිරෝෂන් පෙරේරා මහතා (ස.ජ.බ.)** - ඉන්දියාවෙන් ඇවිත් තිබෙන්නේ ඉක්මනින් පැතිර යා හැකි කොවිඩ් ප්‍රභේදයක්. කොවිඩ් පැණියක් කියලා එකක් දුන්නා. මොනවාද මේ කළේ? කර්මාන්තවල දැවැන්ත කඩා වැටීමක් තිබෙනවා. ඒවා ගොඩගැනීමට රජය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ කොරෝනා සුනාමියට ලෑස්ති වෙන්න අවශ්‍යයයි. උද්දච්ච මනසින් ඉඳලා වැඩක් නැහැ.

**(පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණියේය.)**

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී මධුර විතානගේ මහතා (පො.ජ.පෙ.)** - අපේ රටේ තිබෙන සම්පත් උපරිම ලෙස කළමනාකරණය කර ගනිමින් කොවිඩ් ගැටලුව විසඳමින් සිටිනවා. කාලයෙන් කාලයට විපක්ෂ නායකවරයා විහිළු සපයනවා. ඔහු කියන දේට රාජ්‍ය තාන්ත්‍රිකයන් හිනා වෙනවා. මොන තරම් පීඩනයක් පැමිණියත් ජනාධිපතිවරයා සුදුසු තැන දී සුදුසු තීරණය ගන්නවා. ලේ පිපාසාවෙන් තමයි විපක්ෂය උදේ ඉඳලා රෑ වෙනකන් කතා කරන්නේ. අද විපක්ෂය තමන්ගේ කතාවලින් ඔප්පු කර හමාරයි අනාගතයේදීත් ජනතාවගේ විශ්වාසය දිනා ගත නොහැකි බවට. විවිධ ජාවාරම්කරුවන්ගේ පැත්තේ තමයි මේ විපක්ෂය හිටගෙන සිටින්නේ. කොවිඩ් අර්බුදය පටන්ගත් දා සිට විපක්ෂය අරමුණු කළේ ජනතාවගේ මිනී උඩින් ඔවුන්ගේ දේශපාලනය කරන්නයි.

**පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත බණ්ඩාර මහතා (පො.ජ.පෙ.)** - එන්නත් ලබාදීමේ ක්‍රමවේදය නිසි ලෙස අපි සිදු කරමින් සිටිනවා. මේ වයිරසය පැතිරීම වැළැක්වීම සම්බන්ධයෙන් අපි වැඩිපුරම අවධානය යොමු කළ යුතුයි. මාධ්‍ය ඒ වගකීම ඉටු කරමින් සිටිනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත විය යුතුයි. රටේ පුරවැසියන් විදියට මේ වගකීම බාරගෙන කටයුතු කළොත් මේ වයිරසය තවදුරටත් ව්‍යාප්ත වීම වළක්වා ගත හැකියි. අපේ ප්‍රදේශවලට ගැළපෙන වැඩපිළිවෙළක් අපි ක්‍රියාත්මක කළ යුතුයි. ජාතික මට්ටමෙන් චක්‍රලේඛ නිකුත් කරන තෙක් සිටින්න අවශ්‍ය නැහැ. ආයුර්වේද ක්‍රම ද මේ උවදුර මර්දනයට අපි යොදා ගත යුතුයි. කොවිඩ් අරමුදලේ මුදල්වලට මොකද කළේ කියලා විපක්ෂය අහනවා.

**දේශීය වෙදකම ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි මහතා** - පාරම්පරික මුතුන්මිත්තන් අනුගමනය කළ ජීවන ක්‍රියාවලිය නැවත අනුගමනය කරන්න කියන පණිවිඩය තමයි ස්වභාව ධර්මයෙන් කියන්නේ. මඤ්ඤොක්කා අල, කොමඩු ගෙඩි ඇතුළු පළතුරුවලටත් වසවිස දානවා. පළිබෝධනාශකවලින් තොර රටක් ඇති කළ යුතුයි. උදේ පාන්දර හතරට පහට අවදි විය යුතුයි. එය බ්‍රහ්මමූර්තිය විදියට හඳුන්වනවා. ඒ වෙලාවට අවදිවීමෙන් ස්වසන පද්ධතිය හොඳින් ක්‍රියාත්මක වෙනවා. හිස් බඩ වතුර උගුරු 21ක් බොන්න. වතුරවලින් සිරුර සෝදාගන්න කියන කාරණාවේ වැරැද්ද මොකක් ද? ආයුර්වේදයේ ඒ උපදෙස් දෙනවා. ශාරීරික ව්‍යායාම හොඳින් කරන්න. සරල ජීවන චක්‍රයකට එන්න. තරගකාරී ජීවන රටාවෙන් ටිකකට හෝ මිදෙන්න. මේ දේවල්වලට විරුද්ධ වෙන්න පුළුවන් කාටද? උපාධිධාරී වෛද්‍යවරුන් අපට සිටිනවා. 118ක් ආයුර්වේද රෝහල් තිබෙනවා. 5072ක් ඇඳන් ආයුර්වේද රෝහල්වල තිබෙනවා. පාරම්පරික හා ආයුර්වේද වෛද්‍යවරුන් 1022ක් සිටිනවා. සමස්ත ආයුර්වේද වෛද්‍යවරුන් 2296ක් සිටිනවා. සුවධරණී ඔසු පානය අපි හඳුන්වා දුන්නා. කොවිඩ් පොකුරු මර්දනය කරන්න මේ පානය අපි භාවිතා කළා.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී සමන්ප්‍රිය හේරත් මහතා (පො.ජ.පෙ.)** - සෞඛ්‍ය ඇමැතිවරිය මේ රෝගය සම්බන්ධයෙන් හොඳටම දන්නා ඇමැතිවරියක්. ඇය මේ කොවිඩ් මර්දන කර්තව්‍යය වෙනුවෙන් උපරිමයෙන් උර දෙනවා. කුලියාපිටියෙන් අද රෝගීන් 600ක් වාර්තා වෙනවා. ආණ්ඩුවට මොන තරම් බාධක තිබුණත් නිරෝධායනය වන නිවෙස්වලට රුපියල් 10000 ක බඩු මල්ලක් ගිහිං දෙනවා. කරන්න පුළුවන් වැඩක් ද එය. නමුත් ආණ්ඩුව කරනවා. මේ රෝගය ආරම්භ වූ රට තමයි චීනය. නමුත් අද රෝගය පාලනය කර තිබෙනවා. දිනකට කිහිප වතාවක් දුම් අල්ලනවා. ඒ වගේම දිනකට හය වතාවක් උණුසුම් පානයක් ගන්නවා. ඒ වගේ දේවල් අපටත් කරන්න පුළුවන්.

**පාර්ලිමේන්තු මන්ත්‍රී ශානක්‍යයන් මහතා (දෙ.ජා.ස.)** - කොවිඩ් දෙවැනි රැල්ල ඔක්තෝබර් මාසයේ ඇති වුණා. ඒක පාලනය කරන්න පෙර 20 වැනි සංශෝධනය ගෙනාවා. තුන්වැනි රැල්ලට කියන්නේ පෝට් සිටි රැල්ල කියලා. ආණ්ඩුවේ සංවර්ධන වැඩ ගැන දැන් කතා කරනවා. ඒවා කතා කරන්න පෙර කොවිඩ් මර්දනය කරන්න අවශ්‍ය වෙනවා.

**පාර්ලිමේන්තුව ඊයේ (05) පෙරවරු 10.00ට යළි රැස්විය.**

**රටේ සංචරණ සීමා පැනවීම ගැන තීන්දු තීරණ ගන්නේ දේශපාලන බලධාරීන්**



විජිත හේරත් (ජා.ජ.බ)

**අප මේ වන විට 925,000ක් එන්නත්කරණයට ලක් කර තිබෙනවා**



රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර

**අපේ රටේ විපක්ෂයට හැදිලා තියෙන රෝගයට කිසි දවසක බෙහෙත් හොයාගන්න බැහැ**



ඇමැති රෝහිත අබේගුණවර්ධන

# කුරුණෑගල, මත්තල, ලුණුගම්වෙහෙර සහ බෙලිඅත්ත නවීන නගර ලෙස සංවර්ධනය කිරීමට යයි

## අගමැතිගෙන් අදාළ නිලධාරීන්ට උපදෙස්



කුරුණෑගල, මත්තල, ලුණුගම්වෙහෙර සහ බෙලිඅත්ත නවීන නගර ලෙස සංවර්ධනය කිරීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා අදාළ නිලධාරීන්ට උපදෙස් දෙයි.

කුරුණෑගල, මත්තල, ලුණුගම්වෙහෙර සහ බෙලිඅත්ත නගර අංග සම්පූර්ණ නවීන නගර ලෙස සංවර්ධනය කිරීම සඳහා වන සාකච්ඡාවක් අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේ පිහිටි අගමැති කාර්යාලයේදී ඊයේ (05) පෙරවරුවේ පැවැත්විණි.

මේ නගර නවීන නගර ලෙස සංවර්ධනය කිරීමේ සැලසුම් පිළිබඳ අවධානය යොමු කළ අගමැති මහින්ද රාජපක්ෂ මහතා, විෂය භාර අමාත්‍යවරයා වශයෙන් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ අමාත්‍යාංශ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් දුන්නේය.

නවීන වෙළෙඳ සංකීර්ණයක්, සියලු පහසුකම් සහිත තොග වෙළෙඳපොළ සහ සතිපොළ, රථවාහන අංගණයක්, නගර උද්‍යාන, නව බස් නැවතුම්පොළ, බහුකාර්ය ගොඩනැගිල්ලක් මෙන්ම මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණයකින් සමන්විතව බෙලිඅත්ත නගරය සංවර්ධනය කෙරෙන ආකාරය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිලධාරින් විසින් මෙහි දී පැහැදිලි කරන ලදි.

ද්විත්ව මංතීරු සහිත මාර්ග පද්ධතිය, පිටත සහ ඇතුළත වටරවුම් මාර්ගය මෙන්ම මංතීරු හතරකින් යුතුව මාර්ග පද්ධතිය ඉදිකිරීම පිළිබඳව ද මෙහිදි අවධානය යොමු කෙරිණි.

මත්තල ගුවන්තොටුපළ කේන්ද්‍ර කර ගනිමින් වෙළෙඳ, කර්මාන්ත, නේවාසික පහසුකම්, සංචාරක, සෞඛ්‍ය පහසුකම් මෙන්ම කෘෂි ප්‍රවර්ධන කලාප ඇති කිරීම සහ මත්තල-ලුණුගම්වෙහෙර ආශ්‍රිත ප්‍රදේශයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවත් මෙහි දී අගමැතිවරයා අවධානය යොමු කළේය.

කුරුණෑගල නගරය නවීන නගරයක් ලෙස නිර්මාණය කිරීමත් ඊට අදාළ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවත් මෙහි දී අගමැතිවරයා විමසා සිටියේය. ඒ අනුව සංවර්ධන ව්‍යාපෘති රැසක් කුරුණෑගල නගරය කේන්ද්‍ර කරගනිමින් ඉදිරියේදී ක්‍රියාත්මක වනු ඇත.

ඇමතිවරුන් වන ජෝන්ස්ටන් ප්‍රනාන්දු, නාමල් රාජපක්ෂ, පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහත්ම මහත්මීහු සහ අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් රණවීර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් ආනන්ද සමරසිංහ මහත්වරු මේ අවස්ථාවට සහභාගි වූහ.

# කොවිඩ් මර්දනයට වෙන් කරන මුදල් වෙන කිසිම ව්‍යාපෘතියකට යොදා ගන්නේ නෑ

## ඇමැති නාමල් රාජපක්ෂ

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් මර්දනයට වෙන් කරන මුදල් වෙන කිසිම ව්‍යාපෘතියකට යොදවා නොමැති බවත් කොවිඩ් සඳහා අවශ්‍ය සියලු මුදල් අමාත්‍යාංශය විසින් දෙන බවත් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (05) ප්‍රකාශ කළේය.

කොවිඩ් 19 වසංගතය මර්දනය කිරීම වෙනුවෙන් ගතහැකි සියලු ක්‍රියාමාර්ග රජය විසින් ගන්නා බවත් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සිදුකරන ශරිර සුවතා මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා කොවිඩ් අරමුදලේ මුදල් වෙන්කර නොමැති බවද ඇමැතිවරයා පැවසීය.

ඇමැති නාමල් රාජපක්ෂ මහතා මේ බව සඳහන් කළේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා මතු කරන ලද කරුණකට පිළිතුරු දෙමිනි.

එහිදි වැඩිදුරටත් නාමල් රාජපක්ෂ මහතා සඳහන් කළේ ශරිර සුවතා මධ්‍යස්ථාන ඇති කිරීමට මුදල් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත්තේ 2021 වසර සඳහා අයවැය මගින් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වෙන්කර ඇති මුදල් බවයි. එබැවින් මේ සම්බන්ධයෙන් වැරදි මතවාදයක් සමාජගත කිරීමට කටයුතු නොකරන ලෙසත් කොවිඩ් වසංගත තත්ත්වය සඳහා අවශ්‍ය සියලු මුදල් වෙන්කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය කටයුතු කරන බවත් වැඩිදුරටත් පැවසිය.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා-

ජනතාවගේ ශරීර සුවතාව වර්ධනය කිරීමට ශරීර සුවතා මධ්‍යස්ථාන ඇති කිරීමට කැබිනට් අනුමැතිය හිමිව ඇති බව මාධ්‍ය වාර්තා කර තිබුණා. ඒ මිලියන හයසියයක මුදලක් වෙන්කර ඇති බවටයි. එය අගය කළ යුතුයි. ඒ වගේම එය සැබැවින්ම සිදුකළ යුත්තක්. නමුත් මේ වෙලාවේ කොරෝනා වසංගත තත්ත්වයක් තිබෙනවා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කිරීම ද සිදුවිය යුතුයි. ඒ නිසා මෙහිදි ප්‍රමුඛතාව හඳුනාගත යුතුයි.

**ඇමැති නාමල් රාජපක්ෂ මහතා-**

මිලියන හයසියයක මුදලක් ජිම් හදන්න වෙන් කර තිබෙන බව විපක්ෂ නායකතුමා සඳහන් කළා. විපක්ෂ නායකතුමනි පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. එම මුදල කොවිඩ් අරමුදලින්වත්, කොවිඩ් සඳහා වෙන්කළ මුදල්වලින්වත් වෙන්කර නැහැ. පැහැදිලිව අයවැය ලේඛනයේ සඳහන් මුදල්වලට අනුව අයවැය මගින් වෙන් කරන ලද මුදල්වලින් සිදුකරන ක්‍රියාවලියක් ඒක . ඊට අදාළ කැබිනට් පත්‍රයක් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වගේම තවත් කරුණක් සඳහන් කළ යුතුයි. මේ වෙලාවේ කරන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පමණයි. ඒ වගේම කොවිඩ් සඳහා අවශ්‍ය සියලු මුදල් ලබාදීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි කොවිඩ් සඳහා වෙන් කරන මුදල් කිසිසේත් කප්පාදු කර වෙනත් ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමක් සිදුකරන්නේ නැහැ. ඒ බව වගකීමෙන් යුතුව සඳහන් කළ යුතුයි.

# ගමේ ප්‍රශ්න-ආරවුල් විසඳන්න වසමට පොලිස් නිලධාරියෙක්



නව රාජ්‍ය අමාත්‍යාංශයේ රාජකාරි අරඹමින් රාජ්‍ය ඇමැති දිලුම් කියයි

**සුභාෂිණී සේනානායක**

ග්‍රාම සේවා වසම් කේන්ද්‍ර කරගනිමින් පොලිස් නිලධාරීන් බඳවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව ප්‍රවාහන, ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා ඊයේ (05) පැවැසීය.

ග්‍රාම සේවා වසම්වලට වැඩි පොලිස් නිලධාරීන් පිරිසක් යොමු කිරීමට අවධානය යොමු කර ඇති බවත් ඒ අනුව ගම කේන්ද්‍ර කරගනිමින් පොලිස් නිලධාරීන් ඉදිරියේදී බඳවා ගන්නා බවත් සුහුරුපායේ පිහිටි නව රාජ්‍ය අමාත්‍යාංශයේදී රාජකාරී ආරම්භ කරමින් රාජ්‍ය ඇමැතිවරයා කියා සිටියේය.

ගමක ඇතිවන ආරවුලක් සුළු පැමිණිලි පොලිස් පොතේ ලියා උසාවි ඇමීම වෙනුවට එම වසමට යොමු කරන නිලධාරියා ගමේ ප්‍රශ්න විමසීමේ ක්‍රමයක් හඳුන්වා දෙන බව පැවසූ අමුණුගම මහතා එය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අරමුණ බවත් කියා සිටියේය.

පොලිස් බල ප්‍රදේශවල සීමාව අඩු කිරීමටද ජනාධිපතිවරයාගේ අපේක්ෂා කරන බවත් ගම තුළ ඇති වන ප්‍රශ්න රැගෙන පොලිසියට පැමිණෙනවා වෙනුවට පොලිස් ස්ථානාධිපතිවරයා ගම සමඟ සබඳතා වැඩ කරගනිමින් කටයුතු කිරීමට වගබලාගතයුතු බවත් දිලුම් අමුණුගම මහතා මෙහිදී අවධාරණය කළේය.

ගමකට එක් පොලිස් නිලධාරියකු ලෙස පත්කළ විට එම නිලධාරියා ග්‍රාම නිලධාරිවරයා, සමෘද්ධි නිලධාරීවරයා ඇතුළු අනෙක් නිලධාරීන් සමඟ එක්ව ගමේ ප්‍රශ්න විසඳීමට පියවර ගත යුතු බව හෙතෙම කීවේය.

මහජන ආරක්ෂාව පිළිබඳ ඇමැති සරත් වීරසේකර, තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති තේනුක විදානගමගේ, පාර්ලිමේන්තු මන්ත්‍රී තිලක් රාජපක්ෂ මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# මල් වගාකරුවන්ගේ මූල්‍ය හා අලෙවිකරණ පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළක්

**මහින්ද අලුත්ගෙදර**

රටපුරා විසිරී සිටින මල් වගාකරුවන්ගේ මූල්‍ය හා අලෙවිකරණ පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට රජය තීරණය කරයි.

සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දෙන්නේ සිය උපදෙස් පරිදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව එය ක්‍රියාත්මක කරන බවයි.

මේ යටතේ මල් වගාවේ යෙදී සිටින ගොවීන් සංවිධාන ගත කිරීම, සංවිධාන ගත වූ මල් වගාකරුවන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම, උසස් තත්ත්වයේ රෝපන ද්‍රව්‍ය, වගා කටයුතු සඳහා අවශ්‍ය උසස් තත්ත්වයේ ආනයනය කළ මල් පැළ හා යටිතල පහසුකම් සැපයීම හා මල් වගාකරුවන් සඳහා වෙළෙඳපොළ සම්බන්ධතා ඇතිකර දීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව මල් වගාව පිළිබඳව දැනුම හා කුසලතා වැඩිදියුණු කරමින් වගා කරුවන් සවිබල ගැන්වීමට පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.

www.nlb.lk
NLB
දිනය 2021.05.04 අඟහරුවාදා නිල ප්‍රතිඵල

මහජන සම්පත
දිනුම් වාරය : 4471
දිනා ඇති මුළු මුදල
රු. 11,681,620.00
ජයග්‍රාහී අක්ෂරය U
ජයග්‍රාහී අංක 1 8 5 3 8 3
මීළඟ දිනුම් වාරයේ සුපිරි තෑග්ග
රු. 14,391,638.60

ගොවි සෙත
Govisetha
දිනුම් වාරය : 2766
දිනා ඇති මුළු මුදල
රු. 6,050,560.00
ඉංග්‍රීසි අක්ෂරය G
ජයග්‍රාහී අංක 09 11 70 71
මීළඟ දිනුම් වාරයේ සුපිරි තෑග්ග
රු. 70,195,648.80

Mega POWER 10
දිනුම් වාරය : 828
දිනා ඇති මුළු මුදල
රු. 2,550,920.00
මීළඟ මෙගා සුපිරි තෑග්ග
රු. 132,111,127.60
මීළඟ පවර් සුපිරි තෑග්ග
රු. 10,000,000.00
ඉංග්‍රීසි අකුර B
සුපිරි අංකය 13
ජයග්‍රාහී අංක 05 08 52 78
රු. 10,000,000.00

ධන නිධානය
දිනුම් වාරය : 508
දිනා ඇති මුළු මුදල
රු. 2,825,280.00
ඉංග්‍රීසි අක්ෂරය X
ජයග්‍රාහී අංක 10 39 48 74
මීළඟ දිනුම් වාරයේ සුපිරි තෑග්ග
රු. 96,234,672.00

සුපිරි වාසනා
දිනුම් වාරය 1595
දිනා ඇති මුළු මුදල රු. 2,256,120.00
සුපිරි අංකය 05
ජයග්‍රාහී අංක 08 20 24 28
මීළඟ දිනුම් වාරයේ සුපිරි තෑග්ග
රු. 3,335,443.60

2021.05.04 568,305
රු. 25,364,500.00
රු. 2,000,000.00 02 රු. 1,000,000.00 01 රු. 100,000.00 22
අංක 32, ... කොළඹ 01.
දුරකථන: 011-4607000, 011-4607001-2
ෆැක්ස්: 011-4669475

තලපත්පිටිය
222/3, පන්සල පාර, නුගේගොඩ, මහරගම.



ශ්‍රී ජයවර්ධනපුර රෝහල ආසන්නයේ
පදිංචියට සූදානම්
අධිවේගී පිවිසුමට ආසන්න
නුගේගොඩ මහරගම තලවතුගොඩ නගරාසන්න
මාදිවෙල ඇවිදීමේ මංතීරු පහසුකම් සමගින්
නිදන කාමර 4 සහ 5
දෙමහල්/ තෙමහල් නිවසක්
A - කාණ්ඩයේ නිවසක් මිලි. 22 සිට
B - කාණ්ඩයේ නිවසක් මිලි. 16.5 සිට
C - කාණ්ඩයේ නිවසක් මිලි. 18 සිට
සී/ස රාජ්‍ය සේවා සමුපකාර ඉතිරිකිරීමේ හා ණය දීමේ සමිතිය
19, සෝන්ඩර්ස් පෙදෙස, කොළඹ 12
0717-931533/ 0778-207859/ 0112-327643
මිල ගණන් ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍ර රු. 5,000/- ගෙවා සමිති කාර්යාලයෙන් ලබාගත හැක.
ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය 2021.05.19

# මෝදිගේ අනාගතයට අභියෝග කළ ප්‍රාන්ත මැතිවරණය





තමිල්නාඩු ස්ටාලින්



බටහිර බෙංගාලය බෙනර්ජි



කේරල විජයන්



ඇසෑම් සොනෝවාල්



පුදුචෙරි රංගස්වාමි

**කොවිඩ් වසංගතයේ තුන්වැනි රැල්ල අතිශය දරුණු අන්දමට ඉන්දියාව වෙළාගනිමින් තිබෙන අවස්ථාවක ප්‍රාන්ත මැතිවරණ මඟින් සිය ජනප්‍රියත්වය සොයා ගිය මෝදිට කොවිඩ් රැල්ලට වඩා දැඩි අභියෝගයකට මුහුණ පෑමට සිදුවී ඇත. ඔක්සිජන් ඌනතාවෙන් ජනතාව මහමඟ මියයමින් සිටියදී රට ආගාධයකට තල්ලු කිරීමට මෝදි කටයුතු කරමින් සිටින බවට ඉන්දීය කොංග්‍රසය ඇතුළු විරුද්ධ පක්ෂ ගෙන ගිය මෝදි විරෝධි රැල්ල යථාර්ථයක් බවට පත් වෙමින් තිබේ.**

කොවිඩ් වසංගතයේ තුන්වැනි රැල්ල ලොව කිසිදු රටකට වඩා වැඩි බලපෑමක් එල්ල කරමින් සිටින්නේ ඉන්දියාවටය. දෛනික කොවිඩ් ආසාදිතයන් ලක්ෂ 3කට වඩා සහ මරණ තුන්දහසකට අධික ප්‍රමාණයක් වාර්තා වෙමින් පවතින පසුබිමකදී කිසිදු චකිතයකින් තොරව ප්‍රාන්ත 5ක මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට සහභාගි වූ අගමැති නරේන්ද්‍ර මෝදි සිය ජනප්‍රියත්වය උරගා බැලීමට යෑමේ ප්‍රතිඵලය දැන් නිකුත් වී තිබේ.

මුළු ප්‍රාන්ත 5න්ම මෝදිගේ භාරතීය ජනතා පක්ෂයට දිනා ගත හැකිවූයේ අසෑම් ප්‍රාන්තය පමණි. ඔහු වැඩි බලාපොරොත්තු තබමින් වැඩි බරක් දැමූ බටහිර බෙංගාල ප්‍රාන්තයේ හිටපු ප්‍රධාන ඇමැතිනි මමතා බෙනර්ජීගේ ආධිපත්‍යය බිඳ දැමීමට නොහැකි විය. කවදත් කරුණානිධිගේ සහ ජයලලිතාගේ පක්ෂ අතර දෝලනය වූ තමිල්නාඩුවේ මැතිවරණයේදී භාරතීය ජනතා පක්ෂයට පක්ෂපාතී ඕල් ඉන්ඩියා අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් පක්ෂය (ජයලලිතා) මෙවර මැතිවරණ දෙකකට පසු පරාජයට පත්වූයේ ගාන්ධි පාර්ශ්වයට පක්ෂපාතී ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් (කරුණානිධි) පක්ෂයට ජය අත්කර දෙමිනි.

පසුගිය වසරේ ඉන්දීය මහමැතිවරණයේදී රාහුල් ගාන්ධි තරග වැදුණු කේරල ප්‍රාන්තයේ බලය තහවුරු කරගනු ලැබුවේ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය විසිනි. ආසන 30කින් සමන්විත කුඩා ප්‍රාන්තයක් වන පුදුචෙරි ප්‍රාන්තයේ බලය අත්කර ගත්තේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය සමඟ එක්ව තරග වැදුණු ඕල් ඉන්ඩියා එන්. රාගස්වාමි කොන්ග්‍රසයි. භාරතීය ජනතා පක්ෂයත් ඇතුළත් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයට හිමි වූයේ ආසන 6ක් පමණයි.

අගමැති මෝදිගේ ප්‍රතිවාදී පක්ෂ සහ දේශපාලන විශ්ලේෂකයන්ගේ දැඩි විවේචන මැද පැවැති මේ ප්‍රාන්ත මැතිවරණය අගමැති මෝදිගේ අනාගතයට දැඩි බලපෑමක් එල්ල වූ තීරණාත්මක මැතිවරණයක් බවට පත්වූයේ එලෙසිනි.

කොවිඩ් වසංගතයේ තුන්වැනි රැල්ල අතිශය දරුණු අන්දමට ඉන්දියාව වෙළාගනිමින් තිබෙන අවස්ථාවක ප්‍රාන්ත මැතිවරණ තුළින් සිය ජනප්‍රියත්වය සොයා ගිය මෝදිට කොවිඩ රැල්ලට වඩා දැඩි අභියෝගයකට මුහුණ පෑමට සිදුවී ඇත.

ඔක්සිජන් ඌනතාවෙන් ජනතාව මහ මග මිය යමින් සිටියදී රට ආගාධයකට තල්ලු කිරිමට මෝදි කටයුතු කරමින් සිටින බවට ඉන්දීය කොන්ග්‍රසය ඇතුළු විරුද්ධ පක්ෂ ගෙන ගිය මෝදි විරෝධි රැල්ල යථාර්ථයක් බවට පත්වෙමින් තිබේ.

## බටහිර බෙංගාලයේ බලාපොරොත්තු බිඳ වැටෙයි

මෙවර ප්‍රාන්ත මැතිවරණයේදී මෝදිගේ ජනප්‍රියත්වය බින්දුවට ඇද වැටුණේ බටහිර බෙංගාලයේ මැතිවරණයේදීය. හිටපු මහ ඇමැතිනි මමතා බෙනර්ජීට තුන්වැනි වරටත් මහ ඇමැති ධුරය අත්කර දෙමින් මැතිවරණය නිමාවට පත්වූ අතර, එය ඉන්දියාව පුරා මෝදි විරෝධි රැල්ලක් හමා යෑමේ ප්‍රබලතම සාධකය බවට පත් වී තිබේ.

මෝදි ප්‍රමුඛ වත්මන් භාරතීය ජනතා පක්ෂයට පසුගිය වසරේ මහමැතිවරණයේදී බටහිර බෙංගාලයෙන් දිනාගත හැකි වූයේ ආසන 18ක් පමණි. කවදත් මමතා බෙනර්ජීගේ බළකොටුවක් වන බටහිර බෙංගාලයේ මහමැතිවරණයෙන් ඇගේ ඕල් ඉන්ඩියා ට්‍රිනාමුල් කොන්ග්‍රසය ආසන 22ක් දිනා ගත්තේය. එබැවින් මෙවර එම ප්‍රාන්ත මැතිවරණයේදී මෝදිගේ අදහස වූයේ අනාගත ඉලක්කය සපුරාලීමට නම් බෙනර්ජීගේ ආධිපත්‍යය බිඳ දැමීය යුතු බවය.

ඒ වෙනුවෙන් මෝදි වැඩි උනන්දුවක් හා උද්යෝගයක් පෙන්නුම් කළ අතර, කොවිඩ් වසංගතයෙන් රට දරුණු ප්‍රපාතයකට ඇද වැටෙමින් තිබෙන පසුබිමක වූවත් සිය පක්ෂයේ ජයග්‍රහණයට උර දී එම ප්‍රාන්තයේ පමණක් ප්‍රචාරක රැලි දුසිම් ගණනකට අගමැතිවරයා පෞද්ගලිකව සහභාගි විය.

අගමැතිවරයා මෙවැනි පියවරක් අනුගමනය කරන්නට වූයේ ප්‍රාන්ත මැතිවරණ සමයේදී කොවිඩ් ව්‍යාප්තිය තවත් ඉහළ යනු ඇතැයි එරට සෞඛ්‍ය අංශ අනතුරු අඟවා තිබූ මොහොතකදීය. ඉන්දියාවේ ප්‍රකට තීරු ලිපි රචිකාවක වන ශෝබනා සිය නවතම තීරු ලිපියෙන් පෙන්වා දුන්නේ ‘අද බෙංගාලයේ සිදු වූ දේ හෙට සමස්ත ඉන්දියාවේ සිදුවෙයි‘ කියාය.

‘මේ මැතිවරණ ප්‍රතිඵලය අතිශය අනතුරුදායක බවට මත පළවන භාරතීය ජනතා පක්ෂයට එරෙහිව සටන් වැදීමට අවශ්‍ය සැමට බලාපොරොත්තුවක් සහ හඬක් දුන්නා‘ යැයි බෙංගාල ප්‍රාන්තයේ බෙනර්ජීවාදි දේශපාලන විශ්ලේෂකයකු කියා සිටියේය.

මේ අතර මහාරාෂ්ට්‍ර බටහිර ප්‍රාන්තයේ බලයේ රැඳී සිටින ශිව් සේනා පක්ෂය ද මෝදි විරෝධතා රැල්ලක් අරඹා ඇති අතර, මැතිවරණය වෙනුවෙන් රටේ සෞඛ්‍ය තත්ත්වය පහළට ඇද දැමූ මෝදිගේ පෞද්ගලික පරාජයක් බව පෙන්වා දී ඇත.

‘කොවිඩ් වසංගතයේ ව්‍යාප්තිය වෙනුවෙන් සටන් කිරීම වෙනුවට මෝදි ඇතුළු මධ්‍යම රජය මමතා බෙනර්ජී පරාජය කිරීමට බටහිර බෙංගාලයේ සැරි සරමින් සිටියා‘ ශිව් සේනා පක්ෂය චෝදනා එල්ල කළේ එලෙසිනි.

## තමිල්නාඩු බලය කරුණානිධිගේ පක්ෂයට

මෙවර ප්‍රාන්ත මැතිවරණයේදි කාගෙත් අවධානයට ලක් වූ ප්‍රාන්තය වූයේ තමිල්නාඩු ප්‍රාන්තයයි. දශක ගණනාවක් පුරා කරුණානිධිගේ ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් පක්ෂය සහ එම්ජීආර්ගේ අභාවයෙන් පසු ජයලලිතාගේ නායකත්වයට නතු වූ ඕල් ඉන්ඩියා අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් පක්ෂය අතර දෝලනය වන තමිල්නාඩුවේ බලය පසුගිය මැතිවරණ දෙකකදීම හිමිවූයේ ජයලලිතාගේ පක්ෂයටය. මෙවර දෙපාර්ශ්වයම මැතිවරණයට එක් වූයේ දේවත්වයෙන් පිදුම් ලැබූ මේ දෙදෙනාගේ අභාවයෙන් පසුවය.

කරුණානිධිගේ පක්ෂය ඉන්දීය කොන්ග්‍රසයට හිතවාදී වන අතර, ජයලලිතාගේ පක්ෂය භාරතීය ජනතා පක්ෂයට හිතවාදී විය. මෙවර මෝදි හිතවාදී ජයලලිතා පක්ෂය පරාජය කරමින් බලය අත්කර ගත්තේ ගාන්ධි හිතවාදී කරුණානිධිගේ පක්ෂයයි. ඒ අනුව තමිල්නාඩු ප්‍රාන්තයෙන් ද මෝදිගේ ජනප්‍රියත්වය අතිශය දරුණු ලෙස පහත වැටී තිබේ.



කමල් හසන්

## කමල් හසන්ට අන්ත පරාජයක්

දශක ගණනාවක් පුරා දකුණු ඉන්දීය සිනමාවේ අතිශය ජනප්‍රියත්වය පත්ව සිටි සිනමා නළුවකු වන කමල් හසන් දේශපාලන ප්‍රවාහයට එක් වූයේ මෙවර තමිල්නාඩු මැතිවරණයෙනි. ඔහු මක්කල් නීදි මයියම් නමින් දේශපාලන පක්ෂයක් බිහි කරමින් තමිල්නාඩුවේ මහ ඇමැති සිහිනය දකින්නට වූයේ මීට වසර දෙකකට පෙර සිටය. බැටරි කෑලි හයේ විදුලි පන්දමක් සිය පක්ෂයේ ලකුණ බවට පත් කරගත් මේ අහංකාර නළුවා සිය ප්‍රචාරක රැස්වීම්වලදී එම විදුලි පන්දම දල්වමින් වෙනම සන්දර්ශනයක නිරත වූ අතර, අවසානයේ ඔහු තරග කළ කොයිම්බතූර් පළාතෙන් අන්ත පරාජයට පත් විය. ඔහු පරාජයට පත් වූයේ පසුගිය මැතිවරණයේදිත් කොයිම්බතූර් පළාත ජයගත් නීතිඥවරියක වන භාරතීය ජනතා පක්ෂයේ හිතවාදිනියක වූ වානතී ශ්‍රීනිවාසන් හමුවේය.



## කේරලයේ තිබ්බ අසුනත් නෑ

කවදත් කොමියුනිස්ට් පසුබිමක් ඇති කේරලයේ මෙවර බලය අත්කර ගනු ලැබුවේ ද හිටපු පාලක පක්ෂය වූ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය ප්‍රමුඛ වාමාංශික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණය. සන්ධානයක් පිට පිට දෙවතාවක් කේරලයේ බලය හිමි කර ගැනීමේ වාර්තාව ද එසේ බිහි විය. මීට පෙර පැවැති මැතිවරණයේදී ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය හා එක්ව තරග කළ මෝදිගේ භාරතීය ජනතා පක්ෂය එක් අසුනක් දිනා ගත් අතර, මෙවර මැතිවරණයේදී ඔහුට ඒ අසුනත් අහිමි වූයේ ‘මෝදි සමඟ නව කේරලයක්‘ නමින් ගෙන ගිය ප්‍රචාරක රැල්ල එහෙම පිටින්ම ඉවතට තල්ලු කරමිනි.

කේරලයේ ගාන්ධි හිතවාදීන් බහුලව සිටින අතර, පසුගිය මහමැතිවරණයේදී රාහුල් ගාන්ධි ලෝක් සභාවට පත් වූයේ ද කේරලයේ වයනාත් පළාතේ අසුන ජයගනිමිනි. ඉන්දීය කොන්ග්‍රසයට සහාය පළ කරන එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ ආසන 41ක් ජය ගත්තේය.

කේරලයේ මෝදි විරෝධතාව අතිශය දරුණු වී ඇති අතර, මහ ඇමැති පිනරායි විජයන් පෙරේදා ප්‍රකාශ කළේ භාරතීය ජනතා පක්ෂය ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදය අලෙවියට දැමූ බවය.

## පුදුචෙරි පළාතෙන් අස්වැසිල්ලක්

ආසන 30කින් සමන්විත කුඩා පළාතක් වන පුදුචෙරි ප්‍රාදේශීය මැතිවරණයෙන් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය හා එක් වූ භාරතීය ජනතා පක්ෂයට හිතවාදී ඕල් ඉන්ඩියා එන්. රාගස්වරම් කොන්ග්‍රසය ජයගත් අතර, එක්සත් ප්‍රගතිශීලී සන්ධානය හා එක්ව තරග වැදුණු ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් පක්ෂයට ආසන 6ක් දිනාගත හැකිවිය.

ඒ අනුව පුදුචෙරි ප්‍රාන්තයේ සිය පක්ෂයට හිතවාදී රජයක් බිහිවීම භාරතීය ජනතා පක්ෂයට යම් අස්වැසිල්ලක් වනු ඇත. පසුගිය මැතිවරණයේදී ඉදිරියට පැමිණ සිටි කොන්ග්‍රසයට මෙවර දැඩි පසුබෑමකට ලක්වීම කැපී පෙනේ.

## භාරතීය ජනතා පක්ෂය ඇසෑම් බලය රැක ගනී

ආසන 126කින් සමන්විත ඇසෑම් ප්‍රාන්ත මැතිවරණයේදී ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය හා එක්ව භාරතීය ජනතා පක්ෂයට සිය බලය යළි තහවුරු කරගත්තේය. දීර්ඝ කාලයක් පුරා කොංග්‍රසයට නතුවී තිබූ ඇසෑම් ප්‍රාන්තයේ බලය 2016 දී උදුරා ගැනීමට සමත් වූ භාරතීය ජනතා පක්ෂය මෙවර ආසන 75ක බලය තහවුරු කරගත්තේය. භාරතීය ජනතා පක්ෂයට අභියෝග කළ කොන්ග්‍රසය ආසන 48ක් දිනා ගත්තේය.

අසෑම් ප්‍රාන්තයේ බලය රැක ගැනීමට හැකිවීම භාරතීය ජනතා පක්ෂයට වැඩි සතුටක් නොදැනුණු ජයග්‍රහණයක් බවට පත් වී ඇත්තේ බලාපොරොත්තු රැසක් ගොඩනගා සිටි බටහිර බෙංගාල ප්‍රාන්තයේ බෙනර්ජී ආධිපත්‍යය බිඳ දැමීමට අසමත්වීමේ කනගාටුව හේතුවෙන් බව ඇතැම් දේශපාලන විශ්ලේෂකයෝ පෙන්වා දෙති.

සමස්තයක් ලෙස ගත් විය මේ ප්‍රාන්ත මැතිවරණය නිමාවට පත් වූයේ මෝදිට ඉදිරියේදී මුහුණ දීමට අභියෝග රැසක් ඉතිරි කරමිනි. එය කොවිඩ් තුන්වැනි රැල්ල සාර්ථකව මැඩපැවැත්වීමේ අභියෝගයට වඩා බරපතළ වනු නිසැකය.



**ෆවුස් මොහොමඩ්**

sports.dinamina@lakehouse.lk

# ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් පිලේ ජ්‍යෙෂ්ඨ ක්‍රීඩිකාවකට කොවිඩ්

## වයිරසය ආසාදනය වූයේ අවුරුදු නිවාඩු සමයේදී

**ෆවුස් මොහොමඩ්**

ශ්‍රී ලංකා ජාතික කාන්තා ක්‍රිකට් පිලේ වේගපන්දු යවන ජ්‍යෙෂ්ඨ ක්‍රීඩිකාවකට කොවිඩ් වයිරසය ආසාදනය වී තිබේ. ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාකිස්තාන සංචාරය ඉලක්ක කරමින් පසුගිය මාසයේ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ පැවැති ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් සංචිතයේ පුහුණුවීම්වල නිරත සිටි මේ ක්‍රීඩිකාවට කොවිඩ් ආසාදනය වී ඇත්තේ අවුරුදු නිවාඩුව අතරතුරදීය. ශ්‍රී ලංකා කාන්තා සංචිතයේ පුහුණුවීම් සිදු කර ඇත්තේ පීසීආර් පරීක්ෂණ සිදුකිරීමෙන් පසුව වන අතර, එම පුහුණු කටයුතු අප්‍රේල් 8 වැනිදා නිමාවට පත් වී ඇත. අනතුරුව අවුරුදු නිවාඩුවෙන් පසු අප්‍රේල් 20 වැනිදා නැවත පුහුණුවීම් ආරම්භ කිරීමට පෙර ක්‍රීඩිකාවන් පීසීආර් පරීක්ෂණයට යොමු කිරීමේදී අදාළ ක්‍රීඩිකාවට වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වී තිබේ.

එම ක්‍රීඩිකාව සමඟ නවාතැන් ගෙන සිටි නැගී එන කණ්ඩායමේ ක්‍රීඩිකාවන් කිහිපදෙනකු නිරෝධායනයට යොමු කර ඇතැයි වාර්තා වේ. නාවික හමුදා ක්‍රීඩා සමාජය නියෝජනය කරන අදාළ ක්‍රීඩිකාව මේ වනවිට නාවික හමුදාව භාරයේ ප්‍රතිකාර ගනිමින් සිටින බවත්, ඇගේ තත්ත්වය බරපතළ නොවන බවත් ආරංචි මාර්ග සඳහන් කරයි.

කාන්තා ක්‍රිකට් සංචිතයේ පුහුණුවීම් ආරම්භ කිරීමට පෙර සියළු ක්‍රීඩිකාවන් පීසීආර් පරීක්ෂණයකට ලක් කිරීමට පියවර ගෙන තිබූ බවත්, ඒ අවස්ථාවේදී ඔවුන්ගේ පරීක්ෂණ වාර්තා නෙගටිව් බව තහවුරු වූ බවත් මේ පිළිබඳ කළ විමසීමකදී ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රිකට් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රධාන විධායක ඈෂ්ලි ද සිල්වා මහතා ප්‍රකාශ කළේය. ඒ අනුව අදාළ ක්‍රීඩිකාවට වයිරසය ආසාදනය වී ඇත්තේ නිවාඩු කාලය අතරතුර බව තහවුරු වී ඇත.

පසුගිය මාසයේ අග භාගයේදී ආර්.ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ පිහිටි ඉහළ දස්කම් සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ පිරිසක් කොවිඩ් ආසාදිතයන් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් එම මධ්‍යස්ථානය වසා දැමීමට පියවර ගෙන තිබූ අතර, කාන්තා ක්‍රිකට් පුහුණුවීම් ද ඒ සමගම අවලංගු කර තිබිණි.

කාන්තා ක්‍රිකට් සංචිතයේ සෙසු ක්‍රීඩිකාවන් මේ වනවිට නිරුපද්‍රිතව ඔවුන්ගේ නිවෙස්වල සිටින බවත්, නැවත පුහුණුවීම් ආරම්භ කිරීමට පෙර පීසීආර් පරීක්ෂණයකට පෙනී සිටිනු ඇති බවත් වාර්තා වේ.

කෙසේ වෙතත් කාන්තා ක්‍රිකට් සංචිතයේ සියළු ක්‍රීඩිකාවන් හා කාර්ය මණ්ඩලය ජෛව බුබුළු සෞඛ්‍ය ආරක්ෂක වළල්ලක් යටතේ ඉදිරියේදී යළි පුහුණුවීම් ආරම්භ කරනු ඇතැයි එම ආරංචි මාර්ග වැඩි දුරටත් සඳහන් කරයි.

# අයිපීඑල් අත්හිටුවීමේ පාඩුව කෝටි 2000ක්

මෙවර ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය අතරමගදී අත්හිටුවීම හේතුවෙන් ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලයට ඉන්දීය රුපියල් කෝටි 2000 ක් පමණ ආදායමක් අහිමි වී ඇත. විකාශන සහ අනුග්‍රාහක මුදල් අහිමි වීම හේතුවෙන් මෙම මූල්‍ය පාඩුව සිදුව ඇති බව ඉන්දීය මාධ්‍ය සඳහන් කරයි.

කණ්ඩායම් කිහිපයකින් කෝරොනා ආසාදිතයන් වාර්තා වීම නිසා මෙවර තරගාවලියේ තරග 60න් පැවැත්වීමට හැකි වූයේ තරග 29ක් පමණි. ඉන්දීය ක්‍රිකට් ආයතනයට වැඩිම පාඩුවක් සිදුව ඇත්තේ විකාශන අයිතිය හිමි ස්ටාර් ස්පෝර්ස් ආයතනයෙනි.

දෙපාර්ශ්වය අතර වසරක පහක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් තබා ඇති අතර, එහි සමස්ත වටිනාකම රුපියල් කෝටි 16,347ක් බව ඉන්දීය මාධ්‍ය පෙන්වා දෙයි.

උද්ගත වූ තත්වය හේතුවෙන් තරගාවලියට එක්ව සිටින කණ්ඩායම් 8 සඳහා ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් ලබාදෙන මුදල් ප්‍රමාණයද අඩකින් පමණ මෙවර අඩු වනු ඇතැයිද එම මාධ්‍ය වාර්තාවල වැඩිදුරටත් සඳහන්වේ.

# මයිකල් හසීත් ආසාදිතයි

චෙන්නායි සුපර්කිංග්ස් කණ්ඩායමේ පිතිහරඹ පුහුණුකරු ඔස්ට්‍රේලියානු ජාතික මයිකල් හසී කොවිඩ් ආසාදනය වී ඇතැයි තහවුරු වී තිබේ. ඒ අනුව ඔහු අයිපීඑල් තරගාවලියේ කොවිඩ් ආසාදිත පළමු විදෙස් ජාතිකයා බවට පත් විය.

ඔහු මේ වන විට චෙන්නාය කණ්ඩායම රැඳී සිටින නවදිල්ලි නුවර හෝටලයක දින 10ක කාලසීමාවකට නිරෝධායනය වෙමින් සිටින බව වාර්තා වේ.

චෙන්නායි සුපර් කිංග්ස් පිලේ කොවිඩ් ආසාදිත තුන්වැනි සාමාජිකයා හසී වන අතර, මීට පෙර එම කණ්ඩායමේ පන්දු යැවීමේ පුහුණුකරු එල්. බාලාජිට සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට කොවිඩ ආසාදනය වී තිබිණි.

එම කණ්ඩායමේ සියලු සාමාජිකයන් මේ වන විට ස්වයං නිරෝධායනයේ පසු වන අතර, වෛද්‍ය කාර්ය මණ්ඩලයේ දැඩි අධීක්ෂණය යටතේ පසුවෙති.



# ගාල්ලට දිවා-රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගණ

**දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ**

ග්‍රාමීය ක්‍රීඩා පිටි ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ දිවා රාත්‍රි වොලිබෝල් ක්‍රීඩාංගණ කිහිපයක් ඉදිකිරීමට යෝජිතය. මෙම වැඩසහන යටතේ ව්‍යාපෘති 24 ක් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක අතර ඉන් ව්‍යාපෘති 11 ක් මෙම වොලිබෝල් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීමට යෙදවේ.

මෙම වොලිබෝල් ක්‍රීඩාංගණ සියල්ල සංවර්ධනය සඳහා එක් ක්‍රීඩාංගණයකට රුපියල් මිලියන 1.5 ක මුදලක් වැය කෙරේ. එවැනි ක්‍රීඩාපිටි 11 ක් දිවා රාත්‍රි වොලිබෝල් ක්‍රීඩාංගණ ලෙස සංවර්ධනය කිරීමට නියමිතය.

මේ අනුව, දොඩංදුව මොරකොල ක්‍රීඩාංගණය, ගලගම නිල්වලා වොලිබෝල් ක්‍රීඩාංගණය, පුජාගල්ලෙන වොලිබෝල් ක්‍රීඩාංගණය, මානම්පිටිය වොලිබෝල් ක්‍රීඩාංගණය, වැයිහේන වොලිබෝල් ක්‍රීඩාංගණය, ඕපාත වොලිබෝල් ක්‍රීඩාංගණය, දෙල්ලව වොලිබෝල් ක්‍රීඩාංගණය, නාගොඩ උයන්විට අත්පන්දු ක්‍රීඩාංගණය, අගුළුගල්ල ග්‍රාමීය අත්පන්දු ක්‍රීඩාපිටිය, ඇත්කඳුර පොදු ක්‍රීඩාංගණය සහ ගාල්ල දෙවට සියඹලාවත්ත ක්‍රීඩාංගණය මෙසේ දිවා රාත්‍රි වොලිබෝල් පිටි වශයෙන් සංවර්ධනය කිරීමට නියමිතය.

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ, මේ වසර තුළ මෙම ක්‍රීඩා පිටි ඉදිකිරීම් අවසන් කිරීමට තීරණය කර ඇත. පළාත් පාලන නියෝජිතයන්ගේ පූර්ණ සහයෝගය ද මේ සඳහා ලැබී තිබේ.

# කළුතර බාලිකාවේ සිසුවියන් දෙදෙනකුට කළුපටි

**කළුතර මධ්‍යම විශේෂ**

කළුතර බාලිකා ජාතික පාසලේ සිසුවියන් වන කලාත්මා පියමිණි තිලකරත්න හා නෙත්මිණි නවෝද්‍යා කරාතේ පළමු ශ්‍රේණියේ කළුපටි ලබා ගැනීමට සමත් වූහ. කරාතේ ක්‍රීඩාවේ ඉහළම ශ්‍රේණියට පියවර තැබීමේ පළමු පියවර වන මේ කළු පටි ප්‍රදානය පසුගියදා පැවැති උත්සවයකදී පිරිනැමිණි.

ජපානයේ 'කමිට්සුමා ඔකු කරාතේ කායි' (Kamitsuma Oku Karate Kai) සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ ප්‍රධාන උපදේශක,පාසල් කරාතේ ආත්මාරක්ෂක සටන් ක්‍රීඩා උපදේශක බාහිර කථිකාචාර්ය එල්.පී.එදිරිසිංහ මහතා විසින් මේ කළු පටි පලඳවනු ලැබීය.

ඒ මහතා යටතේ පුහුණුව ලැබූ පාසල් කරාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වාර්ෂික උසස් වීම් ලැබීමේ මේ උත්සවය පසුගියදා කළුතර වේලාපුර මහා විද්‍යාලයීය ශාලාවේදී පැවැත්වූයේ විදුහල්පතිනිය වන කමිට්සුමා ඔකු කරාතේ කායි ශ්‍රී ලංකා සංගමයේ සභාපතිනි සරෝජනී කොතලාවල මහත්මියගේ ප්‍රධානත්වයෙනි.

මෙහිදී සුදු පටි (පහළම ශ්‍රේණිය) 5 දෙනෙක්, කහ පටි පස්දෙනෙක්, තැඹිලි පටි පස්දෙනෙක්, නිල් පටි 13 දෙනෙක් සහ දුඹුරු පටි 8 දෙනෙක් ද පටි ප්‍රදානයෙන් ගෞරව ලැබූහ.

*ඡායාරූප - කළුතර මධ්‍යම විශේෂ*





# ශ්‍රී ලංකා ධජය යටතේ ඔලිම්පික් යන මැටිල්ඩා කාල්සන් කෝටි 142ක අශ්වයකු මිලට ගනියි

**ප්‍රින්ස් ගුණසේකර**

ටෝකියෝ නුවර පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උලෙළේදී අශ්වාරෝහක ඉසව්ව නියෝජනය කිරීමට සූදානම් වන ශ්‍රී ලංකා ක්‍රීඩිකා මැටිල්ඩා කාල්සන් තරගය වෙනුවෙන්ම යුරෝ මිලියන 6ක් (ශ්‍රී ලංකා මුදලින් රුපියල් කෝටි 142ක්) වටිනා අශ්වයකු මිල දී ගනියි. ඇයගේ සහකරු මැන්ෆ්‍රඩ් වොන් ඇල්වර්ඩන් ජර්මනියේ අශ්වයන් අභිජනනය කරන ධනවත් ව්‍යාපාරිකයෙකි. මේ හේතුව නිසාම මැටිල්ඩා කාල්සන්ට තම තරග ඉසව්ව වෙනුවෙන්ම සුදුසු අශ්වයා තෝරා ගැනීමේ හැකියාව උදා වී ඇත.

ශ්‍රී ලංකා අශ්වාරෝහකයන්ගේ සංගමයේ සභාපති සුරංජිත් ප්‍රේමදාස මහතා පවසන්නේ මැටිල්ඩා කාල්සන් ඉතාම හොඳ මානසිකත්වයකින් පසුවන හෙයින් ඔලිම්පික් පදක්කමක් කෙරෙහි බලාපොරොත්තු තබාගත හැකි බවයි. "ඇය තරගයට යන අශ්වයා ලෝකයේ අංක එකේ අශ්වයෙක්. අවුරුදු 12ක් පමණ වයසැති අශ්වයා පිරිමි සතෙක් නිසා මිල අධිකයි. හොඳම ජවයක් ඇති හයිබ්‍රිඩ් අශ්වයෙක් සමඟ මැටිල්ඩා ශ්‍රී ලංකා ධජය අතැතිව ටෝකියෝ යන එක, රටක් හැටියට ආඩම්බරයක්" ප්‍රේමදාස මහතා පැවැසීය.

මැටිල්ඩා කාල්සන් ටෝකියෝ ඔලිම්පික් උලෙළේදී අශ්වාරෝහක ඉසව්වෙන් ශ්‍රී ලංකාවට පදක්කමක් දිනා දීමේ අපේක්ෂාවෙන් පසුවන බව මෙයට වසරකට පෙර ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී පැවැසීය. දැනට ජර්මනියේ පදිංචිව සිටින මැටිල්ඩා කාල්සන් 1984 සැප්තැම්බර් 27 වැනිදා මහනුවරදී උපත ලැබූ අතර, වසර ගණනාවක් තිස්සේ ජර්මනියේ අශ්වාරෝහක ක්‍රීඩා පුහුණුවීම්වල යෙදී සිටින්නීය.

වසර 1984 දී ඇයට මාස තුනක් වෙද්දී ශ්‍රී ලාංකේය මව්පියන් යුවළ ආර්ථික අපහසුතා හේතුවෙන් ස්වීඩන යුවළකට දරුකමට හදා ගැනීමට දී ඇති අතර, පසුව මැටිල්ඩා කාල්සන් යන නම තබා ඇත. කුඩා කාලයේ සිට ක්‍රීඩාවට ආදරය කරමින් පුහුණුවීම්වල නිරත වීමේ උච්චතම ප්‍රතිඵලය මේ වනවිට ඇයට ලැබී ඇත. 37 හැවිරිදි මැටිල්ඩා කාල්සන් ස්වීඩනයේ ක්‍රිස්ටියන්ස්ටාඩ්හි හැදී වැඩුණු අතර, අශ්වාරෝහක වෘත්තිය ආරම්භ කර ඇත්තේ රයිටාර්සෝල්ස් කැප් ක්‍රීඩා සමාජයේදීය. එහිදී මැටිල්ඩා අශ්වයන්ට ආදරය හා කරුණාව දැක්වූ බවත්, පසුව එය ක්‍රීඩාවට වර්ධනය කරගත් බවත් සඳහන් වේ.

පසුගිය වසරේ ජනවාරි මාසයේදී ඔලිම්පික් සුදුසුකම් ලබාගත් මැටිල්ඩා කාල්සන්ගේ නම මාස තුනක් පමණ ගතවෙද්දී අන්තර්ජාතික අශ්වාරෝහක සම්මේලනය ඉවත් කළ අතර, ඇය එම අසාධාරණයට එරෙහිව ලූසැන්හී පිහිටි ක්‍රීඩා බේරුම්කාර මණ්ඩලය හමුවේ නඩුවක් ගොනු කළාය. එහිදී විභාග වූ නඩුවේදී කාල්සන්ගේ නම ඉවත් කිරීම අසාධාරණ නොවන බවට අන්තර්ජාතික අශ්වාරෝහක සම්මේලනයට පක්ෂව තීන්දුව ප්‍රකාශයට පත් විය. එහෙත් පරාජය පිළිනොගත් ඇය එම නඩු තීන්දුව පිළිබඳ සෑහීමකට පත් නොවී අභියාචනාවක් ඉදිරිපත් කිරීමට පියවර ගත්තාය.

ශ්‍රී ලංකා අශ්වාරෝහකයන්ගේ සංගමයේ සභාපති සුරංජිත් ප්‍රේමදාස මහතා 'දිනමිණ' වෙත පැවැසුවේ මැටිල්ඩා කාල්සන් වෙනුවෙන් ස්වීඩනයේ නීතිඥයන් පිරිසක් මෙම නඩුව ඉතා සාර්ථක ලෙස ගොනු කිරීමෙන් අන්තර්ජාතික අශ්වාරෝහක සම්මේලනයේ තර්ක සියල්ල පුස්සක් බවට පත්වූ බවයි.





අශ්වාරෝහෙකයන්ගේ සංගමයේ සභාපති සුරංජිත් ප්‍රේමදාස මහතා හා මැටිල්ඩා කාල්සන් ශ්‍රී ලංකාවේ පැවැති මාධ්‍ය හමුවකදී.

අන්තර්ජාතික අශ්වාරෝහක සම්මේලනය හදිසියේම ශ්‍රේණිගත කිරීම් අනුපිළිවෙල වෙනස් කිරීමෙන් මැටිල්ඩා කාල්සන්ගේ නම පහළට ඇද වැටුණු අතර, එමගින් ශ්‍රී ලංකා ක්‍රීඩිකාවට බලවත් අසාධාරණයක් සිදුව ඇති බවට නීතිඥවරුන්ගේ තර්කය විය.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංගම්වලින් මෙතෙක් කිසිදු ක්‍රීඩකයෙක් හෝ ක්‍රීඩිකාවක ටෝකියෝ ඔලිම්පික් සරිසාධන මට්ටමට ළඟා වී ක්‍රීඩා උලෙළට සුදුසුකම් ලබා නොමැති තත්ත්වයක් යටතේ මැටිල්ඩා කාල්සන්ගේ මතුවීම කැපී පෙනෙන සිදුවීමක් මෙන්ම ශ්‍රී ලංකාවට විශාල ගෞරවනීය අවස්ථාවකි.

"ඉදිරියේදී තවත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් අශ්වාරෝහක ක්‍රීඩාවන් අන්තර්ජාතික තරගවලට යැවිය යුතුයි. දැනට ක්‍රීඩක ක්‍රීඩිකාවන් දහසක් පමණ මේ ක්‍රීඩාව කිරීමට අපේ සංගමයට බැඳී සිටිනවා. එහෙත් ක්‍රීඩා පිටියක් නෑ. දියගම ක්‍රීඩා සංකීර්ණය ආශ්‍රිතව අපට ඉඩමක් ලැබුණා. එහි ඉදිකිරීම සිදුකළා. ඒත් එය තාවකාලිකව නැවැතුණා. ඒ ඉඩම යළි ක්‍රීඩා ඇමැතිතුමා දුන් පසුව අශ්වාරෝහක ක්‍රීඩාව දියුණු කළ හැකියි " අශ්වාරෝහකයන්ගේ සංගමයේ සභාපති සුරංජිත් ප්‍රේමදාස මහතා පැවැසීය.

# ඉසුරුමුණියේ මිනිසා සහ අශ්ව රුව

# සිදුහත් හා කන්ථක ද?



*අනුරාධපුර යුගයේ බිහි වූ ඉසුරුමුණිය රාජ මහා විහාරය ඓතිහාසික වූත්, අපූර්ව වූත් කලාගාරයකි. මහාවංශයේ සඳහන් වන්නේ ක්‍රිස්තු පූර්ව 03 වැනි සියවසේදී මෙරටට වැඩම කළ මිහිඳු හිමියන්ගෙන් මුල් වරට බුදු දහම වැළඳ ගත් දෙවැනි පෑ තිස් රජ ප්‍රමුඛ ප්‍රභූන් අතරින් අරිට්ඨ කුමරු ඇතුළු 500ක් දෙනා වෙනුවෙන් 'ඉස්සර සමණ' විහාරය කර වූ බවය.*

ක්‍රිස්තු වර්ෂ 01, 02 සහ 03 සියවස්වලට අයත් සෙල්ලිපි කිහිපයකම මෙම විහාරය හඳුන්වා ඇත්තේ 'ඉසිරමණි' නමිනි. ක්‍රිස්තු වර්ෂ 479-527 අතර කාලයේ සීගිරියේ විසූ පළමු වැනි කස්සප රජු මේ විහාරය අලුත්වැඩියා කොට කලින් තිබූ ප්‍රමාණයට වඩා විශාල වපසරියක් විහාරයට ඈඳා එය 'බෝඋපුල්වන් කසුප් ගිරි' වෙහෙර යනුවෙන් නම් කර ඇත. එතැන් සිට මහාවංශය සඳහන් කරන්නේ ද 'කසුප්ගිරි' යන නාමයයි.

අනතුරුව ක්‍රිස්තු වර්ෂ 975දී සිවු වැනි මහින්ද රජු විහාරය වට කොට ප්‍රාකාරයක් ඉදි කළ නමුත් ක්‍රිස්තු වර්ෂ 1037දී පමණ කස්සප නොහොත් වික්‍රමබාහු රජු මේ විහාරය තවත් විශාල කර ගොඩනැගූ බව සඳහන්ය.

කලක් තිස්සේ වෙස්සගිරිය යනුවෙන් වරදවා වටහා ගෙන තිබුණේ ඉසුරුමුණිය බව මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීහු තහවුරු කර තිබුණි.

වියතුන් අතර ඉසුරුමුණිය පිළිබඳ පරස්පරයන් ද දක්නට ලැබේ. මහාචාර්ය සෙනරත් පරණවිතානයන් සහ වැලිවිටියේ සෝරත හිමිපාණගේ අදහස වූයේ එය මේඝගිරි විහාරය බවය. මේඝගිරි විහාරය, ඉසුරුමුණි විහාරය ලෙස සැලකුවහොත් එය මහා විහාරයට අයත් සංඝාරාමයක් නොව අභයගිරි පාර්ශ්වයට අයත් එකක් වන බව ආචාර්ය ධර්මරත්න හේරත් මහතාගේ නිගමනය විය.

රමණීය පරිසරයක පිහිටි අනුරාධපුර ඉසුරුමුණිය විහාරය වැදගත් වන්නේ බෞද්ධාගමික වශයෙන් පමණක්ම නොවේ. එය ස්වභාවික හා නිර්මාණාත්මක කලා සෞන්දර්යයෙන් ද පිරිපුන් විහාරස්ථානයකි. මෑත කාලයේ ඉදිකිරීම්වලට අමතරව ඉසුරුමුණියේ ඉපැරණි යුගය සටහන් කරන අංග මෙසේ ගොනු කළ හැකි වේ. අෂ්ට ඵල රුහ බෝධිය, බුදු මැඳුර සහිත පර්වත ලෙන, ලෙන් විහාරයට පිවිසෙන දොරටුවේ මකර තොරණ, පිය ගැට පෙළ සහ සඳකඩ පහණ, මුර ගල් සහ කොරවක් ගල්, පර්වත පාමුල දිය පොකුණ, ඒ සමීපයේ කොටා ඇති ඇත් රූප, බහු උන්නතව ගලෙහි කැටයම් කර ඇති අශ්ව හිස සහ මිනිස් රුව, ඉසුරුමුණියේ පෙම් යුවළ ඇතුළු දැනට කෞතුකාගාරයේ තැන්පත් කර ඇති උන්නත හා බහු උන්නත මූර්ති. මේවා ඉසුරුමුණි විහාරය සෞන්දර්යයෙන් ඔපවත් කරන ඉපැරණි කලාංග අතර වෙයි.

ඉසුරුමුණිය ලෝක ප්‍රකට වීමට වෙසෙසින්ම බලපා ඇති කලා කෘතිය වන්නේ පෙම් යුවළක් ලෙස හැඳින්වෙන ගල් කැටයම ය.

එලකාසනයක හිඳගෙන සිටින පුරුෂයකු ඔහුගේ දකුණු කලවය මත කාන්තාවක හිඳුවාගෙන සිටින අයුරු දක්වන මෙම කැටයම පිටුපස කඩුවක් හා රැස් වලල්ලක් දක්නට ලැබේ. පුරුෂයා හැඳ සිටින්නේ යටි කය ඇඳුමක් පමණක් වන අතර කාන්තාව දිගු ඇඳුමකින් සැරසී සිටී. දෙදෙනාම ආභරණ පැලඳ සිටිති. මෙම කැටයම ඉන්දුනීසියාවේ සුප්‍රකට බෝරෝ බුදූර් බොදු පුදබිමේ මානව රූප කැටයම්වලට බොහෝ දුරට සමානත්වයක් දක්වන බව විද්වත් මතයයි. මෙරට විද්වතුන් බොහෝ දෙනකුගේ මතය වන්නේ මේ කැටයමින් නිරූපණය කෙරෙනුයේ සාලිය කුමරු හා අශෝකමාලාවන් බවය.

මහායානයේ දැක්වෙන අෂ්ට මහා බෝසතුන්ගෙන් අයකු වන මංජු ශ්‍රී මේ කැටයමින් නිරූපිත යැයි මහාචාර්ය සෙස්ටියර් සහ මහාචාර්ය දොහානියන් දෙදෙනාගේ මතයයි. පසුබිමේ දැක්වෙන කඩුව මඟින් ප්‍රඥාවත්, රැස් වළල්ල මඟින් අවිද්‍යාව නමැති අන්ධකාරය දුරු කරන බවත් නිරූපණය වන නිසා එසේ නිගමනය කළ හැකි බව ඔවුහු පවසති.

මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් 'රජ පවුල' ලෙස හඳුන්වන කැටයම රාජ ලීලාසන ක්‍රමයට අසුන් ගන්නා ප්‍රභූවරයෙක් සහ ඊට සමීපව කාන්තාවක් අසුන් ගෙන සිටින අයුරු දක්වයි. හිඳගෙන සිටින අයුරු දැක්වෙන අල්ප උන්නත සිංහ කැටයම පෙර ගොඩනැගිල්ලකට සම්බන්ධ කර තිබූ කලා කෘතියක් බව සැළකේ.

ගොඩනැගිලි සැරසිල්ලක් ලෙස භාවිත කළා යැයි සැලකෙන තිදෙනකුගේ රුව නිර්මිත මානව රූ කැටයමක් ද මෙහි දක්නට ලැබේ. විවිධ විලාස දක්වන වාමන රූප සහිත ගල් කැටයම් 9ක් ද, දෙපස යක්ෂයන් දෙදෙනකු සහිත කුවේරගේ ප්‍රතිරුව නිර්මිත කැටයමක් ද මෙහි වෙයි. ඉපැරණි ශෛලමය ගොඩනැගිල්ලක තිබුණේ යැයි සැලකිය හැකි ලියවැල් මෝස්තරයේ මැද කවාටය තුළ අල්ප උන්නත මිනිසකුගේ කැටයමක් ද දක්නට ලැබේ.

මේ හැර ඉසුරුමුණි විහාරයේ ගල් පර්වතය පාමුල පිහිටි පිරිත් පැන් පොකුණට මුහුණ ලා ඇත් රූප කිහිපයක් දිස් වෙයි. දිය නෑමට එන හස්තීන්ගේ විලාසයක් එමඟින් නිරූපිතය. ඉසුරුමුණි පෙම් යුවළ හැරුණු විට දෙස්-විදෙස් කලා විචාරකයන්ගේත්, විද්වතුන්ගේත් දැඩි අවධානයට ලක් වූ උසස්ම කලා කෘතිය වන්නේ ඉසුරුමුණිය පැරණි විහාරයට දකුණු පස පර්වතයේ අර්ධ උන්නතව නෙලා ඇති 'මිනිසා සහ අශ්ව හිස' දැක්වෙන නිර්මාණයයි. භාරතයේ පල්ලව කලා සම්ප්‍රදායේ ලක්ෂණ පෙන්වන එම කැටයම ක්‍රිස්තු වර්ෂ 4-7 අතරතුර කාලයේ නිර්මාණය කරන්නට ඇති බව සැලකේ.

වියතුන් අතර ඉසුරුමුණිය පිළිබඳ පරස්පරයන් ද දක්නට ලැබේ. මහාචාර්ය සෙනරත් පරණවිතානයන් සහ වැලිවිටියේ සෝරත හිමිපාණගේ අදහස වූයේ එය මේඝගිරි විහාරය බවය. මේඝගිරි විහාරය, ඉසුරුමුණි විහාරය ලෙස සැලකුවහොත් එය මහා විහාරයට අයත් සංඝාරාමයක් නොව අභයගිරි පාර්ශ්වයට අයත් එකක් වන බව ආචාර්ය ධර්මරත්න හේරත් මහතාගේ නිගමනය විය.

එය පිහිටියේ පර්වත මධ්‍යයේ පොකුණේ සිට අඩි 15ක් පමණ උසකිනි. පුෂ්ටිමත් සිරුරකින් හෙබි මැදි වයසේ උදාර පුද්ගලයකුගේ යැයි හැඟවෙන ඉරියව්වකින් යුතු මෙම නිර්මාණය උසින් අඩි 02යි අගල් 08කි. ජව සම්පන්න සිරුර ඍජුව තබාගෙන සිටින මෙම පුද්ගලයාගේ උඩුකය නිරුවත්ය. පුද්ගල වමත භූමියට ස්පර්ශ වෙයි. නවාගෙන සිටින දකුණු පාදයේ දණහිස මතින් දකුණු අත සැහැල්ලුවෙන් ඉදිරියට විහිදා සිටී.

ඍජු බැල්මකින් යුතු දෙ ඇස් වම් පසට බරව පවතී. හිසෙ හි ජටාවකි. මහාරාජ ලීලාවක් ප්‍රකට කෙරෙන මිනිස් රුවේ අත් පාවල ආභරණ පලඳා සිටිනු දක්නට ලැබේ. මිනිස් රුව දකුණු උරහිස සමීපයේ අශ්ව හිසක රුවකි.

මෙහි අඟපසඟ රචනයෙ හි දක්නට ලැබෙන සාමූහික ගැලපීම් රසික නෙත් සිත් අමන්දානන්දයට පත් කිරීමට සමත් ය. අඩක් වමට හැරී එසැවුණු මුහුණෙන් පිලිබිඹු වන්නේ සංහිඳියාව ද?, විඩාව ද?, කුතුහලය ද?, යන්න ගැන කිසිඳු විද්වතකු නිවැරදි අදහසක් පළ කොට නැත.

මේ උදාර පුද්ගලයාගේ දෙ ඇස් කෙලින්ම ඉලක්ක ගත වී ඇත්තේ විහාරයට පූර්ව දිශාවේ ඇති කෙත් වතු දෙසටය. එකී තීව්‍ර දෙනෙත් යොමුව ඇත්තේ කවර අරමුණක් වෙත ද යන්න අවිනිශ්චිතය. මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ මතය වන්නේ මෙමඟින් මූර්තිමත් වන්නේ සශ්‍රීකත්වය ගෙන දෙන අග්නි සහ පර්ජන්‍ය නිරූපනය වන බවය. (ශ්‍රී ලංකාවේ ඉතිහාසය-01-අනුරාධපුර යුගය-අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.)

පර්ජන්‍ය යනු වලාකුළ හෝ වර්ෂාවය. අග්නි යනු ගින්දර ය. මිනිස් රුවෙන් පර්ජන්‍ය හා අශ්ව හිසෙන් අග්නි නිරූපණය වන බව ඔහුගේ අදහස ය.

ඉසුරුමුණිය විහාරය අතීතයේ වර්ෂාව ලබා ගැනීම සඳහා පුද පූජා පැවැත් වූ පුදබිමක් බව සී. ඩබ්ලිව්. නිකලස් විද්වතා සඳහන් කරයි. ඒ හේතුවෙන් ඔහු ද පරණවිතානයන්ගේ මතයට එකඟ වෙයි.

මිනිස් හිසේ ඇති ශීර්ෂාවරණය 'ජටාභර' නමැති හිසකෙස් විලාසිතාවක් බව ද පරණවිතානයෝ දක්වති. එනමුත් පර්ජන්‍ය හා අග්නි දැක්වීමට මිනිස් රුවක් හා අශ්ව හිසක් යොදා ගත්තේ ඇයිදැයි යන්නට පිළිතුරු සොයා යාමට සිදු වන නිසා එකී අදහස තවමත් විවාදාත්මකය. අවලෝකිතේෂ්වර බෝසතුන් තමන්ගෙන් පිළිසරණ පතන ජනතාව දෙස මහා කරුණාවෙන් බලා සිටින අයුරු ඉන් මූර්තිමත් වන්නේ යැයි තවත් මතයකි. එහෙත් මේ මත හෝ නිර්වචන බෞද්ධ සිද්ධස්ථානයකට සම්බන්ධ වන්නේ කෙසේදැයි යන්න සිතා බැලිය යුතු වේ.


ඉසුරුමුණියේ මිනිස් රුව හා අශ්ව හිස වඩාත් සමීප වන්නේ සිදුහත් කුමරු සහ කන්ථක අශ්වයාට විය නොහැකිද? මේ බව විමසීමේදී මිනිස් රුවේ ආභරණ අවම ය. එමඟින් සිදුහත් කුමරු ගිහිගෙය අත්හල බව නිගමනය කළ හැකිය. දෙ ඇස්වලින් නිරූපිත තීව්‍ර බැල්මෙන් තමන්ගේ ඉදිරි ඉලක්කය වන අදිටන ප්‍රකට කෙරෙයි. එබැවින් කන්ථක අසු පිට නැගී විත් නේරංජනාව (පැන් පොකුණ) අබියස සිදුහත් කුමරු විඩා සංසිඳවනු මේ කැටයමින් නිරූපිත වන්නේ යැයි උපකල්පනය කළ හැකිය. එය සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණයට ද සම්බන්ධය. අනෙක් අතින් පරණවිතානයන් දක්වන පරිදි මිනිස් හිසේ ඇත්තේ ශීර්ෂාවරණයක් නොව 'ජටාභර' හිසකේ විලාසිතාව ය. සිදුහත් කුමරුට එවැනි හිසකෙස් විලාසිතාවක් තිබෙන්නට ඇතැයි උපමාන කිරීමට ද හැකිය.


එපමණක් නොව තම හාම්පුතුගේ වෙන්වීම ඉවෙන් මෙන් දැනගත් කන්ථක අසු සිදුහත් කුමරුගේ දකුණු උරහිස සිප ගන්නට මෙන් පිටුපසින් ළං වන අයුරු මෙලෙස කලාකරුවා ඉසුරුමුණි ගල් පවුව මත නිර්මාණය කළා විය යුතු යැයි සිතිය හැකිය. එබැවින් මේ කලා කෘතියෙන් නිර්මාණය කර ඇත්තේ සිදුහත් සහ කන්ථක අසු යැයි නිගමනයකට පැමිණීම යුක්තියුක්තය.

(සංවාදයට විවෘතයි)

**බන්ධුල ගුණරත්න**

*ඡායාරූප - අන්තර්ජාලයෙනි.*





ක්‍රි.ව. 1815 පෙබරවාරි 18 වැනි දින එක්නැලිගොඩ ප්‍රමුඛ සබරගමුවේ සේනාව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත් අඩංගුවට ගැනීමත් සමඟම වසර දෙදහස් ගණනක් අවිච්ඡින්නව පැවති සිංහල රාජ්‍යයේ ස්වාධීනත්වය අහෝසි වී ගියේය. මේ සිද්ධිය ජෝන් ඩොයිලි විසින් එවකට කොළඹ ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වූ රොබට් බ්‍රවුන්රිග් වෙත ලියා යැව්වේ මෙසේය. ඔහු ලිපිය ලියා ඇත්තේ පෙබරවාරි 19 වැනිදා ය.

"ගරු ඔබතුමා ඉතා ඕනෑකමින් මෙතෙක් කල් බලා සිටි සිද්ධිය සාර්ථක වී තිබේ. මහ අදිකාරම් විසින් යවන ලද ආයුධ සන්නද්ධ කන්ද උඩරට වැසියන්ගේ සහයත්වය ඇතිව දුම්බර වැසියන් විසින් මැද මහනුවර ප්‍රදේශයකදී ඊයේ රජතුමා වට කරනු ලැබීය. මැද මහනුවර සිට සැතැප්මක් පමණ ඈතින් වන ගල්ලේගේ වත්තේ උඩුපිටියේ ආරච්චිගේ ගෙදරදී රජතුමා බිසෝවරුන් දෙදෙනෙකු සමඟ අඳුර වැටෙන්නට පැයක් පමණ කලින් අල්වා ගනු ලැබීය."

උඩරට රදලවරු අතර පැවති බල ලෝභීත්වය නිසා වූ සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස ඇහැලේපොල හා විරසක වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇහැලේපොලගේ බිරිඳ ඇතුළු දරුවන් මරා දැමීම හේතුවෙන් පළි ගැනීමේ සිතින් කටයුතු කළ ඇහැලේපොල රජු අල්ලා ගැනීමේ කාර්යය සඳහා මුළු සිතින්ම ඉංග්‍රීසීන්ට පක්ෂපාතීව කටයුතු කළේය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇහැලේපොල කුමාරිහාමි ඇතුළු පවුල විනාශ කළේ රූමත් ඇහැලේපොල කුමාරිය සිය වසඟයට ගැනීමට රජු යෙදවූ උපක්‍රමවලට ඇය එකඟ නොවුණු නිසා යැයිද මතයක් පවතී. කවර සිද්ධියක් නිසා වුව ද අවසානයේ සිදු වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට විරුද්ධව රට තුළම විශාල පිරිසක් නැඟී සිටීමය. එහි ප්‍රතිඵලය වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා පිරිස ඉංග්‍රීසීන්ට අසු වීමය.

රජු අත් අඩංගුවට ගන්නා ලද්දේ එක්නැලිගොඩ ප්‍රමුඛ සබරගමුවේ සේනාව විසිනි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්වා ගැනීම සඳහා උඩරට හා පහතරට සේනා කීපයක්ම මෙහෙයවා තිබේ. පහතරට ඉංග්‍රීසි සෙන්පතිවරු දෙදෙනෙක් යටතේ පැමිණි සිංහල නිලධාරියෙක් වන දියෙස් මුදලි නම් අයෙක් කළ විස්තරයක් 1861 'සිංහලේ' සඟරාවේ හා 1885 මැයි මස 17 වැනි දින 'සරසවි සඳරැස' යන ප්‍රකාශනවල පළ විය. එහි මෙසේ සඳහන් වේ.

# රජු ඇල්ලූ හැටි

## දියෙස් මුදලි 'සිංහලේ' සඟරාවට ලියයි



"රජ්ජුරුවන් ඇල්ලීමට පිටත් වූ ඉංග්‍රීසි යුද්ධ හමුදාව රංචු කීපයකට බෙදී මහනුවරට ගියේය. එයින් මම ගිය රංචුවේ කප්පිත්තන් වන 'දෙබුස් ලොයිතැනන්ට්' සහ 'ස්තෙකන් ඇන්සයින් ක්ලැරට්' ඉංග්‍රීසි මහත්වරුන්ද කවුඩුමුනේද, තෝරවතුරේද, කුරුඳුවත්තේද යන සිංහල මොහොට්ටාලවරු තුන් දෙනාද ක්‍රීසි සහ කප්පන් යන ජා කප්පිත්තන් දෙන්නාද ඇතුළුව සිපයි, ජාවෝ බංගලි හමුදාව අට සීයක් පමණ සිටියෝය. අපි සත්කෝරලයේ පහළ දොළොස් පත්තුවට අයිති නා ගහ ගෙදර මැදින් යන අතර, සිංහල නායක්කර් කෙනෙක් ඇතුළුව ආ සෙනඟක් සමඟ සුළු යුද්ධයක් වී ඔවුන් පන්නා දමා කුරුණෑගල බැස සත් කෝරලේ ඉහළ දොළොස්පත්තුව හරහා මාතලේට පැමිණ එතැන් පටන් ගොංගාවල පාරේ මහනුවරට බහින්ට යන අතර අලුත් ගංතොටුපළ ළඟදී ජනරාල් ඩොයිලේ උන්නාන්සේද, කර්නල් හාඩි සහ කර්නල් හුක් උන්නාන්සේද, කාප්පකාප කප්පිත්තෝද, ඔපිසර මහත්තැන්ද, තම්බි මුදියන්සේද, ජා මුහන්දිරම්ද, ඉංග්‍රීසි, බංගලි, සිපයි, ජාකාර කප්පිත්තෝද, ඔපිසර රාශියක්ද, ඇහැලේපොල මොල්ලිගොඩ යන අධිකාරම් දෙපළ සහ පිලිමතලව්වේ දිසාව ඇතුළු උඩුනුවර යටිනුවර දෙකේ සිංහල සේනාවද, සබරගමුවේ එක්නැලිගොඩ මොහොට්ටාලද, දොලොස්වල මොහොට්ටාලද, මහවලතැන්නේ මොහොට්ටාලද, තවත් නිලමේවරු කීප දෙනෙක්ද ඇතුළු බොහෝ රාශි ගණනක් සෙනඟ ගඟෙන් එගොඩ වෙනවා අපට සම්බ උනෝය.

මේ සෙනඟ ගණන කොපමණද කීවොත් පස් දවසක් ඔවුන් අළුත් ගංතොටින් මෙගොඩ උනෝය. අපිත් ඔවුන් සමඟ එකතු වී මැද මහනුවර රජ්ජුරුවෝ යන අතර තෙල්දෙනියේ හංවැල්ල යන ගමේදී මැද මහනුවරට තව දවසක් ගමන් ඇත කියා ජාමුහන්දිරම් කී නිසා එහි නැවතී සිටියෝය. මේ ඉඩමේ බොහෝ දිග පළල ඇති වෙලක් තිබුණේය. ජනගහනයේ උෂ්ණය නිසා එක්නැලිගොඩ මොහොට්ටාල සමඟ සබරගමුවේ සෙනඟයෙන් පන්සියයක් පමණ පිටත් වුණෝය. මෙලෙස අපි හැතැප්මකින් තුනෙන් පංගුවක් පමණ යන අතර වෙළේ හරහට වයස් දහයක දොළහක පමණ කොලු ගැටයෙක් දුවගෙන යනවා සම්බ වී සබරගමුවේ සෙනඟයෙන් සමහර දෙනෙක් මොහු එළවා අල්වාගෙන ආවාම ඔහු මහත් හයියෙන් වැඳගෙන "හාමුදුරුවනේ මා මරන්ට එපාය. දෙයි හාමුදුරුවෝ වැඩ සිදින තැන මම පෙන්වා දෙඥාය" කීවේය. එතකොට එක්නැලිගොඩ මොහොට්ටාල මේ කොලුවාගේ තුනටියේ වැල් පොටක් දමා බන්දවා වැලෙන් අල්වාගෙන ඔහු ඉස්සර කරගෙන අපි සෑම දෙනම ගියෝය. මෙසේ ටික දුරක් ගොස් ඔන්න ඔය දෙවි හාමුදුරුවෝ වැඩ ඉන්න මාළිගාවට ඉහළින් ගහය, කියා නුග රුකක් පෙන්නුවේය. එතනට අපි ළං වෙනකොට වසා තිබූ ඒ ගෙයි දොර ළඟ දෙන්නෙක් සිටියෝය. මිදුලේ සැතපෙන ගෙයි අප්පුහාමි කෙනෙක් ලංසයක් අරගෙන සක්මන් කරමින් සිට හා, එක්නැලිගොඩ කොයි යනවාද කියා ඇහුවාම අපිත් මෙහාට ආවා තමයි කියා ඔහු උත්තර දෙන අතර සැතපෙන ගෙයි අප්පුහාමි අතේ තිබූ ලංසෙන් එක්නැලිගොඩ මොහොට්ටාලට ඉතාම සැරෙන් ඇන්නේය. ඒ ඇනුම ඔහුගේ වාසනාවන්ත කමෙන් ඔහුට නොවැදී ලංසය බිම ඇනී කැබලි කීපයකට කැඩී යන ලද්දේය. එතකොට සබරගමුවේ මිනිස්සු ඔහු අල්වාගෙන අතින් අතර ඉහළට ගත්තා මම දුටුවා මිස ඔහුගේ ශරීරයට මක් උනාද කියා මම නොදනිමි. එතකොට එක්නැලිගොඩ මොහොට්ටාල ගෙයි දොර ළඟට ගොස් අරින්ට කියා රජ්ජුරුවන්ට කීවේය. නමුත් රජ්ජුරුවෝ දොර නෑර ගෙයිම සිටගෙන එක්නැලිගොඩ අපේ නෑයාද කියා ඇසුවෝය. එතකොට ඔහු ඒ මම තමාය දොර අරින්ඩෙයි කියා කිව්වේය. එහෙත් රන් කඩුව එළියට දමන්ට කීව නමුත් එලෙස කළේ නැත. එතකොට එක්නැලිගොඩ මොහොට්ටාලගේ කීම පිට මිදුලේ තිබුණ වංගෙඩි වගයක් අරගෙන පාරවල් කීපයක් දොරට ගැසුවාම දොර පැලී ගියේය. ඉන්පසු සබරගමුවේ මිනිස්සු ගෙයි ඇතුළට වැද ටිකක් වේලා ගෙයි කෝලාහල කරමින් සිට දෙවියන් වහන්සේලාගේ සියලුම ඇඳුම්, පැලඳුම් කඩාගෙන රෙදි හතර රියන පමණක් පිටින් දොරට දැම්මෝය."

යනාදී වශයෙන් මෙම අවස්ථාව තව දුරටත් විස්තර කර දියෙස් මුදලි සබරගමුවේ මිනිසුන් බිසවුන් වහන්සේලාගේ කුණ්ඩලාභරණ කඩා ගත් අයුරුත්, කන්වලින් ලේ ගලා ගිය අයුරුත් විස්තර කරයි. එසේම දියෙස් මුදලි බෙහෙත් කොළ කොටවා තුවාලවලට ගැල්වූ බවත් දක්වයි. මේ අවස්ථාවේ රජ්ජුරුවන් බලහත්කාරයෙන් එළියට දැමූ එක්නැලිගොඩ "තොගේ අප්පට ගොහින් බාර දෙන්ට වර", යනාදී වශයෙන් පරුෂ වචනවලින් බැන්න අයුරුත් "මූ ඌරෙක් වගේ බැඳලා කුදලාගෙන යන්ට කිරිඳි වැල් ගෙනෙව්" යැයි නියම කළ අයුරුත් දන්වයි. එක්නැලිගොඩ කිරිඳි වැල්වලින් රජු බැඳීමට උත්සාහ කරද්දී තමා කෙරේ තිබූ සාලුව ගලවා "මේකෙන් බඳින්ඩෙයි" කියා දුන් බවද සඳහන් කරයි. අන්තිමේ ඔහු කංකානමගේ පිට උඩ තියා ලියුමක් ලියා ජෝන් ඩොයිලිට යවා ඇත. එහි මෙසේ ලියා තිබේ.

"ඩොයිලේ උන්නාන්සේට බලා ගන්නා වග නම් සිංහලේ රජ්ජුරුවෝ අසු වුණෝය. දැන් එක්නැලිගොඩ මොහොට්ටාල රජ්ජුරුවන්ට බොහෝ නෙරෙක්කු කරමින් අපහාස වශයෙන් බැඳලා තල්ලු කරගෙන එනවාය. ඒ නිසා දෝලා ගණනකුත් ගෙන්වාගෙන තමුන්නාන්සේ කඩිනමට මෙහි එන්ට ඕනෑය. රජ්ජුරුවෝ සහ බිසවුන්වහන්සේලා නිරුවස්ත්‍රව වාගේ සිටින නිසා රෙදිත් ගෙනෙන්ට ඕනෑය." වශයෙන් ඔහු ලිපිය යටිපහුවේ කංකානම අත ජෝන් ඩොයිලි වෙත යවා තිබේ. එම ලිපිය යවා සිංහල ගණිනින් පැයක් ගත වන්නට පළමු කර්නල් යාඩි සහ කර්නල් හක් ප්‍රමුඛ ඉංග්‍රීසි හේවායන් සීයක් පමණ එවා සබරගමුවේ මිනිසුන් විසින් අඩම්තේට්ටම් කොට අත පය බැඳ පිට්ටනියක හරහා සමා සිටි රජු හා බිසෝවරුන් ගලවාගත් අයුරු විස්තර කොට ඇත. ඔවුහු සබරගමුවේ සේනාව කස පහර දී එලවා රජු මුදාගෙන ඉදිරිපිට දණ නමස්කාර කොට බැමි ලිහා සාත්තු කළ බවද දියෙස් මුදලි දන්වා තිබේ.

ජෝන් ඩොයිලි රජ හා බිසෝවරු රාජකීය ගෞරව සහිතව කොළඹට ගෙන යාමට විධි විධාන යෙදීය. මේ සඳහා දෝලාකරුවන් සපයා ගැනීමත්, දෝලා සපයා ගැනීමත්, රාජකීය පිරිසට අවශ්‍ය ඇඳුම් ලබා දීමත් ජෝන් ඩොයිලිට මහත් ප්‍රශ්නයක් විය. මේ තත්ත්වය ජෝන් ඩොයිලි විස්තර කර ඇත්තේ මෙසේය. "රජු හා බිසෝවරුන් ඇඳ පැලඳ සිටි ඇඳුම් පැලඳුම් ඉතා සාහසික ලෙස කොල්ල කනු ලැබීම නිසා රාජ්‍ය තත්ත්වය කෙසේ වෙතත් සාමාන්‍ය පුමතිරින් මෙන් ඇඳ පැලඳ සිටීමටවත් සුදුසු වූ ඇඳුම් පැලඳුම් සොයා ගැනීම ලොකු ප්‍රශ්නයක් විය." යනුවෙනි.

රජු කැඳවාගෙන යන ගමනේදී අඩුපාඩු ක්‍රමයෙන් පිරිමසා ගැනීමට සිදු විය. ගැහැනු ඇඳුම් කීපයක් තම්බි මුදියන්සේ විසින් සපයන ලදී. එහෙත් රජුට සුදුසු ඇඳුම් ලැබුණේ නැත. ඇඳුම් සොයා දෙන ලෙස අදිකාරම්ට දැන්වූ නමුත් එය ඉටු නොවීය. පසුව ආණ්ඩුකාරතුමා මගින් මේ ගැන අදිකාරම් වෙත නියෝගයක් නිකුත් කරවීමට ද ඩොයිලිට සිදු විය. නවාතැන් පිළියෙළ කිරීම ද අදිකාරම් විසින් නිසි ලෙස ඉටු නොකරන ලදී.

මෙලෙස නොයෙක් අපහසුකම් මධ්‍යයේ රජ පිරිස කැඳවාගෙන යාමට විධි විධාන යෙදූ ඩොයිලි රජුගේ වස්තූන් සඟවා තිබූ තැන් පිළිබඳව විස්තර ලබාගෙන ඒවා පිළිබඳව විධි විධාන යෙදීමට ද අමතක නොකළේය. ඔහු ගිඩ්ඩව ගමේ සඟවා තිබූ රජුගේ දේපල පහත සඳහන් පුද්ගලයන් බාරයේ තැබීමට කටයුතු කළේය.

1. කොටුවේ ගෙදර ආරච්චිල - තඹ, පිත්තල, රිදී, බඩු පෙට්ටි 03යි.
2. තලවින්නේ දුරයා - තඹ, පිත්තල, රිදී බඩු පෙට්ටි 02යි තුවක්කු 1යි.
3. මාතලේ කෝරාල - ලොකු කෝක් විලක්කු පහන් 02යි, තුවක්කු දෙකක් හා තවත් දේ.
4. මුතුකෙලියාවේ ආරච්චිල - රිදී කාසි 1300යි. ඇත් දත් 4යි, තඹ හා තවත් දේ.

මේ හැර රජ පවුලේ අනික් දේපල හා ඇඳුම් පැලඳුම් ආදිය ලබා ගැනීමටත් ඒවා පිළිබඳව ලේඛනයක් පිළියෙල කිරීමටත් ඩොයිලි අමතක නොකළේය.

අනතුරුව මහනුවර පාලනය පිළිබඳව විධි විධාන යෙදීම සඳහා ජෝන් ඩොයිලි 1815 පෙබරවාරි 26 වැනි දින මහනුවරට පැමිණියේය. ඔහු මහනුවරට පැමිණ ඇහැලේපොල අදිකාරම් හමු විය. මේ අවස්ථාවේ විශේෂ රාජ ගෞරවයක් නොලැබෙන්නේ නම් තමා තනතුරෙන් අස් වන බව ඇහැලේපොල කියා සිටියේය. මොල්ලිගොඩ අදිකාරම තමාට උඩුගම් පහේ තනතුරද, සත් කෝරලේ හෝ සත් කෝරලයේ දිසාපති කමද අවශ්‍ය බව කියා සිටියේය.

ඇහැලේපොල විසින් ඉටු කරනු ලැබූ සේවයට තුටු පඬුරක් වශයෙන් ආණ්ඩුකාරයාගේ නියමය පරිදි රන් පගෝදි 1000ක් ජෝන් ඩොයිලි පෙබරවාරි 28 වැනි දින ඇහැලේපොල වෙත ප්‍රදානය කරන ලදී. එහෙත් ඇල්ලේපොල විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී.



රජු අල්ලාගත් ස්ථානයේ සිහිවටනය

ඔහු ඉල්ලා සිටියේ තමා ඉටු කළ කාර්යයට විශේෂ ආඥාපතක් ලබා දෙන ලෙසයි. ඔහුට අවශ්‍ය වූයේ රජුගේ තත්ත්වයට සමාන තත්ත්වයකි. එහෙත් මේ අවස්ථාවේ ද අනෙකුත් උඩරට රදලවරුන් විවිධ ඉල්ලීම් කළහ. බඹරදෙනියේ ලියනරාල හා තවත් පිරිසක් පැමිණ ඔවුන්ගේ ආගම ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලීය. මාම්පිටියේ රටේ මහත්තයා කිරිබත්කුඹුරේ ලියනරාල හා උන්දියේරාල පැමිණ ඔවුන්ගේ පාලකයා වශයෙන් මරුමුවට පත් පිලිමතලාවේ මහ අදිකාරම්ගේ පුත්‍රයා හෝ සුදු මහතෙකු පත් කරන ලෙස ඉල්ලීය. මේ සියල්ල සලකා බලා සුදුස්සක් කරන බව දැන්වූ ඩොයිලි උඩරට පාලන කටයුතු සංවිධානයේ නිරත විය. 1815 මාර්තු 2 වැනි දින ඓතිහාසික උඩරට ගිවිසුම ප්‍රකාශයට පත් කෙරිණි. වගන්ති 12කින් සමන්විත මෙම ගිවිසුම මඟින් පවතින සිංහල ක්‍රමය අනුව රට පාලනය කිරීමටත් බුද්ධ ධර්මය ආරක්ෂා කිරීමටත් ඉංග්‍රීසීහු පොරොන්දු වූහ. එදින මහනුවර මඟුල් මඩුවේ පැවති විශේෂ උත්සවයකදී ස්වෛරී සිංහල රාජ්‍ය බලය අවසන් බව ප්‍රකාශ කරන ලදී. සර් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා රාජාසනයේ සිට අදිකාරම්වරුන්ගේද, දිසාපතිවරුන්ගේද, මහනුවර අනෙකුත් රදලවරුන්ගේද බැහැදැකීම පිළිගත්හ. කන්ද උඩරට ප්‍රදේශයේ ඉංග්‍රීසි ආධිපත්‍ය පිහිටුවීමේ ප්‍රකාශ පත්‍රය එහිදී කියවන ලදී. ඊට පසු ඉංග්‍රීසි රාජකීය ධජය ඔසවන ලදින් ආචාර වෙඩි මුර පවත්වන ලදී.

"ඩොයිලේ උන්නාන්සේට බලා ගන්නා වග නම් සිංහලේ රජ්ජුරුවෝ අසු වුණෝය. දැන් එක්නැලිගොඩ මොහොට්ටාල රජ්ජුරුවන්ට බොහෝ නෙරෙක්කු කරමින් අපහාස වශයෙන් බැඳලා තල්ලු කරගෙන එනවාය. ඒ නිසා දෝලා ගණනකුත් ගෙන්වාගෙන තමුන්නාන්සේ කඩිනමට මෙහි එන්ට ඕනෑය. රජ්ජුරුවෝ සහ බිසවුන්වහන්සේලා නිරුවස්ත්‍රව වාගේ සිටින නිසා රෙදිත් ගෙනෙන්ට ඕනෑය."

එහෙත් නියමිත වේලාවට පෙර ඉංග්‍රීසි කොඩිය එසවීමට යාමේදී වාරියපොල සුමංගල හිමි එය බිඳ දමා සිංහ කොඩිය ඔසවා දන්වන ලද අභීතභාවය තුඩ තුඩ පැතිර ගියේය. එහෙත් අවසානයේ ඉංග්‍රීසි ආධිපත්‍ය උඩරටියන් විසින් පිළිගන්නා ලදී.

මෙම ගිවිසුමට එංගලන්තයේ මහ රැජින වෙනුවෙන් සර් රොබර්ට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාද, සිංහලේ වැසියන් වෙනුවෙන් ඇහැලේපොල නිලමේද, මොල්ලිගොඩ මහ අදිකාරම්ද, පිලිමතලව්වේ දෙවන අදිකාරමද, (කපුවත්තේ) හතර කෝරලයේ දිසාව කරවූ පිලිමතලව්වේද (කනිෂ්ඨ), ඌවේ දිසාව කරවූ මොනරවිලද, (කැප්පෙටිපොල) මාතලේ දිසාව කරවූ රත්වත්තේද, තුන් කෝරලේ දිසාව කරවූ මොල්ලිගොඩද (කනිෂ්ඨ), වලපනේ දිසාව කරවූ දුල්ලෑවේද, වෙල්ලස්සේ හා බිම්තැන්නේ දිසාව කරවූ මිල්ලවද, තමන්කඩුව දිසාව කළ ගලගමද, නුවර කලාවියේ දිසාව කරවූ ගලගොඩ ද අත්සන් තැබූහ. උඩරට ගිවිසුම මාර්තු 02 දින ප්‍රකාශයට පත් කළත් එයට අත්සන් කළේ මාර්තු 10 දිනය. ඇහැලේපොල ගලගොඩ සහ පිලිමතලව්වේ ගිවිසුමට අත්සන් කළේ මාර්තු 18 දින බව ඩොයිලි සඳහන් කරයි.

මාර්තු 03 වැනි දින කන්ද උඩරට සියලු නායකයෝ මහා වාසල රැස් වූහ. ප්‍රථමයෙන් ආණ්ඩුකාරවරු විසින් උසස් නායකයන් පස් දෙනා වන ඇහැලේපොල, මොල්ලිගොඩ, කපුවත්ත, පිලිමතලව්වේ හා කැප්පෙටිපොල යන නිලමේවරු පිළිගත්හ. ඉතිරි අය පිළිගැනීමේ ශාලාවට ඇතුළු කිරීමෙන් අනතුරුව ඒ ඒ පත් කිරීම් කරන ලදී. ඒ අනුව මොල්ලිගොඩ මහ අදිකාරම් වශයෙන්ද, කපුවත්තේ දෙවන අදිකාරම් ලෙසද නම් කරන ලදී. අනතුරුව පිලිමතලව්වේ සතර කෝරලේ දිසාව වශයෙන්ද, මොල්ලිගොඩ අදිකාරම් සත් කෝරලේ දිසාව නමින්ද, කැප්පෙටිපොල ඌවේ ද, රත්වත්තේ මාතලේද, කපුවත්තේ සබරගමුවේද දිසාවේ පදවිවලට පත් කරන ලදී.

මාම්පිටියේ කුඩා බංඩාර උඩුනුවර රටේ මහතා ලෙසද, පිලිමතලව්වේ (කනිෂ්ඨ) යටිනුවර රටේ මහත්තයා ලෙසද නම් කරන ලදී.

මේ හැර අනෙක් ප්‍රදේශ සඳහාත් දළඳා මාළිගාවේ තනතුරු සඳහාත් අය වරින් වර පත් කරනු ලැබූහ.

මාර්තු 10 වැනි දින ආණ්ඩුකාරයාගේ ප්‍රධානත්වයෙන් මඟුල් මඩුවේ පැවති රැස්වීමට මල්වතු පාර්ශ්වයේ හිමිවරු යටවත්තේ නාහිමි ප්‍රමුඛවද පැමිණ සිටියහ. මෙහිදී මහා සංඝයා ඇමතූ ආණ්ඩුකරු, "බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ ඔබ වහන්සේලාට සම්පූර්ණ ආරක්ෂාව හා ස්ථිර ආධාර සලසන බව නිසැකව පිළිගන්නා මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි. ඔබ වහන්සේලාගේ විහාරස්ථානයන් ශුද්ධ වස්තූන් සේ සලකනවා ඇත. ඔබ වහන්සේලාගේ ආගමට ගෞරවය සැලසෙනවා ඇත." යනුවෙන් ප්‍රකාශ කළේය. මෙයින් තමන් සතුටට පත් වන බව දෙපාර්ශ්වයේම හිමිවරුන් ප්‍රකාශ කළ පසු මහා නායක හා අනු නායක ධූර සඳහා පත් කිරීම ආණ්ඩුකාරවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

මෙලෙස 1815 පෙබරවාරි 18 සිට මාර්තු 10 අතර කාලය තුළ මහනුවර රාජ්‍ය බලය තහවුරු කර ගැනීමට සූක්ෂම උපායක් යොදමින් කටයුතු කළ ඉංග්‍රීසීන් සුලු කලකින් ඒ සියල්ල අමතක කිරීමේ ප්‍රතිඵලය වූයේ අවුරුදු දෙකකින් මුළු මහත් උඩරට පුරා ඉංග්‍රීසි අධිරාජ්‍ය විරෝධී මහත් කැරැල්ලක් පැන නැඟීමය.

විජේරත්න අතුරුපාන

## දවසේ රාහු කාලය

දහවල් 01.40 සිට 03.13 දක්වා අලුයම 01.34 සිට 03.01 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දින තත්ත්වය

මේෂ රවි 23 භාග බක් අව දසවක තිථිය ලත් ගුරු දින ඉර උදාව 05.55ට ඉර බැසීම 06.19ට සියාවස නැකත උදේ 10.36 න් ගෙවී පුවපුටුප නැකත උදාවේ. බක් අව දසවක තිථිය දහවල් 02.16න් ගෙවී බක් අව එකළොස්වක තිථිය ලබයි. මහේන්ද්‍ර යෝගය රාත්‍රී 07.25න් ගෙවී වෛධෘති යෝගය ලබයි. වණිජ කරණය අලුයම 01.46න් ගෙවී විෂ්ටි කරණය ලබා එය දහවල් 02.16න් ගෙවී බව කරණය උදා වේ.

විෂ කලාව - මාපටැඟිලි අමෘත කලාව - පෙකණිය, මරු සිටින දිසාව - දකුණ

යෝගිනී - උතුර, සුබ දිසාව - නැගෙනහිර

### 2021 මැයි 06 බ්‍රහස්පතින්දා හෝරාව ලබා ගෙවී යන අයුරු.

**උදේ**
05.55 සිට 06.55 දක්වා - ගුරු හෝරාව
06.55 සිට 07.55 දක්වා - කුජ හෝරාව
07.55 සිට 08.55 දක්වා - රවි හෝරාව
08.55 සිට 09.55 දක්වා - සිකුරු හෝරාව
09.55 සිට 10.55 දක්වා - බුධ හෝරාව
10.55 සිට 11.55 දක්වා - සඳු හෝරාව

**සවස**
11.55 සිට 12.55 දක්වා සෙනසුරු හෝරාව
12.55 සිට 01.55 දක්වා - ගුරු හෝරාව
01.55 සිට 02.55 දක්වා - කුජ හෝරාව
02.55 සිට 03.55 දක්වා - රවි හෝරාව
03.55 සිට 04.55 දක්වා - සිකුරු හෝරාව
04.55 සිට 05.55 දක්වා - බුධ හෝරාව

**රාත්‍රී**
05.55 සිට 06.55 දක්වා - සඳු හෝරාව
06.55 සිට 07.55 දක්වා - සෙනසුරු හෝරාව
07.55 සිට 08.55 දක්වා - ගුරු හෝරාව
08.55 සිට 09.55 දක්වා - කුජ හෝරාව
09.55 සිට 10.55 දක්වා - රවි හෝරාව
10.55 සිට 11.55 දක්වා - සිකුරු හෝරාව

**අලුයම**
අලුයම 11.55 සිට 12.55 දක්වා - බුධ හෝරාව
12.55 සිට 01.55 දක්වා - සඳු හෝරාව
01.55 සිට 02.55 දක්වා - සෙනසුරු හෝරාව
02.55 සිට 03.55 දක්වා - ගුරු හෝරාව
03.55 සිට 04.55 දක්වා - කුජ හෝරාව
04.55 සිට 05.55 දක්වා - රවි හෝරාව

**බබාට නමක්**

උදේ 10.36 ගෙවී සියාවස නැකත උදාව පවතින නිසා එතෙක් උපදින දරුවන්ට ගො, ස, සි, සු අකුරුද ඉන්පසු පුවපුටුප නැකත උදාවන බැවින් එතැන් සිට උපදින දරුවන්ට සෙ, සො, ද, දි අකුරුද දිනට අදාළව ත, ද, ධ, න අකුරුද මුල්කොට දරුවාට නමක් දැමීම සුබයි.



අද සුබසෙත

## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - යහපත් තීන්දු තීරණ රැසක්**

මේෂ ලග්නයට අනුව අද ඔබට තම කටයුතු ඉතා පිළිවෙළකට කරගෙන යාමට හැකිවේ. සියලු බාහිර ගැටලු අමතක කර අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් තීන්දු තීරණ කීපයක් ගන්නා දිනයකි. ගෘහ ජීවිතට සතුටුදායක වෙයි. ආර්ථික ප්‍රතිලාභද සහිතයි. තුනටිය උගුර ආශ්‍රිත ආසාදන පෙන්වන නිසා සුපරීක්ෂාකාරී වන්න. තම කටයුතුවලට සෙසු අය සහභාගී වනු ඇත.

**වෘෂභ ලග්නය - උසස් තනතුරු ස්ථාන මාරු**

වෘෂභ ලග්නයට අනුව අද ඔබගේ ආර්ථිකය යහපත්ය. රැකියාගත අභිවෘද්ධිය සහිතයි. උසස් තනතුරු ස්ථානමාරු ඇතිවේ. දුර බැහැර රාජකාරී එළඹෙනු ඇත. තම සමීපතමයින්ගෙන් දුරස්වීමට සිදුවේ. එහෙත් සිය පවුල් සබඳතාව තුළ කිසියම් ස්ථාවර බවක් පවත්වා ගැනීමට හැකිවේ. ශරීර සෞඛ්‍යය අතින් මුත්‍රා ආපදා හිසේ කැක්කුම් නිසා කටයුතුවලට බාධා පැමිණේ.

**මිථුන ලග්නය - අවිවේකී දිනක්**

මිථුන ලග්නයට අනුව අද ඔබට එදිනෙදා කටයුතු හුදෙකලාව කරගෙන යාමට සිදුවේ. ආර්ථික ප්‍රතිලාභ ගෙනදෙන කටයුතු රැසක නියැළීමට සිදු වන අතර විවේකී බව අඩුවීම නිසා කිසියම් පීඩාකාරී තත්ත්වයන් උද්ගත වන දිනකි. තම මවු පාර්ශ්වයේ අය වෙතින් දෝෂාරෝපණ එල්ල වීමට ඉඩ ඇත. වතුපිටිවල වැඩ කටයුතු කෙරේ වැඩි උනන්දුවක්, කැපවීමක් දරන දිනකි. විෂ සතුන් දෂ්ට කිරීම් පෙන්වන නිසා ප්‍රවේශම් වන්න.

**කටක ලග්නය - සිතේ කනස්සලු බවක්**

කටක ලග්නයට අනුව අද ඔබට වියදම් ඉහළ යන දිනකි. තම අත්උදව්වට සිටින අයකුගේ වංචනික කටයුත්තක් පිළිබඳව අනාවරණය වීමෙන් සිතට කනස්සලු බවක් ගෙන දෙයි. තමාට වන්නට තිබූ දැඩි මූල්‍යමය අලාභයක් තම සොහොයුරකු නිසා වළකා ගැනීමට හැකිවේ. නීතිමය විසඳුමකට යාමට ඔබට හැකිවන නිසා අලාභහානි මග හරවා ගැනීමට හැකිවේ.

**සිංහ ලග්නය - නිවෙසේ අලංකරණ කටයුත්තක්**

සිංහ ලග්නයට අනුව ඔබට තම යුග දිවියේ අභියෝග රැසක් ජය ගැනීමට හැකිවේ. ආර්ථික ප්‍රතිලාභයක් වෙනුවෙන් දැඩි කැපවීමක් දරන්නට සිදුවේ. නිවසේ අලංකරණ කටයුත්තක් නිසා වියදම් දැරීමට සිදුවේ. විටින් විට තමාට ගැටලු ගෙන ආ කෙනකුගේ වියෝවක් පිළිබඳව අසන්නට ලැබේ. තම ගෘහ ජීවිතයේ කටයුතු කලට වේලාවට කරගෙන යාමට හැකිවේ.

**කන්‍යා ලග්නය - තම පවුලට නව සාමාජිකයෙක්**

කන්‍යා ලග්නයට අනුව අද ඔබට තම පවුලේ අයකුට හදිසියේ හට ගන්නා රෝගී තත්ත්වයක් නිසා ඒ වෙනුවෙන් කැපවීමට සිදුවේ. ආර්ථික ප්‍රතිලාභ ඇතත් වියදම් අධික වන බවක්ද පෙනෙන්ට තිබේ. තම පවුලට නව සාමාජිකයකු එකතුවන ලකුණු පළ වේ. දුර බැහැර සිට පැමිණි තම ඥාතියකු නිසා නිවසේ කටයුතු සුහදශීලිව කරගෙන යාමට අවස්ථාව උදාවේ

**තුලා ලග්නය - බොහෝ හිතවතුන්ගේ සහාය**

තුලා ලග්නයට අනුව ව්‍යාපාර ලාභ නව ආයෝජනයකට අතගැසීම ආදී කටයුතු නිසා එදිනෙදා ජීවිතය කාර්යබහුල වෙයි. එහෙත් බොහෝ හිතවතුන්ගේ සහයෝගය මත කලක් අක්‍රියව තිබූ කටයුතු රැසක් සක්‍රිය කර ගැනීමට හැකිවේ. තම පිය පාර්ශ්වයේ උරුමකම් හිමිකම් දක්නට ලැබේ. දණහිසට අගුණයි. උඩ නැගීම් හා ගින්දර විදුලිය ආශ්‍රිත කටයුතු කෙරෙහි දුරස්වීම සුභයි.

**වෘශ්චික ලග්නය - රැකියා අභිවෘද්ධිය**

වෘශ්චික ලග්නයට අනුව දේපළ හිමිකම් වාහන ඉඩම් නිවාස ප්‍රතිලාභ පෙනෙන්නට තිබේ. රැකියා ස්ථානගත අභිවෘද්ධියද සහිතයි. තම විවාහගත මත ගැටුමක් දුරදිග යාම නිසා සිතට නොසන්සුන්තා මතු කෙරේ. එහෙත් තම සහායට පැමිණෙන අයකු නිසා ගැටලු අවම කර ගැනීමට ද හැකිවේ. හිසේ වේදනා කැලඹිලි නිසා බොහෝ කලකිරෙන ස්වරූපයක්ද දක්නට ලැබේ.

**ධනු ලග්නය - යුගදිවි ගමනේ යහපත් කඩඉමක්**

ධනු ලග්නයට අනුව අද ඔබගේ දිවිය සැපවත් කරන හේතු කීපයක් ඇතිවේ. ඒ තම යුගදිවි ගමනේ යහපත් කඩඉමක් පසු කරන නිසාය. අඹුසැමි සබඳතා ශක්තිමත් වීම ආර්ථික සඵලතාව හා නව ව්‍යාපාරයකට අත ගැසීම නිසා මේ තත්ත්වය උදාවේ. නිවසේ උත්සවශ්‍රීයක් පෙනෙන්නට තිබේ.

**මකර ලග්නය - අසරණයන්ට පිළිසරණක්**

මකර ලග්නයට අනුව අද ඔබට තම ගම්පියසේ පොදුජන හඬට අනුව සමාජසේවා කටයුත්තකට මුල්වීමට හේතුවේ. ජලයෙන් විදුලියෙන් සිදුවූ අලාභයකට අනුව අසරණවුණු පිරිසක් ඉන් මුදා ගෙන ඇප උපකාර කිරීමට ඔබ ඇතුළු සමීපතමයින්ට පැවරෙන වගකීම් අතර ප්‍රධාන වේ. තම කාලය, ශ්‍රමය, ධනය ඒ අනුව වැයවනු ඇත. සිතේ සතුට සැනසීම ඉන් අත්පත් වනු ඇත.

**කුම්භ ලග්නය - දේපළ උරුමකම්**

කුම්භ ලග්නයට අනුව අද ඔබට තම හිතවත් භාවය මත තමාට උපකාරයට පැමිණෙන අයකු නිසා ධනයකට හිමිකම් කියයි. දේපළ උරුමකම් අතර රැකියාගත අභිවෘද්ධියද පෙනෙන්නට තිබේ. හදිසි අනතුරුසහගත තත්ත්වයක් නිසා එදිනෙදා කටයුතුවලට බාධා පැමිණේ. තම ඥාති හිතෛෂීන් වෙතින් ප්‍රසංශා ලැබෙන දිනකි. වියදම උග්‍ර වුවද සිතේ සතුට පළවනු ඇත.

**මීන ලග්නය - අනාගත ආයෝජනයකට සැලසුම්**

මීන ලග්නයට අනුව අද ඔබට විදේශ රටක සිටින අයකුගෙන් සතුටුදායක ආරංචියක් ලැබෙනු ඇත. ඔබ ඉල්ලා තිබූ ණය මුදලක් ඔබට ලැබෙනු ඇත. ඒ තුළින් ඔබ නව ව්‍යාපාරයකට අතගැසීමට උනන්දුවේ. ආදායම් අතින්ද යහපත් වන අද දින පවුලේ සාමාජිකයින් සියලු දෙනා එකට එකතුව අනාගත ආයෝජනයකට කටයුතු සැලසුම් කරනු ඇත.

---

### පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්නගෙන් සමාජ සත්කාර්යයක්:

# කළුතර කොවිඩ් ආසාදිතයන්ට ප්‍රතිකාර වාට්ටුවක් ඉංගිරිය දිසා රෝහලට

**රක්ෂණ ශ්‍රියන්ත**



පොදු ජන පෙරමුණ කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ කළුතර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති සංජීව එදිරිමාන්න මහතා විසින් කළුතර දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිත පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීමට සියලු පහසුකම් සහිතව ඇඳන් 20කින් සමන්විත ප්‍රතිකාර වාට්ටුවක් ඉංගිරිය දිසා රෝහලේ ස්ථාපිත කර ඊයේ (05) කළුතර දිස්ත්‍රික් මහා දිසාපති ප්‍රසන්න ගිනිගේ මහතා වෙත භාර දෙන ලදී.

ඉංගිරිය රෝහලේ තාවකාලිකව භාවිතයෙන් ඉවත් කර තිබූ වාට්ටුවක් ප්‍රතිසංස්කරණය කර නවීන ඇඳන් 20ක් සහ ඊට අදාළ අනෙකුත් මූලික පහසුකම් සහිතව මේ කොවිඩ් ප්‍රතිකාර වාට්ටු සංකීර්ණය ස්ථාපිත කර තිබේ.

කළුතර දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිතයන් වැඩිවීම සහ අසාධ්‍ය තත්ත්වයේ පවතින රෝගීන් ක්ෂණිකව රෝහල්ගත කිරීමේ ඇති දැඩි වුවමනාව නිසා තමන් විසින් මේ ප්‍රතිකාර වාට්ටු සංකීර්ණය ස්ථාපිත කිරීමට පියවර ගත් බව පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා පැවසීය.

මේ වන විට රජයේ රෝහල්වල ඇඳන් ශීඝ්‍රයෙන් පිරී යමින් පවතින හෙයින් රජය මතම සියලු බර නොපටවා තමන්ගේ ප්‍රදේශයේ ජනතාව වෙත සහන සැලසීමේ දැඩි වුවමනාවෙන් තමන් මේ සද්ක්‍රියාව සිදුකළ බවද ඒ මහතා පෙන්වා දෙයි.

ඉදිරියේදී තම දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිතයන් සඳහා රෝහල්වල ඇඳන් ධාරිතාව 100 දක්වා වැඩි කිරීම තමන්ගේ ඉලක්කය බවත් මේ වන විටද එම ඉලක්කය ජය ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙළ ක්‍රියාවට නංවා ඇති බව පවසන සංජීව එදිරිමාන්න මහතා මේ වැඩසටහනේ දෙවැනි අදියර යටතේ මතුගම රෝහලේද කොවිඩ් ප්‍රතිකාර වාට්ටු සංකීර්ණයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් සිටින බවද කියා සිටියේය.

මේ කොවිඩ් ප්‍රතිකාර වාට්ටු ස්ථාපිත කිරීම සිදුකරනු ලබන්නේ සංජීව එදිරිමාන්න මහතාගේ සහ ඔහුගේ මිතුරන්ගේ ධන පරිත්‍යාගයෙන් සහ ශ්‍රම පරිත්‍යාගයෙනි.



පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න



කළුතර දිස්ත්‍රික් මහා දිසාපති ප්‍රසන්න ගිනිගේ

මේ ජාතික ආපදා අවස්ථාවේදි සම්මත සීමාවන්ගෙන් ඔබ්බට යමින් පුළුල් මහජන සේවාවක් ඉටු කිරීම මහජන නියෝජිතයකු වන තමන්ගේ අපේක්ෂාව බවද සංජීව එදිරිමාන්න මහතා වැඩිදුරටත් කියා සිටී.

---

# මරණ දඬුවම ඉවත දමන්නැයි ඉල්ලා ගොනු කළ අභියාචන පෙත්සමක් අභියාචනාධිකරණය නිෂ්ප්‍රභ කරයි

**නෙල්කා මැදගෙදර**

ජූරි සභාවක් ලබා ගන්නවාද? නැත්ද? යන්න පිළිබද තීරණ ගැනීමට නඩු විභාගය ආරම්භයේදී රත්නපුර මහාධිකරණ විනිසුරුවරයා තමන්ට අවස්ථාව නොදී නීතියට පටහැනිව නඩු විභාගය පවත්වා ඇති බැවින් තමන්ට නියම කළ මරණ දඬුවම ඉවත දමන ලෙස ඉල්ලා පුද්ගලයකු ගොනු කර තිබූ අභියාචන පෙත්සම නිෂ්ප්‍රභ කිරීමට අභියාචනාධිකරණය තීන්දු කර ඇත.

මහාධිකරණ විනිසුරුවරයා අදාළ වරද විත්තියේ නීතීඥවරයාගේ එකඟත්වයෙන් නිවැරදි කර ඇති බැවින්, විත්තිකරුට දුන් මරණ දඬුවම නිවැරදි බවත්, ඒ අනුව අභියාචනය නිෂ්ප්‍රභ කරන බව ඉකුත් අප්‍රේල් මස 29 වැනිදා දෙන ලද මේ අභියාචනාධිකරණ තීන්දුවේ සඳහන් වේ.

රත්නපුර මහාධිකරණය විසින් මරණ දඬුවම් නියම කිරීමට එරෙහිව කුරුකුලගේ සරත් කුමාර නැමැත්තා විසින් ගොනු කර ඇති මේ පෙත්සමේ වගඋත්තරකරු ලෙස නීතිපති නම් කර තිබුණි.

අභියාචනාධිකරණ විනිසුරු සම්පත් බී. අබේකෝන් මහතාගේ එකඟතාව සහිතව අභියාචනාධිකරණ විනිසුරු ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් මේ නඩු තීන්දුව ලබා දී ඇත.

එම තීන්දුවේ මෙසේද සඳහන් වේ.

අධිකරණ පනතේ 11 වැනි ඡේදය යටතේ නඩු විභාගය ආරම්භ වීමට ප්‍රථම ජූරි සභාවක් අවශ්‍යද? නැද්ද? යන්න පිළිබඳ විත්තිකරුගෙන් විමසා ඊට අවස්ථාව ලබා නොදීමෙන් මහාධිකරණ විනිසුරුවරයා විසින් නීතියට පටහැනිව කටයුතු කොට ඇතැයි විත්තිකාර අභියාචකගේ නීතීඥවරයා පෙත්සම් විභාගයේදී අභියාචනාධිකරණයට දැනුම් දී ඇත.

මහාධිකරණ විනිසුරුවරයාගේ තීන්දුව නීතියට පටහැනි බැවින් විත්තිකාර අභියාචකගේ මරණ දඬුවම අහෝසි කොට ඔහු නිදොස් කොට නිදහස් කරන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා ඇත.

මේ පිළිබඳ කරුණු දක්වමින් නීතිපති වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය කියා සිටින්නේ 2019 මාර්තු 26 වැනිදා මේ වරද පිළිබඳ රජයේ නීතීඥවරයා මහාධිකරණ විනිසුරුවරයාට දැනුම් දුන් අතර, ඒ අනුව එම වරද විත්තිකාර අභියාචක නීතීඥවරයාගේ එකඟත්වයෙන් නිවැරදි කළ බවත්ය.ඒ අනුව විත්තිකාර අභියාචකගේ තර්කය පදනම් විරහිත බව ඇය සඳහන් කළාය.

එබැවින් විත්තිකාර අභියාචකගේ පෙත්සම නිෂ්ප්‍රභ කරන ලෙසද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය අධිකරණයෙන් ඉල්ලා සිටියාය.

2019 මාර්තු 26 වැනිදා මහාධිකරණ නඩු වාර්තාවේ සටහන් පරීක්ෂා කිරීමේදී මෙසේ සඳහන් වේ.මේ නඩුවේ නඩු විභාගය 2006 අගෝස්තු16 වැනි දින පූර්වගාමී මහාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා ඉදිරියේ නඩු කටයුතු ආරම්භ කර ඇති නමුත් , එදින ජූරි සභාවක් සහිතව හෝ රහිතව නඩු විභාගයට ගන්නේද යන්න පිළිබද සටහනක් නැති අතර , ඒ සම්බන්ධයෙන් රජයේ නීතීඥවරිය අධිකරණයේ අවධානය යොමු කර ඇත.

ඒ අනුව අධිකරණය මේ නඩු වාර්තා පරීක්ෂා කිරීමේදී ජූරි සභාවක් සහිතව ද හෝ රහිතවද යන්න පිළිබඳ සටහනක් නොමැති බවට අනාවරණය විය.

මේ අවස්ථාවේ විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතීඥවරිය පවසා ඇත්තේ ජූරි සභාවක් රහිතව නඩු විභාගයක් ගැනීම සම්බන්ධයෙන් විරුද්ධ නොවන බවත් , එය නඩු විභාගය ආරම්භයේදී යොදන ලද සටහනක් ලෙස සලකන බවත්ය.

ඒ අනුව විත්තිකාර අභියාචකට අගතියක් වී නැති බව අභියාචනාධිකරණයේ මතයයි.

ඒ අනුව පෙත්සම නිෂ්ප්‍රභ කරන බවද තීන්දුවේ සඳහන් වේ.

විත්තිකාර අභියාචක වෙනුවෙන් නීතීඥ දුමින්ද ද අල්විස් මහතා පෙනී සිටියේය.

නීතිපති වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ලක්මාලි කරුණානායක මහත්මිය පෙනී සිටියාය.

---

# පොලිස් කොස්තාපල්වරුන් බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය කල් යයි

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

මැයි මස 08 වැනි දිනට නියමිතව තිබූ පොලිස් කොස්තාපල්වරුන් සහ කාන්තා පොලිස් කොස්තාපල්වරියන් බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් දින නියමයක් නොමැතිව කල් දැමූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

කොළඹ, අනුරාධපුර, මහනුවර අම්පාර සහ ගාල්ල ප්‍රදේශවල මේ ලිඛිත පරීක්ෂණය පැවැත්වීමට නියමිතව තිබු අතර, රටේ පවතින කොරෝනා තත්ත්වය හේතුවෙන් එය කල් දමා තිබේ.

මේ සම්බන්ධයෙන් අදාළ අයැදුම්කරුවන් වෙත දැනුම් දී තිබුණද ඔවුන්ට යම් තොරතුරක් දැනගත යුතුව ඇත්නම්, දුරකතන අංක 0115811921 සහ 0115811925 යන අංකවලට ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

---

# කිංග්ස්බරි බෝම්බකරුගේ බිරිය ඇතුළු සැකකරුවන් සිව්දෙනා තවදුරටත් රිමාන්ඩ්

**සුභාෂිණී සේනානායක**

කොළඹ කිංග්ස්බරි හෝටලයට බෝම්බ ප්‍රහාරයක් එල්ල කළ සිද්ධියට අදාළව රක්ෂිත බන්ධනාගාරගතව සිටින බෝම්බ ප්‍රහාරය එල්ල කරමින් මියගිය මොහොමඩ් මුබාරක් නැමැති ත්‍රස්තයාගේ බිරිය වන

අයේෂා සිද්ධිකා, මොහොමඩ් වසීම් ඇතුළු සැකකරුවන් සිව්දෙනා තවදුරටත් ලබන ජූනි මස 08 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ(05) නියෝග කළේය.

රටේ පවතින කොවිඩ් තත්ත්වය හමුවේ නඩුව කැඳවනු නොලැබූ අතර අදාළ නියෝග සැකකරුවන් රඳවා සිටින බූස්ස සහ අනෙකුත් බන්ධනාගාරවලට දන්වා යවන ලෙස මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

බූස්ස බන්ධනාගාරයේ රඳවා සිටින ෆස්රුල් රහුමාන් යන සැකකරුට අයත් ජංගම දුරකථන දෙකක් සහ ලැප්ටොප් යන්ත්‍රයක් ඇතුළු උපකරණ රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඉකුත් අප්‍රේල් මස 29 වැනි දින රහස් පොලිසියට නියෝග කළේය.

---

# අක්ෂි යන්ත්‍ර පරිත්‍යාගයක්




මැයි මස 01 වන දිනට යෙදුණු, කිරිබත්ගොඩ, ගැමුණු මාවත, ශ්‍රී නිග්‍රෝධාරාම විහාරාධිපති, පූජ්‍ය පොද්දලගොඩ වංසාලංකාර ස්වාමීන් වහන්සේගේ 53 වැනි ජන්ම දිනය නිමිත්තෙන් කිරිබත්ගොඩ ප්‍රාදේශීය රෝහලට අත්‍යාවශ්‍ය වූ අක්ෂි පරීක්ෂණ යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම

# LexDuco 10 වැනි වසර සමරයි



ඉදි කිරීම් ක්ෂේත්‍රය දිනෙන් දින අලුත් වෙමින් පවතින ක්ෂේත්‍රයක් වන අතර මෑත කාලයේ බොහෝ සමාගම් ඉදි කිරීම් සේවා සඳහා ඉදිරිපත් වන අතර, ඒ අතරින් LexDuco සුවිශේෂී ස්ථානයක් හිමි කර ගනී. ඔවුන් සිය ව්‍යාපාරයේ 10 වැනි සැමරුම පසුගියදා කොළඹදී සැමරූ අතර, පසුගිය වසර 10 තුළ ව්‍යාපෘති 1,000කට වැඩි ප්‍රමාණයක් පාරිභෝගිකයන්ට සාර්ථකව දායක කර ඇත. මේ උත්සවයට කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ සම්භාවනීය අමුත්තන් සහභාගි වූ අතර, ආයතනයේ ආරම්භයේ සිට සේවාව සැපයූ සේවක මහත්ම මහත්මීන්ටද ඒ සඳහා ආරාධනා කර තිබිණි.

LexDuco සිය ගනුදෙනුකරුවන්ට අලංකාර සුඛෝපභෝගී නිවාස සැලසුම් සහ ඉදිකිරීම් කළමනාකරණය සඳහා විසඳුම් දෙන අතරම පාරිභෝගිකයන්ට සිය සිහින නිවහන සාදා ගැනීම සඳහා සැපයුම්කරුවන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට දීම ඇතුළු පදිංචිය දක්වා සියලු කටයුතු වගකීමෙන් කළමනාකරණය කිරීම කරනු ලැබේ.

වසර 10ක සිය ආයතනික ගමන් මඟ පිළිබඳ අදහස් දක්වමින් LexDucoහි සභාපති ආචාර්ය බුද්ධික අධිකාරි මහතා මෙසේ පැවසීය. "ශ්‍රී ලංකාවේ ඉදි කිරීම් කර්මාන්තයේ අවශ්‍යතා තේරුම් ගැනීමට අප සතුව ඇති හැකියාව අපේ ගමනට ශක්තියක් වී තිබෙනවා. පසුගිය වසර 10 පුරාවට අප සමඟ සිටි සියලු සේවකයන්ට, හවුල්කරුවන්ට සහ අපගේ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙනවා.

අපගේ සේවා පරාසය සමඟ තවත් ආකර්ෂණීය එකතු කිරීම් බොහොමයක් නුදුරේදී පාරිභෝගිකයන්ට හඳුන්වා දීමට කටයුතු කරනවා."

# ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් හෝමාගම මූලික රෝහලට වෛද්‍ය උපකරණ පිරිනමයි

දිවයිනේ පැරණිතම මූල්‍ය සමාගමක් වන ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් සමාගම (AMF) පසුගියදා හෝමාගම මූලික රෝහල වෙත රුපියල් මිලියන 2කට අධික වටිනාකමින් යුතු වෛද්‍ය උපකරණ පරිත්‍යාග කළේය. හෝමාගම මූලික රෝහල ප්‍රදේශයේ කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කරන ප්‍රධානතම වෛද්‍ය මධ්‍යස්ථානයයි.

මෙලෙස පරිත්‍යාග කෙරුණු උපකරණ අතරට රෝහලේ දැඩිත්කාර ඒකකයට සහ ශල්‍යාගාරයට අත්‍යවශ්‍යව තිබූ Patient Controlled Analgesia Pumps දෙකක්, DVT Pumps දෙකක් හා Patient Warmers දෙකක් අයත් විය. AMF සමාගම විසින් මේ පරිත්‍යාගය කරන්නේ කොවිඩ් දෙවැනි රැල්ල සමඟ ඇතිව තිබෙන අභියෝගාත්මක තත්ත්වයට පවතින සම්පත් සමඟ මුහුණ දීමට රෝහල් කාර්ය මණ්ඩලය දැඩි වෙහෙසක් ගන්නා අතරතුරදී වීම විශේෂත්වයයි. මේ පිළිබඳ අදහස් දක්වමින් හෝමාගම මූලික රෝහලේ වෛද්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය ජනත හෙට්ටිආරච්චි මහතා මෙසේ පැවසීය "හෝමාගම මූලික රෝහල කොවිඩ් 19 රෝගීන්ට ප්‍රතිකාර කරන මධ්‍යස්ථානයක් වශයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන රෝහලක්. කොවිඩ් වසංගතයේ දෙවැනි රැල්ල ආරම්භ වීමත් සමඟ අප සතුව තිබූ සීමිත සම්පත් සමඟ මේ අභියෝගයට මුහුණ දීම තරමක් දුෂ්කර කාර්යයක් වුණා.

මේ අවස්ථාවේදී අප කළ ඉල්ලීමට ඉක්මනින් හා පරිත්‍යාගශීලීව ප්‍රතිචාර දක්වමින් උපකාර කිරීමට ඉදිරිපත් වීම පිළිබඳ අප AMF සමාගමට බෙහෙවින්ම ස්තූති වන්ත වෙනවා".

මේ පිළිබඳ අදහස් දැක්වූ ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ටී. එම්. ඒ. සාලේ මහතා "ශ්‍රී ලංකාවේ පැරණිතම මූල්‍ය සමාගමක් වශයෙන් හැමවිටම අපේ සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වුණු, ඒ වෙනුවෙන් නොපැකිළිව ඉදිරිපත් වූ ආයතනයක්. රටම වෙලා ගෙන සිටින කොවිඩ් වසංගතයට එරෙහි ජාතික සටනේදී අපේ යුතුකම් කොටස මැනවින් ඉටු කිරීමට හැකි වීම විශාල සතුටක්. ඉදිරියේදීත් මේ වෙනුවෙන් කළ හැකි සියල්ල ඉටු කිරීමට අප සමාගම සැදී පැහැදී සිටිනවා."

# AI & Vision Solutions කිරුළු පලඳී



කෘත්‍රිම බුද්ධියෙන් සවි ගැන්වූ අධි තාක්ෂණික විසඳුම් සැපයීමෙහි ප්‍රමුඛයකු වන AI & Vision Solutions (Pvt) Ltd පසුගියදා පැවැති SLASSCOM Ingenuity Awards 2021 සම්මාන උලෙළේදී බස්නාහිර පළාතේ නවෝත්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ටම පෙරළිකාර වෙනසක් කළ ආයතනයක් ලෙස පිදුම් ලැබීය. මෙරට තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍රයේ අද්විතීය වෙනසක් කරන ආයතන හා පුද්ගලයන් ඇගයීම පිණිස ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සමාගම් සංගමය (SLASSCOM) තෙවැනි වරටත් සංවිධාන කළ සම්මාන උලෙළ කොළඹ ෂැන්ග්‍රී ලා හෝටලයේදී පසුගියදා උත්කර්ෂවත් ලෙසින් පැවැත්විණි.

තොරතුරු තාක්ෂණ නව්‍යකරණ ක්ෂේත්‍රයේ දැවැන්තයන් සමඟ තරග කරමින් AI & Vision Solutions සමාගමට මේ ජයග්‍රහණය ලැබීමට හැකි වූයේ සමාගමේ නවෝත්පාදන හැකියාවේ විශිෂ්ටත්වය නිසාය. කෘත්‍රිම බුද්ධිය (AI), Machine Learning, Computer Vision හා IoT ආදි ක්ෂේත්‍රවල විශේෂඥතාවක් ඇති AI & Vision Solutions සමාගම වැඩි කාර්යක්ෂමතාවකින් යුතු විසඳුම් අඩු වියදමකින් සපයයි. 2019 මුල් භාගයේදී ඇරඹි සමාගම අධි තාක්ෂණික ස්වයංක්‍රිය ප්‍රවේශ පත්‍ර පද්ධති, වාහන ගාල් කළමනාකරණ පද්ධති, අධිවේගී මාර්ග ප්‍රවේශ පත්‍ර පද්ධති, වාහන ප්‍රවේශ පාලන හා සෝදිසි, ප්‍රේක්ෂක විශේෂිත වෙළෙඳ ප්‍රචාරණ විසඳුම්, ජන සංගණන හා විශ්ලේෂණ විසඳුම්, මාර්ග නීති උල්ලංඝන පිරික්සුම්, ජාල හා ආරක්ෂණ විසඳුම් ආදි අධි තාක්ෂණික නිපයුම් රැසක් ඉදිරිපත් කරයි.

නවෝත්පාදනයේ නොසන්සිඳෙන පිපාසය, පාරිභෝගික තෘප්තිය කෙරෙහි වූ දැඩි කැප වීම සමාගමේ සාර්ථකත්වයේ රහසයි. AI & Vision Solutions සමාගමේ නව නිපයුම් හේතුවෙන් විදේශවලට මුදල් ඇදී යෑම වළකී. මේ අගනා සම්මානය වෙනුවෙන් SLASSCOM වෙත කෘතවේදීත්වය පළ කරන AI & Vision Solutions සමාගම සිය පාරිභෝගිකයන් තමන් කෙරෙහි තැබූ විශ්වාසය කෘතඥතා පූර්වකව සිහි කරයි. එමෙන්ම සම්මානය දිනා ගැනීමට කැප වූ කාර්ය මණ්ඩලයට ස්තූතිය පිරිනමයි.

# MARKET PRICE

## රට වටා මිල ගණන්



| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| පහත රට එළවළු | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 90 | 100 | 45 | 45 | 30-35 | | ගෝවා | 95 |
| අළු කෙසෙල් | 100 | 120 | 70 | 60 | 20-30 | | කැරට් | 115 |
| පිපිඤ්ඤා | 100 | 120 | 80 | 60 | 30 | | ලීක්ස් | 50 |
| වැටකොළු | 160 | 160 | 120 | 80 | 60 | | රාබු | 50 |
| බණ්ඩක්කා | 140 | 160 | 90 | 90 | 10-70 | | බීට්රූට් | 70 |
| කරවිල | 160 | 180 | 120 | 110 | 90-110 | | අර්තාපල් | 115 |
| පතෝල | 140 | 160 | 100 | 120 | 50 | | අර්තාපල් රතු | 100 |
| මාළු මිරිස් | 240 | 240 | 180 | 150 | 140 | | නෝකෝල් | 60 |
| බටානා | - | 120 | 90 | 70 | 65-70 | | බෙල්පෙපර් රතු | 350 |
| මුරුංගා | 360 | - | - | - | - | | කහ | 350 |
| එළබටු | 140 | 160 | 100 | 90 | 60-70 | | කොළ | 220 |
| කැකිරි | 80 | 80 | 110 | 30 | 20-30 | | බැසිල් | 330 |
| නෝකෝල් | 160 | 140 | 120 | 90 | 70 | | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 80 | 80 | 50 | - | 30 | | රෙඩ් කැබේජ් | 450 |
| බතල | - | - | 80 | - | 40-60 | | සැල්දිරි | 450 |
| දඹල | 160 | 160 | 110 | 110 | 80-120 | | කොත්තමල්ලි කොළ | 200 |
| මැකරල් | 140 | 140 | 90 | 80 | 70-80 | | අයිස්බර්ග් | 220 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 60 |
| බෝංචි | 200 | 180 | 130 | 140 | 140-150 | | රතුසලාද | 350 |
| ගෝවා ගෙඩි | 100 | 160 | 90 | 100 | 85-110 | | මිංචි | 220 |
| කැරට් | 180 | 200 | 160 | 150 | 140-160 | | පාස්ලි | 220 |
| ලීක්ස් | 120 | 120 | 80 | 75 | 60-70 | | රූබා | 60 |
| රාබු | 120 | 100 | 90 | 80 | 50 | | රෝස්මරි | 700 |
| තක්කාලි | 140 | 140 | 90 | 70 | 60 | | බ්‍රොකෝලි | 550 |
| බීට්රූට් | 120 | 120 | 50 | 50 | 80 | | මල්ගෝවා | 400 |
| සලාද | - | 300 | 250 | - | 140-150 | | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 160 | - | 120 | 30 | 15-20 | | පැවර්ලි | 220 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 140 | 200 | 110 | 100 | 80-100 | | කහ සුකිනි | 170 |
| ඇඹුල් කෙසෙල් | 120 | 120 | 70 | 50 | 20-40 | | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 220 | 200 | 170 | 120 | 100-140 | | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 140 | 140 | 80 | 50 | | | මාළුමිරිස් | 200 |
| ඇඹුන් | 200 | 200 | 140 | - | 130-140 | | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | 130 | 110 | - | | | | |
| ගස් ලබු | 120 | 140 | 110 | 50 | 30-40 | | | |
| ඇපල් (ආනයනික) | 60-80 | 80 | 60 | - | 30-40 | | | |
| මිදි (දේශීය) | - | 1000 | - | - | | | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 900 | - | | | | |
| මිදි (ආනයනික කොළ) | 1100 | 1200 | 900 | - | 1100 | | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 580 | 600 | 530 | - | 550 | | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 480 | 560 | 600 | - | - | | | - |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 200 | 240 | 160 | 70 | 120-140 | | | |
| දෙහි | 180 | 200 | 130 | 130 | 80-90 | | | |
| අමු ඉඟුරු | - | 500 | 240 | - | 160-180 | | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-115 | 110 | 110 | 104 | - | | | |
| සුදු නාඩු | 96-120 | 110 | 115 | 114 | 104-105 | | | |
| රතු කැකුළු | 89-100 | 100 | 95 | 94-95 | - | | | |
| සුදු කැකුළු | 93-115 | 105 | 110 | 104-105 | 100 | | | |
| සුදු කැකුළු සම්බා | 108 | - | 120 | 125 | - | | | |
| තම්බපු කැකුළු සම්බා | 110 | 135 | 155 | 125 | 135-140 | | | |
| කිරි සම්බා | 125-200 | 190 | 190 | - | 198 | | | |



### දැනගෙන ගන්න රන් මිල

| | |
|---|---|
| කැරට් 21 | 94937 |
| කැරට් 22 | 99458 |
| කැරට් 24 | 108500 |

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## රුහුණ විශ්වවිද්‍යාලය - මාතර

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

### IFB අංකය : RUH/ENG/SUP/2021/02

### විද්‍යාගාර උපකරණ (CEE), විද්‍යාගාර උපකරණ (EIE), විද්‍යාගාර උපකරණ (MME), පරිගණක හා ජාල පද්ධති උපාංග, බහුමාධ්‍ය හා කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම, පරීක්ෂා කිරීම සහ නඩත්තුව

01. රුහුණ විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා පහත සඳහන් භාණ්ඩ සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම, පරීක්ෂා කිරීම හා නඩත්තුව සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

| අයිතම අංකය | භාණ්ඩ / විස්තරය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය (රු.) | ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|
| **Package No. 01: Laboratory Equipment (CEE)** | | | | |
| 1.1 | pH meter/Thermometer/EC meter/ORP meter | 3 | 14,000.00 | 3,500.00 |
| 1.2 | Turbidity meter | 3 | 14,000.00 | |
| 1.3 | DO meter | 3 | 12,000.00 | |
| 1.4 | Steel band tape | 10 | 6,000.00 | |
| 1.5 | Linen tape | 10 | | |
| 1.6 | Ranging pole | 20 | | |
| 1.7 | Mallet | 10 | | |
| 1.8 | Compass | 10 | | |
| 1.9 | Arrows | 20 | | |
| 1.10 | Spring balance | 12 | | |
| 1.11 | Thermometer | 1 | | |
| 1.12 | Auto level machine 24 Magnification | 8 | 6,000.00 | |
| 1.13 | Metacentric Height | 1 | 6,000.00 | |
| 1.14 | Deflection of Beams & Cantilevers and Ancillaries | 1 | 15,000.00 | |
| 1.15 | Bending moments in a beam and Ancillaries | 1 | 14,000.00 | |
| **Package No 02: Laboratory Equipment (EIE)** | | | | |
| 2.1 | Rectifier and a Controllable Inverter | 1 | 12,000.00 | 3,000.00 |
| 2.2 | Variable Frequency Drive to Study the Induction Motor Speed Control | 1 | 9,000.00 | |
| 2.3 | Insulation Tester | 1 | 22,500.00 | |
| 2.4 | RF Signal Generator (1 MHz – 3 GHz) | 1 | | |
| 2.5 | PC based Portable Logic Analyzer | 1 | | |
| 2.6 | Portable Digital Multimeter | 5 | 6,000.00 | |
| 2.7 | FPGA Development Board | 1 | 4,000.00 | |
| **Package No 03: Laboratory Equipment (MME)** | | | | |
| 3.1 | Universal tool and cutter grinder (with all standard and optional accessories) | 1 | 22,500.00 | 2,000.00 |
| 3.2 | Industrial flue gas analyzer-portable | 1 | 7,500.00 | |
| **Package No 04: Computer & Network Accessories** | | | | |
| 4.1 | Computer Laptop i7 | 2 | 6,000.00 | 3,500.00 |
| 4.2 | High Performance Workstation | 1 | 30,000.00 | |
| 4.3 | Online UPS – 1 kVA | 8 | 13,000.00 | |
| 4.4 | Online UPS – 2 kVA | 3 | | |
| 4.5 | Online UPS – 3 kVA | 2 | | |
| 4.6 | Internationally Branded Wireless Access Points | 8 | 18,000.00 | |
| 4.7 | Internationally Branded Wireless Access Point range Extenders | 2 | | |
| 4.8 | Internationally Branded 24-Port FXS IP Gateway | 3 | | |
| 4.9 | RJ11 Surge Protectors for Telephones | 10 | 5,000.00 | |
| 4.10 | Analog telephones | 50 | | |
| 4.11 | 24 Ports Gigabit Ethernet Network Switches | 7 | 16,000.00 | |
| 4.12 | Wire Tracker, Line Finder and LAN Cable Tester for Network and Telephone Cable Collation | 1 | 3,000.00 | |
| 4.13 | RJ45 to SC Gigabit Ethernet Media Converter, Single Mode Fiber | 6 | | |
| 4.14 | USB 3.0, 2TB Portable HDD | 1 | | |
| 4.15 | Simulink Desktop Realtime capable DAQ card (8A –IN 14bit, 8A-OUT 14bit, 8D-IN,8D-OUT,2-QEI,4-PWM minimum) (Eg-HUMUSOFT MF634) with computer (i9,32GB,512GB SSD+2TB HDD,21 inch LCD,GTX3090 GPU,1200W power supply), a geared DC motor and accessories, 1.2kVA UPS | 2 | 45,000.00 | |
| 4.16 | GTX3080 OC or better GPU card with 1200W power supply | 2 | 7,500.00 | |
| 4.17 | Image Processing and Machine Learning Capable Mini-Computers(NVEDIA JETSON NANO – 6) with power supply units, SD memory card (64GB), cameras and HDMI cables | 5 | 7,500.00 | |
| 4.18 | Computer | 2 | 6,000.00 | |
| 4.19 | Network printer | 1 | | |
| **Package No 05: Multimedia & Office Equipment** | | | | |
| 5.1 | Touch Screen Smart Interactive Whiteboard | 1 | 7,500.00 | 2,000.00 |
| 5.2 | Photocopy Machine | 1 | 7,500.00 | |
| 5.3 | Public addressing system | 1 | 4,500.00 | |
| 5.4 | FM Microphone | 1 | 12,000.00 | |
| 5.5 | Multimedia projector | 1 | | |
| 5.6 | Projector Screen | 1 | | |
| 5.7 | Headset | 75 | | |
| 5.8 | Pen Drivers | 10 | | |
| 5.9 | Voice Recorder | 5 | | |
| 5.10 | 3.5mm Stereo female socket | 75 | | |
| 5.11 | Camcorder with tripod | 1 | | |
| 5.12 | White board with stand | 1 | | |
| 5.13 | Air Conditioner 18000 BTU | 1 | | |
| **Package No 06: Furniture** | | | | |
| 6.1 | Steel cupboard | 2 | 13,200.00 | 1,000.00 |
| 6.2 | Executive Table | 1 | | |
| 6.3 | Executive chair | 1 | | |
| 6.4 | Table | 15 | | |
| 6.5 | Chair | 75 | | |

02. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.

03. ඉංග්‍රීසි භාෂාවෙන් සකසන ලද අංගසම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් මගින් රුහුණ විශ්වවිද්‍යාලයයේ ගිණුම් අංක 032100112477589 දරන (මහජන බැංකුව උදයන්වත්ත, මාතර) ගිණුමට ඉහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව ගෙවීමෙන් ලත් බැංකු තැන්පතු ලදුපත භාරදීමෙන් හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත ඉහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව ගෙවීමෙන් 2021.05.31 දින පැය 14.00 දක්වා වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශය වෙතින් ලබාගත හැකිය.

04. ලංසු 2021.08.30 වන දින දක්වා වලංගු විය යුතුය.

05. ඇගයීම් අයිතමයෙන් අයිතමය පදනම මත සිදු කරනු ලැබේ.

06. ලංසු සමග ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද අදාළ ලංසු අයිතමවලට සරිලන කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් ද ඉදිරිපත් කළ යුතුය.

07. ලංසු සුරක්ෂණය **"රුහුණ විශ්වවිද්‍යාලයයේ, උප කුලපති"** නමට ලියා ඉදිරිපත් කළ යුතු වන අතර, 2021.09.27 වන දින දක්වා වලංගු විය යුතුය.

08. ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය හා වේලාව 2021.06.01 වන දින පැය 13.00 දක්වා වනු ඇත.

09. අනු පිටපතකින්ද යුක්තව නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු මුද්‍රා තබා ඉහත සඳහන් අවසාන වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ මාතර වැල්ලමඩම රුහුණ විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවීම හෝ එම අවසාන වේලාවට හෝ ඊට පෙර ලැබෙනසේ මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී, කාර්යාලයේ තබා ඇති අංක 01 ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ නම, ටෙන්ඩර් අංකය සහ පැකේජ අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

10. ලංසු, ඉහත සඳහන් ලිපිනයේදී එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ.

11. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

12. අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු මාතර, වැල්ලමඩම රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්) වෙතින් (දුරකථන - 041-2227027) මගින් විමසා ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව ඉහත සඳහන් ලිපිනයේදී කාර්යාල වේලාවන් තුළදී පරීක්ෂාකර බැලිය හැකිය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර.**
**2021 මැයි 06 වන දින**

දිනමිණ වරිපිට | Sunday Observer adz | තිනකරන්

ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු... (වචන 15ක් සඳහා)
ඕනෑම එක් පුවත්පතක් සඳහා රු. 300/-
ඕනෑම පුවත්පත් දෙකක් සඳහා රු. 500/-
පුවත්පත් තුනම සඳහා රු. 650/-

ඔබගේ ලුහුඬු දැන්වීම් ළඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

අනුරාධපුර - TEL : 025 22 22 370 FAX : 025 22 35 411 / මහනුවර - TEL : 081 22 34 200 FAX : 081 22 38 910
කතරගම - TEL : 047 22 35 291 FAX : 047 22 35 291 / මරදාන - TEL : 011 2 429 336 FAX : 011 2 429 335
මාතර - TEL : 041 22 35 412 FAX : 041 22 29 728 / නුගේගොඩ - TEL : 011 2 828 114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 22 25 361 FAX : 021 22 25 361

# ලංසු කැඳවීම

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| කලාපය / අංශය / පළාත | ලංසු යොමු අංකය / අයිතම විස්තරය හා ප්‍රමාණය | ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ලංසු පොත් මිලදී ගත හැකි කාර්යාලය සහ අදාළ අංකය | ලංසු පොතෙහි මිල (රුපි.) | ලංසු වර්ගය ICB/ NCB |
| | **අමුද්‍රව්‍ය** | | | | |
| ජනන (ලක්විජය බලාගාරය) | LV/S/2021/004<br>ලක්විජය විදුලි බලාගාරයෙන් හිස් ප්ලාස්ටික් රසායනික කෑන් ඉවත් කිරීම. | 2021/06/02<br>14.00 පැය | ප්‍රසම්පාදන අංශය, 4 වන මහල, පරිපාලන ගොඩනැගිල්ල, ලක්විජය විදුලි බලාගාරය, ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චලෙයි 61342.<br>TP : 032 226 8972 / 0715777171 Fax: 032 226 8975 | 1,000.00 | NCB |
| බෙ.අ. 03 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/2K21/033<br>ඌව පළාත සඳහා සේවා රැහැන් සඳහා ගැ.ය. පයිප්ප 1300 ප්‍රමාණයක් මිලදී ගැනීම සහ සැපයීම 5.8M / 76.1MM | 02/06/2021<br>15.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | 500.00 | දේශීය |
| බෙ.අ. 03 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/ 2K21/038<br>ඌව පළාත සඳහා Industrial routers අයිතමයෙන් 21 ප්‍රමාණයක් මිලදී ගැනීම සහ සැපයීම. | 02/06/2021<br>15.00 පැය | එම | 500.00 | දේශීය |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/53<br>කණු - වැ.කො. මීටර 9 කි.ග්‍රෑ. 115 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 100 එකු | 03/06/2021<br>10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ-1) කාර්යාලය, බෙදාහැරීම් අංශ - 4 මූලස්ථානය, 3වන මහල, ලංකා විදුලිබල මණ්ඩලය, අංක: 25, නගරසභා පටුමග, දෙහිවල. 011-2638852 | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/54<br>කණු - කොන්ක්‍රීට් පෙරැදි මීටර් 10 කි.ග්‍රෑ. 225 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 100 එකු | 03/06/2021<br>10.00 පැය | එම | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/55<br>කණු - කොන්ක්‍රීට් පෙරැදි මීටර් 11 කි.ග්‍රෑ. 500 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 200 එකු | 03/06/2021<br>10.00 පැය | එම | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/56<br>කණු - කොන්ක්‍රීට් පෙරැදි මීටර් 11 කි.ග්‍රෑ. 850 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 100 එකු | 03/06/2021<br>10.00 පැය | එම | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/57<br>කණු - කොන්ක්‍රීට් පෙරැදි මීටර් 13 කි.ග්‍රෑ. 500 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 100 එකු | 03/06/2021<br>10.00 පැය | එම | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/58<br>කණු - කොන්ක්‍රීට් පෙරැදි බමන ලද මීටර 6 කි.ග්‍රෑ. 50 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 500 එකු | 03/06/2021<br>10.00 පැය | එම | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/59<br>කණු - කොන්ක්‍රීට් පෙරැදි බමන ලද මීටර 8.3 කි.ග්‍රෑ. 100 සාද, සපයා, ගෙනවිත් භාරදීම. 500 එකු | 03/06/2021<br>10.00 පැය | එම | 1,500.00 | NCB |
| බෙ.අ. 04 (ද.ප2) | දප2/මා/ලි03/ටෙන්ඩර්/2021/02<br>මුලටියන උප පාරිභෝගික සේවා මධ්‍යස්ථානය කුලී පදනම මත ගොඩනැගිල්ලක් සපයා ගැනීම. | 25/05/2021<br>14.00 පැය | ප්‍රධාන විදුලි ඉංජිනේරු (මාතර), ලං.වි.ම., රාහුල පාර, මාතර. දු.අ. 041 222 2322 ෆැක්ස් : 041 222 2322 | 500.00 | දේශීය |
| බෙ.අ. 04 (ද.ප2) | SP2/CE(C&CS)/T/2021/13<br>සුවහ එකලා මනු පිරික්සුම් උපකරණ 01 හා සුවහ තෙකලා මනු පිරික්සුම් උපකරණ 01 ක් සපයා ප්‍රවාහනය කිරීම. | 25/05/2021<br>14.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ද.ප2) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ හා පාරිභෝගික සේවා) ඒකකය, ලං.වි.ම.නො. 61/1ඒ, මුහුදු මාවත, තංගල්ල.<br>දු.අ. 047-2200888 ෆැක්ස් : 047-2241806 | 1,000.00 | දේශීය |
| බෙ.අ. 04 (ද.ප2) | SP2/CE(C&CS)/T/2021/14<br>පාරිභෝගික බිල්පත් 5,000,000 සැලසුම් කිරීම මුද්‍රණය කිරීම සහ සැපයීම. | 25/05/2021<br>14.00 පැය | එම | 2,000.00 | දේශීය |
| | **ඉදිකිරීම්** | | | | |
| ජනන (ලක්විජය බලාගාරය) | LV/T/2020/0456<br>දළුව නිවාස සංකීර්ණයේ ජල පිරිපහදු ඒකකය ඉදිකිරීම. | 02/06/2021<br>14.00 පැය | ප්‍රසම්පාදන අංශය, 4 වන මහල, පරිපාලන ගොඩනැගිල්ල, ලක්විජය විදුලි බලාගාරය, ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චලෙයි 61342.<br>TP : 032 226 8972 / 0715777171 Fax: 032 226 8975 | 12,500.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/024<br>වලපනේ විදුලි පාරිභෝගික සේවා මාධ්‍ය)ස්ථානය වෙත පිවිසෙන මාර්ගය සකස් කර ගැනීම සම්බන්ධවයි. | 02/06/2021<br>14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/043<br>යෝජිත පළාත් ගබඩාව හා කණු අංගනය සඳහා තිල්ලම් පිහිටි භූමිය සකස් කිරීම. | 02/06/2021<br>14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/047<br>යෝජිත පිළිමතලාව මධ්‍යම පළාත 2 කාර්යාලයේ පළමු මහලේ කාර්යාල බෙද වෙන් කිරීම. | 02/06/2021<br>14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | 1,000.00 | NCB |
| බෙ.අ. 03 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/S05/2K21/003<br>බදුල්ල, පහළ රජ වීදියේ ස්ථාපිතව ඇති ඉංජිනේරු නිල නිවාසය අලුත්වැඩියා කිරීම. | 02/06/2021<br>15.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | 1,000.00 | දේශීය |
| බෙ.අ. 03 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/S05/2K21/036<br>දියතලාව ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය අලුත්වැඩියා කිරීම. | 02/06/2021<br>15.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 0552222474 | 1,000.00 | දේශීය |
| | **සේවා** | | | | |
| ජනන (ලක්විජය බලාගාරය) | LV/T2021/0124<br>අවුරුද්දක කාලයක් සඳහා ලක්විජය විදුලි බලාගාරය සහ දළුව සහ කරඹ නිවාස සංකීර්ණ සඳහා පිරිසිදු කිරීමේ සේවා ලබා ගැනීම. | 26/05/2021<br>14.00 පැය | ප්‍රසම්පාදන අංශය, 4 වන මහල, පරිපාලන ගොඩනැගිල්ල, ලක්විජය විදුලි බලාගාරය , ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චලෙයි 61342.<br>T.P. 0322268972 / 0715777171, Fax : 0322268975 | 10,000.00 | NCB |
| ජනන (මහවැලි සංකීර්ණය) | MC / UKU / BIDS / 2021 / 006<br>උකුවෙල විදුලි බලස්ථානයේ රාජකාරි ප්‍රවාහන කටයුතු සඳහා ආසන 12ක මගී වෑන් රථයක් අවුරුද්දක කාල සීමාවක් සඳහා කුලියට ලබාගැනීම. | 02/06/2021<br>14.00 පැය | ප්‍රධාන ඉංජිනේරු,, උකුවෙල විදුලි බලස්ථානය, ලං.වි.ම., උකුවෙල. T.P. 066 224 3054 / 066 224 4229 Fax: 066 224 4351 | 1,000.00 | දේශීය |
| ජනන (නාපබල සංකීර්ණය) | SPS/CE/LP/MEM2(P)/20/16<br>සපුගස්කන්ද විදුලි බලස්ථානයේ බලාගාර භූමියේ ශබ්දය අවම කිරීමේ මාර්ගයක් ලෙස මායිම් වැට දිගේ ගස් සිටුවීම. | 02/06/2021<br>10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාපබල සංකීර්ණය), ලංකා විදුලිබල මණ්ඩලය, නව කැලණි පාලම පාර, කොලොන්නාව. දු.ක. - 0112432897 | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (උ.මැ.) | ඩීජීඑම්/එන්සීපී/සීඕඑම්/සී1/එච්වී/2021/006<br>විදුලි ඉංජිනේරු (අනුරාධපුර) විදුලි අධිකාරී (වාණිජ) සඳහා වර්ෂ 02ක කාල සීමාවකට කුලී පදනම මත වෑන්රථයක් ලබා ගැනීම. | 20/05/2021<br>15.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර. දු.අ: 025-2222552 | 500.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/054<br>වර්ෂයක කාලයක් සඳහා ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු (පේරාදෙණිය) ඒකකයට අයත් යටිනුවර කණු අංගනය සහිත ඉඩම සඳහා ආරක්ෂක සේවාවක් සපයා ගැනීම. | 02/06/2021<br>14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/055<br>වර්ෂයක කාලයක් සඳහා ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු (පේරාදෙණිය) ගලහ වි.පා.සේ.මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවාවක් සපයා ගැනීම. | 02/06/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/060<br>කුලී පදනම මත වාහන ලබා ගැනීම ලං. වි.ම. (මධ්‍යම පළාත 2) - ප්‍රධාන ඉංජිනේරු (බලශක්ති කළමනාකරණ) සඳහා වසර දෙකක කාලයකට කුලී පදනම යටතේ මෝටර් කාර් රථයක් ලබා ගැනීම. | 12/05/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/064<br>විදුලි ඉංජිනේරු(වාණිජ) - මධ්‍යම පළාත 2 සඳහා වසර දෙකක කාලයකට කුලී පදනම යටතේ මෝටර් කාර් රථයක් ලබා ගැනීම. | 02/06/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/065<br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු (ගිනිගත්හේන) බල ප්‍රදේශයේ පා.සේ.ම. මස්කෙලිය සඳහා වසර දෙකක කාලයකට වෑන් රථයක් ලබා ගැනීම. | 02/06/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/066<br>ප්‍රධාන විදුලි ඉංජිනේරු (පේරාදෙණිය) බල ප්‍රදේශයට අයත් දවුලගල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා වසර දෙකක කාලයකට ත්‍රිරෝද රථයක් ලබා ගැනීම. | 02/06/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (බපැ) | WPN/CE(CON)/TC1/CLEANING/2021/03<br>ප්‍රධාන ඉංජිනේරු (නැතිම්) බපැ කාර්යාලයේ දෛනික පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම සඳහා වසරක කොන්ත්‍රාත් පදනම මත පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම. | 20/05/2021<br>14.00 පැය | ප්‍රධාන ඉංජිනේරු නැතිම් (බපැ) කාර්යාල, අංක 280, නව ජීවන පෙදෙස, කිරිබත්ගොඩ +94-11-2910183 / +94-11-2908250 | 500.00 | NCB |
| බෙ.අ. 02 (බපැ) | WPN/NCB/DGM-V144/2021/89<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රධාන ඉංජිනේරු (බලශක්ති කළමනාකරණ) | 19/05/2021<br>14.00 පැය | නි.සා. (බපැ) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ.<br>දු.ක. 011-2911071/72 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (බපැ) | WPN/NCB/DGM-V12/2021/175<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රධාන ඉංජිනේරු (බලශක්ති කළමනාකරණ) | 19/05/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (බපැ) | WPN/NCB/CON-V04/2021/176<br>කුලී පදනම මත මෝටර් කාර් රථයක් ලබා ගැනීම. වැඩබිම් ඉංජිනේරු II (නැතිම්) | 19/05/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (බපැ) | WPN/NCB/2021/131<br>පළාත් ගබඩා ගොඩනැගිල්ල (පෙර සැකසූ) කිරිබත්ගොඩ සිට කොටුගොඩ දක්වා මාරු කිරීම සඳහා ලංසු කැඳවීම. | 19/05/2021<br>14.00 පැය | එම | 1,000.00 | NCB |

# කොවිඩ් හමුවේ බොහෝ රටවල් කඩා වැටෙන විට



# වත්මන් ආණ්ඩුව රටට සාධනීය ජයග්‍රහණ රැසක් අත් කර දී තිබෙනවා

## ජනමාධ්‍ය ඇමැති ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල**

වත්මන් ගෝලීය ව්‍යසනය හමුවේ ලොව බොහෝ රටවල් සැම අතින්ම කඩා වැටෙන විට වත්මන් රජය රටටත් ජනතාවටත් සාධනීය ජයග්‍රහණ රැසක් අත් කර දී ඇතැයි ජනමාධ්‍ය ඇමැති, කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා පැවසීය.

එහෙත් පටු පරමාර්ථ ඔස්සේ පසුගිය ආණ්ඩුව මෙන් අනවශ්‍ය ප්‍රචාරණයට නොයා මේ ජයග්‍රහණ නිහඬව ලබාදීමට හැකි වූ බව ද "මාධ්‍ය ලේකම් සංසදය" සමග ජනමාධ්‍ය අමාත්‍යාංශයේදී පෙරේදා (04) පැවති විශේෂ සාකච්ඡාවකදී හෙතෙම පෙන්වා දුන්නේය.

සෞභාග්‍යයේ දැක්මේ ඇතුළත් මාධ්‍ය ප්‍රතිපත්ති හා එහි ඉදිරි කටයුතු පිළිබඳ මේ සාකච්ඡාව පැවැත්වුණු අතර මේ සම්බන්ධයෙන් වන කරුණු ඇතුළත් යෝජනාවලියක් මාධ්‍ය ලේකම් සංසදයේ සභාපති අගමැති මාධ්‍ය ලේකම් විජයානන්ද හේරත් මහතා විසින් ඇමැතිවරයාට දෙනු ලැබීය.

ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ යෝජනා මෙන්ම රජයේ සංවර්ධන ක්‍රියාදාම සම්බන්ධයෙන්ද මේ සාකච්ඡාවේදී අවධානය යොමු විය. සෞභාග්‍යයේ දැක්ම ඔස්සේ මාධ්‍යවේදීන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් වන කරුණු මෙන්ම ඔවුන්ට පවතින ගැටලු කෙරෙහිද මෙහිදී අවධානය යොමු වූ අතර ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කිරීමටද සාකච්ඡා විය.

ඇතැම් දේශපාලන කණ්ඩායම් මෙන්ම පටු පරමාර්ථ ඔස්සේ දිව යන පිරිස් ව්‍යාජ කරුණු ගෙන එමින් ආණ්ඩුවට එරෙහි මතවාද ගොඩනගන බවත් ඒවායේ කිසිදු සත්‍යතාවක් නොමැති බවත් ඇමැති රඹුක්වැල්ල මහතා කීය. වත්මන් ආණ්ඩුව බලයට පත්වූ වහාම සෑම ග්‍රාම සේවා වසමකම සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් ලක්ෂ 20 බැගින් බිලියන 28 ක මුදලක් ලබා දුන් බවත් ලක්ෂයේ රැකියා වැඩපිළිවෙළ මෙන්ම උපාධිධාරීන් 61,000 ට රැකියා ලබාදීම මේ අභියෝගාත්මක අවස්ථාවේදී අතිශය ජනතාවාදී ජයග්‍රහණ බවත් ඒ මහතා කියා සිටියේය.

ඉතාම අසීරුම අවස්ථාවක රුපියල් 5000 බැගින් පවුල් හැත්තෑ දෙලක්ෂයකට බිලියන අසූවක් රජය ලබා දුන් බවද එය මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල- ගලගෙදර කොටසේ වියදමෙන් 70 % ක් වැනි යැයිද රඹුක්වැල්ල මහතා පෙන්වා දුන්නේය.

එමෙන්ම මෙවර අවුරුදු සමයේ දුන් ජනතා සහන සඳහා රුපියල් බිලියන 15 ක් වැය වී ඇතැයිද සෑම ග්‍රාම නිලධාරී වසමකටම නිවෙසක් ලබා දෙමින් නිවෙස් 14,000 ට අධික ප්‍රමාණයක් ඉදිවෙන වන්නේයැයිද විදුලිය නැමැති සෑම නිවසකටම විදුලිය ලබාදීම ක්‍රියාත්මක කැර ඇතැයිද හෙතෙම පැවසීය.

ජනමාධ්‍යවේදීන්ගේ සුබසාධනය වෙනුවෙන් මෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් යෝජිත බොහෝ වැඩපිළිවෙළ පවතින ව්‍යසන තත්ත්වය හමුවේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවද ඉදිරියේදී එම වැඩපිළිවෙළ ක්‍රියාවට නංවන බවද ඒ මහතා ප්‍රකාශ කළේය. මෙරට රාජ්‍ය රූපවාහිනී නාලිකා දෙක සඳහා රුපියල් ලක්ෂ 900 ක වියදමින් නවීන පහසුකම්වලින් සමන්විත ප්‍රවෘත්ති මැදිරි දෙකක් ස්ථාපිත කෙරෙන බවත් මේ සඳහා ජනාධිපතිවරයාගේ පූර්ණ මැදිහත් වීම මෙන්ම උපදෙස් ලබාදී ඇති බවත් ඇමැති රඹුක්වැල්ල මහතා සඳහන් කළේය.

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් මොහාන් සමරනායක, ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සුදේව හෙට්ටිආරච්චි, මාධ්‍ය ලේකම් සංසදයේ සභාපති අගමැති මාධ්‍ය ලේකම් විජයානන්ද හේරත්, ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මිලින්ද රාජපක්ෂ, ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක කිංස්ලි රත්නායක, මාධ්‍ය ලේකම් සංසදයේ ලේකම් නිමල් වීරතුංග , කැඳවුම්කරු ප්‍රදීප් අනුර කුමාර මහත්වරුන් ඇතුළු මාධ්‍ය ලේකම්වරු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

---


## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# සෞඛ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

| දිනය | 2021-05-05 |
|---|---|
| ණය/ ප්‍රදාන අංකය සහ ශීර්ෂය | ණය 3727/G0618-SRI : සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය | HSEP/PIU/SP/W18/01/2021<br>වැඩ ප්‍රසම්පාදනය – 2 වන වටය – අදියර 1<br>(2DHC/3 PMCU)<br>රත්නපුර දිස්ත්‍රික්කය |
| ලොට් | (W 18) ලොට් 'ඒ' බෙලිහුල්ඔය DHC 1<br>(W 18) ලොට් 'බී' ගල්පාය PMCU 1<br>(W 18) ලොට් 'සී' කුරුවිට PMCU 2<br>(W 18) ලොට් 'ඩී' පැල්මඩුල්ල DHC 2<br>(W 18) ලොට් 'ඊ' රජවක PMCU 3 |
| ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය | 2021-06-04 |

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආසියානු සංවර්ධන බැංකුව වෙතින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අරභයා ණය මුදලක් ලැබී ඇත. මෙම මුදලින් කොටසක් ඉහත දැක්වෙන කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රභවයන් සහිත රටවල ලංසුකරුවන්ට ලංසුකරණය විවෘතය.

02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කාර්යාලය යටතේ කොළඹ - 08, කිංසි පාරේ, නො.3/19, සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා, "සේව්‍යයා" විසින් පහත විස්තර කොට ඇති පරිදි ප්‍රාදේශීය රෝහල් (DHC) දෙකක් සහ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක (PMCU) තුනක් ඉදිකිරීම ඇතුළු කාර්යයන් ඉදිකොට සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | නව ඉදිකිරීම්/ ඕපීඩී ප්‍රදේශය (වර්ග අඩි) |
|---|---|
| ලොට් 'A' බෙලිහුල්ඔය DHC 1 | 2,937 |
| ලොට් 'B' ගල්පාය PMCU 1 | 3,562 |
| ලොට් 'C' කුරුවිට PMCU 2 | 3,852 |
| ලොට් 'D' පැල්මඩුල්ල DHC 2 | 9,146 |
| ලොට් 'E' රජවක PMCU 3 | 2,755 |

03. ආ.සං.බැංකුවේ තනි අදියර තනි කවර ක්‍රියාපටිපාටියට අනුකූලව විවෘත තරගකාරී ලංසුකරණය මෙහෙයවනු ලබන අතර, ලංසුකරණ ලිපිලේඛන වල විස්තර කර ඇති පරිදි යෝග්‍යතා පූර්ණ රටවල ලංසුකරුවන්ට විවෘතය.

04. පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් සහිත යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් පමණක් මෙම ලංසුකරණයට සහභාගි විය යුතුය.

**අ. මූල්‍ය**

(i) **ඓතිහාසික මූල්‍යමය කාර්ය සාධනය :**

ලංසුකරුගේ වර්තමාන මූල්‍යමය තත්ත්වයේ ස්ථාවරත්වය ඔප්පු කර දැක්වීම පිණිස පසුගිය වසර තුන සඳහා (2017/2018, 2018/2019 සහ 2019/2020) විගණිත මූල්‍ය නිවේදන ඉදිරිපත් කිරීම.

(ii) **වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යය :**

ලංසුකරුට (හවුල් ව්‍යාපාර හා හවුල්කාරිත්ව ඇතුළුව) පසුගිය වසර 3 තුළ ක්‍රියාත්මක වන හෝ සම්පූර්ණ කළ කොන්ත්‍රාත් සඳහා ලැබූ සහතික කළ ගෙවීම් එකතුව ලෙස ගණනය කළ (පහත වගුව බලන්න) වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් අවම සාමාන්‍යයක් සතුවිය යුතුය. (පහත දක්වා ඇති අවශ්‍යතාවයන් එක් එක් සමූහය (ලොට්) සඳහා වෙන් වෙන්ව අදාළ වේ.)

| සෞඛ්‍ය මධ්‍යස්ථානයන්හි නම් | ශ්‍රී ලං. රු. (මිලියන) |
|---|---|
| ලොට් 'A' බෙලිහුල්ඔය DHC 1 | 40.33 |
| ලොට් 'B' ගල්පාය PMCU 1 | 47.54 |
| ලොට් 'C' කුරුවිට PMCU 2 | 45.22 |
| ලොට් 'D' පැල්මඩුල්ල DHC 2 | 69.70 |
| ලොට් 'E' රජවක PMCU 3 | 47.20 |

(iii) **මූල්‍ය සම්පත් :**

ලංසුකරු (හවුල් ව්‍යාපාර හා හවුල්කාරිත්ව ඇතුළුව – අදාළ වේනම්) තමන්ගේ වර්තමාන කොන්ත්‍රාත් බැඳීම් සඳහා වන අවශ්‍යයෙන් කළ යුතු මුදල් ගෙවීම් අඩු කොට, තම මූල්‍ය සම්පත් පහත දැක්වෙන කොන්ත්‍රාත් විෂයයන් සඳහා වන සම්පූර්ණ අවශ්‍යතාවයන් සපුරාලන බව හෝ ඉක්මවා යන බව හෝ පැහැදිලි කර පෙන්වා දිය යුතුය. (පහත දක්වා ඇති අවශ්‍යතාවයන් එක් එක් සමූහය (ලොට්) සඳහා වෙන් වෙන්ව අදාළ වේ)

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | (ලොට් අංක) | ශ්‍රීලං.රු. මිලියන |
|---|---|---|
| ලොට් 'A' බෙලිහුල්ඔය | DHC 1 | 6.53 |
| ලොට් 'B' ගල්පාය | PMCU 1 | 7.70 |
| ලොට් 'C' කුරුවිට | PMCU 2 | 7.33 |
| ලොට් 'D' පැල්මඩුල්ල | DHC 2 | 11.29 |
| ලොට් 'E' රජවක | PMCU 3 | 7.65 |

**ආ. පළපුරුද්ද :**

(i) **සමාන ස්වභාවයේ හා ප්‍රමාණයේ කොන්ත්‍රාත් :**

ලංසුකරු (හවුල් ව්‍යාපාර සහ හවුල්කාරිත්ව ඇතුළුව – අදාළ වේ නම්) යෝජිත කාර්යයන්ට සමාන වන, එක් එක් කොන්ත්‍රාත්තුවෙහි තම සහභාගිත්වයේ අගය පහත දැක්වෙන අගයන් ඉක්මවා යන, පසුගිය වසර පහ තුළ සාර්ථකව හෝ විද්‍යමානව කොන්ත්‍රාත්කරුවකු, හවුල් ව්‍යාපාර සහකරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු ලෙස අඩුතරමින් එක් කොන්ත්‍රාත්තුවකට හෝ සහභාගි වී තිබිය යුතුය.

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම | (ලොට් අංක) | ශ්‍රීලං.රු. මිලියන |
|---|---|---|
| ලොට් 'A' බෙලිහුල්ඔය | DHC 1 | 16.13 |
| ලොට් 'B' ගල්පාය | PMCU 1 | 19.02 |
| ලොට් 'C' කුරුවිට | PMCU 2 | 18.09 |
| ලොට් 'D' පැල්මඩුල්ල | DHC 2 | 27.88 |
| ලොට් 'E' රජවක | PMCU 3 | 18.88 |

(ii) එක් ලංසුකරුවකු සාර්ථක ලංසු (අඩුම මිල නියම කළ ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාරාත්මක) කීපයක් ඉදිරිපත් කරයි නම් ලංසු ඇගයීමේදී පහත දැක්වෙන, ලංසුවෙහි ඉදිරිපත් කර ඇති පරිදි, එකතු කළ අවශ්‍යතාවයන් සපුරාලීමට ඔහු සතු ධාරිතාවයද වත්කමක් ලෙස ඇතුළත් කෙරෙනු ඇත.

- වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යය
- මූල්‍ය සම්පත්
- වෙන්කළ හැකි උපකරණ සහ
- ක්ෂේත්‍රගතකරණ පිරිස්

**සුදුසුකම් නිර්ණායකයන් ලංසුකරණ ලියැවිල්ලේ වඩාත් මැනවින් විස්තර කොට ඇත.**

05. වැඩිමනත් විස්තර ලබා ගැනීමටත්, ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් වැඩකරන දිනයන්හි කාර්යාල වේලාවන් තුළ (08.30 පැය සිට 16.15 පැය දක්වා) පහත සඳහන් අය අමතන්න.

**ව්‍යාපෘති ඉංජිනේරු,**
**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**නො.75, ධර්මපාල මාවත, රත්නපුර.**
**විද්‍යුත් තැපෑල :** eng.hsep.piusab@gmail.com
**දුරකථන : 045-2221554**
**ෆැක්ස් : 045-2221554**

06. ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන ලබාගැනීමට යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්;

* රත්නපුර දිස්ත්‍රික්කය (2DHC/3PMCU) – අදියර 1 වටය 2 වැඩ ප්‍රසම්පාදනය W18 සඳහා ලංසුකරණ ලිපිලේඛන ඉල්ලා ඉහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

* වගුවේ අයිතම අංක 08 යටතේ සඳහන් කර ඇති පරිදි ආපසු නොගෙවන (ශ්‍රී ලංකා රුපියල්) ගාස්තුවක් 2021-06-03 දින 15.00 පැයට හෝ ඊට පෙර ගෙවීම.

* ගෙවීම් කළ යුත්තේ "**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ගිණුම් අංක 84171161**" නමින් බැංකු අණකරයක් මගින් හෝ කාර්යාල දිනයන්හි 09.00 පැය සිට 15.00 පැය දක්වා මුදලින් හෝ ලංකා බැංකුවේ ගිණුම් අංක 84171161 වෙත සෘජුව තැන්පත් කිරීම මගිනි.

07. සේව්‍යයා විසින්, **5 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී 2021 මැයි 19 දින 1030 පැයට පූර්ව - ලංසු රැස්වීමක්** මෙහෙයවනු ඇත.

08. **නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**නො.78, ධර්මපාල මාවත, රත්නපුර.**
**ශ්‍රී ලංකාව.**

යන ලිපිනයට ඔබේ ලංසු ලංසුකරණ ලියැවිල්ලේ විස්තර කොට ඇති පරිදි ලංසු සුරක්ෂණය සමග **2021-06-04 දින 1030 පැයට** හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු සුරක්ෂණය බැංකු ඇපකරයක ආකෘතියෙන් ඉදිරිපත් කරන්නේ නම්, එය ලංසු ලිපිලේඛනවල 4 වන කොටසේ සඳහන් ආකෘතිය යොදගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් "**සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ**" නමට නිකුත් කළ බැංකු ඇපකරයක් විය යුතුය.

| සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම (ලොට්) | ලංසු සුරක්ෂණ (ශ්‍රී ලං. රු.) | ආපසු නොගෙවන ගාස්තුව/ ශ්‍රී ලං. රු. |
|---|---|---|
| ලොට් 'A' බෙලිහුල්ඔය DHC 1 | 403,000 | 6,000.00 |
| ලොට් 'B' ගල්පාය PMCU 1 | 475,000 | 7,000.00 |
| ලොට් 'C' කුරුවිට PMCU 2 | 452,000 | 7,000.00 |
| ලොට් 'D' පැල්මඩුල්ල DHC 2 | 697,000 | 10,000.00 |
| ලොට් 'E' රජවක PMCU 3 | 471,000 | 7,000.00 |

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කොට විවෘත නොකරම ආපසු එවනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම, එම අවස්ථාවට සහභාගිවීමට කැමති ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී සිදු කෙරේ.

10. ලංසු, විවෘත කිරීමේ දින සිට දින 90 ක් සඳහා වලංගු විය යුතුය. ලංසු සුරක්ෂණය ලංසු විවෘත කිරීමේ දින සිට දින 118 ක් සඳහා වලංගු විය යුතුය.

11. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හෝ සබරගමුව පළාත් සභාවේ පළාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ කාර්යාලය හෝ ලංසුකරු විසින් ලංසු පිළියෙළ කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී දරනු ලබන කිසිදු පිරිවැයක් සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.

**සභාපති/ ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**නො.3/19, කිංසි පාර, කොළඹ - 09,**
**ශ්‍රී ලංකාව.**
**දිනය : 2021-05-04**


---

## කොරෝනා වයිරසයට අදාළ ජාන විකෘතිතා ප්‍රභේද තුනක්:

# ඉදිරියේදී මේ ප්‍රභේද තවත් ප්‍රබල විය හැකියි

### ජපුර විශ්වවිද්‍යාලයේ ආසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය චන්දිම ජීවන්දර

**ශිරාන් රණසිංහ**

කොරෝනා වයිරසයට අදාළ ජාන විකෘතිතා සහිත ප්‍රභේද තුනක් මේ වන විට හඳුනාගෙන ඇතැයි ද ඉදිරි කාලයේදී මේ ප්‍රභේද තවත් ප්‍රබල ලෙස වර්ධනය වීමට හැකියාව ඇතැයි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය චන්දිම ජීවන්දර මහතා පැවසීය.

මේ වන විට එංගලන්ත ප්‍රභේදය දකුණු අප්‍රිකාව සහ බ්‍රසීල යන ප්‍රභේද තුන හඳුනාගෙන ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නිර්දේශ කර තිබෙන එන්නත්වලට ඔරොත්තු දෙන නව විකෘති ප්‍රභේද මතුවීමට හැකි බැවින් ඒ ඇති වන විකෘති වයිරසවලට සරිලන පරිදි නව එන්නත් සොයා ගැනීමට සිදුවන බවද වෛද්‍ය ආචාර්ය චන්දිම ජීවන්දර මහතා පැවසීය.

මේ කොරෝනා වයිරසය මිහිපිටින් තුරන් කර දැමීමට ඇති එකම ක්‍රමය වන්නේ මිනිස් සිරුරට වයිරසය ඒම නතර කර ගැනීමයැයිද ඒ සඳහා කළ යුත්තේ ආරක්ෂාවීම යැයිද හෙතෙම කීය. ඒ අතරතුර සියලු දෙනා එන්නත්කරණයට ලක් කළ යුතු බවද ඒ මහතා සඳහන් කළේය.

---

# නිවැරදි කිරීමයි

දිනමිණ ඊයේ (05) දහවැනි පිටුවේ සමන් රත්නප්‍රිය මහතා පාර්ලිමේන්තු මන්ත්‍රී ලෙස පළ වූයේ ප්‍රමාද දෝෂයකිනි. එය හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන් රත්නප්‍රිය ලෙස නිවැරදි විය යුතුයි.



අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

# ලංකාරාමයේ මාහැඟි පින්කමක්

ඓතිහාසික ලංකාරාම විහාරස්ථාන පුදබිමේ අභිනවයෙන් ඉදිකළ බුද්ධ මන්දිරයේ බුද්ධ ප්‍රතිමා වහන්සේලාගේ ධාතු නිදන් කිරිමේ උත්සවය සුබ මොහොතින් සිදු කෙරිණ.
අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස, රුවන්වැලි චෛත්‍යරාමාධිපති පල්ලේගම හේමරතන, ලංකාරාමාධිපති රළපනාවේ ධම්මජෝති, මිරිසවැටිය චෛත්‍යරාමාධිපති ඊතළ වැටුනවැවේ ඥානතිලක නාහිමිවරුන් ඇතුළු අටමස්ථාන විහාරස්ථාන නාහිමිපාණන්වහන්සේලාගේ අනුශාසකත්වයෙන් මෙම පින්කම සිදු කළහ.
අනුරාධපුර ආයුර්වේද අක්ෂි වෛද්‍ය පි. විරසිංහ මහතාගේ මුල්‍ය දායකත්වයෙන් මෙහි මුලික ඉදිකිරිමේ කටයුතු ආරම්භ කෙරිණ. පසුව මේ සඳහා මහනගර හා බස්නාහිර සංවර්ධන කටයුතු අමාත්‍යාංශය මගින් මිලියන 25.6 මුදලක් ලබා දෙන ලදි. පසුව මෙහි වැඩකටයුතු සම්පුර්ණ කිරිම සඳහා ලක්ෂ සියයකට අධික මුල්‍ය දායකත්වයක් ගම්පහ, සියනෑ කෝරළයේ පදිංචි වසන්ති පොතුපිටිය ගුරු මාතාව හා සිසුන්, මාපියන් විසින් ලබා දි තිබේ.

දසත - දස අත ම එක තැන

අම්බලන්ගොඩ සමූහ ආර්. ඥාණදාස

## මාදම්පාගම කොවිඩ් මරණ නැහැ

මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ මාදම්පේ මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසයේ මේ වන විට කොරෝනා රෝගීන් තිස් හතර දෙනකු සොයා ගෙන ඔවුන් රෝහල් කරායොමු කොට ඇති අතර පෙරේදා (04) දිනයේදී එම කොට්ඨාසයේ තවත් පුද්ගලයන් හතළිස් දෙනෙකුට පී. සී. ආර්. පරීක්ෂණ සිදු කළ බව සෞඛ්‍ය නිලධාරියෙක් අප හා පැවසුවේය.
මේ වන තෙක් එම කොට්ඨාස තුළ කිසිම කොරෝනා රෝගියෙකු මිය ගොස් නොමැති බව ද එම සෞඛ්‍ය නිලධාරියා වැඩි දුරටත් සඳහන් කළේය.

කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට

## ගිංතොට ආපදාවට ලක්වූ නිවාස සඳහා වන්දි



ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගිංතොට බටහිර ග්‍රාම නිලධාරී වසමේ ආපදාවට ලක්වූ නිවසක් සඳහා වන්දි අත්තිකාරම් මුදල් ප්‍රදානය කිරීම සහ ක්ෂණික සහන සැලසීම ප්‍රාදේශීය ලේකම් හිමාලි රත්නවීර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කරන ලදී. අප්‍රේල් මස 29 දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ඇතිවූ පස් කණ්ඩි කඩා වැටීකින් මෙම නිවස හානියට පත් වී තිබිණ.

සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

# කොරෝනා නීති කඩමින් සුදු කෙළිය 9ක් පැය 50ක් ප්‍රජා සේවයේ

කොරෝනා නීති කිසිවක් මායිම් නොකරමින් මෙවැනි වසංගත කාලයකදී නගරයක් මධ්‍යයේ කල්ලි ගැසී මුදලට සුදු කෙළිමින් සිටි 9 දෙනකුට දඩ හා ප්‍රජා සේවා කටයුතු පැය 50ක කාලයක් ලබා දෙමින් සැකකරුවන්ට දැඩි ලෙස අවවාද කරමින් මුදා හැරීමට කන්තලේ දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත් තිෂානි තේනබදු මහත්මිය පසුගියදා නියෝග කළාය.
මෙලෙස දඩ හා ප්‍රජා සේවා සඳහා යොමු කරන ලද්දේ පසුගියදා (28) රාත්‍රි කන්තලේ නගර මධ්‍යයේ සුදු කෙළිමින් බූරුවා ගසමින් සිටි නගරයේ සුපිරි පන්තියේ ව්‍යාපාරිකයන් 6 දෙනකු හා ස්ථිර සේවයන්හි රැකියාවල නියුතු තිදෙනකුත්ය.
මෙහිදී සුදු පිටියේ තිබී රුපියල් 14,000කට ආසන්න මුදලක් ද අධිකරණය හමුවට ඉදිරිපත් කොට තිබිණි. ව්‍යාපාරිකයන් 6 දෙනාට රුපියල් 5000 බැගින් හා පැය 50ක ප්‍රජා සේවාවක්ද අනෙක් තිදෙනාට රුපියල් 1500ක දඩයක් හා ප්‍රජා සේවයට ද යොමු කරමින් සැකකරුවන්ට දැඩි ලෙස අවවාද කොට මුදා හැර තිබේ.
සහකාර පොලිස් අධිකාරි i රෝහණ වනිගසේකර මහතාට ලද තොතුරක් මත කොට්ඨාස අපරාධ මර්දන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මහේෂ් ගංගොඩ මහතා ඇතුළු උප පොලිස් පරීක්ෂක දිසානායක, පොලිස් සැරයන් ප්‍රේමවංශ (26554) ඇතුළු නිලධාරීහු වැටලීමට එක් වූහ.

මුන්නේශ්වරම සමූහ

## සතොස වහලා ජනතාව අසතුටෙන්




කෝවිඩ් 19 ආසාදිතයකු හමුවීම නිසා තාවකාලිකව වසා දැමු හලාවත සතොසෙන් ඉටු වන මහජන සේවාව ඒ අයුරින්ම ලබාදීමට විකල්ප ක්‍රියා මාර්ගයක් ක්‍රියාත්මක නොකිරීම නිසා තමන් දැඩි අසීරුතාවකට මුහුණ දි සිටින බව පාරිභෝගිකයෝ පෙන්වා දෙති.
විශේෂයෙන්ම මේ දිනවල අහස උසට මිල ඉහළ ගොස් ඇති අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මිල නිසා හලාවත ප්‍රදේශයේ බොහෝ වෙළඳසල් පාලන මිලක් ක්‍රියාත්මක නොකිරීම නිසා පාරිභෝගික ජනතාව කළුකඩ ග්‍රහණයට හසුවි ඇති අතර විවෘතව පැවැති සතොස මගින් තමන් විශාල සහනයක් ලද බවත් එම පාරිභෝගිකයෝ පෙන්වා දුන්හ.

සීගිරිය විශේෂ

## කොරෝනා අස්සේ හොර රහසේ බඩු විකුණා අත්අඩංගුවේ

දඹුල්ල නගරය හුදෙකලා කර ඇති අවස්ථාවක විවිධ කණ්ඩායම් වෙළඳසල් විවෘත කරමින් සහ විවිධාකාරයට නගරයට පැමිණීමේ ප්‍රවණතාවක් මතුව ඇති බවට ලැබුණු තොරතුරු මත වෙළෙඳ ව්‍යාපාරිකයන් පොලිසිය, මහ නගර සභාව දඹුල්ල නගරාධිපති ජාලිය ඕපාත මහතා හා එක් ව විමර්ශනයක නිරත විය. එහිදී කිසිදු කාරණාවක් නොමැතිව නගරයේ නිකරුණේ ගැවසුණු පුද්ගලයන් පලවා හැරීමට පොලීසිය මෙන්ම සෞඛ්‍ය බල බලධාරීන් පියවර ගනු ලැබූහ.
දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ඉදිරිපිට වසා දමා තිබූ තොග වෙළෙඳසලක් හොර රහසේ විවෘත කරමින් පාරිභෝගික භාණ්ඩ අලෙවි කරමින් සිටියදී නගරාධිපති ජාලිය ඕපාත මහතා ඇතුළු සෞඛ්‍ය කණ්ඩායමට මෙන්ම පොලිසියට අතටම හසු කර ගැනීමට හැකි විය.
මෙම වෙළඳ සැල් හිමියාට දැඩි ලෙස අවවාද කළ නගරාධිපති ජාලිය ඕපාත මහතා සහ දඹුල්ල පොලිසිය ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දුන්නේය.
මේ අතර නගරයේ කොවිඩ් 19 ආසාදනය වී රෝහල් ගත කර ගැනීමට නොහැකිව නිවෙස් වල සිටි 60 දෙනෙකු පමණ අසාදිත පුද්ගලයින් බස් රථ දෙකක් යොදාගෙන යුද හමුදාවේ පනස් තුන් වන සේනාංකයේ සහයෝගය ඇතිව ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට රැගෙන යෑමේ ක්‍රියාවලිය ද දඹුල්ල මහනගර සභාවේ සෞඛ්‍ය ඒකකය මගින් සිදු කරනු ලැබිය.

## ප්‍රඥා ප්‍රාසාද දෙවන මුද්‍රණයත් එළියි



ප්‍රවීණ ලේඛකයකු මෙන්ම මාධ්‍යවේදියකු වන ශෂී ප්‍රභාත් රණසිංහ මහතා විසින් රචිත ප්‍රඥා ප්‍රාසාද නමැති නව කතාවේ දෙවන මුද්‍රණය ඉකුත් දා නිකුත් විය. කෘතියේ පිටපතක් එහි ප්‍රකාශක දේශබන්ධු සිරිසුමන ගොඩගේ මහතා විසින් කතුවරයාට පිරිනැමූ අවස්ථාව.

බලන්ගොඩ විශේෂ සම්පත් ප්‍රියනන්දන

## බෝවත්ත නිවෙසක සුදු හඳුන් කිලෝ 253ක්

බලන්ගොඩ පොලිස් බල ප්‍රදේශයට අයත් බෝවත්ත ප්‍රදේශයේ ඇති නිවසක් පරික්ෂා කර සුදු හඳුන් කිලෝ 253 ක් සමඟ සැකකරුවකු ඊයේ (05) දා අත්අඩංගුවට ගෙන ඇතැයි පොලිසිය පවසයි.
බලන්ගොඩ පොලිස් ස්ථානාධිපතිට ලද තොරතුරකට අනුව විශේෂ පොලිස් නිලධාරින් කණ්ඩායමක් විසින් එම නිවස පරික්ෂාවට ලක් කරනු ලැබු අතර එහිදී වයස අවුරුදු 40 ක පුද්ගලයකුද අත්අඩංගුවට ගත් බව පොලිසිය පැවැසීය.
එම සුදු හඳුන් තොගය බලන්ගොඩ බෝවත්ත ගම්මානයට ඉහළින් ඇති රක්ෂිතයෙන් කපා ඇති බවට පොලිසිය විසින් සිදු කළ මුලික විමර්ශනවල දි හෙළිව තිබේ.

මිහිර විජේසේකර - මාරවිල සමූහ

## යතුරුපැදි අනතුරෙන් දෙදරු පියා මරුට

හලාවත කොළඹ ප්‍රධාන මාර්ගයේ මාරවිල පොලිස් වසමට අයත් හත්තිනිය ප්‍රදේයේ ඊයේ (4) සවස සිදු වූ යතුරුපැදි අනතුරකින් පුද්ගලයකු මිය ගොස් තිබේ. මියගොස් ඇත්තේ කොස්වාඩිය ප්‍රදේශයේ පදිංචි සිටි චමින්ද බුද්ධික මාරසිංහ නමැති වයස අවුරුදු 46 ක දෙදරු පියෙකි. යතුරුපැදි දෙකක් හා ත්‍රිරෝද රථයක් එකිනෙක ගැටීමෙන් මෙම අනතුර සිදුවී ඇත. මියගිය අය බරපතළ තුවාල ලබා මාරවිල මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව අසාධ්‍ය තත්ත්වයේ පසු වූ හෙයින් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බව මාරවිල පොලිසිය පවසයි.

කරන්දෙනිය සමූහ අනුරාධ ප්‍රියදර්ශන

## ත්‍රිරෝද රියේ ජෙලිග් නයිට් කූරු 50ක්



ඇල්පිටිය කොට්ඨාශ දූෂණ මර්ධන ඒකකය විසින් ඊයේ රාත්‍රී අම්බලන්ගොඩ පොලිස් වසමේ තිලක පුර බෙන්වලප්‍රදේශයේ දී ත්‍රිරෝද රථයකින් රැගෙන යමින් තිබූ ජෙලිග් නයිට් කූරු 50ක් සමඟ සැකකරුවන් තිදෙනකු අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් වැඩිදුර විමර්ශන කටයුතු සඳහා අම්බලන්ගොඩ පොලීසියට බාර දී තිබේ.

එස්. ජී. උබේපාල - කැබිතිගොල්ලෑව සමූහ

# කාබනික පොහොරවලින් ගොවිතැන් කරන්න අමාරුයි

ජනාධිපතිතුමන් ගත් තීරණය අනුව කෘෂි රසායනික පොහොර එක් වරම නවතා දැමීමේදී රටේ වාර්ෂිකව නිෂ්පාදනය වන කෘෂි භෝගවල විශාල අඩුවක් ඇති විය හැකි බවත් ගොවීන් ලෙස පොහොර දීර්ඝ කාලීනව තමන් බලාපොරොත්තු වෙන බවත් මැදවච්චිය ගොවීහු පවසති.
කාබනික පොහොර භාවිතයෙන් ආදායම් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් රසායනික පොහොර නැතිව ගොවිතැන් කිරීමට, මේ වන විට ගොවීන් හට බියක් ඇති වී ඇති බව ද වැඩිදුරටත් ඔවුහු පැවසූහ.
මේ වන විට දිවයිනේ බහුලව වකුගඩු රෝගීන් වාර්තා වන දිස්ත්‍රිකයක් ලෙස නම් දරා ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ රටට බත දෙන ජනතාව වකුගඩු මාරයාගෙන් මුදා ගැනීමට මෙන්ම දිවයින පුරා මේ වකුගඩු මාරයාගෙන් බැට කන ජනතාව වෙනුවෙන් ජනාධිපතිතුමන් විසින් ගෙන ඇති තීරණය පිළිබඳ අප කළ විමසීමකදී මැදවච්චිය ගොවීහු මෙසේ කියා සිටියහ.







**ලිදවැව එම්. කරුණාරත්න ගොවි මහතා,**
අපට ඉදිරියෙදී ගොවිතැන් කරන්න බැරි වෙයි කියලා බියක් තියෙනවා කාබනික පොහොර එක්ක. මම කුඹුරු, ගොඩ භෝග අක්කර 30ක් - 35ක් පමණ වගා කරන ගොවියෙක්. ඒ නිසා මට නම් රසායනික පොහොර අවශ්‍ය වෙනවා. අපි ගොවිතැනින් ජීවත් වෙන්නේ. ඒවා පාඩු වුණාම අපි ජීවත් වෙන්නේ කොහොමද..? කාබනික පොහොරවලින් ගොඩක් අමාරුයි ගොවිතැන් කරන්න. රසායනික පොහොරවලින් විශාල ආදායමක් ගන්න පුළුවන්. කාබනික පොහොරවලින් ආදායම් ගන්න බෑ. ඒ නිසා එක පාර රසායනික පොහොර නැති කරන්නේ නැතිව තව ටික කාලයක් මේ විදිහටම ගොවිතැන් කරන ගමන් කාබනික පොහොරවලට ගොවීන් හුරු කිරීම සුදුසුයි කියලයි මගේ අදහස.

**77 තුලානේ ටී. අමරසිරි තිලක ගොවි මහතා,**
පොහොර තහනමට අපි අකමැතියි. එහෙම කරනවා නම් කාබනික පොහොරවලට සුදුසු බීජ ලංකාවේ නිෂ්පාදනය කරලා තමයි තහනම් කරන්න ඕනේ. මෙහෙම කළාම අපිට වගා කරන්න අපහසුයි එකවරම.

**වයි. එම්. ගුණසේකර ගොවි මහතා,**
රසායනික පොහොර තහනමට අපේ විරුද්ධත්වයක් නෑ. නමුත් එක වරම තහනම් කිරීම සිදුසු නෑ. එහෙම වුණාම සමස්තයක් ලෙස රටේ භෝග නිෂ්පාදනය කඩා වැටෙනවා. ඒ සියල්ල ඇණිහිටියම අපේ ආර්ථිකය පහත වැටෙනවා. ඒ අනුව කාබනික පොහොර භාවිතයට අපට හුරු වෙන්න අමාරුයි. ඒ නිසා මෙය පියවරින් පියවර කළ යුතු වැඩක් කියලයි මගේ අදහස.



# බෞද්ධයන්ගේ ෂඩ් වර්ණ උරුමයට වසර 136 යි

ලෝකවාසී බෞද්ධ ජනතාව ඉමහත් ගෞරවයෙන් ඔසවන ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය අපට උරුම වී මෙම අප්‍රේල් 28දාට පුරා වසර 136ක් සපිරුණි. ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ ශ්‍රී ලාංකික බෞද්ධයන් වන අපටය. ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය නිර්මාණය වීම පිළිබඳව දිගු ඉතිහාසයක් ඇත.

1885 මාර්තු 27 දින නිකුත් වූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් වෙසක් දින නිවාඩුව ප්‍රකාශයට පත් කිරීම නිසා අතිශය උද්දාමයට පත් බෞද්ධ ආරක්ෂක සභාව එම වර්ෂයේ වෙසක් උත්සවය අති උත්කර්ෂවත් ලෙස සැමරීමට තීරණය කළ අතර, එම උත්සවය සංවිධානය කිරීම සඳහා දස දෙනකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී.

ඒ සඳහා හික්කඩුවේ සුමංගල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිවරු, දොන් කරෝලිස් හේවාවිතාරණ, ඒ. පී. ධර්ම ගුණවර්ධන, විලියම් ද ආබෲව්, සී.පී. ගුණවර්ධන, චාර්ල්ස් ඒ. ද සිල්වා, එන්.එස්. ප්‍රනාන්දු, පීටර් ද ආබෲව් සහ එච්. විලියම් ප්‍රනාන්දු යන මහත්වරු එම කමිටුවට අයත් වූහ.

කමිටුවේ වෙසක් උත්සව වැඩසටහන මෙසේය.

(01) මුහන්දිරම් ඒ.පී. ධර්ම ගුණවර්ධන මහතාගේ සංවිධායකත්වය යටතේ 1885 අප්‍රේල් 27 දින කොළඹ පිටකොටුවේ දොන් කරෝලිස් සාප්පුව අසල සිට මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට පෙරහරක් සංවිධානය කිරීම.

(02) අප්‍රේල් 28 දින උදේ කොටහේනේ දීපදුත්තාරාම විහාරස්ථානයේදී බෞද්ධ කොඩියක් උත්සවශ්‍රීයෙන් එසවීම.

(03) අප්‍රේල් 28 දින සවස 'වෙසක් නිවාඩුව' මැයෙන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසින් කැලණි රාජමහා විහාරස්ථානයේදී විශේෂ දෙසුමක් පැවැත්වීම.

## බෞද්ධ කොඩියේ උපත

වෙසක් පොහෝ දින එසවීමට කොඩියක් අවශ්‍ය බව මේ අවස්ථාවේ පෙනී ගිය හෙයින් ඒ සඳහා සැලසුම් ඉදිරිපත් කිරීමට කමිටු සාමාජිකයෝ තීරණය කළහ. ඒ අනුව කමිටු සාමාජිකයන් විසින් විවිධ මාදිලියේ සැලසුම් ඉදිරිපත් කළ ද ෂඩ් වර්ණ බුද්ධ රශ්මිය විදහාපාන අයුරින් සී.පී. ගුණවර්ධන සූරීන් විසින් ඉදිරිපත් කරන ලද කොඩි සැලසුම වඩා සුදුසු යැයි එම කමිටුව මඟින් පිළිගන්නා ලදී.

බෞද්ධ කොඩියේ උපත පිළිබඳව ආරංචිය ප්‍රථම වතාවට ජනතාව අතරට ගෙන ගියේ 'සරසවි සඳරැස' පුවත්පත මඟිනි. ඒ 1885 අප්‍රේල් 17දා නිකුත් වූ පුවත්පත මඟිනි. 'බෞද්ධයන් විසින් ඔසවන්නට ව්‍යවස්ථා කර ගෙන තිබෙන කොඩියක්' යන ශීර්ෂ පාඨය යටතේ එම පුවත පළ වූයේ මෙලෙසිනි.

"සර්වඥයන් වහන්සේ ලෝ පහළ වූ දින ප්‍රකාශ කරන සළකුණක් වශයෙන් ද ගෞරව වශයෙන් ද බුද්ධ රශ්මියේ වර්ණ හය ප්‍රකාශ කරන කොඩියක් එසවීමට කොළඹ වැසි බෞද්ධයන් විසින් සම්මත කරගෙන තිබෙයි. මේ කොඩිය මේ මස 28 වැනිදාට පැමිණෙන වෙසඟපුර පසළොස්වක දිනදී කොළඹ මාලිගාකන්දේ පිරිවෙනේ සහ කොටහේන දීපදුත්තාරාම විහාරස්ථානයෙහිද තවත් මේ අසල විහාරස්ථානවල ද ඔසවන්නට ව්‍යවස්ථා කරගෙන තිබෙයි. මේක ලක්වැසි සියලු බෞද්ධයන් විසින් ආදර්ශයට ගත යුතු යහපත් වැඩක් බැවින් ඒ කොඩියේ ආකාර හඳුන්වන පිණිස මෙහි පහත චිත්‍රයක් බහාලමු.

මෙයින් අඟවන්නේ සර්වඥයන් වහන්සේ ජීවමාන කාලයෙහි උන්වහන්සේගේ ශරීරයෙන් නික්මුණු නීල, පීත, ලෝහිත, ඕදාත, මාංජේෂ්ට, ප්‍රභාෂ්වර යන වර්ණ හයයි. සර්වඥයන් වහන්සේ ජීවමාන කාලයෙහි උන්වහන්සේගේ කේශධාතු ආදී නීල වර්ණ අවයවවලින් නීල වර්ණය ද, දන්ත ධාතු ආදී ශ්වේත වර්ණ වූ අවයවවලින් සුදු පැහැය ද යනාදී වශයෙන් ෂඩ් වර්ණ ඝණ බුද්ධ රශ්මීන් විහිදුණු බව පොත්පත්වල ලියා තිබෙයි. එබැවින් මේ වර්ණ සය ප්‍රකාශ කරන කොඩියක් උන්වහන්සේ ලෝ පහළ වූ දවසේ එසවීම යහපත් අර්ථයක් අඟවන ක්‍රියාවකි. මේ වැඩේ කල්පනා කළ බෞද්ධයන්ට ස්තූති කරමින් සියලු බෞද්ධයන් විසින් මේ ක්‍රියාව පැවැත්විය යුතු බව මතක් කරම්හ."

කොඩියේ උපත ගැන තොරතුරු සපයන යට සඳහන් සඳරැස පුවත්පත කොඩියේ නිර්මාතෘවරයකු ගැන සඳහන් නොකරයි. එහෙත් මෙම කොඩියට සැලසුම්කරුවකු සිටිය යුතුය. ඔහු කවුද යන්න 1928 මැයි මාසයේ පළ වූ 'සුදනමිණ' සඟරාව හෙළි කරයි. "බෞද්ධ කොඩියක් උවමනා යයි නියමකරගත් උතුමන් සෑම දෙනාම නොයෙක් අන්දමේ සැලැස්මවල් (ප්ලෑන්) සැපයූ නමුත් ෂඩ් වර්ණ බෞද්ධ රශ්මිය මුල් කරගෙන සී.පී. ගුණවර්ධන මහත්මයා විසින් සාදන ලද කොඩිය වඩා සුදුසු යයි සම්මත විය."

## ෂඩ් වර්ණ සංකල්පය

ගෞතම බුදුන් වහන්සේ බුද්ධත්වයෙන් සිවු වැනි සතියෙහි බෝ මැඩට වයඹ දෙසින් පිහිටි රතනඝර නම් විහාරයෙහි වැඩ වසමින් පට්ඨාන ධර්මය මෙනෙහි කළ සේක. එම අවස්ථාවේදී උන්වහන්සේගේ ශරීරයෙන් සවණක් රැස් මාලාවෝ නික්ම ගියහ. කේශාදී නීල ස්ථානවලින් නීල රශ්මිය ද, ඡවි ආදී පීත ස්ථානවලින් පීත රශ්මිය ද මස්, ලේ ආදී රක්ත ස්ථානවලින් ලෝහිත රශ්මිය ද, ඇටවලින් හා දත්වලින් ඕදාත රශ්මිය ද, ශරීරයේ අතුල් පතුල් හා තොල්වලින් මාංජේෂ්ට රශ්මිය ද, නීල පීතාදී සියලුම වර්ණයෙන් සංකීර්ණව ප්‍රභාෂ්වර රශ්මිය ද නික්ම ගිය බව පොත්පත්වල සඳහන් වෙයි.

## ෂඩ් වර්ණ බෞද්ධ කොඩි සෙවණේ ප්‍රථම වෙසක් උලෙළ පැවැත්වීම

1885 අප්‍රේල් 28 දින කොළඹ මධ්‍යස්ථානය කරගෙන ලක්වැසි බෞද්ධයන් විසින් පවත්වන ලද ඒ ඓතිහාසික වෙසක් උත්සවය 'සරසවි සඳරැස' පුවත්පත මෙසේ සඳහන් කරයි.

"කලින් ප්‍රකාශ කර තිබුණු පරිද්දෙන් වෙසඟ පුර පසළොස්වක දවස වූ ගිය මස විසි අට වැනිදා සර්වඥයන් වහන්සේ ලෝ පහළ වූ දින සලසා ආණ්ඩුවේ සියලුම උසාවි කච්චේරි ආදිය වසා දමා නිවාඩු දවසක් කරන ලද්දේයි.

සර්වඥයන් වහන්සේ ලෝ පහළ වූ මෙම පුර පසළොස්වක දින කොයි කාලවලත් බෞද්ධයන් විසින් පාප ක්‍රියාවලින් දුරුව විවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙන දවසකි. නමුත් මේ පසුගිය වෙසක් පුර පසළොස්වක් දවස ආණ්ඩුව විසින් නිවාඩු දිනයක් කළ බැවින් ඒ ප්‍රීතිය කරණකොට ගෙන අතිශයින්ම ලක්දිව නානාදිග්භාග වැසි බෞද්ධයන් විසින් නොයෙක් පුණ්‍යකර්ම කිරීමෙන් හා මහත් ප්‍රීතියෙන් කල්ගත කළ බව දැන ගතිමු.:

කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමාගමේ සාමාජිකයන් විසින් ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය කොළඹ විද්‍යෝදය පිරිවෙනෙහි ද, කොටහේන දීපදුත්තාරාම විහාරස්ථානයෙහි ද, බොරැල්ල හුණුපිටිය ගංගාරාමය වැනි කොළඹ නගරයේ පිහිටි විහාරස්ථානවලත්, කැලණි රාජමහා විහාරස්ථානයේ හා කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සභා ශාලාවේ ද බෞද්ධ කොඩි ප්‍රදර්ශනය කර ඇත. මීට අමතරව බොරැල්ලේ සිට විචිත්‍රවත් පෙරහරක් ද කොටහේනේ දීපදුත්තාරාමයට පැමිණ ඇති අතර, කොම්පඤ්ඤවීදියේ සිට තවත් පෙරහරක් විද්‍යෝදය පිරිවෙනට පැමිණ ඇත.

මෙදින රාත්‍රී කොටහේන දීපදුත්තාරාම විහාරස්ථානයේදී මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසින් ධර්ම දේශනාවක් පවත්වා ඇත. සිදුහත් උපත හා වෙසක් නිවාඩුව සම්බන්ධව වැදගත් කරුණු ද එම ධර්ම දේශනාවට ඇතුළත් වී ඇත.

## බෞද්ධ කොඩියේ සැලසුම්කරු

ෂඩ් වර්ණ බෞද්ධ කොඩියේ සැලසුම්කරු පිළිබඳව විවිධ මතවාද තිබී ඇති අතර, කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමිතිය කියා සිටියේ බෞද්ධ කොඩිය ඕල්කට්තුමන්ගේ නිර්මාණයක් බවය. ඒ මතය ඕල්කට්තුමන් විසින් මෙසේ නිවැරදි කර ඇත. "මා බෞද්ධ කොඩිය සැලසුම් කළ බව කියන මුලර්ගේ වාර්තාව වැරදිය. එහි ගෞරවය හිමි විය යුත්තේ කොළඹ පරමවිඥානාර්ථ සමාගමේ සාමාජිකයන්ටය. මා කළ එකම දෙය නම් හැඩය වෙනස් කිරීමට යෝජනා කිරීම පමණකි."

ඕල්කට්තුමන්ගේ යෝජනාවට අනුව ජාත්‍යන්තර ප්‍රමිතියට ගළපන ලද ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය 1885 අප්‍රේල් 09 වැනි දින 'සරසවි සඳරැස' පත්‍රයේ පළ කර ඇත.

කෙසේ වෙතත් ෂඩ් වර්ණ බෞද්ධ කොඩියේ සැලසුම්කරු මාතර මඩිහේ උපන් කරෝලිස් පූජිත ගුණවර්ධන මහතා බව නිසැක ලෙසම ඔප්පු කර ඇත.

ලෝකවාසී බෞද්ධ ජනතාවගේ ගෞරවාදරයට පත්ව ඇති ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය පිළිබඳවත්, එම කොඩිය උපත ලද අප්‍රේල් 28දා දිනයත් මෙරට ජාතික වශයෙන් සැමරීමක් සිදු නොවීම කනගාටුවට කරුණකි.

රත්නසිරි පතිරණ

# ලන්දේසීන්ට මාරකයක් වූ වන්නිච්චි

සාර ඉසුරු කාලය නිමා වන්නේ ඉතිහාසය ලියන්නට විවේකයද අහිමි වෙමිනි. ඒ හන්දාම ලක් කතා වත හරියටම සොයන්නට අසීරු වෙහසක් දරන්නට වන්නේ දහසය වැනි සියවසේ සිටය. ඉතිහාස ලිය වූ යුගයන්වල සටන් ජයගත් සැටි ද, ඉතිහාසය නොලියා කළ සටන් පරාජය වී ඇති සැටිය ඉතිහාසය දෙසම බලන විට පෙනේ. ඉතිහාසය ලියන්නට සතුරු වියවුල් ද මුල් වේ. ඒ වගේම ජාතික ඉසුරුමත්භාවය ද බලපායි. ඉසුරුමත් බව අහිමි වූ යුගවල මෙන්ම සතුරු යුගවල ද ඉතිහාසය නොලියා ගත් හේතුවක් හමු වන්නේ බටහිර ජාතීන් සිරිලකට සතුරන් වූ කාලයේය. එවිට මතු වන පැනය වන්නේ එහෙම වූයේ ඇයිද කියාය. ඒ කාලේ ඉතිහාසය ලියා ඇත්තේ සතුරාම නිසා සතුරාගෙන් මිතුරාගේ ඉතිහාසය දැන ගන්න මැළි වී ඇත. එය හරිම ස්වභාවික හේතුවකි. ඒත් ඒ හේතුව ස්වභාවික වුණත් මෝඩ හේතුවක් වේ. ඒ මොකද සතුරා පමණක් නම් ඉතිහාසය ලියා ඇත්තේ සතුරාගෙන්වත් ඉතිහාසය ඉගෙන ගත යුතුය. සිරිලකට ඇති ලෙඩක් වන්නේ එහෙම කරන්න තරම් දියුණුකමක් නැති වීමය.

ලංකාවේ ඉතිහාසය ලක් පුතුන්ම ලියා ඇතුවා වගේම විදේශිකයන් ද ලියා තිබේ. ඒ අතරින් පෘතුගීසි, ලන්දේසි, ප්‍රංශ හා ඉංග්‍රීසීන් විශේෂ වන්නේ ඔවුන් ඉතිහාසය ලියන්නේ සිරිලක් පුතුන් එය නොලියා තැබූ කාලයක වීමය. කැප්පැටිපොල පුරන් අප්පු වගේම වාරියපොල සුමංගල, කුඩාපොල රාහුල වැනි ගිහි පැවිදි වීරවරයන් සටන් කළ ද ඉතිහාසය ලියා තැබුවේ නැත. ඔවුහු නායකත්වය දුන් ව්‍යාපාරවල ලේඛකයන් හෝ රචකයන්ට ඉඩක් තිබී නැත. ඉතින් ඒ වීර පරපුරේ ඉතිහාස සොයා ගත හැක්කේ සතුරාගෙන්මය. දැන් මේ ප්‍රශ්නය ගැඹුරටම ගිහින් සොයා සිතූ පැතූ වීර සිරිත වන්නේ හික්කඩුවේ සුමංගල මහා තෙරිඳුය. උන්වහන්සේ මහාවංසය සිංහල බසට නගමින් ජාතික සටනට යළි පන්හිඳ එක් කිරීමට යත්න දැරුවේ ඒකය. එත් ඒ තෙරිඳු සිරිතින් ඉතිහාසයට එකතු වූ බොහෝ අයට මේවා නොපෙනේ. ඒ නිසා ක්‍රි:ව: 1450 සිට ලංකාවේ ඉතිහාස පොතින් මැකී ඇති චරිත බොහෝය. එහෙම මැකී ගිය චරිත නිසා නූතන අපට වී ඇති මහත් විපත්තියක් වේ. ඒ මන්ද බටහිර ජාතීන් සමඟ බැඳී ගිය සියවස් හයක ඉතිහාසයට විනිශ්චයක් අහිමිවීමය. එහෙම අහිමි වීමෙන් වර්තමානය තනා ගත නොහැකි අවිනිශ්චිතයක් ගොඩනැඟීමය. විනිශ්චයක් නැති ජාතියක් අවිනිශ්චිතවීම හැර වෙන කුමක් වන්නද? සුද්දා හදා දුන් කෝච්චි පාර අඟලක් දික් කර ගන්න බැරිව ඇත්තේ ඒකය. ඔවුහු හැදූ තාර පාර ට්‍රැෆික්වලින් පුරවාගෙන මහ මඟ දුක් විඳින්නේ මේ හින්දාය. කොටින්ම බටහිරයන් තැනූ පරිපාලනයත්, පාර්ලිමේන්තුවත්, අධිකරණයත් දූෂිතයන්ගෙන් පිරී ඉතිරී ඇත්තේ මේකය. මේවා විනිශ්චයක් නැති අවිනිශ්චිතයක ප්‍රතිපලයන්ය. කෙටිවම කීවොත් බටහිරයන් මේ සියලු විනාශවල වග උත්තරකරුවන් කරනු හැර විනිශ්චයක් ලබා ගැනීමක් නැත. විනාශ



සිතුවම- කුසල සමරවික්‍රම

තැනුවේ බටහිර නම් ඔවුන්ගේ රටවල පාර්ලිමේන්තුවත්, පාරිපාලනයත්, අධිකරණයත්, පාර තොටත් අවුලක් නොවී අපේ රටේ මේ අවුල ආවේ කොතනින්ද? එසේ නම් මඟ හැරී ගිය ඉතිහාස විනිශ්චයක අඩුව ඇති බව පෙනේ. මෙහෙම පෙනෙන්නට වඩාත් හේතුව වූයේ මඟ හැරී ගිය යුගයක ජීවමාන ගැහැනියක් හමු වූ නිසාය. ඈ තෙමේ 'වන්නිච්චි මරියා සෙම්බත්ති' කුමාරියය.

වන්නිච්චි මරියා සෙම්බත්ති දෙමළ කුමරියක වීමත්, ඇය කිතුණු බැතිමතියක වීමත් නිසා සිංහල ලේඛනවලට නාවා විය හැකිය. එහෙත් ප්‍රධාන හේතුව, ජාති ආගමික හේතුවක්ම නොවේ. ඇය ගැන ලියවී ඇත්තේ ලක් පුතුන් ලිව් ලේඛනවල නොව බටහිරයන් ලිව් ලේඛනවලය. ඇත්තටම ලංකාවේ ජනයා ලන්දේසීන්ට එරෙහිව මාරක ජාතික සටනක් කර ඇත්තේම නැති තරම්ය. පෘතුගීසීන්ට එරෙහිව වීදිය බණ්ඩාර, මායාදුන්නේ, ටිකිරි රාජසිංහ වගේම විමලධර්මසූරිය, සෙනරත් නමින් විරුවන් බිහිවන්නේය. නමුත් ලන්දේසී විරෝධී වීරවරයන්ගේ සටහන් ලංකාවේ ඇත්තේම නැත. මේ ඉතිහාසයෙන් අසා සොයා ගත යුතු ඇත්ත ප්‍රශ්නය ය. ඇත්ත ප්‍රශ්න සොයන ගතියක් නැති ඔලමොට්ටලයන්ගෙන් ඉතිහාසය නිදහස් කර ගන්නා තුරු මෙවැනි විමසුම් නැති වමාරන්නන් හා අනුකාරකයන් ලක් ඉතිහාස විෂය රසට බුදිනු ඇත. කොහොමින් හරි ලන්දේසීන්ට එරෙහිව ජාතික සටනක් ඇවිල නොගියේ මන්දැයි සිතමි. එසේ වන්නට බලපෑ ප්‍රබල තතු නිමිත්ත ලන්දේසීන්ගේ ජාතික ගතිය වන්නට ද ඇත. ඔවුහු කෲරත්වය වෙනුවට සහනශීලීත්වයද, ජලය හා ගොවි බිම මතද බැඳුණු අමුතු ජාතික ලකුණක් පෙන්නූ ජාතියකි. ඒ වගේම ලන්දේසීන් බටහිරින් මෙහි එන්නේ සිරිලක දෙවන රාජසිංහගේ ඇරයුම් ලද ජාතියක් සේ නිල ගිවිසුමක්ද සමඟය. ලන්දේසීන් යුද්ධ කළේ සිංහලයන් හෝ ලක්වැසියන් සමඟ නොව ලක් පොළොවේ තලාව හෙවත් වැල්ල බඩ අල්ලා ගෙන උන් පරංගීන් සමඟය. ඒ නිසා ලන්දේසීන් සමඟ සටනක් අල්ලන්න මතුපිට හේතුවක් ලක් වැසියාට තිබුණේ නැත. ඒත් හේතුවක් තිබූ හැටි පෙනුණේ වන්නිච්චි මරියා සෙම්බත්ති නිසාය.

සිරිලක ජනයා අතරින් ලන්දේසීන්ට එරෙහි මාරක ගැටුමක් දී ඇත්තේ ඇයය. ඇය ලක් පොළොවේ දෙමළ දුවණියක් වීමත්, කිතුණු බැතිමතියක් වීමත් නිසා සුවිශේෂීය. ඒ වගේම යාපන රාජධානියේ ඔටුන්නට උරුම ලේ ඇත්තිය විදියට ඇය විදහා පෑ සටන කතාවට ගත යුතු වීරකමක් වගේම දේශපාලන ගැඹුරක්ද සහිතය. ඇය හින්දු දහමෙහි කාලි මාතා, වල්ලි මාතා, පත්තිනි මාතා, දුර්ගා මාතා සමඟ මරිය මාතා එකට එක් කළ අමුතු කුමරියය. මේ රටේ කිතුණු විද්වතුන් වගේම සිංහල විද්වතුන් අමතක කළ ඇති අමුතු දාර්ශනිකාවිය ය. මධු මෑණියන් නමින් ජේසු ස්වාමි දරුවාගේ මෑණියන් සිරිලක දී නව උපතක් ලබන කතාව විහිදී යන්නේ එතැනින්ය. ඒ වගේම වන්නිය නමින් ලංකාවේ ඇති විශේෂ භූ කලාපය පාලනය කළේ 'මහා වන්නියා' නමින් පුරුෂයෙකි. ඒ මහාවන්නියා ධූරයට පත් වන පළමු ස්ත්‍රිය වන්නිච්චි මරියා සෙම්බත්තිය ය. වන්නිච්චි විසින් කළ සටන ලන්දේසීන්ට මාරක වූයේ ඒකය. කෙතරම් මාරක වූවේද කියන්නේ නම් එය මහනුවර රජ මැඳුරෙන් උපකාර පතන්න තරම් ලන්දේසීන්ව අසරණ කරන්නේය. වන්නි වන පෙතටම වී දිවි ගෙවී සිරිලක පුරාණ අමුතු ජනවංශය වන්නින්ය. ඒ වගේම ප්‍රතාපවත් උරුමයක් ඇති ඔවුන්ට සෘජුව සිංහල ප්‍රභූත්වය හා දෙමළ ප්‍රභූත්වය සමඟ නෑකමත් තිබූ ජන වංශයකි. මේ සියල්ලට වඩාත් අභිමානයක් එක් කරන්නේ ජය ශ්‍රී මහා බෝධිය රකින ජන පවුර ඇත්තේ වන්නිගේ වන්නිවරු අතර නිසාය. රාජධානිය එකොළොස් වන සියවසේ අනුර නුවර හැර යාමෙන් පසු වන්නියේ වන්නීන් ශ්‍රී මහා බෝධිය රකින එකම රැකවරණය වන්නේය. එය වඩාත් උච්චස්ථානයකට එන්නේ බටහිරයන් මෙහි ආ දහසය වැනි සියවසේය. මෙවන් ජන තීරුවක් සහිත වන්නියේ වන්නිච්චිගේ ලන්දේසි විරෝධය මාරක වන්නේය. ඇගේ සටන් ක්‍රම අමුතු වූ අතර එය වන්නි මහා වනාන්තරය මැද උපන් අමුතු ගරිල්ලා සටන් වූ බව පවසන්නේ'ලූතිනන් තෝමස් නෝගල්'ය. නෝගල් කියන්නේ මුලින් කී ලෙස සතුරන් විසින් ලියවුණ ලක් ඉතිහාසය ලිව් එක් මිනිසෙකි. ඒත් ලුතිනන් තෝමස් නෝගල්ගේ තතු විත්ති කියවා ලක් අතීත වත ගැන නිශ්චිතතාවක් ගොඩනගා ගැනීමට මැළි වී ඇත. ඔහුගේ තතු වාර්තාව කියවන විට හැඟී යන්නේ වන්නිච්චි මරියා සෙම්බත්ති කුමරියගේ වීරත්වය වගේම ඇගේ සටන් ශිල්ප ක්‍රමය නූතන දියුණු ආයුධ සහිත ලන්දේසීන්ට කෑලෑ ආයුධ හා සටන් ශිල්ප ඔස්සේ වන්නිච්චි කළ අභියෝගය මතු කර ගත යුතු කථාවකි. මන්ද ඒ ඔස්සේ අහිමිව යන්නේ මේ රටේ තිබූ අමුතු සටන් ශිල්පයකි. ඒ වගේම ලන්දේසීන් සමඟ ලක් රජය ගිවිසුමට බැඳී ඇති විට ඇය එක විටම පාර්ශ්වය දෙකම අභියෝගයට ලක් කොට සටන් කළේ නිදහස් රාජ්‍යයක් වීමට ද යන්න සෙවිය යුතුය. මන්ද නූතන බෙදුම්වාදයේ අවසාන මාරක සටන තිබුණේ වන්නි මහා වනාන්තරය මැදය. ඒත් ප්‍රශ්නය වන්නේ බටහිරට එරෙහි සටන් කළ සියලු සිංහල වීරවරුන් මතක තබාගෙන සතුරාගේ ඉතිහාස පොතින් සොයා ගෙන ඇති අප මේ දෙමළියට යුක්තිය ඉටු කර නැති සැටිය ය. ඒ නිසා වන්නිච්චිගේ ජීවිතය සොයා යෑම මනුෂ්‍යත්වයේ ආල අන්දරය විවර කර ගැනීමක් වන්නේය. ඇගේ තතු විත්ති දිගේ ඇවිද යන්න ලුතිනන් තෝමස් නෝගල් අපට චරිතයක් වන්නේ ද ඒකය. ඒ වගේම ආගමික ජාතික බේදවලින් පිට පොදු පූජා භූමියක් වී ඇති 'මඩු පල්ලිය' ලක් කතාවතේ ඉතිහාස නිමිත්තක් වී ඇති විට ඒ නිමිති කථාව හරි මැදින් ඇය හමුවීමය. නමුත් සිංහලයන් වගේම දෙමළුන්ද, කිතුණුවන් වගේම හින්දු බෞද්ධයන් ද වන්නිච්චි මරියා සෙබ්බත්ති ගැන කිසිම වීමංසාවක්, පර්යේෂණයක් නොකිරීම ඓතිහාසික කනගාටුවක් ඇති කරන සිදුවීමකි. ජාති ආගමික භේද නැතුව සමාජයක් පුරා කැපවන්නන් අහිමි වේගන යන්නේය. කැපවන්නන්ට ජීවත්වීමට, කථා කිරීමට, මතුවීමට ක්‍රමය අහිමි වෙමින් පවතින්නේය. ඒ නිසා සුහද සමාජයක් අපට වුවමනා වී ඇත. වන්නිච්චි සහ නෝගල් වෙතින් ඉගෙන ගත යුතුව ඇත්තේ ඒකය. ඓතිහාසික අසාධාරණ නඩත්තු කරන තරමට වර්තමාන අසාධාරණය පවතිනු ඇත. ඒ නිසා මිතුරන්-හතුරන් කොයි කවුරුවත් ලියා ඇති ඉතිහාසය රට නඟන ධර්මතා විනිශ්චයක් සේ ගෙන මේ අවිනිශ්චිත දැවලින් මිදීමේ මාවත කර ගත යුතුය. ඉතින් වන්නිච්චි මරියා සෙබ්බත්ති මාතාව ජාතියේ මාතාවක් සේ ගෙන සොයා යා යුත්තේය.

සුජිත් අක්කරවත්ත

කටාරම

දිනමිණ

2021 මැයි 06 බ්‍රහස්පතින්දා

නුවරකලාවියේ වංශ

# විසල් නිම්නයේ සංස්කෘතික අරගලය

*ශ්‍රී ට පෙර ලියවිල්ලෙන් සනාථ කෙරුණේ නුවරකලාවිය යන නාමයට ප්‍රධාන වූ භූගෝලීය හා ඓතිහාසික සාධක පිළිබඳව විමසුමකි. එම ලියැවිල්ලෙහි දිගුවක් ලෙසටය මෙම ලියවිල්ල කැන්දන් එනුයේ. "නුවරකලාවිය වූ කලී ශ්‍රී ලංකා සිතියමට අනුගතව උතුරු මැද පළාතෙහි අනුරාධපුර දිස්ත්‍රික්කය ආවරණය වූ භූමි භාගයයි. එය මිනුම් දෙපාර්තමේන්තු මිනුම්වලට අනුගතව වර්ග සැතපුම් 2808.64ක් වනු ඇති. ශ්‍රී ලංකා ධරණීතලයෙහි වූ විශාලතම නිම්නය ද මෙය බව නොකිය මනාය. මෙහි වත්මන් ජනගහනය සිංහල, මුස්ලිම් හා දමිළ කොටස්වලින් සමන්විත වේ. 1978 මැතිවරණ කොමසාරිස් වාර්තාවලට අනුකූලව එදා ඡන්ද සංඛ්‍යාව 223702 කි. මෙම ප්‍රමාණය වත්මනේ ශීඝ්‍රකාර අයුරින් වර්ධනය වී ඇත.*

නුවරකලාවිය නම් වූ මෙම මහා නිම්නය දිග හැරී ඇත්තේ උත්තරාංශ 8.55 සිට 7.47 හා නැගෙනහිර දේශාන්තර අංශක 97.57 සිට 81.00 අතරය. මෙහි ඉම්ගම් මායිම්ගතව උතුරු මායිම උතුරු පළාතය. වයඹ හා මධ්‍යම පළාත දකුණට මායිම්ව ඇත. නැගෙනහිරට නැගෙනහිර පළාතේ හා තමන්කඩුව දිසාව මායිම්ව පවතී. පුත්තලම් හා මන්නාරම් දිසාවන්හි මායිම් බස්නාහිරට අදාළ වෙයි.

මේ අතර වව්නියාව දිසාවෙහි මායිමේ පිහිටි පදවිවැවේ සිට කුරුණෑගල දිස්ත්‍රික්ක මායිමේ ඇති 'පරවහගමට' විහිදුණු නුවරකලාවියේ එක් කෙළවරක දුර ප්‍රමාණය සැතපුම් 122 ක් වන අතර මධ්‍යම පළාතේ මායිම් හා පිහිටි ඉහවැලහින්නේ සිට ගල්කන්දේ මඩුඔයට ඇති කෙලවර සැතපුම් 75ක් වෙයි. එසේම කලා ඔයේ පාලමේ සිට අනුරපුර ත්‍රිකුණාමල පාරේ ගලගොඩහින්න දක්වා දික් වූ කෙළවර සැතපුම් 65ක් ලෙසටය නුවරකලාවියේ මායිම්වලට අනුගත දිග හා පළල ගණනය වනුයේ.

මෙසේ වූ නුවරකලාවිය නිම්නය එදා සිංහල පාලන ක්‍රමවේදය පහසු කර ගැනීම පරමාර්ථ කොට ගෙන පළාත් වශයෙන්, තුලාන් වශයෙන් හා කෝරළ වශයෙන් බෙදා තිබිණ. එම බෙදීම් මෙසේ කැටිකරගෙන දැක්වීම අනුචිත නොවේ යැයි හඟිමි. ඒ අනුව මේ මහා නිම්නය ප්‍රධාන වශයෙන් පළාත් තුනකට බෙදා තිබුණේ, නුවරගම් පළාත, හුරුලුගම් පළාත හා කලාගම් පළාත වශයෙනි. මෙම පළාත් නැවත කෝරළවලටත් ඒ කෝරළ තුලාන්වලටත් බෙදී තිබුණේ මෙයාකාරයෙනි.

**නුවරගම් පළාත** : නුවරගම් කෝරළේ/ කැදෑ කෝරළේ/ කනදරා කෝරළේ/ එප්පාවල කෝරළේ /කඩවත් කෝරළේ/ විලච්චි කෝරළේ වශයෙන් නුවරගම් පළාතේ මෙම කෝරළ හය යටතේ තුලාන් විසි පහක්ම ක්‍රියාත්මක විය.

එසේම,

**හුරුලුගම් පළාත** : තල්පේ කෝරළේ/ කුංචුට්ටු කෝරළේ/ මහපොතාන කෝරළේ/ අඩ්ඩියාන්කුලම කෝරළේ/ උලගල්ල කෝරළේ/ මටොඩුවා කෝරළේ වශයෙන් හුරලුගම් පළාතේ මෙම කෝරළ හය යටතේ තුලාන් දහසයක් ක්‍රියාත්මක විය.

තවද,


**කලාගම් පළාත** : උන්දුරා කෝරළේ/ කිරලව කෝරළේ/ නෑගම්පහ කෝරළේ/ කැලෑගම් කෝරලේ/ මාමිනියා කෝරළේ මෙසේ වූ කලාගම් පළාතේ කෝරළ පහ යටතේ තුළාන් දහ අටක්ම ක්‍රියාකාරි වූ බවත් නුවරගම් පළාතේ මෙම කෝරළ පහ යටතේ තුලාන් දහ නමයක්ම ක්‍රියාත්මක වූ බවත් සුපැහැදිලිය.

මේ අයුරින් පළාත් තුන ප්‍රධාන කොටගෙන නුවරකලාවියේ එදා කෝරළ 17කට ආසන්න ප්‍රමාණයක් තිබු අතර ඒවා යළි 60කට ආසන්න තුලාන් සංඛ්‍යාවකට බෙදී තිබූ බව පෙනේ. මෙසේ එදා සිංහල පාලන ක්‍රමය කාලයක් පැවති අතර ඉංග්‍රීසි පාලන අණසකට නුවරකලාවිය සම්පූර්ණයෙන්ම නතු වී ඇත්තේ 1833 වසරේ බවට අනුරාධපුර ඉතිහාසය දෙස් දෙයි. එම ඉතිහාසය ගැඹුරින් අධ්‍යයනය කිරීමේදී හමු වන ප්‍රධාන සිද්ධීන් අතර ඉංග්‍රීසි පාලනය යටතේ නුවරකලාවියේ පාලන කටයුතු කිරීමට අනුරාධපුරයට ප්‍රථමයෙන්ම පැමිණ ඇත්තේ ඉංග්‍රීසි ඒජන්තවරයෙකි. ඔහු නමින් ලුතිනන් මැන්ගස්කීල්ය. මේ ලුතිනන්වරයා සිය පාලන බලය අතට ගත්තේ 1873 දී බවයි එවකට වාර්තා හෙළි කරනුයේ. එසේ හෙයින්ම මෙමප්‍රදේශයේ එතෙක් පැවැති සිංහල පාලන රටාවට සුහුරුව සිටි මේ මහා නිම්න වැසියන් නොකමැත්තෙන් වුව ද ඉංග්‍රීසින්ගේ පාලනයට කෙමෙන් කෙමෙන් හුරු වූයේ උගුරට හොරා බෙහෙත් බොන ආකාරයෙනි.

කෙසේ නමුත්, සුදු පාලකයන්ගේ හිත්පිත් නැති ඒකාධිපති පාලන ක්‍රමය අපේ නුවරකලාවිය වාසීන්ට නොදිර වූ නිසාම ඔවුන්ගේ යටි සිත්හි ඇවිළගත් ක්‍රෝධ ගිනි දැල් වහන් කරගෙනය. විටින් විට පැමිණි සුදු ඒජන්තවරුන්ගේ බලපුළුවන්කාරකම්වලින් යුතු පාලනය මොවුන් ඉවසා දරා සිටියේය. ඊට හේතුව රාජ සමයේ සිටම නිවහල් නිදහස් දිවි පෙවෙතක සහනශීලී බව වැළඳු ඔවුන් සුද්දන්ගේ වහල්ලුන් වීමට කිසිසේත්ම මනාප නොවීමයි. මේ පර සුදු බලලෝභී අසාධාරණ පාලනය කවර මොහොතක හෝ 'කැති පොලු ගා' දමන්නට තරම් සැහැසි ආවේගයකින් වෙලී පැටලී සිටි අපේ නුවරකලාවීයයන් දිවි පරදුවට තබා හෝ තම නිජ බිම සුරක්ෂිත කරගැන්මේ සටන මෙහෙයවීමේ දේශප්‍රේමී නායකත්වයක් ප්‍රාර්ථනා කළ අවස්ථා එමටය. එසේ වුවද එම උදාර පැතුම ඉෂ්ට වන අවධියක් පේන තෙක් මානයකවත් නැති සේය. ඒ ගැන සුසුම්ලමින් චිත්ත සංතාපයෙන්ම සත වර්ෂයකට සමීප දීර්ඝ කාලයක් ඔව්හු, විටින් විට මාරු වන සුදු ජාතිකයින් හමුවේ අසරණ වූහ.

මේ අතරතුර සුදු ඒජන්තවරුන් වෙනුවට 1931දී නුවරකලාවියට ඉංග්‍රීසි රාජ්‍යයට අවනතව පත් වූයේ ශ්‍රී ලාංකික ඒජන්තවරයෙකි. ඔහු වනාහි සී. එල්. වික්‍රමසිංහ මහත්මාය. මෙතුමා ශ්‍රී ලාංකීය පරපුරුධාරියකු නිසා දේශීය කැක්කුමක් ඔහු සතුව ඇතැයි සිතන්නට තරම් අපේ ගැමි ජනතාව තුළ විශ්වසනීයත්වයක් ගොඩ නොනැගුණේ අන් කිසිවක් නිසා නොව, සුදු පාලන නීතියටම එතුමාට ඇපකැප වී සිය රාජකාරිය කරගෙන යාමට සිදු වීම හේතුවෙනි. මේ නිසාමය වික්‍රමසිංහ ඒජන්තවරයා ශ්‍රී ලාංකීය ජනතාවගෙන් දුරස්ථව ඉංග්‍රීසීන් හා සහසම්බන්ධව හෙළ රට්ටුන්ට වඩා නොරට්ටුන් නිරතුරුව ඇගැයුවේ.

මෙවන් පුද්ගලයකුගෙන් මේ නුවරකලාවිය නිම්නධාරීන්ට හුස්ම පොදක් නිදහසේ ගැනීමට පවා ඉඩහසරක් අපේක්ෂා කළ නොහැකි බව ඔව්හු මනාව පසක් කරගෙන සිටියහ. එනිසාම ඉංග්‍රීසින්ගේ දෑඪ පාලන බලයට එරෙහි වීමේ සිංහල දේශප්‍රේමී බල අරගලය පැලක් පිළක් පාසාම මෝදු වූයේ කඩිනම් දේශ හිතෙෂි නායකත්වයකට 'ඉව' අල්ලමිනි. ඒ අතර හෙළ රුහිරු ඉස්මෙන් ඉපිල ගිය ජාත භූමි ප්‍රේමණීයත්වය, හෙළ පුරවරය පුරාවට වපුරමින් හෙළයන් කුළු ගැන්වීමේ මහාර්ඝ ව්‍යාපාර ගම්බිම්වල පවා ඉස්මතු වූයේ උපන් බිම පරයින්ගෙන් බේරා ගැනීමේ ප්‍රබල චේතනාව පෙරදැරි කරගෙනමය.




(නුවරකලාවිය සිතියමේ ඒ ඒ පළාත් දක්වා ඇති සිතියම)





නුවරකලාවියේ ගජසිංහ කොඩිය

මෙම උත්තුංග දේශප්‍රේමී සිංහල අරගලය හුදෙක්ම දේශපාලනීය එදිරිවාදිකම් පසිදා ගැනීම පරමාර්ථ කරගෙන පමණක් දිගේලි වූවක් නොව එය සංස්කෘතිකමය මුහුණුවරකින්ද සමන්විත වී, දේශපාලනීය හා සංස්කෘතිය බල අරගලයක් ලෙසින් දියත් වූයේ. මෙහිදී ශ්‍රී ලාංකීය ග්‍රාමීය ජනී ජනයා දේශපාලනමය පැතිකඩට වඩා උත්සුක වූයේ, තම පරපුරෙන් පරපුර ජානගතව රුහිරු ඉස්මේ කැලතී ඇති බොදු ආගම දහම ප්‍රාණය සේ ආරක්ෂා කර ගැන්මේ සංස්කෘතික අරගලයට ළය පෑමටය.

එනිසාම දේශප්‍රේමී බල අරගලයේ සංස්කෘතිකමය ව්‍යාපාරය ප්‍රබල අයුරින් ගොඩනැගුණේ අපේ නුවරකලාවියේ අගනුවර වන බෞද්ධාලම්බන ප්‍රීතියෙන් ඔකඳ වන බොදුනුවන්ගෙන්ම සපිරි අනුරාධපුර පූජා භූමිය කේන්ද්‍ර කරගෙනය.

මේ අයුරින් කේන්ද්‍රගතව ක්‍රියාත්මක වූ සංස්කෘතිකමය, ව්‍යාපාරික අරගලයේ දේශප්‍රේමී නිර්මාතෘන් ලෙස එඩිතරව පෙරමුණ ගත්තේ අනගාරික ධර්මපාලතුමාණන් හා වලිසිංහ හරිස්චන්ද්‍ර උතුමාණන්ය. සංස්කෘතික අරගලයේ ප්‍රධානතම අපේක්ෂාවන් වූ අරමුණු දෙකක් විය. අනුරාධපුර නව නගරය ගොඩනැගීමේ ව්‍යාපාරය හා පූජා භූමිය සුරැකීමේ ව්‍යාපාරය යන අපේක්ෂා ද්විත්වය ඊට අයත් විය.

එදා මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යභාරය ඉංග්‍රීසි පාලනයෙන් අනිවාර්යයෙන්ම ඉටු විය යුතු බව තරයේ උද්ඝෝෂණය කරමින් එඩිතරව කියාපාමින්, අරගල කළ දේශ විමුක්ති ඉහත කී උදාරතා හෙළෝත්තමයින්ගේ නොනිමි ජාත භූමි අරගලයේ අග්‍ර ප්‍රතිඵල අද නුවරකලාවියේ අපි සාඩම්බරයෙන් භුක්ති විඳින්නෝ වෙමු.

*එදා මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යභාරය ඉංග්‍රීසි පාලනයෙන් අනිවාර්යයෙන්ම ඉටු විය යුතු බව තරයේ උද්ඝෝෂණය කරමින් එඩිතරව කියාපාමින්, අරගල කළ දේශ විමුක්ති ඉහත කී උදාරතා හෙළෝත්තමයින්ගේ නොනිමි ජාත භූමි අරගලයේ අග්‍ර ප්‍රතිඵල අද නුවරකලාවියේ අපි සාඩම්බරයෙන් භුක්ති විඳින්නෝ වෙමු.*

එදා නුවරකලාවියේ අනන්‍යතා ධජයක් පැවති බවත්, එම ධජය 18 වැනි සියවසේදී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් බුදු සසුන යළි නඟා සිටුවීම පරමාර්ථ කරගෙන නුවර පෙරහර සමාරම්භ කළ විට නුවරකලාවියේ ප්‍රධානියා වූ 'දිසාව' විසින් ධජය පෙරටු කරගෙන තම ප්‍රදේශවාසින් පිරිවරා පෙරහරට සහභාගී වූ බවත්, ආර්. ඩබ්ලිව්. අයිවර්ස් සඳහන් කරයි. එදා මහනුවර රාජධානියේ සෑම දිසාවක්ම මේ සිරිත අනුගමනය කළ බවද පැවසෙයි. ඒ අනුව නුවරකලාවියේ සලකුණ වූ ගජසිංහ ධජය එහි අනන්‍යතාව පසක් කැරිණ. මෙම දිසාවල ධජය පෙරටුකර ගෙන පෙරහැරේ යෑමේ අයිතිය තිබුණේ ඒ ඒ දිසාවන්වල දිසාවට පමණි. මහනුවර පෙරහරේ අදාළ දිසාවන්ට ලැබෙන ස්ථානය අනුපිළිවෙලකට සිදු වී තිබිණි. මේ අනුව නුවරකලාවියේ සිංහල ධජයේ සලකුණ වූයේ ගජසිංහ රුවය. ඒ රුව ධජය මධ්‍යයේ පිහිටි අතර, ඒ රූපය පාදස්ථලයක් මත සිටින ඇත් හිසකින් යුතු සිංහ රුවකි. මෙම ගජසිංහ රුව වටකොට අඳුරු රතු පැහැති කඩ ඉරිවලින් නිර්මිත ආයතාශ්‍රයක් වෙයි.

මේ ගජසිංහ මහා කොඩිය දිගින් අඩි 03 අඟල් 06ක් ද, පළලින් අඩි 06ක් ද වෙයි. එහි පසුබිම කාසාය වර්ණයෙන් යුක්තය. කොඩිය වටා ඇති පුළුල් බෝඩරය කිරිබත් කැට හැඩැති අඳුරු ස්වේත වර්ණ රූප තිහකින් සමන්විතය. එමෙන්ම මේ ගජසිංහ ධජයේ කොන් හතරේ බෝපත් හතරක් දැකිය හැකි අතර, සෙසු පසුතලය කුඩා මල් කැකුළු මෙන් විසිර ගිය රූපවලින් යුතු මුළුතල මෝස්තරයකින් අලංකාර වී තිබේ.

ගජසිංහ රුව පෙර පාදයක් ඔසවා වල්ගය අලංකාර අන්දමින් එසවී ඇති අතර ගමනෙහි යෙදෙන එඩිතර සිංහ රාජයකුගේ කඳ කොටසින්ද, ඊට උඩින් සමාන්තරව හොඬවැල විහිදුවාගෙන පසුපස බලන ඇත් හිසකින්ද යුක්තය. මෙසේ වූ ඇත් හිස තුළින් ගම්‍යමාන වන්නේ නිරතුරු සෝදිසියෙන් යුක්ත, සුපරීක්ෂාකාරීභාවය මෙන්ම ශක්තියත්, වාසනාවත්, කාර්යක්ෂමභාවයත් ප්‍රකාශ කිරීමත් ලෙසටය විද්වතුන්ගේ මතය වන්නේ.

**කේ. බී. මානෑව**

*සේයාරු - අන්තර්ජාලයෙනි.*

කටාරම

සංස්කරණය
**බන්ධුල ගුණරත්න**

**'කටාරම', දිනමිණ -ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.**
katarama@lakehouse.lk

2021 මැයි 06 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# ප්‍රසම්පාදන දැන්වීමයි

## අධ්‍යාපන, ඉඩම්, ඉඩම් සංවර්ධන, මහා මාර්ග, ප්‍රවෘත්ති අමාත්‍යාංශය

### දකුණු පළාත

## දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත දැක්වෙන කර්මාන්ත සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි දකුණු පළාත් සාමාජිකයින්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

අදාළ ප්‍රසම්පාදන අයදුම්පත්‍ර 2021.05.06 දින සිට 2021.05.24 දින ප.ව. 3.00 දක්වා **"සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, නො. 19, පහළ ඩික්සන් පාර,ගාල්ල"** කාර්යාලයෙන් ලබා ගත හැකිය. එක් ප්‍රසම්පාදන පතක් වෙනුවෙන් රු.. 2,000/- ක් වටිනා (ආපසු නොගෙවන) **"සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය"** නමින් ලංකා බැංකුවේ අංක 1587418 ගිණුමට මුදල් බැරකරන ලද බැරපත දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් අංශයට ඉදිරිපත්කර ලබා ගන්නා රිසිට්පතක් ඉදිරිපත් කළ යුතුය. (මුදල් භාරගනු නොලැබේ.)

සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන පත්‍ර මුල් පිටපත සහ දෙවන පිටපත වෙන වෙනම ලියුම් කවර වලද, පසුව එම ලියුම් කවර දෙක එක ලියුම් කවරයක බහා අදාළ කර්මාන්තයේ නම වම්පස ඉහළ කෙළවරේ ලියා 2021.05.25 දින පෙ.ව. 10.00 ට පෙර **"සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, නො. 19, පහළ ඩික්සන් පාර, ගාල්ල"** කාර්යාලයේ ඇති ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලීමට හෝ ලියාපදිංචි තැපැලෙන් එවීමට හැකිය. සියළුම ප්‍රසම්පාදන පත්‍ර 2021.05.25 දින පෙ.ව. 10.00 ට විවෘත කරනු ලබන අතර, ප්‍රසම්පාදනකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට ඒ සඳහා සහභාගී විය හැකිය.

| අනු අංකය | ප්‍රා.ඉ. කාර්යාලය | කර්මාන්තය | CIDA ශ්‍රේණිය | ලංසු බැඳුම්කර වටිනාකම රු. |
|---|---|---|---|---|
| 01 | බද්දේගම | යටලමත්ත උඩුගම මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම (0+700 Km) RHS | C-09 | 11,000/- |
| 02 | බද්දේගම | **පැකේජ් අංකය :** BA 03<br>I. ලබුදූව තරාවල මාර්ගයේ පැති කානු ඉදිකිරීම (2+100 Km)<br>II. තොටගොඩ ගනේගොඩ මාර්ගයේ හරස් කානු ඉදිකිරීම (1+100 Km) | C-09 | 12,000/- |
| 03 | බද්දේගම | **පැකේජ් අංකය :** BA 04<br>I. බෝපෙගොඩ පිංකන්ද මාර්ගයේ හරස් කානු ඉදිකිරීම<br>II. තිරාණගම පිංකන්ද මාර්ගයේ පැති කානු ඉදිකිරීම(120m) | C-08 | 44,000/- |
| 04 | ඇල්පිටිය | දෙද්දුව ගෝනගල කයිකාවල මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම (5+450 Km) | C-07 | 55,000/- |
| 05 | ඇල්පිටිය | තල්ගස්වල පිටිගල මාර්ගයේ බෝක්කුව පුළුල් කිරීම(9+900 Km) | C-08 | 38,000/- |
| 06 | ඇල්පිටිය | ඇල්පිටිය පිටුවල මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (1+240) RHS | C-08 | 36,000/- |
| 07 | ඇල්පිටිය | තණබද්දේගම ඇල්පිටිය මාර්ගයේ කානු ඉදිකිරීම (4+100 - 4+400 RHS, 3+800 - 4+000 RHS) | C-07 | 72,000/- |
| 08 | ඇල්පිටිය | **පැකේජ් අංකය :** EL 02<br>I. තණබද්දේගම හැම්මැලිය මාර්ගයේ උරහිස් තැනීම (7.20 Km)<br>II. අම්පෙගම ඇත්කදුර මාර්ගයේ කානු ඉදිකිරීම (3+200 Km)LHS | C-07 | 54,000/- |
| 09 | තවලම | මත්තක බඹරවාන මාර්ගයේ (1+900 Km) පෙට්ටි බෝක්කුව ඉදිකිරීම | C-07 | 75,000/- |
| 10 | තවලම | **පැකේජ් අංකය :** TW 02<br>I. උඩුගම බංගම මාර්ගයේ නිර්මිත තැනීම<br>II. බටහේන දූන්හේන මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම(11+600 Km) | C-08 | 24,000/- |
| 11 | මාකඳුර | **පැකේජ් අංකය :** MK 03<br>I. අතුඇල දූරංගල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම (0+950 Km) RHS<br>II. අතුඇල දූරංගල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම (1+300 Km) RHS<br>III. දූරංගල කොළණිය මාර්ගයේ පෙට්ටි බෝක්කුව පළල් කිරීම (2+250 Km) | C-07 | 54,000/- |
| 12 | මාකඳුර | **පැකේජ් අංකය :** MK 04<br>I. ඉහලවිටියල පහලවිටියල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම(1+500 Km) LHS<br>II. දෙයියන්දර කිරම මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (5+000 Km)<br>III. සපුගොඩ ගතාර රංසැගොඩ මාර්ගයේ නිර්මිත තැනීම | C-08 | 45,000/- |
| 13 | මාකඳුර | දෙනියාය පල්ලේගම මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම (0+500 Km) | C-09 | 12,000/- |
| 14 | වැලිගම | **පැකේජ් අංකය :** WE 03<br>I. වැලිහිඳ මාලිම්බඩ මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම (7+050 Km)<br>II. හල්ලල හොරගොඩ වැල්ලාන මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (87 m)<br>III. කද්දුව දම්පැල්ල මාර්ගයේ පෙට්ටි බෝක්කු ඉදිකිරීම (1+020 , 1+982 Km)<br>IV. කප්පරතොට වටරවුම මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (1+200 - 1+280 Km)<br>V. කප්පරතොට වටරවුම මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (1+600 - 1+700 Km) | C-07 | 81,000/- |
| 15 | වැලිගම | **පැකේජ් අංකය :** WE 04<br>I. බටවල පාතෙගම මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම (2+000 Km)<br>II. දෙවිනුවර තල්පාවිල මාර්ගයේ හියුම්පයිප්ප බෝක්කුව ඉදිකිරීම (3+250 Km)<br>III. කොටවිල නිදංගල වරකපිටිය මාර්ගයේ නිර්මිත තැනීම (0+000 - 0+500 Km)<br>IV. කඹුරුගමුව මිරිස්ස මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (4+400 - 4+500 Km) | C-07 | 87,000/- |
| 16 | වැලිගම | **පැකේජ් අංකය :** WE 05<br>I. වල්ගම කනත්තගොඩ මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම (1+000 Km)<br>II. කපුදූව උඩුව කඩවැද්දුව මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (3+300 Km)<br>III. කපුදූව උඩුව කඩවැද්දුව මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (0+140 -0+280 Km)<br>IV. උඩුකාව හල්ලල මාර්ගයේ පෙට්ටි බෝක්කු ඉදිකිරීම (0+300, 3+500 Km)<br>V. වල්ගම කනත්තගොඩ මාර්ගයේ කානු ඉදිකිරීම (0+080 -1+050 Km) | C-07 | 87,000/- |
| 17 | වැලිගම | **පැකේජ් අංකය :** WE 06<br>I. වෙහෙල්ගොඩ මාලගොඩ මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම (0+300 Km)<br>II. කද්දුව දම්පැල්ල මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (0+051 - 0+163 Km)<br>III. කැකණඳුර රත්මලේ දික්වැල්ල මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම<br>IV. මිදිගම ඉබ්බාවල මාර්ගයේ හරස් කානු ඉදිකිරීම (2+500 Km) | C-07 | 52,000/- |
| 18 | තංගල්ල | **පැකේජ් අංකය:** TA 01<br>I. ගොඩිගමුව පට්ටියපොල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම (2+099Km) LHS<br>II. ගොඩිගමුව පට්ටියපොල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම (2+465Km) LHS<br>III. ගොඩිගමුව පට්ටියපොල මාර්ගයේ බෝක්කුව හා පැති බැම්ම ඉදිකිරීම (2+850Km, 2+450 Km) | C-07 | 60,000/- |
| 19 | තංගල්ල | **පැකේජ් අංකය:** TA 02<br>I. උඩයාල අළුත්වැව මාර්ගයේ පාලමේ අත්වැට ඉදිකිරීම (8+150 Km)<br>II. පලතුඩුව මාරකොල්ලිය මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (1st Km) | C-09 | 18,000/- |
| 20 | තංගල්ල | කටුවන ඌරුබොක්ක මාර්ගයේ (5+600 Km) පැති බැම්ම ඉදිකිරීම | C-08 | 34,000/- |
| 21 | තිස්ස | **පැකේජ් අංකය:** TI 03<br>I. අම්බලන්තොට වාදුරුප්ප මාර්ගයේ කොන්ක්‍රීට් කානු ඉදිකිරීම (0+480 Km - 0+560 Km)<br>II. වැලිගත්ත බූන්දල මාර්ගය කොන්ක්‍රීට් කිරීම (2+100 - 2+300 Km) | C-07 | 56,000/- |

සියලුම ප්‍රසම්පාදන පත්‍ර සමග ඉහත වටිනාකමින් යුත් දින 90ක ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු වේ. මෙය පිළිගත් බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයකින් ඉදිරිපත් කළ හැකිය. නැතහොත් ඉහත ඇප බැඳුම්කරයේ වටිනාකමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ලංකා බැංකුවේ අංක 1587467 ගිණුමට මුදල් බැරකරන ලද බැරපත ගිණුම් අංශයට ඉදිරිපත් කර ලබාගන්නා රිසිට්පත ඉදිරිපත් කළ හැකිය.(මුදල් භාරගනු නොලැබේ).

ප්‍රසම්පාදන පතෙහි සියළුම පිටු ප්‍රසම්පාදනකරු විසින් අත්සන් කර ඔහුගේ නිල මුද්‍රාව තැබිය යුතුය.

(මේ සම්බන්ධ වැඩි විස්තර දුරකථන අංක 091-2226440, 091-4936371 න් ලබාගත හැකිය)

**සැ.යු. -** ආයතනයක් මගින් ප්‍රසම්පාදන පත්‍ර ලබා ගන්නා විට ඊට අදාළ ලංසු බැඳුම්කරය ද එම ආයතනය නමින් ලබා ගත යුතුය.

**ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.**

**සාමාන්‍යාධිකාරී,**
**දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**නො. 19, පහළ ඩික්සන් පාර,**
**ගාල්ල.**

**2021.05.04**

# ප්‍රසම්පාදන දැන්වීම

### වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## ජාතික තරගකාරී ලංසු කැඳවීම

01. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පහත අංක 01 වගුවේ සඳහන් මිලදී ගැනීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**වගුව අංක : 01**

| ලංසු අංකය | විෂය විස්තරය | ප්‍රමාණය | ආපසු නොගෙවන තැන්පතුව (රු.) | ලංසු අවලංගු වන දිනය | ලංසු ඇපකරය (රු.) | ලංසු ඇපකරය වලංගු විය යුතු කාලසීමාව |
|---|---|---|---|---|---|---|
| IFB/ID/GOSL/NCB/2021/007 | **Procurement of Computers** | | | | | |
| | **Lot 01 -** Procurement of Desktop Computers i3 | 12 | 5,000.00 | 09.09.2021 | 20,000.00 | 07 ඔක්තෝබර් 2021 |
| | **Lot 02 -** Procurement of Desktop Computers i3 | 20 | | | 50,000.00 | |
| | **Lot 03 -** Procurement of Desktop Computers i7 | 18 | | | 80,000.00 | |
| | **Lot 04 -** Procurement of Workstation Computers | 08 | | | 40,000.00 | |
| | **Lot 05 -** Procurement of Notebook Computers i5 | 51 | | | 160,000.00 | |
| | **Lot 06 -** Procurement of Notebook Computers i7 | 02 | | | 10,000.00 | |
| IFB/ID/GOSL/NCB/2021/010 | **Procurement of Computer Peripherals & Office Equipment** | | | | | |
| | **Lot 01 -** Procurement of UPS | 26 | 2,000.00 | 09.09.2021 | 3,000.00 | 07 ඔක්තෝබර් 2021 |
| | **Lot 02 -** Procurement of A4 Laser Printers (Black) | 19 | | | 15,000.00 | |
| | **Lot 03 -** Procurement of A4 Colour Laser Printers | 03 | | | 5,000.00 | |
| | **Lot 04 -** Procurement of A3 Digital Photocopier (LED Colour) | 01 | | | 10,000.00 | |
| | **Lot 05 -** Procurement of A3 Colour Image Scanners | 03 | | | 2,000.00 | |
| | **Lot 06 -** Procurement of Multimedia Projectors | 09 | | | 20,000.00 | |
| | **Lot 07 -** Procurement of Fax Machines | 08 | | | 10,000.00 | |
| | **Lot 08 -** Procurement of A3 Photocopy Machines | 12 | | | 30,000.00 | |
| IFB/ID/GOSL/NCB/2021/011 | Supply & Installation of Gap - Bed Lathe Machines | 02 | 4,000.00 | 09.09.2021 | 150,000.00 | 07 ඔක්තෝබර් 2021 |
| IFB/ID/GOSL/NCB/2021/012 | Procurement of Vis Spectrophotometer | 01 | 1,000.00 | 09.09.2021 | 40,000.00 | 07 ඔක්තෝබර් 2021 |

02. කොවිඩ් - 19 වසංගත ව්‍යාප්තිය නිසා ලංසුපත් මිලදී ගැනීම සඳහා පහත වගුවේ සඳහන් ආකාරයට ආපසු නොගෙවන තැන්පතු මුදලේ බැංකු ලදුපත හා ඉල්ලීමේ ලිපිය වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන), නො. 230, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 07 වෙත (idprocurement1.@gmail.com / Fax - 011-2582677) , 2021 මැයි 10 දින සිට 2021ජූනි 10 දින දක්වා රජයේ වැඩකරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා යොමුකළ යුතුය.

**වගුව : 02**

| බැංකුවේ විස්තරය | | බැංකු ලදුපත හා අයදුම් ලිපිය එවිය යුතු | | ලංසුපත් නිකුත් කිරීම | |
|---|---|---|---|---|---|
| බැංකුව | ගිණුම් අංකය | විද්‍යුත් ලිපිනය | ෆැක්ස් අංකය | වේලාව | ස්ථානය |
| BOC Taprobane Branch | 7042385 | idprocurement1@gmail.com | 011-2582677 | පසු දින 10.00 - 11.00 (මුල් පිටපත) | පහත අංක වලින් විමසන්න 011-2582677 011-2581162 - Icom-217 |

03. පූර්ව ලංසු රැස්වීම් විස්තර පහත අංක 03 වගුවේ සඳහන් කර ඇත.

**වගුව අංක : 03**

| ලංසු අංකය | විෂය විස්තරය | ස්ථානය | දිනය | වේලාව |
|---|---|---|---|---|
| IFB/ID/GOSL/NCB/2021/007 | Procurement of Computers | ශ්‍රවණාගාරය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව. නො. 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 හෝ Zoom Meeting | 13.05.2021 | 10:00 |
| IFB/ID/GOSL/NCB/2021/010 | Procurement of Computer Peripherals & Office Equipment | | | |
| IFB/ID/GOSL/NCB/2021/011 | Supply & Installation of Gap - bed Lathe Machines | | 13.05.2021 | 14:00 |
| IFB/ID/GOSL/NCB/2021/012 | Procurement of Vis Spectrophotometer | | 13.05.2021 | 15:00 |

04. ඉදිරිපත් කරන සියලුම ලංසු ඒ ඒ ලංසුව සඳහා අදාළ වටිනාකම සහිත ලංසු සුරක්ෂණ සහතිකය සමග අදාළ ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොකරන ලංසු අසම්පූර්ණ ලෙස සලකා කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. මෙම යන්ත්‍ර / උපකරණ සඳහා නිෂ්පාදකයා බව හෝ ඒවා සැපයීම සඳහා අදාළ නිෂ්පාදකයාගේ බලයලත් නියෝජිතයා බවට නිෂ්පාදකයාගේ සහතිකය අදාළ නිශ්චිත පත්‍රිකාවේ සහතික කර ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන ලංසු සම්පූර්ණ ලෙස සලකා කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසුවට අදාළ සියලුම ලිපිලේඛන වල ලංසු ඉදිරිපත් කරන අය / ආයතනයේ බලයලත් අය අත්සන් කර ආයතනයේ සහ පෞද්ගලික මුද්‍රාවද තැබිය යුතුය.

07. සම්පූර්ණ කරන ලද ලංසු, **2021 ජූනි 10 දින පැය 14.00 (ප.ව. 2.00)** ට හෝ ඊට පෙර ලැබෙන පරිදි **කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 230 හි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 3 වන මහලේ, කාමර 311 හි (ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ කාමරය)** මේ සඳහා තබා ඇති **ටෙන්ඩර් පෙට්ටියේ** බහාලීමට හෝ **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව"** වෙත ඉහත ලිපිනයට **ලියාපදිංචි තැපැල්** මගින් එවීමට හැකිය. ලංසු භාරගැනීම **2021 ජූනි 10 වන දින පැය 14.00 (ප.ව. 2.00)** ට අවසාන වන අතර, ඒ වහාම විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ප්‍රසම්පාදනයේ නම සහ ප්‍රසම්පාදන අංකය** (IFB No.) සඳහන් කළ යුතුය.

08. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ලංසු භාරගනු ලබන අවසාන දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කළහොත් ඊලග රාජකාරී දිනයේ එම වේලාව සහ එම ස්ථානයේදී ලංසු විවෘත කරනු ලබේ.

09. එක් ලංසුවක් හෝ ලංසු කීපයක් හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

10. මේ සඳහා උනන්දුවක් දක්වන්නන් **වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන) වෙතින් (දුරකථන අංක :** 011-2582897 හෝ 011-2582677) වැඩිදුර තොරතුරු ලබාගත හැක.

**ඉංජිනේරු කේ.ඩී.එන්. සිරිවර්ධන,**
**වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව,**
**230, බෞද්ධාලෝක මාවත,කොළඹ 07.**

**දිනය : 2021.05.07**

